


දිවයින
ඉරිද සංග්‍රහය
ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 14

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

## මේ සටහන් තැබූ භික්ෂූන්වහන්සේගේ පුණ්‍යානුමෝදනාව

මාගේ ගුරුදේවයාණන් වහන්සේ වන
අති ගෞරවණීය දොඩම්පහල චන්ද්‍රසිරි
මහනායක ස්වාමීන්වහන්සේට ද
කල්‍යාණමිත්‍රභාවයෙන් උපකාර කළා වූ
සියළුම ගෞරවණීය ස්වාමීන්වහන්සේලාට ද
නිදුක් නිරෝගී සුවපත්භාවය පිණිසත් මේ ජීවිතයේ දීම
චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධය පිණිසත්
මෙම ධර්මදානමය කුසලය හේතු වේවා...

**වැඩි පිරිසකට ධර්මය බෙදා දීමේ අරමුණින් මෙම දහම් පොත් මාලාව අවම මුදලකට ඔබ අතට පත් වන බව සලකන්න.**

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

අතහැරීම 14

ඉදිරිපත් කිරීම
**ඉන්ද්‍රජිත් සුබසිංහ**

**දිවයින ඉරිදා සංග්‍රහයේ**
**ලිපි මාලාවක් ඇසුරිනි**

**© ඉන්ද්‍රජිත් සුබසිංහ**

පළමුවන මුද්‍රණය - 2020 සැප්තැම්බර්
දෙවන මුද්‍රණය - 2021 මැයි

**වෙබ් පිටුව:**

**www.maharahathunwedimagaosse.com**
**www.mrwo.lk**

ISBN - 978-955-7887-49-4

**මහ රහතුන් වැඩි මඟ ඔස්සේ දහම් පුස්තක ලබා ගත හැකි ආකාරයන්...**

- **දිවයින පුරා පොත් අලෙවිසැල් වෙතින්**
- **ඔබගේ නිවසටම හෝ ආසන්නතම ප්‍රධාන තැපැල් කාර්යාලය වෙතද ගෙන්වා ගත හැක.**

මෙතෙක් පළ වී ඇති පොත් පිළිබඳ සම්පූර්ණ විස්තරය සඳහා
පසුපස කවරයේ ඇතුල් පැත්ත බලන්න.

**විමසීම් -**
දූරකථන: 011 2755767
011 2755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.00 දක්වා)

ඡායාරූප
**වාසල සේනාරත්න**

මුද්‍රණය සහ බෙදාහැරීම

**ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්**

230/15, කම්මල පාර, කිරිවත්තුඩුව, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත, පරිසර හිතකාමී තීන්ත භාවිතයෙන් මුද්‍රිත යි.)

'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ ' ලිපි මාලාව පින්වත් ඔබ වෙනුවෙන් පුදනු ලැබූ උන්වහන්සේ එදා ඒ සටහන් තබනු ලැබුවේ අප්‍රකටව ය. මහා ඝන වනාන්තරයේ ඈත කුටියක සිට, සිතත්, පරිසරයත් සහමුලින් ම නිසල මොහොතක, ලොව ම නිදනා රාත්‍රියක, විටෙක රූස්ස ගස් අතරින් පෙරී එන ළහිරු කිරණ හෝ තවත් විටෙක ලන්තෑරුමේ දුප්පත් එළියේ පිහිටෙන් තැබූ ඒ සටහන් දිවයින සිසාරා සදහම් සුවඳ වී හමා ගියේ ය. ඒ සුවඳ හමන්නේ කොයි ඉසව්වෙන් දැයි සැදැහැති දනෝ විමසූහ. ඒ දහම් සුවඳින් හදවත සුවඳවත් කරගත් අයෙක් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඒ දහම් සුවඳ පතුරුවාහළ බුදුපුතුන් දැකීමට ප්‍රාර්ථනා කළහ; සත්‍යක්‍රියා කළහ; තවමත් ගළපාගත නොහැකි දහම් ගැටලුවක් වේ නම් එය ඒ පින්වත් ස්වාමීන් වහන්සේගෙන් ම විමසා ගළපා ගැනීමට උනන්දු වූ හ.

කාලයාගේ ඇවෑමෙන් ඒ ප්‍රාර්ථනා ඉටු විය. සටහනකින් ඔබ දුටු උන්වහන්සේව සියැසින් දැක ගැනීමට ඔබට හැකි විය. නැතිනම් ඔබට ඒ සඳහා හේතු තිබුණි. එතෙක් ඇසින් කියවූ දහම් ගැළපුම දෙසවනින් ඇසීම උදෙසා දසදහස් ගණනින් රැස් වූ හ. පිරිස කොතරම් උන්වහන්සේ වටා රැස් වුව ද, උන්වහන්සේ උන්වහන්සේගේ ස්වභාවයෙන් ම සිටි සේක. රැස් වන කඳු ගණන් පිරිකර ද, දහස් ගණන් පිරිවර ද ලෝකය වශයෙන් ම, මාරයා වශයෙන් ම දුටු සේක. ප්‍රශංසාවත්, සාධුකාරයත්, ගැරහුමත්, විවේචනයත් ධර්මයට ම ගැළපූහ.

වනයේ රූක්ෂ මණ්ඩලයක රැඳුණු හුදකලාව තමන් වහන්සේගේ විවේකය පිණිසත්, ගම, නගරයේ සැකසුණු ධර්ම මණ්ඩපයක ඉල්ලීම ධර්මකාමී ජනතාවගේ පහසුව පිණිස කැපකිරීමක් ලෙසත් වස්කාලයෙන් වස්කාලය, උන්වහන්සේ ඉකුත් වසර කිහිපය ගෙවා දැමූහ. නමුත් උන්වහන්සේ අප සැම කෙරෙහි අනුකම්පාවෙන් අඛණ්ඩව ම ශ්‍රී සද්ධර්මය අප සැම වෙත දායාද කළ සේක. මේ එවැනි වූ තවත් උතුම් දහම් ගැළපුම් පෙළක එකතුවකි.

# පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නො ගැසූ තැනක් වේ ද? අත් නො විඳි අත්දැකීමක් වෙද් ද? ඒ සා තැන්හි කරක්ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමු ද? අප හැමදා ම කැරකුණේ එක ම තැනක් වටා ය; විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ වැනි එක ම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ, යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කල්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත් ද, ඒ කල්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

**ඉන්ද්‍රජිත්**

## ස්තුති පූර්වක පුණ්‍යානුමෝදනාව

**දිවයින ලිපි මාලාව ඉදිරිපත් කළ ඉන්ද්‍රජිත් සුබසිංහ මහතාටත්, දැනට එම ලිපි මාලාව සම්බන්ධීකරණය කරනු ලබන මනෝජ් අබේධීර මහතාටත්, දිවයින පුවත්පතේ අධ්‍යක්ෂක මණ්ඩලය, කතෘ මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළුම දෙනාටත්, මෙම ධර්ම දානමය කුසලය නිදුක් නිරෝගී සුවපත් භාවය පිණිසත්, උතුම් ධර්මාවබෝධය පිණිසත් හේතු වේවා !**

# පටුන

සිල්පද පහේ ආරක්ෂාව තුළ ජීවත්වන කෙනා සැමවිටම පෞරුෂත්වයෙන් යුත් පින්වතෙක් 1

අපි මේ මුළු රටම ශීලයේ යාග භූමියක් බවට පත්කර ගනිමු 4

බුද්ධෝත්පත්ති කාලයක විකෘති මෙසේ නම් අබුද්ධෝත්පත්ති කාල කෙසේ වෙයිද? 7

විඳීම් සොයා අයාලේ යන සිතක රස්තියාදුව 16

ඔබේ ඇලීම ගැටීමටත් මිලක් දෙන සමාජයක, ඔබ වෙනුවෙන් ඉස් මස් පවා කැපකළ සරණක් ... 23

භික්ෂූත්වයේ ආදර්ශය 'ඩිමාන්ඩ්' එකක රිමාන්ඩ් කළ හැකිද? 33

සැඩ පහර හයකට හසුවී ගලාගෙන යන 'කඳක්' නොවන්න! 43

උතුම් බුදුගුණයන් නොවන්නට මම අද කොහේදැයි සිතුවාද? 52

රැකියාවේ යුතුකම වගකීම භවයටම වැටුප තීරණය කරනු ඇත 57

තෙපාවක් මත රැඳුණු දිවියක් මහ මෙරක් වනු කෙලෙසදෝ 64

තෘෂ්ණාව තෘෂ්ණාවෙන්ම නැතිකරන කලාව 71

ප්‍රශ්නය බරපතල වුනත් හේතුඵල ගැලපීමේදී මතුවන දේ සුන්දරයි 79

ගෙයි ගින්දර පිටටත් එපා! පිටරටටත් එපා! 85

තමන් තුළටම එබී බලන්න, ලොව බිහිසුණුම අඳුර ඇතිදැයි කියා 91

දුක නමැති රෝගයට එකවර ඔසු දෙකක් 98

සක්කාය දිට්ඨියට මොන පන්ති භේදයක්ද.. 104

පූර්වාදර්ශයන් ගන්න - අනුකරණයට නොයන්න 110

සංස්කාරයන්ගේ සූදු අන්තුවා කවුද? 116

ඔබ කියවා ඔබේ ඇමතිතුමාට කියවන්න දෙන්න! 122

භාවනාවෙනුත් අං එනවා නම්... 126

සඳ එළියට වශී නොවන පාළුවක් නැති විවේකය 134

ලෝකය පාලනය කරන්නේ ඇමරිකාව හෝ රුසියාව නොවන වග.. 142

## විශේෂ ලිපි

පාස්කු ප්‍රහාරයට පසුවදනක් 151

පාස්කු ප්‍රහාරයෙන් පසු වෙසගේ සැබෑම අසිරිය 159

විභාගයට යන දරුවා නියම ජයග්‍රාහකයෙක් කරන මග 166

ඉන්ද්‍රිය සංවරයෙන් නෙළුම් විල පිරික්සමු 176

වසරක් පරණ වෙන මොහොතේ අලුතෙන් සිතන විදිහ 183

උපන් බිමට ඇති ධර්මානුකූල සම්බන්ධය කුමක්ද? 190

# සිල්පද පහේ ආරක්ෂාව තුළ ජීවත්වන කෙනා සෑමවිටම පෞරුෂත්වයෙන් යුත් පින්වතෙක්

ශීලය කියන්නේ බොහෝම සුන්දර අර්ථයක් ශීලය ජීවිතයට එකතු වුණ තැනදි ජීවිතය සැහැල්ලු වෙනවා. ජීවිතය සරල වෙනවා. ශීලයයි මනුෂ්‍යයා තුළ ඉන්ද්‍රිය සංවරය ඇති කරල දෙන්නේ. මේ ඉන්ද්‍රිය සංවරයයි මනුෂ්‍යයා තුළ තම යුතුකම් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඒවා නිවැරැදිව ඉටුකිරීම සම්බන්ධයෙන් සතිය සිහිය ඇති කර දෙන්නේ. ශීලයෙන් දුර්වල වෙන ප්‍රමාණයට සමාජයේ ජීවත්වන පින්වතුන්ලා ගේ සතිය සිහිය දුර්වල වෙලා යනවා. මෙම අනතුරේ පැතිකඩක් සමාජය තුළ නිර්මාණය වෙලා තිබෙනවා.

පංචශීලයෙන් පටන් ගෙන උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලය දක්වා ශීලයේ සුන්දර අර්ථයන් ජීවිතයට එකතු කර ගැනීමට අදාළව බුදුරජාණන් වහන්සේ පින්වතුන්ලාට ධර්මය දේශනා කර තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුතුව සිල්පද සමාදන් වෙන්න, සමාදන් වූ ශීලය ආරක්ෂා කර ගන්න, ආරක්ෂා කරගත් ශීලය ආවර්ජනය කරන්න, ආවර්ජනය කළා වූ ශීලය විදර්ශනා නුවණින් දකිමින් උතුම් ශීලයේ අර්ථය තුළින් ප්‍රඥාව මතු කර ගන්නය කියල. නමුත් වර්තමාන සමාජයේ බහුතරයක් පින්වතුන් ශීලය ප්‍රඥාව උදෙසා මෙහෙයවීම පසෙක තිබියදී ශීලය මමත්වයේ දැඩිභාවය උදෙසා යොමු කර ගන්නා බවත් පෙනෙන්නට තිබෙනවා.

ශීලය සැපය උදෙසා යහපත උදෙසා ජීවිතයට එකතුකර ගත යුතු අර්ථයක් කියන තැනින් බැහැර වී ශීලය සමාජය තුළ අනුන්ව රවට්ටන තවත් මෝස්තරයක් බවට පත්වීමේ අනතුරක් සමාජය තුළ පෙනෙන්නට තිබෙනවා. භික්ෂුව මෙසේ සඳහන් කළේ ප්‍රසිද්ධියේ සිල්පද සමාදන් වෙන බොහෝ දෙනෙක් ප්‍රසිද්ධියේ සහ අප්‍රසිද්ධියේ සිල්පද දුර්වල කර ගන්නා නිසයි. ශීලය හාස්‍යයක් වුණ සමාජයක සම්මා දිට්ඨියේ සහ සම්මා සංකප්පයන්ගේ අර්ථයන් දුර්වලවෙලා යනවා. එහි ප්‍රතිඵලය වන්නේ බෞද්ධ ලේබලය යටතේ අබෞද්ධ සමාජයක් බිහිවීමයි. මේ අනතුර වර්තමානයේ සමාජය තුළ ක්‍රමානුකූලව සිදුවෙමින් පවතිනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සිල්පද පහේ ආරක්ෂාව තුළ ජීවත් වන පින්වතා සෑමවිටම පෞරුෂත්වයෙන් යුත් පින්වතෙක්ය කියල. පෞරුෂත්වය කියන වචනය වර්තමාන සමාජය තුළ වැරදි විදිහට විග්‍රහ වෙනවා. වර්තමාන සමාජයේ පෞරුෂත්වය කියන්නේ යම් පුද්ගලයෙකුගේ ශරීරයේ උස මහත කඩවසම් භාවයයි. එහෙම හඳුන්වන කඩවසම් භාවයකුත්, පෞරුෂත්වයකුත් ලෝකය තුළ තිබෙනවා තමයි. නමුත් ඒ පෞරුෂත්වය ධර්මයේ පෞරුෂත්වය නොවෙයි. ධර්මානුකූල පෞරුෂත්වයෙන් යුත් භික්ෂුවක්ය කියල කියන්නේ යම් භික්ෂුවක් උතුම් පැවිදි භාවයට පත් වීමට පෙරාතුව "මම බුදුරජාණන් වහන්සේ උදෙසා ජීවිතය කැපකරමි, බුදුරජාණන් වහන්සේ මතු කර පෙන්වූ චතුරාර්ය සත්‍ය ධර්මය ජීවිතයට එකතු කර ගනිමි"යි චිත්තයක් ඇති කර ගෙන උතුම් පැවිදි උපසම්පදා ලබාගත්ත ද ඉහත උතුම් අරමුණ උදෙසා කුමන මාර බලවේග පැමිණිය ද ජීවිත පරිත්‍යාගයෙන් යුතුව තම වන්දනීය අරමුණු කරා ගමන් කරන්නාවූ භික්ෂුවටයි, පෞරුෂත්වයෙන් යුත් භික්ෂුවක් කියල කියන්නේ.

යම් භික්ෂුවක් උතුම් ආර්ය ශීලය උදෙසා ආර්ය සමාධිය, ආර්ය ප්‍රඥාව, ආර්ය ඥාන දර්ශන, ආර්ය විමුක්තිය උදෙසා වීර්යය වඩනවා නම් එම භික්ෂුවයි පෞරුෂත්වයෙන් යුතු භික්ෂුව කියල ධර්මයේ සඳහන් වෙන්නේ. බුදුරජාණන් වහන්සේ වරක් වර්ණනා කරනවා අඩි හතරක් වත් උස නොමැති පෙනුමෙන් දුර්වල ලකුන්ඨකභද්දිය ස්වාමීන් වහන්සේ මගේ ශාසනය තුළ වැඩ සිටින ආර්ය ඥාන දර්ශනයෙන් පරිපූර්ණ වූ පෞරුෂයෙන් යුත් භික්ෂුවක්ය කියල. ගිහි කල කසළ ශෝධකයෙක් වශයෙන් රැකියාව කළ සුනීත ස්වාමීන් වහන්සේ උතුම් සංඝ සමාජයේ පෞරුෂයෙන් යුත් භික්ෂුවක් කියලා. භික්ෂූන් වහන්සේලා වශයෙන් අපි දක්ෂ විය යුතුයි, අතීතයේ යම් දවසක අපි යම් උතුම් අරමුණක් සාක්ෂාත් කර ගනිමියි පැවිදි භාවයට පත්වුණා ද එම උතුම් අරමුණ තුළ වර්තමානයේ ජීවත්වෙනවාද කියන කාරණය නිරතුරුවම ආවර්ජනය කර බැලීමට; වැරදි ඇතොත් සැබෑ අරමුණ කෙරෙහි සතිය සිහිය වහ වහා ඇතිකර ගැනීමට. එවිටයි අපි සංඝ සමාජයේ පෞරුෂත්වයෙන් යුත් භික්ෂුවක් වීමේ සුදුසුකම ලබන්නේ.

සංඝ සමාජයේ සාමාජිකයින් වන අපි ප්‍රාතිමෝක්ෂ ශීලය තුළ ශක්තිමත් වෙමු. අදට වඩා වැඩිපුර ශිල්පදයක් හෙට දවසේ රකිමු. හෙටට වඩා වැඩිපුර ශිල්පදයක් පසුවදාට රැකගනිමු. ශීලයට අපේ භික්ෂු ජීවිතය තුළින් වැඩි වටිනාකමක් ලබාදෙමු. ශීලයේ ආනිශංස තුළින් මයි, ජනතාව තුළ භික්ෂු සමාජය කෙරෙහි ප්‍රියභාවය අභියෝගයන් ඉදිරියේදී ශක්තිමත් වෙන්නේ.

# අපි මේ මුළු රටම ශීලයේ යාග භූමියක් බවට පත් කර ගනිමු

ගිහි බෞද්ධ පින්වතුන්ලාත් ශීලය නමැති යාග භූමියේ කොටස්කරුවන් වෙන්න. නිතිපතා පංචශීලය සමාදන් වෙලා එම සිල්පද ආරක්ෂා කර ගන්න. නායක පින්වතුන්ලා බොරු කීවාට, ඔබලා බොරු කියන්න එපා. නායක පින්වතුන්ලා සොරකම් කළාට ඔබලා සොරකම් කරන්න එපා. තම බිරිඳගෙන් සැමියාගෙන් පමණක් සතුටු වන සිල්වතෙක් වෙන්න. සවසට අරක්කු කඩ ඉදිරියේ පෝළිම් ගැසෙන්න යන්න එපා. පින්වත් ගිහි ඔබ ශීලය නමැති යාග භූමියේ ශක්තිමත් අවංක සටන්කරුවෙක් වෙන්න. ආගමික සමගියට, ජාතික සමගියට ගරු කරන ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් පූජකතුමන්ලා වගේම එම ආගම් වල ගිහි පින්වතුන්ලාත් මෙම ශීල යාගයේ කොටස්කරුවන් වෙන්න අවශ්‍යමයි. එහෙයින් අනෙකුත් ආගම් වල පින්වතුන්ලාත් නිතිපතා පංචශීලය ආරක්ෂා කර ගන්න. සතුන් මැරීමෙන් හැකිතාක් වළකින්න. තම තමන්ගේ ආගමික ශාස්තෘන් වහන්සේලාගේ ඉගැන්වීම් වලට අදාළව යහපතෙහි යෙදෙන්න.

අතිගෞරවණීය, උත්තරීතර මහානායක ස්වාමීන් වහන්සේලා හතරදෙනාගේ නායකත්වයෙන් මහා සංඝරත්නය, බෞද්ධ ගිහි පින්වතුන්ලා ශීල යාගය තුළ ශක්තිමත් වන විට අනෙකුත් ආගම් වල පූජක තුමන්ලා තම ගිහි පින්වතුන්ලා සමග ශීල යාගය තුළ ශක්තිමත් වන විට මහා සංඝරත්නයේත් ජනතාවගේත් පින කුසලය ශක්තිමත් වෙනවා. ජනප්‍රිය භාවය ඇති වෙනවා.

එවිට හේතුඵල ධර්මයන් විසින්ම දුස්ශීල බලවේගයන් නොසිතූ ආකාරයට පරාජය කරා ගමන් කරාවි. එම නරක උදවියට කුමක් සිදුවේද කියල ඔබ සිතන්න අවශ්‍ය නැහැ. දේවදත්ත හාමුදුරුවන්ට කුමක් සිදුවේද කියල බුදුරජාණන් වහන්සේ සිතුවේ නැහැ. කෝකාලික හාමුදුරුවන්ට කුමක් සිදුවේද කියල සාරිපුත්ත මහරහතන් වහන්සේ සිතුවේ නැහැ. උන්වහන්සේලා අභියෝගයන් හමුවේ ආර්ය ශීලය තුළ ශක්තිමත් වීම පමණක් මයි, සිදු කළේ. එම නිසා පින්වත් ඔබ මීළඟට වෙන දෙය ගැන නොසිතා ශීල යාග භූමියේ ශක්තිමත් සටන් කරුවන් වෙන්න. ඔබ තුළ රැස් වෙන කුසල් සංස්කාර විසින් අකුසලය පරාජය කර දමාවි. නමුත් ඉතින් කුමන සංස්කාරයත් අනිත්‍ය භාවයට පත් වෙන සංස්කාරයක් මයි. නමුත් සම්මා සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව උදෙසා අප අපවත් වන තුරාවටම කළහැකි යමක් වේද ධර්මානුකූලව එය ඉටු කිරීම අපගේ යුතුකමක් වෙනවා. පින්වත් ඔබ ශීල යාගයේ ශක්තිමත් වෙන විට ඔබගේ ඉන්ද්‍රිය සංවර භාවය ශක්තිමත් වෙනවා. අභියෝගයන් ඉදිරියේ සිල්පද ආරක්ෂා කර ගෙන ඒවාට මුහුණදීමේ සතිය, සිහිය ඔබ තුළ ඇති වෙනවා. ශීල යාගයේ යෙදෙන පින්වතා අභියෝගයන් ඉදිරියේ පලායන පින්වතෙක් වෙන්නේ නැහැ. ධර්මානුකූලව මෙත් සිත උපයෝගි කර ගෙන අභියෝගයන් ජය ගන්නා කෙනෙක් බවටයි, පත් වෙන්නේ.

පින්වත් ඔබට මෙම සටහන් ලියන භික්ෂුව උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලයේ අර්ථයෙන් හුඟාක් ප්‍රතිඵල ලබාගන්න භික්ෂුවක්. එම අත්දැකීම් තුළ හිඳිමිනුයි පින්වත් ඔබට ශීල යාගයේ ශක්තිමත්භාවය ගැන ඉහත සටහන තැබුවේ. ලිපිය අවසන් කරන මොහොතේ නැවතත් ගෞරවයෙන් මතක්කර සිටිනවා අති ගෞරවණීය උත්තරීතර මහානායක ස්වාමීන් වහන්සේලා හතරදෙනා වහන්සේලාගේ නායකත්වයෙන් පින්වත් ගිහි පැවිදි අපි සියල්ලෝම, මේ මුළු රටම ශීලයේ යාග භූමියක් බවට පත් කර ගනිමු. එම ශීල යාගයේ ශක්තිය

මුළු රටටම යහපතක් වේවි. ඔබ අප සියලු දෙනාටම මෙලොව පරලොව සැපය උදෙසාම හේතු වේවි. දුස්ශීල බලවේගයන්ගේ පරාජය තාවකාලිකව හෝ සිදුවේවි.

මෙය සටහන් තබන භික්ෂුවට සමාජය තුළ පුංචි හෝ ගෞරවයක් තිබෙනවා නම් එම ගෞරවය භික්ෂුව අපවත් වෙන තුරාවටම අඩුවෙන්න ඉඩ තබන්නේ නැහැ. භික්ෂුව එම තත්ත්වය ඇති කර ගන්නේ වංචාවකින්, ප්‍රෝඩාවකින්, අස්බැන්දුමකින් නොවේ. උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලයේ අර්ථය තුළින් මයි. ශීලය ඔබට ලබා දෙන මුල්ම ප්‍රතිලාභයන් දෙක තමයි තමාගේ කීර්ති රාවය පැතිර යෑම සහ බියෙන් තොරව හැසිරීම කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එම නිසාම ගිහි පැවිදි අපි ශීලයෙන් ශක්තිමත් නම් පින ගින්දරක් බවට පත් කර ගෙන සිල් පද බිඳින පාලක පින්වතුන්ලාට සද්ධර්මයේ අර්ථය මතු කර දෙන්න, ශීලයේ ශක්තිය මතු කර දෙන්න, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මෙත් සිතින් කටයුතු කරමු. භික්ෂු සමාජයේ දේශපාලනය විය යුත්තේ එම වගකීමයි.

# බුද්ධෝත්පත්ති කාලයක විකෘති මෙසේ නම් අබුද්ධෝත්පත්ති කාල කෙසේ වෙයිද?

උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කොට ගැනීමේ මූලිකම අදියර වන නිවැරැදි කල්‍යාණමිත්‍ර ආශ්‍රය, උතුම් සද්ධර්ම ශ්‍රවණය, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම තුළින් එම වීර්යවන්ත පින්වතා, පින්වතිය, තමා තුළින් තමා දකිනවා, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමකගේ පහළ වීමේ සැබෑම අර්ථය, උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් ලෝකයාට දේශනා කිරීමය කියලා. මේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන්, දැක්ම සහ අවබෝධය තුළ උතුම් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරිහත් ධර්මතාවන් ජීවිතයට ලැබිය හැකිය කියන විශ්වාසය එම පින්වතා තුළ ඇති වෙනවා.

තමාගේ උතුම් සෝවාන් ඵලය අවබෝධය උදෙසා සතිය සිහිය ශක්තිමත් වෙනවා. සති සම්බොජ්ඣංගය වැඩෙන තැනදී, ධර්මයට අදාළව ජීවිතය දැකීමේ ධම්ම විචය සම්බොජ්ඣංගය ශක්තිමත් වෙනවා. ඔහු අතීත, වර්තමාන, අනාගත පටිච්ච සමුප්පන්න සංසාර ගමන, සංසාර බිය, සංසාර ගැඹුර නුවණින් විමසා බලනවා. වීර්ය සම්බොජ්ඣංගය ඔහුට අවශ්‍ය ජවය ලබා දෙනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ උතුම් ධර්මය තමා තුළින් මයි තමා දැකිය යුත්තේ කියලා. යම් පින්වතෙකුට බලෙන් අල්ලලා සෝවාන් ඵල අවබෝධය

ලබා දෙන්න අපිට බැහැ. අපට කළ හැක්කේ බුදුරජාණන් වහන්සේගේ ධර්මයට අදාළව, මාර්ගය කියා දීම පමණයි. බුදුරජාණන් වහන්සේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් තුළින් නිවැරැදි මාර්ගය අපට කියලා දෙනවා.

චතුරාර්ය සත්‍ය ධර්මයේදී බුදුරජාණන් වහන්සේ මුලින්ම දේශනා කරන්නේ දුක කියන කාරණයයි. දුක කියලා බුදුරජාණන් වහන්සේ අර්ථ දක්වන්නේ, ජාති, ජරා, ව්‍යාධි, මරණ. ශෝක, පරිදේව, දුක්ඛ දෝමනස්ස, ප්‍රියයන් ගෙන් වෙන් වීම, අප්‍රියයන් හා එක් වීම සහ පංච උපාදානස්කන්ධය නිත්‍ය වශයෙන් ගැනීම නිසා සකස් වෙන දුකයි. මාර්ගය වඩන පින්වතා දුක තමා තුළින් දකිනවා. අපි සැම කෙනෙක්ම මේ දුක තුළ ජීවත් වෙනවා.

චතුරාර්ය සත්‍ය ධර්මයන්ට අදාළව දුක තමා තුළින් මතු කොට දකින, මාර්ගය වඩන, වීර්ය වන්ත පින්වතා දෙවැනිව දකිනවා, චතුරාර්ය සත්‍ය ධර්මයන්ට අදාළව දුකට හේතුව කුමක්ද කියලා. පින්වත් ඔබ අත්දකින දුකට හේතු දෙකක් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ නැහැ. දුකට ධර්මානුකූලව එක හේතුවයි තිබෙන්නේ. දුකට එකම හේතුව, තෘෂ්ණාවයි.

දෙවැනි ආර්ය සත්‍යයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කුමක් කෙරෙහි තෘෂ්ණාවද? රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ ධර්මයන් කෙරෙහි ඇති කොට ගන්නා තෘෂ්ණාවයි. උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන්ට අදාළව තමා තුළින් ම දුක මතුකොට දැක්ක, මාර්ගය වඩන පින්වතා, දුකට හේතුව තෘෂ්ණාවත් තමා තුළින් ම මතු කොට දකිනවා.

චතුරාර්ය සත්‍ය ධර්මයන්ට අදාලව දුක තිබෙන්නේත්, තමා තුළ නම්, දුකට හේතුව තෘෂ්ණාව තිබෙන්නේත් තමා තුළම නම්, දුකෙන් මිදීම සඳහා තෘෂ්ණාව නිරෝධය කළ යුත්තේත්, තෘෂ්ණාව සියුම් කොට ගත යුත්තේත් තමා තුළින් ම බව ධර්මානුකූලව දකිනවා.

චතුරාර්ය සත්‍යය ධර්මයේ මුල්ම ආර්ය සත්‍යයන් තුන, තමා තුළින්ම මතුකොට දකින මාර්ගය වඩන වීර්යවන්ත පින්වතා, දුකින් මිදීම උදෙසා, තෘෂ්ණාව සියුම් කිරීම උදෙසා තමා විසින් ම ගමන් කළ යුතු ධර්මානුකූල එකම මාර්ගය උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය බව ධර්මානුකූලව දකිනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන්, තමා තුළින් ම විවේකීව දැකිය යුතුව තිබියදී, අපේ පින්වත් ගිහි පැවිදි පින්වතුන්ලා රට වටේ, ලෝකෙ වටේ, ධර්මය සොයමින් ඇවිදිනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්මයන්ට අදාළව පමණක් සිතන්නට පින්වත් ඔබට, මාර්ගය විවර කොට දෙන්නේ උතුම් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් ලබන්නා වූ, සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීමේ ධර්මතාව තුළින් පමණක් මයි.

මේ ජීවිතයේදී ම උතුම් අධිගමයන් කරා යන ගමන, උතුම් සෝවාන් ඵලය අවබෝධය කරා යන ගමන, සතියකින් මාසයකින්, අවුරුද්දකින් එසේත් නැත්නම් මේ ජීවිතයේදී පමණක් පින්වත් ඔබ ලැබූ ව්‍යායාමයක ප්‍රතිඵලයක් නොවේ. සාංසාරික පුරුදු, පුහුණු, පටිච්ච සමුප්පන්නව මතු කොට ගන්න ඕනේ. අපි සෑම කෙනෙක් පසුපස ම, මේ උතුම් ශක්තිය සැඟවිලා තිබෙනවා.

චුල්ලපන්ථක පොඩි හාමුදුරුවෝ, කොළ අතු වලින් විලි වසා ගෙන සිටි බාහිය දාරුචීරිය, පෙර දින බීමතින් සිටි සන්තිස ඇමතිවරයා, උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධය ලබන්නේ බුදුරජාණන් වහන්සේ විසින් එම පින්වතුන් පටිච්ච සමුප්පන්නව පුහුණු කළ අතීත ශක්තිමත් විදර්ශනාත්මක ධර්මතාවන් මතු කොට දීම තුළින් මය.

මෙය සටහන් තබන භික්ෂුවගේ මතකයට නැගෙනවා මගේ ගිහි ජීවිතයේදී එක්තරා දවසකදී මම විවාහය සඳහා සුදුසු ද, නැතිද කියලා බලන්න, මනමාලියකගේ පොරොන්දම් පත්‍රයක්

අරගෙන, ජ්‍යොතිෂවේදී මහත්මයෙක් ළඟට ගියා. එවකට එම ජ්‍යොතිෂවේදී මහත්මයා රටේ ප්‍රසිද්ධ ජ්‍යොතිෂ පත්‍රයක කර්තෘ මණ්ඩලයේ සාමාජිකයෙක්. මේ මහත්මයා තවමත් නිරෝගීව ජීවතුන් අතර සිටිනවා. මේ මහත්මයා මාව හඳුනන කෙනෙක්. එම මහත්මයා මුණ ගැහෙන්න කාර්යාලයට ගොඩ වෙලා මා පැමිණි කාරණය ප්‍රකාශ කළා.

ඔහු පොරොන්දම් පත්‍ර දෙක අතට ගත්තෙත් නැහැ. ඒ ජ්‍යොතිෂවේදී මහත්මයා ගත් කටටම ප්‍රකාශ කළේ ඔබ ඇවිල්ල තිබෙන්නේ විවාහ වෙන්න නොවේ, පැවිදි වෙන්නය කියලා. ඒ වෙලාවේ මම ඔහුගෙන් ප්‍රශ්න කළා, මහත්මයා මගේ හඳහන බලන්නෙත් නැතිව, අතේ හස්ත රේඛා බලන්නෙත් නැතිව, කොහොමද එහෙම අනාවැකියක් කියන්නේ කියලා. ඒ මහත්මයා ප්‍රකාශ කළේ ඔබ පැවිදි වෙනවාය කියලා මම කියන්නේ, ඔබේ දේහ ලක්ෂණ බලලාය කියලා.

මෙය සටහන් තබන භික්ෂුව ගිහි ජීවිතයේදී වයස අවුරුදු දහඅටේ දී පටන්, අනාගතය ගැන දැන ගන්න, ජ්‍යොතිෂවේදී මහත්වරුන් ළඟට ගිහින් තිබෙනවා. නමුත් මම පැවිදි වෙනවාය කියලා ස්ථිරවම කියපු එකම ජ්‍යොතිෂවේදි මහත්මයා ඔහුයි. ඔහු එය ප්‍රකාශ කළෙත්, මගේ හඳහන හෝ හස්ත රේඛා බලලා නොවේ.

භික්ෂුව පින්වත් ඔබට අන්‍යශීලව්‍රතයක් ගැන පාඩමක් කියලා දෙන්න හදනවා නොවේ. මේ ජීවිතයේ දී උතුම් අධිගමයන් අවබෝධය උදෙසා පටිච්චසමුප්පන්න අතීත ධර්මානුකූල, පුහුණු, පුරුදුත් මතු කොට ගන්න අවශ්‍ය බව, මතු කොට දීමට උදාහරණයක් දැක්වූවා පමණක් මය.

වර්තමාන අවබෝධය උදෙසා අතීත පුරුදු පුහුණු මතු කොට දෙන තීරණාත්මක සාධකය වෙන්නේ උතුම් ශ්‍රී සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම මය.

මෙය සටහන් තබන භික්ෂුව, පින්වත් ඔබට සෝවාන් ඵල අවබෝධය උදෙසා අවශ්‍ය මුල් ම ධර්මානුකූල ශක්තිය කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, ශ්‍රවණය කළා වූ සද්ධර්මය ධර්මානුකූලව නුවණින් මෙනෙහි කිරීම වශයෙන් සඳහන් කළා.

දෙවැනි අදියර වශයෙන් භික්ෂුව දැක්වූවේ තමා තුළින් චතුරාර්ය සත්‍ය ධර්මයන් මතුකොට ගැනීමයි. අතීත, වර්තමාන, අනාගත පටිච්චසමුප්පන්න දුක, ඔහු තමා තුළින් නුවණින් දකිනවා. අතීතයේ පටිච්චසමුප්පන්නව, සතර අපායන්ට වැටිලා, ප්‍රේත ලෝකය, තිරිසන් ලෝකය, අසුර ලෝකය, නිරය මහගෙදර කොට ගෙන වින්දා වූ දුක, නුවණින් දකිනවා. බුදුරජාණන් වහන්සේ ඔබේත්, මගේත් මහගෙ දර කියලා කියන්නේ ඔබේ අම්මා තාත්තාගෙන් ඔබට ලැබුණ නිවසට නොවේ. ඔබත්, මමත්, මගේ කොට ගෙන පැළපදියම් වූ මහගෙදර සතර අපාය මයි.

මෙය සටහන් තබන භික්ෂුව දෑස් පියාගෙන, මොහොතක් නුවණින් දකිනවා, සතර අපායේ සෑම බිම් අඟලක ම මම පටිච්ච සමුපන්නව කරක්ගහලා තිබෙනවා. බල්ලෝ, බළල්ලු වෙලා, මම මොන තරම් සංසාරේ ගුටි කන්න ඇතිද? හරක්, ඌරො, එළුවො, කුකුල්ලු වෙලා, මම මොන තරම් මැරුම් කන්න ඇතිද? මුවන්, හාවුන් වෙලා මොන තරම් පණ පිටින්ම ලොකු සතුන්ට ගොදුරක් වෙන්න ඇතිද?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, “මේ පැමිණියා වූ දීර්ඝ භව ගමනේදී, මම තිරිසන් ආත්ම භව වල ඉපදෙන අවස්ථා වලදී, මිනිසුන් මගේ බෙල්ල කපා ගෙන, මරා ගෙන කාපු වෙලාවේ ගලාගිය රුධිරය, මහා සාගරයේ ජලයට වැඩිය” කියලා. මට මහා සාගරය පෙනෙන්නේ ජල කඳක් හැටියට නොවේ, පටිච්ච සමුප්පන්නව මගෙන් ම ගලාගිය රුධිර සාගරයක් හැටියටයි. රජවරුන්ට, සොරුන්ට, මං පහරන්නන්ට, යුද්ධ වලට, භීෂණයන්ට මැදි වෙලා සංසාරයේ මොන තරම් නම් කඳුළු සාගරයක්, රුධිර සාගරයක් බාහිර, ආපෝ ධාතුවට මුසු කරන්නට ඇතිද? අකීකරු බිරින්දෑවරු

නිසා, අකීකරු ස්වාමිපුරුෂයන් නිසා, චපල පෙම්වතුන් නිසා, චපල පෙම්වතියන් නිසා, සංසාරයේ මොන තරම් මම මැරුම් කන්න ඇතිද? සද්ධර්මයේ නාමයෙන් මිථ්‍යා ධර්මයන්ට රැවටිලා මොන තරම් නම්, අපාගත වෙන්න ඇතිද?

වර්තමානය දෙස බලන්න. මොන තරම් මිථ්‍යා ධර්මයන් සමාජ ගත වෙනවාද? කෙනෙක් බුදුරජාණන් වහන්සේ ඉපදුන තැන සොයනවා, තව කෙනෙක් වචන වල අර්ථ නිරුක්ති සොයනවා, තව කෙනෙක් ශීලයෙන් තොරව සෝවාන් වෙන හැටි සොයනවා. තව කෙනෙක් කවුද හරි, කවුද වැරදි කියලා සොයනවා. තව කෙනෙක් අධිගම ලාභීන් සොයනවා.

සුන්දර චතුරාර්ය සත්‍ය ධර්මයන් ජීවමානව තිබියදී, කල්‍යාණ මිත්‍ර ආශ්‍රයේ දුර්වලතාවයන් නිසා ම, තෘෂ්ණාවත්, දුකත් කියන දෙක ම ශක්තිමත් කොට ගන්නවා. සුන්දර බුද්ධෝත්පාද කාලයක, අපේ ධර්ම මාර්ගය, වර්තමානයේ මෙහෙම විකෘතියක් නම්, අබුද්ධෝත්පාද කාල වලදී කුමන කතාද? චතුරාර්ය සත්‍ය ධර්මයන්ට අදාළව, ධර්මානුකූලව දුක නුවණින් දකින පින්වතා මෙතෙක් නොදැක්ක දුකේ හැඩ තල ඔහු මතු කොට දකිනවා. අතීත පටිච්ච සමුප්පන්න භව ගමනේ මෙවන් වියරු දුකක්, මම අත් වින්දේ තෘෂ්ණාව කියන එකම කාරණය නිසාම බව ඔහු මතු කොට ගන්නවා. මේ සෑම තැනකදීම ඔහු අතීත, වර්තමාන, අනාගත පටිච්ච සමුප්පන්න දුක නුවණින් දකිනවා. එරමිණියා ගොතා ගෙන නොසිටියත්, ඉහත අර්ථය ඔහු තුළ වැඩෙන්නා වූ භාවනාවක්; අනාගත සෝවාන් ඵල අවබෝධය උදෙසා ඔහු තුළ වැඩෙන භාවනාවක්. සතර අපාය දැන් ඔහුට කමටහනක්.

වර්තමානයේ සමහරක් බෞද්ධ පින්වතුන්ලාට සතර අපාය විනෝදාංශයක් බවට, ආදායම් මාර්ගයක් බවට, සුරතලෙක් බවට පත්වෙලා තිබෙනවා. කෙනෙක් ගෙන් ඇසුවොත් ඔබේ විනෝදාංශය කුමක්ද කියලා, බල්ලො ඇතිකිරීම, කුරුල්ලො ඇතිකිරීම, මාළු ඇති කිරීම කියනවා. ඇතිකරන සතුන් විකිණීම නිසා ආදායම් මාර්ගය ම මිච්ඡා ආජීවයක් බවට පත් වෙලා.

තවත් සමහරු දේවාල හදා ගෙන, ප්‍රේතයන්, භූතයන්, යක්ෂයන් සමග ආදායම් මාර්ග උදෙසා ම ඥාති සම්බන්ධතා ඇති කොට ගන්නවා. තවත් සමහර පින්වතුන් සති අන්තයේ, මහා සාගරයේ පිහිනීම, නෑම, කිමිදීම විනෝදාංශයන් කර ගෙන, අසුර ලෝකයේ සඬ්ඣාවන් ජීවිතයට එකතු කොට ගන්නවා.

ධර්මයේ අර්ථයන් ගෙන් ඈත්වෙන සමාජයක පින්වත් ඔබත්, මමත් අධර්මය තුළින් ම ධර්මය සොයනවා. නමුත් දුකත්, දුකට හේතුව තෘෂ්ණාවත්, තමා තුළින් ම දුක නැති කිරීමේ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයත්, ස්වක්ඛාත ධර්මයේ සරල ගුණයන්, ඒහිපස්සිකව බබළමින්, තමා තුළ ම තිබෙනවා. භික්ෂුව නැවතත්, කල්‍යාණ මිත්‍ර ආශ්‍රයේත්, සද්ධර්ම ශ්‍රවණයේත්, උතුම් සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීමේත් ඇති උත්තරීතර වටිනාකම පින්වත් ඔබට මතක් කොට දෙනවා.

වර්තමාන සමාජයේ පින්වතුන් හුග දෙනෙක්, තම අධ්‍යාපනය උදෙසා, නිවසක් හැදීම උදෙසා, වාහනයක් ගැනීම උදෙසා, විවාහය උදෙසා හිතන තරම් කාලයෙන් එක දශමයක් වත් තමා තුළම සැඟවී තිබෙන චතුරාර්ය සත්‍ය ධර්මයන් ගැන සිතන්නේ නැහැ. උතුම් සෝවාන් ඵලයට පත් වීම ගැන සිතුවොත්, අධි වීර්යයෙන් අනුකරණයන් මයි සොයා ගෙන යන්නේ.

අධි වීර්යය සකස් වෙන තැනදී, සති සම්බොජ්ඣංගයන්, ධම්ම විචය බොජ්ඣංගයන්, අන්තවාදීව මයි වැඩෙන්නේ. ඒ නිසා ම සෝවාන් ඵලයත්, තෘෂ්ණාවෙන් ම ගන්නවා. සෝවාන් ඵලය මගේ කොට ගන්නවා. මා තුළ සෝවාන් ඵලය තිබෙනවා ය කියලා ගන්නවා. සෝවාන් ඵලය මගේ ආත්මය කොට ගන්නවා. එම ආත්මය තුළ මම සිටිනවා ය කියලා දකිනවා. සෝවාන් ඵලයෙන් චුත වෙන වෙලාවේ සෝවාන් ආත්මය සකෘදාගාමී ඵලයට පත් වෙන බව දකිනවා. ආත්මීය දෘෂ්ටියෙන් සෝවාන් ඵලය ගන්නවා. හේතුඵල ධර්මයන්ට අදාළව දකින්නේ නැහැ.

තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, විදර්ශනාත්මක ශීලය හෙවත් ආර්යකාන්ත ශීලය, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය නමැති හේතුව නිසා සකස් වෙන ධර්මානුකූල ඵලය වශයෙන් සෝවාන් ඵල අවබෝධය දකින්නේ නැහැ. ආර්ය අෂ්ටාංගික මාර්ගය විදර්ශනාත්මකව ශක්තිමත් වීම හේතුවෙන් නිරෝධය වෙන සක්කායදිට්ඨිය, විචිකිච්ඡාව සහ අන්‍යශීල කෙරෙහි විශ්වාසයෙන් බැහැර වීම තුළින් සකස් වෙන ඵලය වශයෙන් සෝවාන් ඵල අවබෝධය දකින්නේ නැහැ.

කල්‍යාණ මිත්‍ර ආශ්‍රයේ දුර්වල භාවය නිසාම, අධිමාන්නය නිසාම, ඉන්ද්‍රිය ධර්මයන් දුර්වල භාවය නිසාම, ඉහත අර්ථයන් පෝෂණය කරන පින්වත් ගුරුවරුන් අපේ සමාජයේ ඕනෑවට වඩා සිටිනවා. ඒ නිසාම සෝවාන් වැඩමුළු, සෝවාන් පන්ති, සෝවාන් පාඨමාලා අවසානයේ කරවටක් එරෙමින් අපි දුකසේ විඳීමට තෘෂ්ණාව ම සොයනවා.

නිවැරැදි කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, උතුම් සද්ධර්ම ශ්‍රවණය, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම තුළින් විවේකී මධ්‍යස්ථ වීර්යය තුළින්, තමා තුළින් ම දුකත්, දුකට හේතුව තෘෂ්ණාවත් මතු කොට ගන්න දක්ෂයා, දුකෙන් මිදීමේ එකම මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙනවා. ඔහු තමන් ගමන් කරන සෝවාන් ඵල මාර්ගය ගැන ලෝකයට අඬබෙර ගහන කෙනෙක් නොවේ. ඔහු රට වටේ දිවීම නතර කරලා අධර්මය පසුපස, මිච්ඡා ධර්මයන් පසුපස අවිචාරවත්ව දුවන තම සිතුවිලි, උතුම් ශ්‍රී සද්ධර්මයේ **ස්වාක්ඛාත** ගුණයේ සරල භාවයෙන්, **සන්දිට්ඨික** ගුණයේ විශ්වාසයෙන්, **අකාලික** ගුණයේ කලබලකාරී බවෙන් තොර, මධ්‍යස්ථ වීර්යයෙන්, ඒහිපස්සික ගුණයේ විවෘත දැක්මෙන්, **ඕපනයික** ගුණයේ තමා තුළින්ම ප්‍රගුණ කිරීමේ නිවැරැදි ධර්ම මාර්ගය මතුකොට ගන්නවා.

මේ නිවැරැදි ධර්ම මාර්ගය පින්වත් ඔබ මතු කොට ගත හොත්, පින්වත් ඔබේ වයස, ජාතිය, කුලය, දුප්පත් පොහොසත් බව, උගත් නූගත් බව කුමක් වුවද, ඔබ ධර්මයේ '**පච්චත්තං වේදිතබ්බෝ**' ගුණය තමා තුළින්ම සුන්දරව අත්දකිනවා. ධර්ම මාර්ගය තුළ නිවැරැදිව ගමන් කරලා, යම් පින්වතෙක් ලබන්නා වූ අත්දැකීම හරිම සුන්දරයි. කෙළෙස් තුනී කොට ගත්, නිවෙන සිතුවිලි බියෙන් තොරව, හරිම නිදහස්. එය පොතක් කටපාඩම් කරලා, දේශනා කරන, සටහන් තබන දෙයක් වගේ නොවේ. උතුම් ශ්‍රී සද්ධර්මයේ සෑම ගුණයක් ම එම අත්දැකීම් තුළ කිඳා බැස තිබෙන්නේ.

විවේකයෙන් සිත නිවන, නිවෙන සිතෙන් විදර්ශනාව වැඩෙන, සුන්දර වස් කාලයෙන් සතියක් ම ගෙවී ගියා. අද ඉරිදා දවසක්. උදෑසන පිණ්ඩපාත මඩුවට හතළිහකට වැඩිපිරිසක් දානය රැගෙන පැමිණ සිටියා. ඒ සෑම කෙනෙක් ම ගමේ සහ අවට ගම්වල පින්වතුන්, එම පින්වතුන්ලා ගේ උතුම් තෙරුවන් කියන අර්ථය කෙරෙහි, දානය කියන අර්ථය කෙරෙහි, තිබෙන අහිංසක පිනේ ආශ්වාදයෙන්, පෝෂණය වුණා වූ උද්‍යෝගය දකින කොට, භික්ෂුවට එම පින්වතුන් කෙරෙහි, ගෞරවණීය කරුණාවක් ඇති වෙනවා.

ඒ නිසා ම අද උදෑසන චතුරාර්ය සත්‍යය ගැන කෙටි හැඳින්වීමක් සිදුකළා. බුදුරජාණන් වහන්සේ පිරිනිවී ගොස් වසර දෙදහස් හයසියයක් ගිය තැනකදී, ධර්ම මාර්ගයේ උතුම් පූර්වාදර්ශයන්, පරමාදර්ශයන් ඉඩෝරයට හසුවුණ, කල්‍යාණ මිත්‍රයන් අසත්පුරුෂයෙක් හැටියටම දකින්න උත්සාහ කරන සමාජයක බුදුරජාණන් වහන්සේගේ සුන්දර ශ්‍රාවකයෙක් හැටියට භික්ෂුවගේ යුතුකම ජීවිත පරිත්‍යාගයෙන් ම ඉටු කරනවා.

# විඳීම් සොයා අයාලේ යන සිතක රස්තියාදුව

දැන් වේලාව සවස 5.30 ට පමණ ඇති. කුටිය අවට පරිසරය හරිම නිහඬයි. දවසේ අවසාන ආහාර වේල සොයමින් කිචි බිචි ගාන කුරුල්ලන්ගේ නාදය, ඈසී නෑසී යනවා. සුළඟ වේගයෙන් හමා ගෙන ඇවිත්, නැවතත් නවතිනවා. සෑම දෙයක්ම නිරතුරුවම වෙනස් වෙනවා. අපි කැමති අකැමැති දෙයක්, වෙනස් වී යන කොට අපි අලුත් දෙයක් සොයනවා. ඒ සොයාගත් දෙයත් වෙනස් වෙන දෙයක් මයි. අවසානයේ වෙනස් වෙන ලෝකයේ අර්ථය තුළ නොවෙනස් වෙන දේවල් සොයන්න ගිහිල්ල, අපගේ පටිච්චසමුප්පන්න භව ගමන ඉලක්කම් වලින් දක්වන්න බැරි තරමට, දීර්ඝ කොට ගන්නවා.

ලොව්තුරු බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ මහ පොළොවේ තිබෙන පස් වෙරළු ගෙඩි තරමට ගුලි කරන්නය කියලා. එහෙම ගුලි කරලා මේ මම පටිච්චසමුප්පන්නව ගෙවා ගෙන පැමිණි එක කල්පයක්, මේ මම ගෙවා ගෙන පැමිණි තවත් කල්පයක් කියලා, එක වෙරළු ගෙඩිය එක වෙරළු ගෙඩිය අයින් කරන්න කියනවා. පින්වත් ඔබ වෙරළු ගෙඩි ප්‍රමාණයට ගුලි කරපු පස් ගුලි අවසන් වෙලා යනවා. නමුත් ඔබත්, මමත් පටිච්චසමුප්පන්නව ගෙවා ගෙන පැමිණි කල්ප ගණන අවසන් වෙන්නේ නැහැයි කියලා මේසා ගණනය කළ නොහැකි දීර්ඝ පටිච්චසමුප්පන්න භව ගමනක් ඔබත් මමත්, කැමති, අකමැති විඳීම් සොයමින් ගෙවා ගෙන පැමිණියත් මේ නිමේෂයේදී

ඔබ නොසන්සිඳුණා වූ ඒ කැමැත්ත අකැමැත්ත ම සොයමින් සිටිනවා. ගිහි ජීවිතයේදී භික්ෂුව හරිම කැමතියි අලුත් අත්දැකීම් සොයන්න. එක අත්දැකීමක් අයිති කොට ගත්තට පස්සේ නැවත එම අත්දැකීම පසුපස මම කවදාකවත් හඹාගෙන ගියේ නැහැ. තවත් අලුත් අත්දැකීමක් සෙව්වා. එදා මට තේරුණා, විඤ්ඤාණය නමැති මැජික්කරුවා, මට දැනීම් සකස් කොට දුන්නා, සැඟවුණා වූ නොතේරෙන්නා වූ නොවින්දා වූ කුමක් හෝ දෙයක් ලෝකය තුළ තිබෙනවායි කියලා. එම නිසයි, ගිහි ජීවිතයේදී මමත්, අත්දැකීම් පසුපස හඹාගෙන ගියේ. එදා මම විඤ්ඤාණය ගැන වත්, විඤ්ඤාණය යනු මැජික්කරුවෙක් බව වත් දැනගෙන සිටියේ නැහැ.

විඤ්ඤාණය නමැති මැජික්කරුවාගේ නූල් සූත්තර වලට අදාළව නැටවුණා වූ රූකඩයක් බවට මම පත් වෙලයි සිටියේ. පූර්වාදර්ශයක්, පරමාදර්ශයක්, සමාජයේ කොතැනකින් වත් අපිට ලැබුණේ නැහැ. සංස්කාර හේතුවෙන් සකස් වෙන විඤ්ඤාණය නමැති මැජික්කරුවා ගසා දෙන මැස්ස මත, ජීවිතය නමැති කරවිල වැල, කැමැති අකැමැති ඵලයක් ලබමින්, සොයමින් සරුසාරව වැඩී ගියා.

මේ ලිපිය සටහන් තබන මොහොතේ භික්ෂුවගේ සිත, කුටිය කියන සංඥාව මත විදර්ශනාත්මකව නැවතී තිබුණත් පින්වත් ඔබ මේ නිමේෂයේදීත් ගොඩක් දේවල් සොයනවා. භික්ෂුව මෙතැනත් ගොඩක් දේවල් කියලා සටහන් කළත්, ගොඩක් දේවල් ලෝකයේ නැහැ. බුදුරජාණන් වහන්සේ ලෝකය කාරණා පහකටයි ගොනු කරන්නේ. ධර්මානුකූලව ලෝකයට අයිති කාරණා පහ වෙන්නේ රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ කියන අර්ථයන් පහයි. ඉහත අර්ථයන් පහෙන් තොර දෙයක් මේ ලෝක ධාතුව තුළ ධර්මානුකූලව දකින්න නැහැ.

බුදුරජාණන් වහන්සේ මේ ලෝක ධාතුව ධර්මානුකූලව කාරණා පහකට ගොනු කළත්, අපේ අවිද්‍යාව නිසාම අපි ලෝකය, ලෝකයක් ම කොට දකිනවා. ලෝකය ලෝකයක් ම කොට දකිද්දී, අපි දකින සංකීර්ණ ලෝකය විඳින්න, සිත නිරතුරුවම රස්තියාදුවේ යනවා. අවිද්‍යාව විසින් සංකීර්ණභාවයට පත්කොට ගන්නා වූ ලෝකය තුළ, විඳීම් සොයාගෙන අයාලේ යන සිතට, ධර්මානුකූලව "සිතක රස්තියාදුව" කියලා කියනවා. ධර්මයකින් නොහික්මුණු, ලැජ්ජාව, භය දෙකින් නොහික්මුණු මෙවන් රස්තියාදුකාර සිතකට පුළුවන්, ලොව්තුරා බුදුරජාණන් වහන්සේත් රස්තියාදුකාරයෙක් වශයෙන් දකින්න, ක්‍රිස්තුන් වහන්සේත් රස්තියාදුකාරයෙක් වශයෙන් දකින්න, දේවදත්ත හාමුදුරුවො තුළ සකස් වුණ මෙවන් රස්තියාදුකාර සිත නිසා දේවදත්ත හාමුදුරුවෝ පෙළඹුණා බුදුරජාණන් වහන්සේ විනාශ කොට දමන්නට.

අජාසත්ත රජතුමා ලැබූ අසත්පුරුෂ ආශ්‍රයන් නිසා ම සකස් වුණ රස්තියාදුකාර සිත් නිසා, පීතෘ ඝාතක අකුසල සිදු කොට ගැනීමට යොමු වුණා. ක්‍රිස්තුස් වහන්සේගේ නොහික්මුණු අනුගාමිකයන් කිහිප දෙනෙක් තුළ සකස් වුණ රස්තියාදුකාර සිත් නිසා ක්‍රිස්තුන් වහන්සේ පණ පිටින් ම කුරුසයේ ඇණ ගසා ජීවිතක්ෂයට පත් කළා. නිඝණ්ඨනාථ පුත්තගේ ප්‍රධාන දායකයා වූ සච්චකගේ නොහික්මුණු රස්තියාදුකාරයෙක් වරක් බුදුරජාණන් වහන්සේට අභියෝග කරනවා. "මම ඔය ගෞතමයන්ව, ශක්තිමත් එළුවෙක්ගේ අං දෙකෙන්, රැවුලෙන් අල්ලලා, කරකවලා පොළොවේ ගසන්නේ යම් සේද, මම ඔය ගෞතමයන්ව තර්කයෙන් පරාජයට පත් කරලා පොළොවේ ගසනවා"ය කියලා. ධර්මයෙන් නොහික්මුණු රස්තියාදුකාර සිතකට පුළුවන් ඔහුගේ අනාගත භව ගමන ම සතර අපායක් බවට පත් කොට දමන්න.

ලෝකය, අවිද්‍යාවෙන් සංකීර්ණ කොට ගත් මනුෂ්‍යයෝ සංකීර්ණ කොට ගත් ලෝකය පසුපස්සේ විඳීම් සොයමින් හඹාගෙන යද්දී, අතීතයේ ලබපු අත්දැකීම් නැවත, නැවත ලබන කොට ජීවිතය නීරස වෙනවා. මේ අවස්ථාව අපි බොහොම පරිස්සම් විය යුතු තැනක්. මේ තැනදී ඔබට ධර්මානුකූල හික්මීමක් නොලැබුණොත්, ඔබ ඔබට ම අනතුරුදායක, විඳීම් සොයා ගෙන ඔබේ සිත රස්තියාදුවේ යවනවා. එවිට ඔබේ අම්මා තාත්තා කියන්නෙත් ඔබට තවත් රූපයක් පමණක් ම වෙනවා. බුදුරජාණන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ කියන්නේ තවත් එක චරිතයක් පමණක් ම වෙනවා. ධර්මයකින් ලැජ්ජාව, භය දෙකෙන් නොහික්මුණු රස්තියාදුකාර සිතකට පුළුවන් තමන්ගේ බිරිඳත් සමග, පෙම්වතියත් සමග ලබන ලිංගික ආශ්වාදය, නිවන හැටියට දකින්න.

වරක් තරුණ මහත්මයෙක්, භික්ෂුවට ප්‍රකාශ කළා "ඔස්ට්‍රේලියාවට හරි කැනඩාවට හරි පැනගන්න තිබෙනවා නම් නිවන් දැක්කා වගේ"ය කියලා. බුදුරජාණන් වහන්සේ කාමයත් දිය බුබුළකට, පිනි බිඳුවකට, ජලයේ ඇඳි ඉරකට, විෂකුරු සර්පයකුට, මස් වැදැල්ලකට, ගිනියම් වූ අඟුරු වළකට උපමා කරද්දී, අවිද්‍යාවෙන් පෝෂණය වූ රස්තියාදුකාර සිතක්, කාමයන්ගේ ආශ්වාදය නිවන හැටිය ම දකිනවා නම්, එම පින්වතා මනුෂ්‍යයෙක්ව ඉපදුණු ජාති අන්ධයෙක් බවට මයි පත් වෙන්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ලෝකයේ පුද්ගලයන් හතර දෙනෙක් සිටිනවාය කියලා. පළමු වැනි පුද්ගලයා තමයි සැඩපහරට අනුව ගමන් කරන්නා. මීළඟ පුද්ගලයා සැඩ පහරට එරෙහිව යන පුද්ගලයා, තුන්වැනි පුද්ගලයා තමයි, සැඩ පහරට ගසාගෙන නොයන පුද්ගලයා. හතර වැනි පුද්ගලයා තමයි, සැඩ පහර තරණය කොට භවයෙන් එතෙරට යන පුද්ගලයා කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සැඩ පහරට අනුව ගසාගෙන යන පුද්ගලයා විනාශය

කරා ම ගමන් කරන පුද්ගලයාය කියලා. සැඩ පහරට ගසාගෙන නොයන සහ සැඩ පහරට එරෙහිව යන පුද්ගලයන් දෙදෙනා, ධර්මාවබෝධය දෙසට ගමන් කරන පුද්ගලයන් දෙදෙනා වෙනවා. සැඩපහර තරණය කොට එතෙරට යන උත්තමයා උතුම් රහතන් වහන්සේ ම වෙනවාය කියලා.

වර්තමාන සමාජය දෙස බලන කොට ධර්මානුකූලව අපට පෙනෙන්නේ සැඩපහරට අනුව ගසාගෙන යන පින්වතුන්ලා, ඒ කියන්නේ විනාශය කරා ගමන් කරන පින්වතුන්ලාගේ වැඩි වීමක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ලෝකය කවදත් ලෝකයේ ස්වභාවයෙන් ම පවතිනවාය කියලා. ලෝකයේ ඇත්තම ස්වභාවය තමයි දුකය කියන කාරණය. ආධ්‍යාත්මික, බාහිර රූපය වෙනස් වී යද්දී දුකමයි අපි උරුම කොට ගන්නේ, ඇලීම්, ගැටීම්, උපේක්ෂා, වේදනාවන් වෙනස් වී යද්දී, දුකක් මයි අපි උරුම කොට ගන්නේ. හඳුනා ගැනීමේ සංස්කාර, දැනීම් වෙනස්වී යද්දී අපි දුකක් මයි සකස් කොට ගන්නේ. මෙයයි ලෝකයේ ඇත්තම ස්වභාවය.

ඒ නිසා ම, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. දුක ම අර්ථය කොටගත් ලෝකය දුකේ වර්ධනය උදෙසා නොව දුකේ ප්‍රහාණය පිණිස ම යොදාගන්න කියලා. බුදුරජාණන් වහන්සේ ඔබෙන් බලාපොරොත්තු වූ මෙම අර්ථය, ඔබ ජීවිතයට එකතු කොට ගන්න නම්, පින්වත් ඔබ ධර්මානුකූලව මීට වඩා අර්ථවත්ව සිතන්නට වෙනවා. තෘෂ්ණාවෙන් ඔද්දල් වුණ ලෝකය නමැති පංච උපාදානස්කන්ධ මාරයා, කවදත් ලෝකය නිර්මාණය කරන්නේ, වැරදි කරන පුද්ගලයා වැරදි කරලා සතර අපායට ඇද දමන්න. වැරදි නොකරන පුද්ගලයා වැරදි කරන පුද්ගලයන් සමග ගැටීමට යොමු කරලා, ඔහුවද සතර අපායට ඇද දමන්න. වැරැද්දත්, නිවැරැද්දත්, දෙකම මාරයාට අයිති ධර්මතාවන් දෙකක් ම වෙනවා. මෙය සටහන් තබන භික්ෂුව වැරැද්දෙනුත්, නිවැරැද්දෙනුත් දෙකෙන් ම මිදුණු භික්ෂුවක්. භික්ෂුව ඇත්ත ඇති සැටියෙන් දකිනවා. ඇත්ත ඇති සැටියෙන් දකිනවාය

කියන අර්ථය, සරල අර්ථයක් නොවේ. ඇත්ත ඇති සැටියෙන් දකින්න නම්, ඔහු තුළ විදර්ශනාත්මක සම්මා සතිය, සම්මා සමාධිය තිබෙන්නට ඕනේ, එහි පෝෂණයෙන් සම්මා ඥාණ සකස් වෙන්න ඕනේ. ඉන් මෙහා අපි ඇත්ත ඇති සැටියෙන් දැක්කත්, ඒ දැක්කා වූ සිතට නැවත අපි බැඳී යනවා. ඒ නිසාම අපි ඇත්ත බොරුවක් කොට දැකීමේ මාරයාගේ සියුම් උපායට අවසානයේදී කොටුවෙනවා.

විදර්ශනාත්මක සම්මා සතිය, සම්මා සමාධිය දුර්වල නිසා ම, පින්වත් ඔබ කොතෙක් නිවැරැදි වුණත්, අනුන්ගේ වැරදි ඉදිරියේ ඇලීම් ගැටීම් ඇති කොට ගෙන විනාශය කරා ම ගමන් කරනවා. අසත්පුරුෂ අනුන්ගේ සිතේ රස්තියාදුකාරිත්වය නිසාම පින්වත් ඔබත් රස්තියාදුකාර සිතක උරුමය අයිතිකොට ගන්නවා.

පින්වත් ඔබ, උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය ජීවිතයට එකතු කොට ගත්, වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම සිංහල බෞද්ධ පින්වතෙක් නම් ඔබේ ජීවිතයත් සමග බැඳුණු පූජනීය වගකීමක් තිබෙනවා. මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනය ආරක්ෂා වෙන්න ඕනේ, උතුම් තෙරුවන්ගේ ආත්මගරුත්වය ආරක්ෂා වෙන්න ඕනේ, මේ උතුම් අර්ථයන්, ලෝකයාගේ යහපත උදෙසා ආරක්ෂා කරන්න ඕනේ, ඔබත් ආරක්ෂා වෙලා මයි. පින්වත් ඔබ අනාරක්ෂිත නම් ඒ කියන්නේ ඔබත් සිතේ රස්තියාදුකාරිත්වයට යට වෙලා නම් එය ඔබේත් ශාසනයේත් විනාශය පිණිස මයි හේතු වන්නේ. ඔබත් තෙරුවනට අගෞරව කරන බෞද්ධයෙක් බවට මයි පත් වෙන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, වැරැද්ද ඉදිරියේ නිහඬව ඉන්න එපාය කියලා. මෙත් සිතින් ඇත්ත ඇති සැටියෙන් පහදලා දෙන්න කියලා. නමුත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ යමක් පහදලා දෙන්න යද්දී අපේ මෙත් සිත ද්වේශ සිතක් බවට පත්වීමයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යම් අකුසලයක් සිදුකොට යමෙක් දුක් විපාකයක් ලබයිද එබඳු අකුසල් සිදුකරමින්, අනුවණ පුද්ගලයෝ තමන්ට ම තමන්, සතුරන්ව ජීවත් වෙනවයි කියලා. බුදුරජාණන් වහන්සේට ආර්යයන් වහන්සේලාට අගෞරව පිණිස ප්‍රකාශ කරන පාපී වචන, තොල ගෑ සැණින් මිය යන, හලාහළ විෂක් බඳු යැයිද එවන් පාපී වචන වැනි, හොඳින් මුවහත් කරන ලද වෙනත් ආයුධයක් නොමැති බවත්, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මේ ලෝක ධාතුවේ කිසිම දෙවියකුට, බ්‍රහ්මයකුට, මනුෂ්‍යයකුට, බුදුරජාණන් වහන්සේට අගෞරව කරන්න බැහැ. යමෙක් එහෙම අගෞරව කළොත්, අගෞරවයට පත්වන්නේත්, කෙළෙසෙන්නේත් තමන් ම යැයි අපි තේරුම්ගත යුතුව තිබෙනවා. සංස්කාර හේතුවෙන් සකස් වෙන විඤ්ඤාණය, ලෝකයේ සාධාරණ ම අධිකරණ ක්‍රියාවලිය වෙනවා. සැබෑ සිංහල බෞද්ධ පින්වතෙක් කවදාකවත් ක්‍රිස්තුස් වහන්සේට අගෞරවයක් කරන්නේ නැහැ.

## ඔබේ ඇලීම ගැටීමටත් මිලක් දෙන සමාජයක, ඔබ වෙනුවෙන් ඉස් මස් පවා කැපකළ සරණක්...

සැබෑ ක්‍රිස්තියානි භක්තිකයෙක්, කවදාකවත් බුදුරජාණන් වහන්සේට අගෞරවයක් කරන්න පෙළඹෙන්නේ නැහැ. නමුත් තෘෂ්ණාවෙන් ඔද්දල් වුණු විදීමේ විවිධත්වයන් සොයා ගෙන යන රස්තියාදුකාර සිතකට පුළුවන් තමා තමාට ම අවීචි මහා නිරයට ඇද දමන්නට. අසත්පුරුෂ භාවයෙන් පෝෂණය වුණ රස්තියාදුකාර සිතුවිල්ලකින්, මතුවෙන මුහුණේ සිනාරැල්ල ගිනි ජාලාවකින් මතු වෙන ගිනි දැල්ලක් මයි කියලයි ධර්මයේ සඳහන් වෙන්නේ. විවිධත්වයෙන් යුත් විඳීම් සොයා ගෙන ලෝකය හඹාගෙන යෑමේ නිදහස පින්වත් ඔබට තිබෙනවා.

නමුත් ගින්දරත් සමග සෙල්ලම් කිරීම, ඔබේම විනාශයට ම හේතු වෙනවා. වර්තමානයේ ඇඟිල්ල තබලා වැරැද්දක් පෙන්වන්න තැනක් ලෝකය තුළ නැහැ. ලෝකය ලෝකයේ ස්වභාවයෙන් දුකත් සමග ගමන් කරනවා.

ලෝකය ලෝකයේ ස්වභාවයෙන් ගමන් කරද්දී පින්වත් ඔබ ලෝකය තුළ සකස් වන ඵලයන්ට අකැමැතිනම් පින්වත් ඔබට වර්තමානයේ ඉතුරුවී තිබෙන්නේ ලෝකයෙන් නිවීම දෙසට ගමන් කිරීම පමණක් මයි. නමුත් පින්වත් ඔබට අවශ්‍ය නම් ඔබේ තෘෂ්ණාවට අදාළව ලෝකය නිවැරැදි කරන්න, එය කිසිදා හමු නොවන මිරිඟුවක් වුවත්, එම මිරිඟුව පසුපස ඔබ හඹා යද්දී පින්වත් ඔබේ සැපයට අදාළ මග වියදම් ගැන ඔබ

ධර්මානුකූලව සිතා බලන්නත් දක්ෂ වෙන්න ඕනේ. සැපයට අදාළ මග වියදම කියලා සඳහන් කළේ පිනයි. මිරිගුවක් පසුපස හඹාගෙන යද්දී වුවද මෙත් සිතින් ඔබ කටයුතු කරන්න දක්ෂ නම් මිරිගුව කිසිදා හමු නොවුණත් හඹායෑමේ වෙහෙස නිවාග න්න පින නමැති සැපය හෝ ඔබට ඉතිරි වෙනවා.

සමාජය දවසින් දවස සංකීර්ණභාවයට පත්වෙනවා. සමාජයේ සංකීර්ණභාවය සකස් කොට දෙන්නේ මනුෂ්‍යයාගේ තෘෂ්ණාව විසින්. තෘෂ්ණාවේ කෘත්‍රිම පොහොරින් සුවසේ පෝෂණය වන ඇලීම්, ගැටීම් හේතුවෙන් සකස් වෙන අකුසල් සංස්කාරයන්ගේ ඵලය වන විඤ්ඤාණය නමැති මැජික්කරුවා, හෙට දවසේදී මෙතෙක් ඔබ මනුෂ්‍ය ලෝකයේදී නොදුටු නොඇසූ නොසිතූ, අලුත්, අලුත් රූප, වචන, ජවනිකා අදහස් මෝස්තර සමාජගත කරාවි. පින්වත් ඔබ මේ අලුත් ජවනිකා වලින් පිරි රඟමඬල දැකලා කම්පා නොවන්න. ඔබ ඔය දකින්නේ අධර්මය විලිලා උපදින නැවුම් ධර්මය මය.

වරක් තරුණ මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා, ස්වාමීන් වහන්ස, කොච්චර සිතුවත් සිතලා ඉවරයක් කරන්න බැහැනේ කියලා. භික්ෂුව එම තරුණයාට දැනුම් දුන්නේ පින්වත් ඔබට සිතලා ඉවරයක් කරන්න බැරි නම් කරුණාකර සිතීම නවත්වන්න කියලා. භික්ෂුව මේ ආසනය මත වාඩි වෙලා, දෑස් දෙක පියාගෙන, අතීතයට සිත යොමු කොට දකිනවා. සංසාරයේ පටිච්චසමුප්පන්නව සතර අපායේ සත්ත්වයන් වෙලා මනුෂ්‍යයන් දෙවියන් වෙලා මොන තරම් නම් සිතන්න ඇතිද? මේ මොහොතේදීත් අපි සිතනවා. අතීතයට එකතු වෙන සෑම සිතුවිල්ලක් ම අනාගත පංච උපාදානස්කන්ධයකට අවශ්‍ය සංස්කාරයන් සකස් කොට දෙනවා. ඔබට හොරා ඔබේ ලෝකය ඔබ ම ගොඩනගා ගන්නවා. තියුණු කඩුවක් අතින් ගත් තෘෂ්ණාව නමැති වධකයාව මගේ සැපය මගේ දුකය කියලා ඔබ ම සතුටින් ගත් තැනදී සිතලා නම් මේ ප්‍රශ්නය විසඳිය නොහැකි බව පින්වත් ඔබ තේරුම් ගත යුතුව තිබෙනවා.

පින්වත් ඔබ ඉදිරියේ තිබෙන්නේ රූප වෙනස් කරමින් ආශ්වාදය සොයන සමාජයක්. ඔබට අවංකව ආදරය කරන කරුණාව දක්වන සමාජයක් නොවේ. පින්වත් ඔබේ ඇලීම් ගැටීම් මිල කරන රස බලන සමාජයක්. නමුත් ඔබ මේ සමාජයට වෛර කරන්නට එපා. එය ඔබ තවත් විනාශය කරා යෑමක් වෙනවා. ධර්මයෙන් නොහික්මුණු රස්තියාදුකාර සිතුවිල්ලක් සකස් කොට දෙන භව ගමනේ රස්තියාදුව නුවණින් දැක වරද ඉදිරියේ ලැජ්ජාව බිය ඇති කොට ගන්න පින්වත් ඔබ දක්ෂ වන්න.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ නමක් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනක් දස පාරමී ධර්මයන් පුරලා, උතුම් සම්මා සම්බුද්ධත්වයට පත් වෙන්නේ, ලෝකයාට චතුරාර්ය සත්‍යය කියන එකම ධර්මය දේශනා කිරීමටයි. උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථය කියන්නේ, මේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයටයි. පින්වත් ඔබ බුදුරජාණන් වහන්සේ සැබැවින්ම සරණ ගියා කියන්නේ, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කොට ගත් සැබෑ ම බෞද්ධයෙක්ය කියලා කියන්නේ මේ උතුම් චතුරාර්ය සත්‍යය ජීවිතයට එකතු කොට ගත්තාය කියන කාරණයයි.

පින්වත් ඔබ, ඔබේ හෘදසාක්ෂියට තට්ටු කරලා අවංකව ම ඔබෙන් අහන්න, ඔබ සැබැවින් ම ධර්මානුකූලව ම බෞද්ධ පින්වතෙක්ද කියලා. පින්වත් ඔබ අර්ථවත් ම බෞද්ධයෙක් කියලා දැනගන්න මිණුම්දණ්ඩ තමයි, මේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් ජීවිතයට එකතු කොට ගෙන ජීවත් වීම. චතුරාර්ය සත්‍යය නොදැනීම අවිද්‍යාව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. බුදුරජාණන්වහන්සේ සූත්‍රගත ධර්මයේදී ඇස් ඇති පුරුෂයෙක් ගැන දේශනා කරනවා. මේ ධර්මයේ සඳහන් ඇස් ඇති පුරුෂයා කියලා කියන්නේ, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබන, ආර්යයන් වහන්සේලා ඇසුරු කරන සද්ධර්මය ශ්‍රවණය කරන, ධර්මය නුවණින් මෙනෙහි කොට ජීවිතයට දරාගන්නා පින්වතාටයි. පින්වත් ඔබට සුන්දර දීප්තිමත්, හොඳින් පෙනෙන

ඇස් දෙකක් තිබුණත්, පින්වත් ඔබ, තවමත් චතුරාර්ය සත්‍ය ධර්මයන් ජීවිතයට එකතු කොට නොගත්ත පින්වතෙක් නම්, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඔබ ඇස් ඇති, ජාති අන්ධයෙක්ය කියල. ඔබ ලෝකය දකින්නේ ලෝකය හැටියට මයි. එවැනි ජාති අන්ධ පින්වතා දුක දකින්නේ සැපයක් හැටියට. දුකට හේතුව දකින්නේ, මුදල් නොමැති වීම හැටියට. දුකෙන් මිදීම හැටියට දකින්නේ, ධනවත් භාවයට පත්වීම. දුකින් මිදීමේ මාර්ගය හැටියට දකින්නේ, ශීලාචාර ධර්මයන් සදාචාරාත්මක ධර්මයන් මරා ගෙන ලෝභ, ද්වේෂ, මෝහ ධර්මයන් වඩවා ගෙන මුදල් සෙවීමයි. තාවකාලික සැපයක් කරගසාගෙන අනාගත දුක ම පොදි බැඳගන්නා මාර ධර්මයන්ගේ ග්‍රහණයට වර්තමානයේ චතුරාර්ය සත්‍ය ධර්මයන්ගේ අර්ථය ගොදුරු වෙලා.

ලෝකයාට විවේකයක් නැහැ, සිතන්න. ලෝකයාට සිතේ සංහිඳියාවක් නැහැ, හොඳ නරක හඳුනා ගන්න. ලෝකයාට පූර්වාදර්ශයක් නැහැ. ඉන්ද්‍රිය සංවරය ඇතිකොට ගන්න. ඇයි ලෝකයාට මෙහෙම වෙලා තිබෙන්නේ? දුකින් මිදීමේ එකම මාර්ගය, ධනය, නිලතල, සම්පත් දේපළ අධ්‍යාපනය කියන මිථ්‍යා ධර්මයන්, ජීවිතයට එකතු කොට ගැනීම නිසා. බුදුරජාණන් වහන්සේ ඉපදීම දුකයි කියන කොට, අපේ ම බෞද්ධ පින්වතුන්, ලක්ෂ ගණන්, කෝටි ගණන් වියදම් කරලා, පංචනීවරණ කාමච්ඡන්දයන් වඩමින්, ඉපදීම සමරන්න උපන්දින සාද පවත්වනවා. මත්වතුර, රසමසවුළු නොහික්මුණු අසංවර විලාසිතා, ආගන්තුක ඇවතුම් පැවතුම් තුළින් මේ ලැබුවා වූ සුන්දර පින්වන්ත ජීවිතය, නැවත සතර අපායේ උපතකට අවශ්‍ය සාධක ඇති කොට ගැනීම උදෙසා ම මෙහෙයවනවා.

ජනතාවට පූර්වාදර්ශයන් දිය යුතු අපේ රටේ දේශපාලනය කරන පින්වතුන්ලා, අවුරුදු හැත්තෑවේ උපන්දිනය සමරන්නත්, කේක්ගෙඩි කපනවා. පැදුරු සාද පවත්වනවා. මහා රාත්‍රි වෙනකම් සිංදු කියනවා. බජව් දමනවා. පූර්වාදර්ශයන් නැති, සුන්දර මිනිස් සමාජයක් දිනෙන් දිනම අවිද්‍යාවේ අඳුර දෙසට

ගමන් කරනවා. චතුරාර්ය සත්‍ය ධර්මයන් නොදැනීම නිසා ම, පෙර ජීවිතයේ ශීලය නිසා ම, දානය නිසා ම, මෛත්‍රිය නිසා ම, ඔබට ලැබුණු මේ සුන්දර ආයුෂ, වර්ණය, සැපය, බලය සහිත ජීවිතයෙන්, ඔබ කෘතවේදීභාවය දක්වන්නේ පංචනීවරණයන්ට. පංචනීවරණයන්ට පින්වත් ඔබ කෘතවේදීත්වය දක්වද්දී, ඔබ තුළ මැවෙන්නේ අවිද්‍යාව මයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

පින්වත් ඔබ ඇස් දෙක පියාගෙන දකින්න, මේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට ගන්න, බුදුරජාණන් වහන්සේ මහා සාගරයේ ජලයට වඩා රුධිරය දන්දීලා තිබෙනවා. මහ පොළොවේ පස්වලට වඩා ශරීර මාංශ දන්දීලා තිබෙනවා. සක්විති රජපදවි, සිටු ඇමැති පදවි දන්දීලා තිබෙනවා. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනාවක්, බෝධි සත්ත්වයන් හැටියට මේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට ගැනීම උදෙසා කඳුළෙන්, රුධිරයෙන්, මසෙන්, ජීවිතයෙන් සිදු කළා වූ මහා පරිත්‍යාගය නුවණින් දකින්න. මේ සෑම පරිත්‍යාග යක්ම බුදුරජාණන් වහන්සේ සිදු කළේ පින්වත් ඔබ උදෙසා මයි. පින්වත් ඔබට දුකෙන් මිදීමේ සැබෑ මාවත විවරකොට දීම උදෙසා මයි.

පින්වත් ඔබ වෙනුවෙන් බුදුරජාණන් වහන්සේ එවන් උතුම් පරිත්‍යාගයන් සිදු කොට තිබියදී, ඇයි ඔබ බුදුරජාණන් වහන්සේට අකීකරු දරුවෙක් වෙන්නේ? මෙය සටහන් තබන භික්ෂුව, බුදුරජාණන් වහන්සේට කීකරු දරුවෙක් වූණේ, මා උදෙසා බුදුරජාණන් වහන්සේ සිදු කළ අපරිමිත වූ මහා කැපවීම දැකලා මයි. මෙය ඔබෙත් මගෙත් ඇත්ත කතාවයි. අවිද්‍යාව නිසා ම මේ ඇත්ත කතාව අපි දකින්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ නමකගේ උතුම් පහළවීමේ ඇත්ත අර්ථය නොදැක, බොරුවෙන් ජීවත් වෙන බෞද්ධ ජාතියක් වීමේ ප්‍රවණතාව දෙසට වර්තමානයේ බෞද්ධ ජීවිත ගමන් කරනවා.

ස්වාමින් වහන්සේලා නිකාය වශයෙන්, කණ්ඩායම් කල්ලි වශයෙන් කටයුතු කරනවා. එකිනෙකට වෙනස් ධර්මයන් දේශනා කරනවා. මේවා හේතුවෙන් ජනතාව අසරණ වෙලා තිබෙනවා. එහෙම නම් නිවැරැදි ධර්මය තෝරා ගන්නේ කෙසේද? මේ අපි දකින්නේ ධර්මයයි. ධර්මය තිබෙන්නේ නිවැරදි කිරීමට නොව වැරදි දැක ගැටීමට නොව, නිවැරැදි දෙය දැක ඇලීමට නොවේ. වැරැද්දට ගැටිලා අපි නිවැරැදි දෙයට ඇලෙනවා නම්, එතැන තිබෙන්නෙත් දුකමයි. ධර්මය කියලා කියන්නෙ වැරැද්දට ගැටීමවත්, නිවැරැදි දෙයට ඇලීමත් නොවේ. වැරැද්දත් නිවැරැද්දත් දෙක ම අනිත්‍ය වූ ධර්මතාවන් කියල දැකලා, වැරැද්දත් නිවැරැද්දත් ඉදිරියේ උපේක්ෂාව කියන අර්ථය ජීවිතයට එකතු කොට ගැනීමයි. අපි යම් දවසක මේ උපේක්ෂාවත් අනිත්‍යයි කියලා දකින්න ඕනේ. ඒත් දැන්ම එයට කලබල විය යුතු නැහැ.

අපි අද මේ ධර්මය සාකච්ඡා කරන්නේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පාලා වසර දෙදහස් හයසියයක් ගිය තැනකදී. බුදුරජාණන් වහන්සේ මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කොට ගන්න කියලා දේශනා කළේ නිකාය වශයෙන් බෙදිලා නොවේ. තව තව අනුනිකායන් හදල නොවේ. කණ්ඩායම් ගැහිලා කල්ලි ගැහිලා නොවේ. මේ උතුම් ශාසනය ආරක්ෂා වෙමින් උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් අපේ ජීවිත වලට දරා ගැනීම තුළින් මයි. මේ යථාර්ථය අපි ජීවිතයට එකතු කොට ගතහොත් ධර්ම මාර්ගයේ මොන තරම් විකෘතීන් මතු වුණත්, අපිට වරදින්නේ නැහැ. මොන තරම් මිථ්‍යා ධර්මයන් සමාජගත වුණත් අපිට වරදින්නේ නැහැ.

අපි වරද්දා ගන්නේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරපු, ධර්මයන් අසන්නේ නැතිව, අනුන් දේශනා කරන ධර්මයන් අසන්නට යෑම නිසාමයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තමන් සමස්ත ලෝක ප්‍රජාවට ම කාරණා හතරක් පමණක් මයි දේශනා කරන්නේ. පළමුවැනි කාරණය තමයි දුක, දෙවැනි

කාරණය තමයි මෙන්න දුකට හේතුව තෘෂ්ණාව, තුන්වැනි කාරණය තමයි මෙන්න දුක නැති කිරීම, හතර වැනි කාරණය තමයි මෙන්න දුක නැති කිරීමේ මාර්ගය. පින්වතුනේ, ඉහත කාරණා හතර පහළවීමයි බුදුරජාණන් වහන්සේගේ පහළවීමේ අර්ථය.

ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක, තමා තුළ මයි තිබෙන්නේ. දුක තියෙන්නේ තමා තුළ නම්, දුකට හේතුව තෘෂ්ණාව තිබෙන්නේ තමා තුළ ම නම්, දුකෙන් මිදීම උදෙසා තෘෂ්ණාව නැති කළ යුත්තෙත් තමා මයි. තෘෂ්ණාව නැති කිරීමේ මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කළ යුත්තේ තමා මයි. මේ උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය කියන්නේ, තමා තුළින් තමා දකින තමා තුළින් තමා අවබෝධ කොට ගන්නා ධර්මයක්. දුක තිබෙන්නේත් ඔබ තුළ නම් දුකට හේතුව තෘෂ්ණාව තිබෙන්නේත් ඔබ තුළ ම නම්, තෘෂ්ණාව නිරෝධය කළ යුත්තේත් ඔබ ම නම් තෘෂ්ණාව නිරෝධය කිරීමේ මාර්ග යේ ගමන් කළ යුත්තේත් ඔබ ම නම්, නිවැරැදි සද්ධර්මය සොයා ගැනීමේදී කාටවත් ම ගැටලුවක් මතු වන්නේ නැහැ. ධර්මයත්, ධර්මයේ අවබෝධයත් තමා තුළ මයි තිබෙන්නේ.

දෑස් පියාගෙන තමා දෙස බලන්න. දුක තමා තුළ තිබෙනවා. දුකට හේතුව තෘෂ්ණාව තමා තුළ තිබෙනවා. දුකෙන් මිදීම උදෙසා ඔබ කළ යුත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීම පමණක් මයි. මේ සා සරලව බුදුරජාණන් වහන්සේ, මේ උතුම් ධර්මය තමා තුළින් දැක, තමා තුළින් අවබෝධ කොට ගැනීමට මාර්ගය දේශනා කොට තිබියදී අපි මොකද කරන්නේ? තමා දෙස නොබලා අනුන් දෙස බලනවා. අනුන්ගේ නිකාය, අනුන්ගේ කණ්ඩායම්, කල්ලි, අනුන්ගේ ධර්මයන් දෙස බලනවා. සංසාරයේ පටිච්චසමුප්පන්නව පුහුණු කළා වූද, දුක පිණිස ම හේතු වන ධර්මතාවයන් දෙස බලනවා. පින්වත් ඔබ මේ සටහන තබන භික්ෂුව දෙස, බැලිය යුත්තේ භික්ෂුව හරිද, වැරදිද කියලා දැකීමට නොවේ. භික්ෂුව දේශනා කරන ධර්මයෙන් භික්ෂුවගේ

ජීවිතය තුළින් මතු වෙන යම් පූර්වාදර්ශයන් ගෙන් ගත යුතු යමක් තිබෙනවා නම් ඒ දෙය ඔබේ ජීවිතයට අරගෙන ඔබ නිදහස් වීම සඳහා යි.

නමුත් වර්තමාන සමාජය ඒ දෙය නොවේ කරන්නේ. බුදුරජාණන් වහන්සේ හරිද වැරදිද කියල සොයනවා. ශ්‍රී සද්ධර්මය හරිද වැරදිද කියලා සොයනවා. බුදුරජාණන් වහන්සේ ඉපදුන තැන සොයනවා. මස්, මාළු වල පව් තිබෙනවා ද කියල සොයනවා. ශීලයෙන් තොරව ප්‍රඥාව ගැන සොයනවා. වචන වල අර්ථ නිරුක්ති සොයනවා. අහවල් හාමුදුරුවෝ හරිද වැරදිද කියලා සොයනවා. බුදුරජාණන් වහන්සේ අපිට මේවා සොයන්න කියලා නැහැ. මේවා සොයන්න, සොයන්න සමස්ත සද්ධර්මයේ අර්ථය ම අපි විකෘතියක් බවට පත් කොට ගන්නවා. දුකෙන් මිදීමේ නාමයෙන් දුකට ම හේතු වන තෘෂ්ණාවට තව තව වර්ධනය කොට ගන්නවා.

පින්වත් ඔබට නිවැරැදි සද්ධර්මය අවශ්‍ය නම් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ, නිවැරැදි සද්ධර්මය ඔබ තුළ මයි තිබෙන්නේ. නමුත් වර්තමානයේ කල්‍යාණමිත්‍ර ආශ්‍රය දුර්වලයි. නුවණින් මෙනෙහි කිරීමේ ශක්තිය දුර්වලයි. ඒ නිසාම තමා තුළ ඇති ධර්මය මගහැර, ලෝකය තුළ අපි අධර්මය සොයමින් දුවනවා. තමා තුළ සකස් වෙන දුක තමා විසින් ම නිරෝධය කළ යුතු, සුන්දර මාර්ගයක් බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබියදී, ධර්මය සොයමින් අපි ලෝකෙ වටේ, රට වටේ, දුවනවා. කණ්ඩායම් ගැහෙනවා. කල්ලි ගැහෙනවා. මම හරියි, ඔහු වැරදියි කියනවා. ධර්මයේ නාමයෙන්, ධර්මාවබෝධයේ නාමයෙන්, තෘෂ්ණාව ම සංවර්ධනය කොට ගන්නවා.

පින්වත් ඔබ මොහොතක් දෑස් පියාගන්න. චතුරාර්ය සත්‍ය ධර්මයේ මුල් ආර්ය සත්‍යය වන දුක තමා තුළින් තමා දකින්න. දුකට හේතුව රූප වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කෙරෙහි ඇති කොටගන්නා වූ තෘෂ්ණාව ම බව දකින්න. දුක තුනීකොට ගැනීමට, තෘෂ්ණාව සියුම් කොට ගත යුත්තේ තමා

ම බව දකින්න. එහෙම දකිමින් තෘෂ්ණාව නිරෝධය කරන මාර්ගය වන සුන්දර ආර්ය අෂ්ටාංගික මාර්ගය ජීවිතයට එකතු කොට ගන්න. නිකාය කණ්ඩායම්, කල්ලි, විචිකිච්ඡා, ලෝකය ම යන දිශාවකට යන්න දෙන්න. පින්වත් ඔබ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සැබෑ ම ධර්ම මාර්ගය වන, තමා තුළින් ම දුක කියන කාරණයත්, දුකට එක ම හේතුව වන තෘෂ්ණාව කියන කාරණයත්, තෘෂ්ණාව නිරෝධය කරන උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයත්, මතු කොට ගන්න.

ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය ඔස්සේ ගමන් කොට මෙලොව පරලොව ලෞකික සැපයත්, ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය ඔස්සේ ගමන් කොට උතුම් මාර්ග ඵල සැපයත් ජීවිතයට එකතු කොට ගන්න දක්ෂ වෙන්න. දුක වැඩෙන, තෘෂ්ණාව වැඩෙන, ධර්මයේ නාමයෙන්, අධර්මයන් ජීවිතයට එකතු කොට ගෙන මුළු ලෝකය ම තමන් තමාව ම රවටා ගත්තත්, සැබෑ නිවැරැදි චතුරාර්ය සත්‍ය ධර්මයන් ඔබ ජීවිතයට එකතු කොට ගත හොත් පින්වත් ඔබ දුක තුනී කොට ගන්නවා මයි. එය ලෝක ධර්මයක් ම වෙනවා.

වර්තමානයේ උතුම් ශ්‍රී සද්ධර්මය වැරදිලා නැහැ. උතුම් ශ්‍රී සද්ධර්මය විකෘතිවෙලා නැහැ. සැබෑ චතුරාර්ය සත්‍ය ධර්මයන් ප්‍රතික්ෂේප කිරීම නිසා ජනතාවට වැරදිලා, ජනතාව විකෘතියක් වෙලා තිබෙන්නේ. මේ මොහොතෙත් පින්වත් ඔබ තුළ සුන්දරව විවෘතව උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන්ට අදාළව අර්ථයන් අර්ථවත්ව තිබෙනවා. නමුත් වර්තමානයේ සිදුවෙමින් පවතින්නේ, කල්‍යාණමිත්‍ර ආශ්‍රයේ දුර්වලභාවයන් නිසා ම, සමාජයට ධර්මානුකූලව පූර්වාදර්ශයන් නොලැබීම නිසා ම, ගිහි පැවිදි දෙපාර්ශවය ම සංසාර බිය, සංසාර ගැඹුර, සංසාර දුක නුවණින් මෙනෙහි නොකිරීම නිසා ම, රූපයන් කෙරෙහි ඇලීම් ගැටීම් කෙරෙහි, හඳුනා ගැනීම් කෙරෙහි, සංස්කාරයන් කෙරෙහි, විඤ්ඤාණයන් කෙරෙහි, ඇති කොට ගෙන ඇති අසීමිත කෙළ හලන තෘෂ්ණාව නිසා ම, ලෞකිකත්වය තුළ

බැසගෙන තමා තුළින් ධර්මය නොදැක, ලෝකය තුළින් සැප සොයා යෑමේ ඵලයයි වර්තමාන සමාජයේ ඛේදවාචකය බවට පත් වෙලා තිබෙන්නේ.

මෙය සටහන් තබන භික්ෂුවට සමාජයේ කොතැනක වත් වරදක් නම් පේන්නේ නැහැ. සමාජය නිවැරැදි තැන ස්ථාන ගත වෙලා සිටිනවා. තෘෂ්ණාව වැපුරුවොත් ඔබ, දුක අස්වැන්න හැටියට ලබනවා මයි. ලෝකය හදන්න යෑම පසෙක තබා, ශ්‍රී සද්ධර්මයේ හරි වැරදි සොයන්න යෑම පසෙක තබා, සංසාර බිය දකිමින්, ඔබ ලෝකය තළු මර මරා අයිති කොට ගන්න උත්සාහයෙන් මිදෙන්න. කාමයන්ගේ නිසරු භාවය, අනිත්‍ය භාවය දකිමින්, තනි තනිව ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙන්න. ඔබ හැදුණොත් රට හැදේවී. ඔබ නොහැදී රට හදන්න යෑමේ විපාකය අද සමාජය අත්දකින්නේ. ඔබේ ධර්මානුකූල පූර්වාදර්ශයන් සමාජය යම් පමණකට හෝ නිවැරැදි වීමට උපකාරක ධර්මයන් සකස් කොට දේවි. ඔබටත්, මටත් වර්තමාන සමාජ අර්බුදය ඉදිරියේ කරන්නට ඉතුරු වෙලා තිබෙන්නේ එම වගකීම පමණයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ලෞකික සැපයට මාර්ගයත් උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය මයි කියල.

# භික්ෂුත්වයේ ආදර්ශය 'ඩිමාන්ඩ්' එකක රිමාන්ඩ් කළ හැකිද?

දැන් වෙලාව සවස පහට පමණ ඇති. එකපාරටම ම පරිසරය අඳුරු වුණා. මහා වැස්සක් වැටෙන්න හොඳට ම ළඟයි වගේ. ඊයේ රාත්‍රියෙත් සුළඟ සමග මහා වැස්සක් ඇද හැළුණා. මේ වැසි වලට ගම්වාසීන් කියන්නේ මහියංගණ පෙරහැර වැස්ස කියලා. තද වියළි කාලගුණයක් මොහොතකට නවත්තලා, වැටෙන මේ වැස්සට ගම්වැසියන් හරිම සතුටුයි. මහියංගණ පෙරහැර ළංවෙලා වැටෙන මේ වැස්ස නිසාම, ගම්වාසී පින්වතුන්ලා මහියංගණ පෙරහැරත් සමග පුද පූජාවන් ලබන සමන් දෙවියන් කෙරෙහි විශ්වාසය වැඩි කොට ගන්නවා.

කැලයේ ජීවත්වෙන සතුන්ට නම් වියළි කාලගුණය කර්කෂ වුවත්, මහා වැසි එම සතුන්ට පීඩාවක් මයි. භික්ෂුව උදෑසන පිණ්ඩපාත මඩුවට වඩින විට අඩිපාරේ කුරුලු බිත්තර කිහිපයක් ම වැටී බිඳී තිබෙනවා භික්ෂුව දැක්කා. මෙවන් මහා වැසිවලට ගොඩක් කැමති සතෙක් කැලයේ සිටිනවා. ඒ තමයි අලියා. තමන්ගේ උෂ්ණාධික ශරීරය සිසිල් කොට ගන්න, එයාට නම් හොඳ අවස්ථාවක් අද ලැබිලා තිබෙනවා. වැස්ස තදින් වසිනවා. කුටියේ ලන්තෑරුම පත්තු කරලා බාල්කයේ එල්ලලා, පුටුව ඇන්ද මත පත්තු කරගන්න ලොකු ඉටිපන්දම් ආලෝකය, මේ සටහන් ලියන්න භික්ෂුවට උපකාරක ධර්මයන් සකස් කොට දෙනවා.

භික්ෂුවට සටහන ලියන්න සිත ඉඩ දෙන්නේම නැහැ. සිත පුදුමාකාර සතුටකින් ප්‍රීතියකින් පිරිලා. භික්ෂුව තනිව ම භික්ෂුවට ම කියා ගන්නවා සැපයි සැපයි හරිම නිදහසයි කියලා. හොඳ වෙලාවට ළඟපාතක කවුරුවත්ම නැහැ. සිටියා නම් සමහර විට භික්ෂුව පිස්සෙක්, කියලා කියන්නත් පුළුවන්. මේ ශීතලත් නොදැනෙන, මේ මහා වැස්සේ රට උළු සෙවිලි කළ මැටි කුටියේ භික්ෂුව ලබන මේ උතුම් ධර්මානුකූල විදර්ශනාමය සැපය ගැන පින්වත් ඔබට සටහන් තබන්නේ, ධර්මයේ උතුම් ගුණයන් තවමත් ජීවමානව තිබෙනවාය කියන ඇත්ත, කෙරෙහි පින්වත් ඔබේ විශ්වාසය ශක්තිමත් කොට දෙන්න.

බුදුරජාණන් වහන්සේ කෙරෙහි අවංක භාවයෙන් ධර්ම මාර්ගයේ ගමන් කරලා, ලබන්නා වූ සත්‍ය අත්දැකීම්, මෙලෙස පින්වත් ඔබේ වීර්යය උදෙසා සටහන් තබන කොට, සමහර පින්වතුන්ලා භික්ෂුවට චෝදනා කරන අවස්ථාත් තිබෙනවා.

පසුගිය දිනක පින්වත් මහත්මයෙක් භික්ෂුවට චෝදනාත්මකව කාරණයක් සඳහන් කළා. එම චෝදනාව එම පින්වත් මහත්මයාගේම වචනවලින් භික්ෂුව මෙහි සටහන් තබනවා. ඒ මහත්මයාගේ චෝදනාව 'ඔබ වහන්සේ ඩිමාන්ඩ් කරනවා නේද?' කියලා. ඩිමාන්ඩ් කරනවා කියන වචනයේ අදහස, ඔබ වහන්සේ අගේ කරනවා නේද කියලයි. භික්ෂුව එම මහත්මයා ගෙන් ඇසුවා, ඇයි මහත්තයෝ එහෙම කියන්නේ කියලා. එවිට එම මහත්මයා කියනවා, භික්ෂුව සමාජය තුළ සැඟවිලා ජීවත් වෙලා, ඉඳලා හිටලා ජනතාව අතරට පැමිණෙනවා ය කියලා. එම පින්වත් මහත්මයා ඉහත කාරණයට කියන්නේ භික්ෂුව ඩිමාන්ඩ් කරනවා කියලයි.

මෙය සටහන් තබන භික්ෂුව කවදාකවත්, සැඟවිලා ජීවත් වෙලා නැහැ. උපසම්පදා භික්ෂුවකට හැංගිලා තනිව ම ආහාර හදා ගෙන වළඳන්න බැහැ. භික්ෂුව සෑම උදෑසනකම, රටේ

කොහේ හෝ ගම්මානයකට, නගරයකට පිණ්ඩපාතයට වඩිනවා. කොතැනක හෝ ආරණ්‍යයක, පන්සලක, කුටියක, ගිහි පින්වතුන්ගේ සිවුපසය ලබමින් වැඩ සිටිනවා.

බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට, 'මහණෙනි, ජනතාව නොගැවසෙන, විවේකී රුක්ඛ මූලයකට, ශූන්‍යාගාරයකට, ආරණ්‍යයකට වැඩම කොට, ඔබලාගේ ධර්ම මාර්ගය ශක්තිමත් කොට ගන්න' කියලා, තම ශ්‍රාවකයන්ට අනුශාසනා කර තිබෙන්නේ තම ශ්‍රාවකයන්ට අගේ කරන්නද?

'මහණෙනි, වැසි තුන් මාසය එකම ස්ථානයක් අධිෂ්ඨානය කොට, ගිහි පින්වතුන්ලා ගේ පළිබෝධයන් ගෙන් හැකිතාක් බැහැර වී විවේකීව, නොලැබූ ධ්‍යානයන්, නොලැබූ විදර්ශනාමය අවබෝධයක් ලබන්න' යැයි බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට විනය කාරණාවක් පනවා ඇත්තේ තම ශ්‍රාවකයන්ට අගේ කරවන්නද?

'මහණෙනි, ඔබලා ගමට, නගරයට, උදෑසන පිණ්ඩපාතයට වඩින කොට, වටපිට නොබලා, බිමට හෙළූ දෑසින්, ඉර වගේ, සඳ වගේ, කොතැනක වත් නොරැඳී, නොඇලී නොගැටී පිණ්ඩපාතය අවසන් කොට, කුටියට වඩින්න' කියලා බුදුරජාණන් වහන්සේ අපට අවවාද කොට තිබෙන්නේ, අපිව අගේ කරවන්නද?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, 'මහණෙනි, ගැඹුරු ප්‍රපාතයක් දෙස බලන පින්වතා තම කය ප්‍රපාතයෙන් බැහැරට මෑත් කොට ගෙන, හිස පමණක් ප්‍රපාතය දෙසට යොමු කොට බලන්නේ යම් සේද, ඔබලා ගිහි සමාජය සමග කය මෑත් කොට ගෙන හැසිරෙන්න'ය කියලා.

පින්වත් මහත්තයෝ මේක අපේ උතුම් බුද්ධ වංශයේ භික්ෂු ප්‍රතිපදාව. වර්තමානයේ ඒ උතුම් බුද්ධ වංශයේ භික්ෂු ප්‍රතිපදාව යම් පමණකට දුර්වල වෙලා, ස්වාමීන් වහන්සේලා සීමාව

ඉක්මවා සමාජගත වෙලා තිබෙන බව ඇත්ත. නමුත් භික්ෂූන් වන අප, අපගේ පිය උරුමයෙන් ලද භික්ෂු චර්යාවන්, පැවැත්විය යුත්තේ, උතුම් සංඝ සමාජයට පූර්වාදර්ශයක් උදෙසා මයි. ගිහි සමාජයට උතුම් සංඝ සමාජය කෙරෙහි ශ්‍රද්ධාව ගෞරවය ශක්තිමත් කොට දීම උදෙසා මයි.

බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයේ දී දේශනා කරනවා, ආර්ය මාර්ගය පුහුණු කරන ස්වාමීන් වහන්සේලාට, 'මඟහැර යෑමෙන් ප්‍රහීනය කළ යුතු ආශ්‍රවයන්' ගැන, 'දුරු කිරීමෙන් ප්‍රහීනය කළ යුතු ආශ්‍රවයන්,' වගේම 'ගිහි සමාජයෙන් මෑත්ව සමථ විදර්ශනාවෙන් ප්‍රහීනය කළ යුතු ආශ්‍රවයන්' ගැන, මේ සෑම ඉගැන්වීමක දීම, බුදුරජාණන් වහන්සේ ඉලක්ක කරන්නේ උතුම් සංඝ සමාජයේ ආදර්ශමත් භාවයයි. එසේ නොමැතිව ස්වාමීන් වහන්සේලාගේ අගය පෙන්වීම නොවේ.

පින්වතුනි, මෙය සටහන් තබන භික්ෂුව කුමක් අගය කරන්නද, එසේත් නැත්නම් ඩිමාන්ඩ් කරන්නද? මේ කබ, කඳුළු, ගලන, සුද වසා ගන්න, අන්ධ භාවයට පත් වෙන මේ ඇස අගය කරන්නද? කලාඳුරු සැරව ගලන කන, සොටු ගලන නාසය, කුණුකෙළ ගලන දිව, රෝගී බවින් ගහන, අපිරිසිදු කුණුවෙන, දුර්ගන්ධය හමන, දිවා රාත්‍රි අශුචි, මුත්‍රා, දහදිය වැගිරෙන මේ ශරීරය අගේ කරන්නද?

අතීතයේ වැඩ සිටියා වූ සැරියුත් මහෝත්තමයන් වහන්සේගේ සොහොයුරෙක් වූ කදිරවනේ රේවත මහෝත්තමයාණන් වහන්සේ තම මුළු භික්ෂු ජීවිතකාලය ම, කර්කෂ වනවාසී ජීවිතයක් ගත කළේ සමාජයට අගය පෙන්වන්නටද?

උතුම් භික්ෂු ප්‍රතිපදාවන් ගැන පුංචි හෝ අවබෝධයක් නැති පින්වතුන්ලාව, අධර්මයෙන් සතුටු කරන්න භික්ෂූන් වන අපට අවශ්‍ය නැහැ. මෙය සටහන් තබන භික්ෂුව. ගිහි ජීවිතයේදී ඇති තරම් සමාජ ආශ්‍රය කරපු කෙනෙක්. ඒ සමාජ ආශ්‍රය මයි, අසීමාන්තික අත්දැකීම් ගොන්නක් සමගයි, ගිහි සමාජයෙන්

බැහැරට පැමිණියේ, භික්ෂුව යම් දවසක ගිහි සමාජයෙන් බැහැරව, භික්ෂු ජීවිතයට පැමිණියේ අතීතයේ කරපු දෙය නැවත කරන්න නොවේ. මෙතෙක් නොකරපු දෙයක් කරන්නත් නොවේ. කරපු දේවලුත් නොකරපු දේවලුත් කෙරෙහි තිබෙන තෘෂ්ණාව, නිරෝධය කිරීම සඳහා මයි.

ඊයේ ඉරිදා දිනයක්. උදෑසන පිණ්ඩපාත මඩුවට හැත්තෑ පහකට වැඩි පිරිසක්, පිණ්ඩපාතය බෙදීමට පැමිණ සිටියා. මෙම පිරිස අතර අනුරාධපුරය, ගල්ගමුව, නුවර, මහියංගණය වැනි ඉතා දුර බැහැර ප්‍රදේශවල පින්වතුන්ලා ද උදෑසන හත වෙනකොට පැමිණ සිටියා. ඉතා දුර බැහැර සිට පැමිණ සිටි මේ පින්වතුන්ලා ගේ, මහා සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව, ගරුත්වය, කර්මය, කර්මඵල විශ්වාසය දකිද්දී, පිණ්ඩපාත දානය පූජා කොට අවසානයේ සිදු කරන පින් අනුමෝදන් කිරීමේදී භික්ෂුව මෙහෙම අනුශාසනාවක් සිදුකළා.

"භික්ෂුව මේ ඈත ගම්මානයක වස් සමාදන්ව වැඩ සිටින්නේ. නමුත් පින්වත් ඔබලා කෙසේ හෝ තොරතුරු සොයා ගෙන, ඈත දුර බැහැර සිට, උදේ පාන්දර එකට දෙකට, තුනට අවදි වෙලා, පිණ්ඩපාත දානය හදාගෙන, උදෑසන හතට පිණ්ඩපාත මඩුවට පැමිණිලා, දානය පූජා කරගනිද්දී, පසඟ පිහිටුවා වන්දනා කරද්දී, පින්වත් ඔබ තුළ වැඩෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, ගරුත්වය, වීර්යය, මහා සංඝරත්නය අරමුණු කොට ගෙන භික්ෂුව කෙරෙහි ඔබලා ඇති කොට ගෙන තිබෙන විශ්වාසය, දකිද්දී, භික්ෂුව ඔබේ පිණ්ඩපාත දානය, ඔබලාගේ ගෞරවණීය වන්දනාවන්, එක වචනයකින් හෝ ඔබලාට බොරුවක් කියලා, බොරුවක් කරලා, ගන්නවා නම්, වංචාවක් කරලා ගන්නවා නම්, ශීලයෙන් දුර්වලව සිට පිළිගන්නවා නම්, පින්වත් ඔබලාගේ විශ්වාසයේ අයෝමය ශක්තියට, භික්ෂුවගේ හිස සත්කඩකට පැළෙනවා මයි" කියලා.

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ, ගිහි ජීවිතයේදී පිප්පලි නමැති තරුණයා හැටියට, උතුම් පැවිදි උපසම්පදාව, බලාපොරොත්තුව, බුදුරජාණන් වහන්සේගේ හමුවට පැමිණි මුල්ම අවස්ථාවේ පිප්පලි තරුණයා බුදුරජාණන් වහන්සේගේ උතුම් සම්මා සම්බුද්ධ ඤාණය කෙරෙහි අචල විශ්වාසයෙන් සිදු කළා වූ, ගෞරවණීය වන්දනාව ලබලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "මම උතුම් සම්මා සම්බුද්ධත්වය අවබෝධ නොකර, මේ පිප්පලීගේ වන්දනාව පිළිගත්තා නම්, මගේ හිස සත්කඩකට පැළෙනවා" කියලා. අයෝමය ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් සිදුකරන වන්දනාවත්, වන්දනාවන් සිදු කරන පින්වතුන්ගේ විශ්වාසයට බොරු කරලා, යමෙක් ලබනවා නම් ඔහුට සමාජයේ වැඩි දවසක් පවතින්න බැහැ පිස්සෙක් වෙනවා, ඉහත ධර්මයට අදාළව.

දැන් වේලාව සවස හයත් පසුවෙලා, වැස්ස ටිකක් තුරල් කරලා. පුටුවේ ඇන්ද මත දැල්වෙන ඉටිපන්දම අඩකටත් වැඩිය පිච්චිලා ගිහිල්ලා. නිහඬ බව පමණක් උරුම, විදර්ශනාමය සප්ත බොජ්ඣංග ධර්මයන් ගෙන් සිතුවිලි සන්නද්ධ වූ මේ සුන්දර රාත්‍රියේ දී පින්වත් ඔබට මෙය සටහන් තබන භික්ෂුව දිවුරා කියනවා, මගේ භික්ෂු ජීවිතයේදී භික්ෂුව කවදාක වත් බුදුරජාණන් වහන්සේට අකීකරු වෙලා, පින්වත් ඔබට බොරුවක්, වංචාවක් කරලා නැහැය කියලා.

රටපුරා ධර්ම දේශනාවන් පවත්වන කාලවලදී, ධර්ම ශ්‍රවණයට කැමැති සත්පුරුෂ පින්වතුන්ලා, පැය කිහිපයක්, නොසෙල්වී හිඳ ගෙන සද්ධර්මය ශ්‍රවණය කරලා, ධර්ම දේශනාව අවසානයේදී පැයක්, පැය දෙකක්, දිග පෝලිමේ ඇවිල්ලා, සමාජයේ ජීවත් වෙන සෑම තරාතිරමක පින්වතුන් පිරිකර පූජා කරලා පසඟ පිහිටුවා වන්දනා කරන්නේ සංඝරත්නය, කෙරෙහි මොන තරම් නම් ශ්‍රද්ධාවකින්ද, ගෞරවයකින්ද, භික්ෂුව කෙරෙහි විශ්වාසයකින් ද? සත්පුරුෂ ගිහි පින්වතුන්ලා ගේ මෙවැනි ශ්‍රද්ධාවෙන්, ගරුත්වයෙන්, විශ්වාසයෙන් සිදු කරන වන්දනාවක්, භික්ෂුව එම පින්වතුන්ලාට එක වචනයකින්

හෝ බොරුවක්, වංචාවක්. කොට ගන්නවා නම්, මෙය සටහන් තබන භික්ෂුවගේ හිස සත්කඩකට පැලිලා, මේ වන විට අවසන්. භික්ෂුව විකෘතියක් වෙලා අවසන්.

භික්ෂුව ධර්ම දේශනාවකට වඩින කොට, සත්පුරුෂ ගිහි පින්වතුන්ලා, ගෞරවණීය ස්වාමීන් වහන්සේලා, කාලය, ශ්‍රමය, ධනය, වැය කොට, සිදු කොට තිබෙන, සුන්දර, විසිතුරු, මලින්, පාවඩ වලින්, උඩුවියනින්, කර තිබෙන පූජාවන් දකිද්දී, පින්වත් ඔබලාට භික්ෂුව එක වචනයකින් හෝ බොරුවක් රඟපෑමක් කරලා එම ගෞරවණීය පූජාවන් ලැබුවා නම්, මේ වන විට භික්ෂුව පිස්සෙක්, විකෘතියක් වෙලා අවසන්.

භික්ෂුවගේ ඇත්ත කථාව පිළිබඳව මීට වඩා ධර්මානුකූලව පින්වත් ඔබට දෙන්න සහතිකයක් භික්ෂුවට නැහැ. ගෞරවණීය පින්වත, ලෝකය චෝදනාවන්ටත්, පැසසුම්වලටත් එකසේ ම විවෘතයි. ලෝකයෙන් මිදීම කියන්නේ චෝදනාවනුත්, පැසසුමුත් අනිත්‍ය වූ සංස්කාරයන් බව අවබෝධ කොට ගැනීමයි.

මෙය සටහන් තබන භික්ෂුවගේ ඇත්ත කථාව, ලෝකයට, සත්පුරුෂ බෞද්ධ ජනතාවට, ගෞරවණීය අන්‍ය ආගමික පින්වතුන්ලාට, සන්නිවේදනය කරන්නට, දිවයින ඉරිදා සංග්‍රහය සද්භාවයෙන් යුතුව, ප්‍රති උපකාරයක් බලාපොරොත්තුවෙන් තොරව, ලොකු කැපවීමක් සිදු කළා. මහ රහතුන් වැඩි මඟ ඔස්සේ ලිපි පෙළ, මුලින්ම බුදුමඟ පත්‍රයේත්, පසුව ඉරිදා දිවයින සංග්‍රහයේත් පළවීමට පටන් අරගෙන දැනට අවුරුදු නවයක් පමණ වෙනවා.

මේ කාලය පුරාවට, භික්ෂුව සටහන් තැබූ එකම වචනයක් වත්, වෙනස් නොකර, සංස්කරණය නොකර, දිවයින ඉරිදා සංග්‍රහය සැකයක්, විචිකිච්ඡාවක්, බියක්, ඇති කොට නොගෙන මෙම මහරහතුන් වැඩි මඟ ඔස්සේ ලිපි පෙළ ජනතාව අතට පත් කළා. අද දක්වා භික්ෂුව කවදාකවත් දිවයින පත්‍ර කාර්යාලයට ගොඩ වෙලා නැහැ.

අද දක්වාම මේ සටහන ලියලා, පින්වත් ඔබ භික්ෂුවට පූජා කරන ලියුම් කවර, සහ මුද්දර වල පිහිටෙන්, ලිපිය අදාළ පිටුවේ සංස්කාරක මහත්මයාගේ නිවසේ ලිපිනයට තැපැල් කරනවා පමණක් මයි. මුල්ම අවස්ථා දෙකකදී පමණක් ඉන්ද්‍රජිත් සුබසිංහ මහත්මයාට ලිපි ලියූ තනිරුල් පොත් දෙක බැගින් ලබා දුන්නා.

මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ පිබිදීමක් ඇති කොට දීම උදෙසා, ගෞරවණීය ගිහි, පැවිදි ජීවිත වල ශාසනික අර්ථයන් බල ගැන්වීම උදෙසා, විදර්ශනාමය සරණක් අහිමිව සිටි, බෞද්ධ ජනතාවට, සරණක් වීම උදෙසා දිවයින ඉරිදා සංග්‍රහය වසර හයක් වැනි කාලයක් සිදු කළ කෘතවේදී සත්පුරුෂ මාධ්‍ය මෙහෙවරට, උතුම් ධර්මදානය පින්කමට, භික්ෂුව වැසි සමය ගත කරමින්, ධර්මයේ උත්තරීතර සැපයත් අත්විඳින මේ නිසල රාත්‍රියේදී, ඉරිදා දිවයින සංග්‍රහයට කෘතවේදීව ගෞරවයෙන් පින් අනුමෝදන් කරනවා.

පින්වතුන්ලාට තවත් කාරණයක් ගෞරවයෙන් මතක් කර දෙනවා, උතුම් සද්ධර්මය, ධර්මානුකූලව තේරුම් ගන්න අදක්ෂ, ගිහි පැවිදි සමහරක් පින්වතුන්ලා ගේ අදහසක් තිබෙනවා, මාධ්‍යයකට යම් පුද්ගලයෙක්ව ජනප්‍රිය කරවන්න පුළුවන්ය කියලා. පින්වතුනි, ධර්මය ඉගෙන ගත්තාට පමණක් අපි අංග සම්පූර්ණ වෙන්නේ නැහැ. ඉගෙන ගන්නා ධර්මය හේතුඵල ධර්මයන්ට අදාළව නුවණින් දකින්නත්, දක්ෂ වෙන්න ඕනේ. යම් පින්වතෙක් ප්‍රකාශ කරනවා නම් පුවත් පතකට, ගුවන් විදුලියට, රූපවාහිනියට යම් පුද්ගලයෙක්ව ජනප්‍රිය කරවන්න පුළුවන්ය කියලා, එම කතාව ධර්මානුකූලව ඇත්තක් වෙන්නේ නැහැ.

පින්වත් මහින්ද රාජපක්ෂ මහත්මයා, විධායක බලය අතේ තබා ගෙන, රාජ්‍ය ගුවන් විදුලිය, රූපවාහිනිය, ලේක්හවුස් ආයතනය තමා යටතේ තබාගෙනත්, පසුගිය ජනාධිපතිවරණයෙන්

පරාජයට පත් වෙනවා. මාධ්‍ය තිබුණත් ඒ මහතාගේ ජනප්‍රිය භාවයට අදාළ ශීලයේ ශක්තිය ඒ මොහොතේ දුර්වල භාවයට පත්ව තිබීමයි ඊට ධර්මානුකූල හේතුව වෙන්නේ.

වර්තමානයේ එම තත්ත්වය සහමුලින් ම සංස්කාරයන්ට අදාළව ජනප්‍රිය භාවයට පක්ෂව වෙනස් වී තිබෙනවා.

යම් මාධ්‍යයකට පුද්ගලයෙක් ජනප්‍රිය කරවන්න පුළුවන් වන්නේ, අදාළ පුද්ගලයාට ජනප්‍රිය භාවයට අදාළ කුසල් සංස්කාරයන් ජීවිතය පසුපස තිබෙනවා නම් පමණක් මයි. ජනප්‍රිය භාවයට අදාළ ධර්මානුකූල සංස්කාර යම් පුද්ගලයෙක් සතුව නැතිනම්, ලක්ෂ ගණන් වියදම් කොට දැන්වීම් පළ කළත්, වැඩ සටහන් සිදු කළත්, ඔහුව ජනප්‍රිය කරවන්න බැහැ. එයයි ධර්මානුකූල සත්‍යය.

යම් පුද්ගලයෙක්ගේ ජනප්‍රිය භාවයට අදාළ ප්‍රධානම ධර්මතාවය තමයි ශීලයේ ශක්තිය. සිල්වත් භාවයේ පළමුවැනි ආනිශංසය තමයි ජනප්‍රිය භාවය. යම් පුද්ගලයෙක් සතු පටිච්ච සමුප්පන්න සිල්වත් භාවයේ ශක්තියට, දානයට අදාළ, වර්ණය, සැපය, බලයත්, මෛත්‍රියට අදාළව දෙවියන්ට, මනුෂ්‍යයන්ට, අමනුෂ්‍යයන්ට ප්‍රිය වීම, සතුරන් දමනය වීම. කීර්ති රාවය පැතිරීම වැනි සංස්කාරයන්ගේ ශක්තියත් යම් පුද්ගලයකුගේ ජීවිතය තුළින් පටිච්ච සමුප්පන්නව විපාකයට පැමිණිය හොත්, ඔහුගේ ජනප්‍රිය භාවය කිසිවෙකුට නැවැත්විය නොහැකි, දීර්ඝ කාලීන ජනප්‍රිය භාවයක් වෙනවා.

එම ජනප්‍රිය භාවය නැවැත්විය හැක්කේ එම පුද්ගලයා දුශ්සීල භාවයට, අකුසල් මූලයන්ට කොටු වුණොත් පමණක් මයි. ඒත් අතීත කුසල් සංස්කාර ශක්තිමත් නම්, ඔහුගේ ජනප්‍රිය භාවය තාවකාලිකව රැඳී තිබෙන්න අවස්ථාව ධර්මානුකූලව තිබෙනවා.

ඉහත සටහන තුළින් පින්වත් ඔබට ධර්මානුකූලව තේරුම් යන්න ඇති, "මාධ්‍යයකට පමණක් යම් පුද්ගලයෙක්ව ජනප්‍රිය කරවන්න බැහැ. යම් පුද්ගලයෙක් මාධ්‍ය තුළින් ජනප්‍රිය වෙන්නේ ඊට අදාළ කුසල් සංස්කාර ඔහු සතුව තිබෙනවා නම් පමණක්ය" කියලා. එම නිසා ගෞරවණීය පින්වත් ගිහිපැවිදි පින්වතුන්ලා නොදන්නා භාවයෙන් සමාජයේ කාටවත් චෝදනා කරන්න එපා, මාධ්‍ය තමයි ඔය මනුස්සයාව ජනප්‍රිය කළේ කියලා.

යම් ගෞරවණීය පින්වතෙක් එහෙම චෝදනා කළොත් එම පින්වතා චෝදනා කරන්නේ උතුම් ශීලයේ, දානයේ, මෛත්‍රියේ ආනිශංස ධර්මයන්ට මය.

# සැඩ පහර හයකට හසුවී ගලාගෙන යන 'කඳක්' නොවන්න!

මේ දිනවල කැලයේ හැම තැනම පුංචි, පුංචි, සුදුපාට මල් පිපිලා. කැලයේ මල් පිපුණහම කැලය හරිම ලස්සනයි. ඒ මල්වල ලස්සන බලන්න කවුරුවත්ම අහල පහලක වත් නැහැ. කැලයේම පිපිලා, කැලය ලස්සන කරලා, ඒ මල් කැලයේ ම පර වෙලා යනවා. බුදුසමිඳුන් ඉදිරියේ ඇති, සත්‍යයේ පූජාසනයක් මත පූජා වෙලා, පරවී යන්න මේ මල් වාසනාවන්ත නැහැ.

මීමැස්සන්ට නම්, මේ මල් සෙල්ලම් බඩු ගානයි, කැලෑ මලේ සුවඳේ ආශ්වාදයෙන් ගුම්, ගුම් හඬ නඟා, මීමැස්සෝ සිත්සේ රොන් උරා බොනවා. මල ගැන වගක්වත් මීමැස්සන්ට නැහැ. රොන් උරා බී සතුටු වුණ මීමැස්සෝ, ආපසු මල දෙස නොබලා ම පියාඹා යන්නේ, තමන්ගේ ම මීවදයට. මලේ රසය මීමැස්සන්ට පූජා කරලා කැලයේ කැලෑ මල්, කැලයේ ම පරවෙලා යනවා. මීමැස්සන්ගේ ආත්මාර්ථකාමී භාවය නිසාදෝ, කැලෑ මලේ පිහිටෙන් පෝෂණය කළාවූ මීවදයත් කවුරුන් හෝ මනුෂ්‍යයෙක් ඩැහැගෙන යනවා.

වනයේ වන මල් පිපෙනවා, මීමැස්සෝ මීවද බඳිනවා, මනුෂ්‍යයෝ මීවද කඩාගන්නවා, අවසානයක් නැති ගමනක්, ලෝකය ඉදිරියේ තිබෙනවා. කාලය වේගයෙන් ගලාගෙන යනවා, ලෝකය අපි ළඟ නතර කරලා.

ලෝකය අපි ඉදිරියේ නතරවී තිබෙනවාය කියලා අපිට පෙනුනත්, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා තෘෂ්ණාවේ සැඩපහර ලෝකය යටකරගෙන ගලාගෙන යනවාය කියලා. පින්වත් ඔබ ඇසෙන් ප්‍රියමනාප රූපයන් දකිද්දී, ඇස හරහා තෘෂ්ණාවේ සැඩපහර ගලාගෙන යනවා. පින්වත් ඔබ කනෙන් කැමැති, අකැමැති ශබ්දයන් අසද්දී, තෘෂ්ණාවේ සැඩ පහර කන හරහා ගලාගෙන යනවා. පින්වත් ඔබේ නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින්, කැමැති, අකැමැති දැනීම් සකස් වෙද්දී, තෘෂ්ණාවේ සැඩ පහර වේගයෙන් ඉහත ආයතනයන් හරහා ගලාගෙන යනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පින්වත් ඔබේ ආයතන හයේ ඵස්සය තුළින් ගලාගෙන යන, මේ තෘෂ්ණාවේ සැඩ පහරට පටිච්චසමුප්පන්නව භවයෙන් භවයට ඔබව ගසාගෙන යනවා.

පින්වත් ඔබ සිතනවා ඔබ ඉන්නේ සතුටෙන්ය කියලා, ඔබ සිතනවා ඔබ සිටින්නේ තෘප්තියෙන්ය කියලා, ඔබ සිතනවා ඔබ සිටින්නේ ජයග්‍රාහීවය කියලා, ඔබ සිතනවා ඔබ සිටින්නේ විනෝදයෙන්ය කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පින්වත් ඔබ, තෘෂ්ණාවේ සැඩ පහරට හසුවී කරවටක් දුක නමැති සාගරයේ ගිලී සිටින පින්වතෙක්ය කියලා.

පින්වත් ඔබ මොහොතක් ඇස් දෙක පියාගෙන දකින්න, තව මොහොතකින් පින්වත් ඔබ, කට, දිව, නහර පිනවන, රස බොජුන්, මත් වතුර සොයාගෙන යන පින්වතෙක් වෙන්න පුළුවන්, පින්වත් ඔබ තව මොහොතකින්, ලස්සන, විසිතුරු, මෝස්තර විලාසිතා සහිත ඇඳුම් පැළඳුම් ආභරණ, සොයාගෙන, සාප්පු සවාරි යන කෙනෙක් වෙන්න පුළුවන්. පින්වත් ඔබ, සති අන්තයේ විනෝදය, විවේකය, සොයාගෙන, ඈත දුරබැහැරක, යන පින්වතෙක් වෙන්න පුළුවන්. සමාවෙන්න පින්වත, ඔබ තෘෂ්ණාවේ සැඩ පහරට අසුව, ගසාගෙන යන පින්වතෙක් බවට පත්වෙලයි සිටින්නේ. ඔබ තුළ සකස් වෙන සෑම ඇලීමේ, ගැටීමේ සිතක් පාසා ම පින්වත් ඔබ තෘෂ්ණාවේ සැඩ පහර වේගවත් කොට ගන්නවා.

කාමයේ කෙටි ආස්වාදයට, රූපයේ කෙටි ආස්වාදයට, සැපය යැයි, තෘප්තිය යැයි, ජයග්‍රහණය යැයි, විනෝදය යැයි රැවටෙන මනුෂ්‍යයෝ ලන්තෑරුම් එළියේ ආලෝකයට ලොල්වී පිච්චී මියයන පළඟැටියන් මෙන් කෙටි සැපය ඉදිරියේ සතුටු වී, දුක ඉදිරියේ පසුතැවෙනවා. දුකත්, සැපත් දෙක ඉදිරියේදී ම, පින්වත් ඔබ තෘෂ්ණාවේ සැඩ පහරට ගසාගෙන යනවා.

ඇස තුළින් කන තුළින් ගලාගෙන යන තෘෂ්ණාවේ සැඩ පහර වේගවත් වෙන්න, වේගවත් වෙන්න සතර අපාය නමැති දිය සුළියේ ග්‍රහණයට ඔබ කොටු වෙන්න පුළුවන්.

කෙටි කාමයේ ආශ්වාදය, කෙටි රූපයේ ආශ්වාදය, ඔබලා හරිම, රැවටිලිකාර ධර්මතාවයන් දෙකක්. මෙය සටහන් තබන භික්ෂුව, ගිහි ජීවිතය තුළ, මේ රැවටිලිකාර ධර්මයන් දෙකට, මොනතරම් රැවටිලා තිබෙනවාද? සක්කායදිට්ඨිය, මමත්වයේ දැඩිභාවය, ආශ්වාදය ඔබේ පිය උරුමයයි. මමත්වයේ දැඩිභාවයේ පිය උරුමයෙන් ලද ජාන ශක්තිය, මගේ ලේ, මස්, සම් ඇට මිදුළු හරහා කිඳා බැස, ඔබ ඇති කළා වූ ප්‍රමාදය සුළුපටු නම් නොවේ. මට මතකයි, අතීතයේ යම් දවසක ඔබ මට කියනවා "පැවිදි වෙන්න අවශ්‍ය නැහැ, පිනට දහමට ලැදි යුවතියක් කසාද බැඳලා, ධර්මයේ හැසිරෙමු"යි කියලා. මට මතකයි තවත් දවසක ඔබ මට කියනවා, "පිනට දහමට ලැදි යුවතියක් සමග විවාහ වෙලා, දරුවෙක් හදලා, අපි දෙදෙනා ම පැවිදි වෙමු"ය කියලා. පිනට දහමට ලැදි යුවතියක්ය කියන අර්ථය, මාව ගොඩාක් තෘෂ්ණාවේ සැඩ පහරට කොටු කරන්න උත්සාහ ගත්තා.

මට මතකයි, මා පැවිදිවීම සඳහා ගෙදරින් නික්ම යන්න දින දෙක තුනකට පෙරාතුව මගේ කාමරයේ දුරකථනය උදේ අටට පමණ නාද වුණා. දුරකථනයෙන් කතා කළේ කාන්තා කටහඬක්. ඇය මා හඳුනන කාන්තාවක්. ඇය මට වසර පහකට මෙහා හමුවෙලා තිබුණෙ නැහැ. ඇය දුරකථනයෙන් එකපාරට ම යෝජනා කළා මාව හමුවෙන්න අවශ්‍යයි කියලා. මම ඇයට

ප්‍රකාශ කළා, මම පැවිදි වෙන්න තීරණය කරලයි තිබෙන්නේ කියලා. ඇය ගත් කටටම ප්‍රකාශ කළේ, ඔයාට මොළේ හොඳ නැතිද, කියලා. දැන්ම මහණවෙන්න එපා, වයසට ගිහින් මහණවෙන්න කියලා. මම ඇයට ප්‍රකාශ කළා මගේ තීරණයේ වෙනසක් නැහැය කියලා.

උතුම් පැවිදිභාවයට පත්වීම සඳහා, නිවසින් පිටවී යාමට දින දෙක තුනකට පෙරාතුව, උදේ පාන්දර අටට පමණ සෘද්ධියෙන් පැමිණි මාරදූතියක් සේ, දුරකථනයෙන් මා සොයා පැමිණි, අනුන්ගේ ඇසෙන්, මනසින් ගලා බසින තෘෂ්ණාවේ සැඩ පහරක් මා වළක්වා ගත්තේ, භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ දේශනා කොට වදාළ සංසාර බිය, සංසාර ගැඹුර තුළින් මය, ආශ්වාදයේ අනිත්‍යභාවය තුළින්මය.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ධර්මයේ නොහැසිරෙන, සංසාර බිය, කාමයන්ගේ නිසරුභාවය නොහඳුනන, නිදිමතට, විනෝදයට ලොල්වෙමින්, ආහාරයට ගිජුවෙමින්, කාලා, බීලා, විනෝදවෙලා ඒ මේ, අත පෙරළෙමින් නිදන, අනුවණ පින්වතා, අවිද්‍යාවේ අන්ධභාවය නිසාම, කැමැත්තෙන්ම මේ තෘෂ්ණාවේ සැඩ පහරට බිලිවී, නැවත, නැවත මව් කුසවලට ගොඩගසනවාය කියලා.

මෙය සටහන් තබන භික්ෂුව, ඇස් දෙක පියාගෙන මොහොතක් දකිනවා, ඇස තුළින් දැක්කාවූ කැමැති, අකැමැති රූපයන් නිසා මනස තුළින් ගලා බසින තෘෂ්ණාවේ සැඩ පහර, පටිච්චසමුප්පන්නව මව් කුසවල් ලක්ෂ කීයකට නම් ගොඩගසන්නට ඇතිද කියලා. ඕපපාතික උපත්, ලක්ෂ කීයකට ගොඩගසන්නට ඇතිද කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහණෙනි, ඔබට පෙනෙන ඔය ජලයෙන් පිරුණු, මහා සාගරය කියන්නේ, සාගරයක් නොවේය කියලා. ඔය මහා සාගරය කියන්නේ, ජල කඳක් පමණක්මය කියලා. ඔය ජල කඳට සීමාවක්, මායිමක්,

අවසානයක් තිබෙනවා. නමුත් ඇසේ ඵස්සය නිසා, කනේ, දිවේ, නාසයේ, මනසේ ශරීරයේ ඵස්සය නිසා, සකස් වෙන තෘෂ්ණාවේ මහා සැඩ පහර, අතීතයේ, කල්ප විනාශයන් දස දහස් ගණනක්, පසු කොට ගෙන, සීමාවක්, මායිමක්, අවසානයක් නොමැතිව පටිච්චසමුප්පන්නව ගලාගෙන ඇවිත් තිබෙනවා.

විඤ්ඤාණය නමැති මැජික්කරුවා, උපාදානය නමැති සුදු හුණු කැටයෙන්, භවය නමැති කළුලෑල්ලේ, සංස්කාර නමැති පුළුන් කොට්ටයෙන් මක, මකා, සිතුවම් කළා වූ අලුත්, අලුත්, මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම, සතර අපා, සත්ව රූපවල, විවිධත්වය හිමිකාරිත්වය, පින්වත් ඔබ නුවණින් මෙනෙහි කොට දැකීමට දක්ෂ වෙන්න.

විඤ්ඤාණය නමැති මැජික්කරුවා සුදු හුණු කැටයත්, කළු ලෑල්ලත්, පුළුන් කොට්ටයත් උපයෝගී කොට ගෙන භව ගමනේ මෙතෙක් කර ගෙන පැමිණි ඇඟ කිලිපොලා යන අති බිහිසුණු සූක්ෂම මේ මැජික් සූදුව, පින්වත් ඔබ වර්තමානයේත් නොදකින්නේ, අවිද්‍යාවේ අඳුර නිසා මය. දැනුමට, බුද්ධියට, පළපුරුද්දට හසු නොවන මේසා සාහසික භව දුකක්, පටිච්චසමුප්පන්නව පින්වත් ඔබට උරුම කොට දුන්, විඤ්ඤාණය නමැති සූක්ෂම මැජික්කරුවා, පෝෂණය කරන, අවිද්‍යා අඳුරේ සැඟවී පින්වත් ඔබට මුකුළු කරන, සංස්කාර නමැති අසත්පුරුෂ රූපසුන්දරියගේ, අසත්පුරුෂ භාවයත්, සුන්දරත්වයත් යන දෙක ම තෘෂ්ණාවේ සැඩ පහර වේගවත් කොට දෙන එකම කාසියේ දෙපැත්ත බව, පින්වත් ඔබ ධර්මානුකූලව දකින්න.

මේ සටහන ලියන දැන් වේලාව සවස පහට පමණ ඇති. පරිසරය හොඳටෝම නිහඬයි, සප්ත බොජ්ඣංග ධර්මයන් පැලපදියම් වූ භික්ෂුවගේ සිතත්, පරිසරයේ නිහඬභාවයත් එකතු වූ තැන, පරිසරයත් භික්ෂුවගේ ජීවිතයත්, එකක් බවට පත් වෙනවා.

විවේකය හරිම ගාම්භීර ධර්මයේ අත්දැකීම් ජීවිතයට එකතු කොට දෙනවා, ආධ්‍යාත්මික සහ බාහිර සතර මහා ධාතුව එක ගොඩකටත්, විඤ්ඤාණය සහ ආයුෂය තව ගොඩකටත් දමලා, භික්ෂුව මොහොතක් පංචඋපාදානස්කන්ධ ලෝකයෙන් නිදහස් වෙනවා. මේ නිදහස තාවකාලිකව ලෝකයෙන් මිදුණා වූ නිදහසක්. විඤ්ඤාණය නමැති මැජික්කරුවාට, රූපයට බැස ගැනීමට තිබෙන නිදහස තාවකාලිකව ඇහිරුවා වූ නිදහසක්. පංචඋපාදානස්කන්ධ ලෝකය, මොහොතක් අක්‍රීය කළා වූ නිදහසක්.

භික්ෂුව නැවතත් ජීවිතයට ගොඩ වෙනවා, පරිසරයේ නිහඬභාවය නැති වෙලා, ආයෙමත් වේගයෙන් සුළං හමනවා, සතරමහා ධාතුව අනිත්‍යභාවයට පත් වෙන වේගය, නුවණින් දකින්න, ප්‍රඥාවේ විනිවිදභාවය අත්‍යවශ්‍ය ම වෙනවා. එතෙක් අපි සතරමහා ධාතුවේ අනිත්‍යභාවය ඉදිරියේ, සතරමහා ධාතුවේ ම උපකාරයෙන් සකස් වෙන, පංචඋපාදානස්කන්ධ ලෝකය නමැති, තෘෂ්ණාවේ සැඩ පහර, වේගවත් කොට ගන්නවා. තෘෂ්ණාවේ සැඩ පහරට හසුවී පටිච්චසමුප්පන්නව ගසා ගෙන යන, පින්වත් ඔබේත්, මගේත් භව ගමන, වළක්වා ගැනීමට ඇති එකම ධර්මානුකූල මාර්ගය, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පෝෂණය වූ, සතරසතිපට්ඨාන ධර්මයන් කෙරෙහි මනාව පිහිටුවා ගත් සිහිය යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පෝෂණය වූ සතර සතිපට්ඨාන ධර්මයන් කෙරෙහි, මනාව සිහිය පිහිටුවා නොගැනීම නිසා ම, මනුෂ්‍යයාගේ ඇසෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින්, ගලාබසින තෘෂ්ණාවේ සැඩ පහරේ වේගය තුළින්, මතු කොට දී තිබෙන, සමාජ විකෘතිය, සමස්ත සමාජය ම, විසඳුමක් පෙනෙනතෙක් මානයක වත් නොපෙනෙන ප්‍රශ්නාර්ථයක් බවට පත්කොට තිබෙනවා.

දැනුම තේරුම තිබෙන බුද්ධිමතුන්, සමාජය වෙලාගෙන තිබෙන මේ ධර්මානුකූල ප්‍රශ්නාවලියට බොහෝම සුන්දර, අධර්මානුකූල හේතු දක්වනවා, කෙනෙක් කියනවා, ආණ්ඩුව වෙනස් විය යුතුය කියලා, තව කෙනෙක් කියනවා ව්‍යවස්ථාව වෙනස් කළ යුතුය කියලා, තවත් කෙනෙක් කියනවා දෙවියෝ කෝපවෙලාය කියලා, තව කෙනෙක් කියනවා රටේ ග්‍රහචාරය හොඳ නැහැය කියලා, තවත් සමහර පින්වතුන්, රටේ සිටින අයගේ පින් මදිය කියලා, දිව්‍ය තලවල සිටින පින්වත් දෙවියන්ට අපේ රටේ අම්මලාගේ මවුකුසවල පිළිසිඳ ගන්න කියලා අධිෂ්ඨාන පූජා තියනවා. ප්‍රශ්නයට විසඳුම් වශයෙන්, දක්වන හේතු දෝරේ ගලාගෙන යනවා, නමුත් ප්‍රශ්නයට සැබෑම ධර්මානුකූල හේතුව වන, මනුෂ්‍යයාගේ ඇසෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින් ගලා බසින තෘෂ්ණාවේ වේගවත් සැඩ පහර, ප්‍රශ්නයට සුන්දර විසඳුම් ඉදිරිපත් කරන ගෞරවණීය පින්වතුන්ලාත් යටකරගෙන ම, හැමෝගේම ඇස් වසා තව තවත් දුක දෙසට ම, අනතුර දෙසට ම ගලාගෙන යනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සත්ත්වයාට ඇති, ලොකුම බිය, ජරා, ව්‍යාධි, මරණ, බියයි කියලා, ජරා, ව්‍යාධි, මරණ බිය ඉදිරියේ, ජීවිතයේ කොනක් ධර්මයේ ගැටගහලා මරණ බියට, රෝග බියට, බලාපොරොත්තු බිඳවැටීමේ බියට, ධන හානි, ව්‍යාපාරික හානි, බියට, පමණක් ධර්මයේ පිළිසරණ සොයන පින්වතුන්, සද්ධර්මයේ උතුම් සැපය ලැබීම උදෙසා, අර්ථවත්ව ජීවිතයට බැඳ දැමිය යුතු, දුක ඇතිකරන, තෘෂ්ණාවේ රැහැන්පට අසිහියෙන්ම ජීවිතයෙන් ලිහා දමනවා.

තෘෂ්ණාවේ රැහැන් පට ජීවිතයෙන් ලිහා දැමූ කල, නිදැල්ලේ රූප, වේදනා, සඤ්ඤාවන් සොයා ගෙන යන ජීවිතය, බොහෝම වේගවත් වෙනවා. මේ වේගය සමාජගත වෙන්නේ, ජනතාවගේ ජාතික, ආගමික, විශ්වාසයන් තුළින් පෝෂණය වුණ, සියලුම සමාජ සාරධර්මයන්, විකෘති කරමින්. ඒ වගේමයි, ස්වාභාවික

පරිසරය, ස්වාභාවික සම්පත් අවිචාරයෙන් විනාශකොට දමමින්, උතුම් සාරධර්මයන්ගේ, ස්වාභාවික පරිසරයේ, වටිනාකම තබා මේ බුද්ධෝත්පාද කාලයක, තමන් ලැබූ උතුම් මනුෂ්‍ය ජීවිතයේ වටිනාකමවත්, නොහඳුනන පින්වත් මනුෂ්‍යයෝ, වර්තමානයේ, ස්වාභාවිකත්වය මරා දැමූ, අස්වාභාවික කෘත්‍රිම ලෝකයක්, මහ පොළව මත නිර්මාණය කරමින් පවතිනවා.

ස්වභාවධර්මය මරාගෙන, ඉදිවෙන මේ අස්වාභාවික, කෘත්‍රිම ලෝකයේ, අස්වාභාවික මනුෂ්‍යයෙක් වීම සඳහා, සුදුසුකම් ලැබීමට, ලොකු තරඟයක්, සමාජය තුළ ඇතිවෙලා තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන, විභාග පැවැත්වීමේ පෙරේතකම, තරගකාරිත්වය තුළ මේ නිර්මාණය වෙමින් පවතින, අස්වාභාවික කෘත්‍රිම ලෝකයේ, අස්වාභාවික මනුෂ්‍යයෙක් වීම සඳහා පින්වත් ඔබ දක්වන උනන්දුව හොඳින්ම ප්‍රකට වෙනවා.

මුදල් මුල්කොට ගත්, කාමච්ඡන්දයන් මුල්කොට ගත්, සාරධර්මයන් නොතකන, විනය වඳ බැහැපු, මේ ඉදිවෙන අස්වාභාවික කෘත්‍රිම ලෝකයේ, ජීවත් වෙන පින්වතුන්, ධර්මය, අධර්මයෙන් වසා දමනවා. උතුම් චතුරාර්ය සත්‍යය ධර්මයන්ට දෙන්නේ නවීකරණය කරපු අර්ථයන්, දුකට හේතුව තෘෂ්ණාව කියලා මේ පින්වතුන් පිළිගන්නේ නැහැ. එම පින්වතුන් කියන්නේ, දුකට හේතුව සල්ලි නැති වීම කියලා, දුකට හේතුව, ස්වයං පාලනය නොදීමය කියලා, දුකට හේතුව, සමලිංගික සේවනය, ගබ්සාව නීතිගත නොකිරීමය කියලා, දුකට හේතුව, කාන්තාවන්ට නිදහසේ මත් වතුර මිලදී ගැනීමට අවසර නොදීමය කියලා, දුකට හේතුව, විකෘතියෙන්ම නවීකරණය කරනවා.

තෘෂ්ණාවේ සැඩ පහරට හසුව, මොළය සෝදාගත් පින්වත් මනුෂ්‍යයෙක්ගෙන් ඇසුවොත්, ආර්යඅෂ්ටාංගික මාර්ගයේ ඇති වැදගත් කම කුමක්ද කියලා, එම පින්වතා පිළිතුරු දෙන්නේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මොන වැදගත් කමක්ද, ඊට වඩා

අධිවේගී මාර්ගය වටිනවා, මාතරට පැයෙන් යන්න පුළුවන්ය කියලා. මේ අස්වාභාවික කෘත්‍රිම ලෝකයේ ජීවත් වෙන පින්වතුන්, ජීවිතයෙන් වේගයක් මයි සොයන්නේ, මෙවැනි පින්වතුන්ලාට මේ උතුම් ශ්‍රී සද්ධර්මය හරිම හිසරදයක්, පංචශීලය ගැන කියන්නේ නැති, අකුසල් මූලයන් ගැන කියන්නේ නැති, නැවත පටිච්චසමුප්පන්න උපතක් ගැන කියන්නේ නැති, මාර ධර්මයන් සරණ යන්නයි මේ පින්වතුන්ලා සැදී පැහැදී සිටින්නේ, මේ අය, ආස්වාදය පසුපසම හඹා යමින්, මොනතරම් වෙහෙස වෙලා, යමක් ලබාගත්තත්, ඒ ලබන්නේ පරණ අත්දැකීමක් මයි.

ඒ නිසාම, ජීවිතයේ තෘප්තියක් නැහැ. අතෘප්තියෙන් ආයෙමත් සොයනවා, ජීවිතවලට කිසිම විවේකයක් නැහැ. සති අන්තයේ නිවාඩුවක් ලැබුණොත්, විනෝදය සොයන්න යනවා, සෙවීමේ ඉවරයකුත් නැති, මෙතෙක් සොයා ගත්ත දෙයකුත් නැති, ජීවිතය, තෘෂ්ණාවේ සැඩ පහරට හසුවී, පැද්දි, පැද්දී දුක දෙසටම ගලා ගෙන යනවා, ඵස්සය අසල සැඟවී, අකුසලයට එබිකම් කරන තෘෂ්ණාව, පින්වත් ඔබේ අසිහියෙන් උපරිම ප්‍රයෝජනය අරගෙන, විඤ්ඤාණය නමැති මැජික්කරුවාට පෝෂණය වීමට ඇති තරම් සංස්කාර නැවත නැවත එකතු කොට දෙනවා.

# උතුම් බුදුගුණයන් නොවන්නට මම අද කොහේදැයි සිතුවාද?

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, තෙරුවන් සරණ ගිය පින්වතෙක්, පින්වතියක්, බහුල වශයෙන් වාසය කළ යුතු විහරණය, බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, සිහිකිරීමය කියලා. මෙය සටහන් තබන භික්ෂුවට, නිරතුරුව ම බුදු ගුණයන් සිහිපත් වෙනවා. අපට කවදාකවත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් සතු උතුම් බුදුගුණයන් ඇති කොට ගන්න බැහැ. බුදුගුණයන්, බුදුරජාණන් වහන්සේලාට පමණක් සාධාරණ වූ ගුණයන්. භික්ෂුවගේ, භික්ෂු ජීවිතය සිහිපත් වෙද්දී, භික්ෂුවට මතකයට නැගෙන්නේ, බුදුරජාණන් වහන්සේගේ උතුම් බුදුගුණයන්. ඒ උතුම් බුදුගුණයන් නොවෙන්න, භික්ෂුව මේ මොහොතේ කර්මය කර්මඵල නොහඳුනන, මිථ්‍යා දෘෂ්ටික මනුස්සයෙක්. පින්වත් ඔබේ, සම්මාදිට්ඨියේ අර්ථයන් ගෙන් පෝෂණය කොට ගන්නා, ජීවිත දෙස බලන්න, ඔබේ ගෞරවණීය ජීවිතය, බුදුගුණයක ඵලයක් මයි.

බුදුරජාණන් වහන්සේ සතු උතුම් මහා කරුණා ගුණයේ, ශක්තිය මයි, අපගේ ජීවිත සම්මාදිට්ඨියේ අර්ථයන් ගෙන් ආලෝකවත් කළේ. බුදුරජාණන් වහන්සේගේ ශක්තිය විශ්වය තුළ පැතිරිලා තිබෙනවාය කියලා සඳහන් වෙන්නේ, මේ භවාත්‍රය තුළ ජීවත්වන සම්මාදිට්ඨියෙන් දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම, ප්‍රජාව මේ බුදුගුණයන්ගේ අසිරිමත් භාවය තම ජීවිතය තුළින් දරා ගැනීම නිසා මය.

අපි උතුම් බුදුගුණයන්ගේ රැකවරණයෙන් බැහැර වන තරමට, උතුම් බුදුගුණයන් විශ්වයෙන් අතුරුදන් වී යනවා. තමා තුළින් තම ධර්මයේ ගුණයන් දරා ගැනීමේ ඕපනයික ගුණයේ ශක්තියයි, උතුම් බුදුගුණයන් ලෝකයම ආරක්ෂා කොට තබන්නේ. පරිසරය දෙස බැලුවත්, මනුෂ්‍ය ප්‍රජාව, තිරිසන් ප්‍රජාව දෙස බැලුවත් මේ සෑම දෙයක් තුළින්ම භික්ෂුව දකින්නේ උතුම් බුදුගුණයන්ගේ අසිරිමත් ඵලයක් මයි. පින්වත් ඔබට උතුම් සද්ධර්මය මුණනොගැසී, මිථ්‍යාදෘෂ්ටික භාවයට පත් වුණා නම්, මේ සතා සිවුපාවා, මනුෂ්‍යයා, පරිසරය, මොන තරම් නම් ලෝභ, ද්වේෂ මෝහයන් ගේ විකෘතියක් වෙන්න තිබුණාද? කැලයේ සතා සිවුපාවා යම් තරමකින් හෝ තවමත් නිදැල්ලේ හැසිරෙන්නේ යම් පමණකට හෝ නියමිත කාලවල වැසිවැටී මහ පොළොව කාන්තාරයක් නොවීමේ, භාග්‍යය අපි ලබලා තිබෙන්නේ බුදුගුණයන් කෙරෙහි අපි දක්වන්නා වූ කෘතවේදී භාවය නිසාමයි.

මනුෂ්‍ය සමාජය තුළ ශීලාචාර සදාචාරාත්මක ධර්මයන් යම් පමණකට හෝ ආරක්ෂා වී තිබෙන්නේ, උතුම් බුදුගුණයන් තුළින් සමාජය ලැබූ ශික්ෂණය නිසා මය. පින්වත් ඔබගේ දෑසට, සවනට, මනසට, අරමුණු වන සෑම යහපත් සිතුවිල්ලක් ම, බුදුගුණයන් කෙරෙහි විශ්වාසයෙන්, මනුෂ්‍යයා තුළ ඇති වූ ධර්මානුකූල ශික්ෂණයේ ඵලයක් ය. පින්වත් ඔබ, ජීවත් වීමේදී අත්දකින සෑම අහිතවත්, අසංවර දෙයක් ම බුදුගුණයන් කෙරෙහි විශ්වාසයෙන් බැහැර වූ, මිථ්‍යාදෘෂ්ටික භාවයේ ම ඵලයක් ය. භික්ෂුව පින්වත් ඔබට, මේ සටහන තබන වේලාවේ, භික්ෂුව තුළ පින්වත් ඔබ කෙරෙහි ඇතිවන ආර්ය මෛත්‍රියේ සිතුවිලි, උතුම් බුදුගුණය සරණ යෑමෙන් උපන් භික්ෂුවගේ ධර්මානුධර්ම ප්‍රතිපදාවේ ශක්තියයි.

බුදුගුණයකින් තොරව සම්මාදිට්ඨියෙන් තොර යහපත් දෙයක්, සිල්වත් දෙයක්, මෛත්‍රීසහගත දෙයක්, කුසල් ධර්මයක්, සුගතියක් භව නිරෝධයක් භික්ෂුව නොදකියි. භාග්‍යවතුන්

වහන්ස, ඔබ වහන්සේගේ උතුම් බුදුගුණයත්, සම්මාදිට්ඨියට පත් ප්‍රජාව, විශ්වාසයෙන්, ගෞරවයෙන්, ජීවිතවලට එකතු කොට ගන්නා තෙක් ම, බුදුගුණය විශ්වය තුළ ජීවමානව පවතිනු ඇත. කවදා හෝ දවසක උතුම් බුදුගුණයන් මේ විශ්වයෙන් අතුරුදන් කොට දමන්නේ, අජීවී සතර මහා ධාතුව නොව, සජීවී උතුම් බුදුගුණයන් සරණ නොයන අපි විසින් මය. අජීවී විශ්වය තුළ කොතැනක වත්, බුදුගුණයක් නැත. උතුම් සම්මාදිට්ඨියට පත් ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරන පින්වත් ඔබ, ඔබගේ ජීවිත තුළින් මයි, උතුම් බුදුගුණයන් ඊළඟ පරම්පරාවට දායාද කොට දිය යුත්තේ.

භික්ෂුව මේ සටහන ලියන මොහොතේ, ආශ්වාස ප්‍රශ්වාස කරන වාතය, ආලෝකය ලබන හිරු එළිය, දෙපා තබා ගෙන සිටින මහපොළොව, පිපාසය සංසිඳවන දිය දෝත, කුසගින්න සංසිඳවන පිණ්ඩපාතය නමැති සතර මහා ධාතුව, සාරා සංඛ්‍ය කල්ප ලක්ෂ ගණනාවක්, අපට විමුක්ති මාර්ගය මතු කොට දීම උදෙසා, දස පාරමී ධර්මයන් පිරූ ගෞතම බෝධිසත්වයන් වහන්සේගේ, පටිච්චසමුප්පන්න රුධිරයෙන්, කඳුළින්, දහදියෙන්, ශරීර මාංශයෙන් මොන තරම් නම් පෝෂණය වෙලා ඇතිද?. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තමන් සතු උතුම් බුදුගුණයන් සම්මා දිට්ඨියට පත් අපගේ ලේ මස්, සම්, ඇට, නහරවැල් තුළට ළං කොට දක්වා තිබුණත්, අපි තවමත් බුදුරජාණන් වහන්සේ, අපිට ගොඩක් ඈතින් තබා තිබෙනවා. මෙය සටහන් තබන භික්ෂුව, යම් දවසක උතුම් පැවිදි භාවයට පත්වුණාද, භික්ෂුව තමන්ගේ පැවිදි ජීවිතය දැක්කේ උතුම් බුදුගුණයන්, ගෞරවයෙන් විශ්වාස කිරීම තුළින් ලැබූ ඵලයක් ලෙසින් මය.

"භාග්‍යවතුන් වහන්ස, මාගේ මේ භික්ෂු ජීවිතයේ අයිතිය ඔබවහන්සේට මය. භාග්‍යවතුන් වහන්සේ මට දුන් භික්ෂු ජීවිතය, ඔබ වහන්සේ භික්ෂුවක ගෙන් බලාපොරොත්තු වූ භව

නිරෝධය උදෙසා ජීවිත පරිත්‍යාගයෙන් කැප කරමි" කියන අධිෂ්ඨානය පමණයි, මා ගිහි ජීවිතය හැරගිය දවසේ මා තුළ තිබූ ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන්ගෙන් තොර එකම අරමුණ වුණේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ උතුම් බුදුගුණයන් තුළින්, ජීවිතවලට ලබා දෙන අයෝමය මහා කරුණා ගුණයේ ශක්තිය, අපේ ලේ, මස්, සම්, ඇට නහරවැල් තුළින් මතු කොට දකිද්දී, මේ ලෝක ධාතුව තුළ තිබෙන අර්ථවත් ම බුද්ධ පූජාව, තමා තුළින් බුදුරජාණන් වහන්සේ බලාපොරොත්තු වූ විමුක්තිය සාක්ෂාත් කොට ගැනීම පමණක් මයි කියලා දකිනවා.

මේ උතුම් දැක්ම සතර අගතියෙන් තොර දැක්මක්. මේ දැක්ම සතර අගතියෙන් තොර දැක්මක් බවට පත් කොට දෙන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශක්තිමත් භාවය තුළින් පෝෂණය වූ සතර සතිපට්ඨාන ධර්මයන් සහ එම සතර සතිපට්ඨාන ධර්මයන් තුළින් ශක්තිමත් කොට ගන්නා සප්තබොජ්ඣංග ධර්මයන් විසින් මය. මෙතනදී බුදුරජාණන් වහන්සේ සතර අගතියෙන් තොරව කියලා දේශනා කොට ඇත්තේ, පළමුවැනි කාරණය ඡන්දය ඒ කියන්නේ කැමැත්ත.

බුදුරජාණන් වහන්සේ උදෙසා සැබෑම, අර්ථවත්ම, බුද්ධ පූජාවක් ලෙස තම ජීවිතය පූජා කරන භික්ෂුවක්, එය සිදුකළ යුත්තේ ලාභ සත්කාර, කීර්ති, ප්‍රශංසා, ජනප්‍රිය භාවයන්, සශ්‍රීක සිවුපසය, කෙරෙහි කැමැත්තකින් තොරව මය. මේ ශක්තිය ලබා ගැනීම උදෙසා භික්ෂුවකට උපකාරක ධර්මයන් සකස් කොට, දෙන්නේ, තමන් ප්‍රගුණ කළ කායානුපස්සනාවයි.

ජාති, ජරා, ව්‍යාධි, මරණයන්ට තෝතැන්නක් වූ මේ ජීවිතයට, මරණයට අත වනන මේ ජීවිතයට ලේ, සෙම්, සොටු, සැරව, මුත්‍රා, අසූචි කළගෙඩියක් වූ මේ රූපයට, කුමන ලාභ සත්කාරයක් ද?. කුමන කීර්ති ප්‍රශංසාවක්ද?. තමා තුළින් රූපයේ අනිත්‍යභාවය දකිමින්, රූපය තවත් පටිච්චසමුප්පන්න රූපයක් උපද්දවා ගැනීම උදෙසා නොව, රූපය රූපයේ නිරෝධය

උදෙසා ම යොමු කර ගන්නවා. ලාභසත්කාර, කීර්ති ප්‍රශංසා එම භික්ෂුව වේදනානුපස්සනාවෙන් දමනය කොට ගෙන සැප වේදනාවන්ගේ අනිත්‍යභාවය දකිනවා.

සතර අගතියට අයත් දෙවැනි අර්ථය තමයි ද්වේශයෙන් තොරවීම. භික්ෂුවක් අර්ථවත්ව බුදුරජාණන් වහන්සේට බුද්ධ පූජාවක් ලෙස තම ජීවිතය පූජා කරන්නේ ද්වේශයෙන් තොරව මයි. වේදනානුපස්සනාවට අදාළව සැප, දුක් විඳීම් වල අනිත්‍යභාවය දකිමින්, එම භික්ෂුව ද්වේශය සියුම් කරනවා, ද්වේශය සකස් කොට දෙන, සැප දුක් වේදනාවන් අතීත සංස්කාරයන්ගේ ම පටිච්චසමුප්පන්න ඵලයක් බව දකිමින්, හේතුඵල ධර්මයන්ට අදාළව එම භික්ෂුව ද්වේශය සියුම් කොට ධර්මයේ උපේක්ෂාවට සිත ගන්නවා. වර්තමානයේ ද්වේශයට හේතු වන, සංසාරයේ තමන්ම පටිච්චසමුප්පන්නව සිදුකළ වැරදිවලට තමා තමාගෙන් පළිගන්නේ නැහැ. එම භික්ෂුව දන්නවා, ද්වේශය කියන්නේ, තමා තමාගෙන් ම පළිගැනීමක් ය කියලා. ද්වේශය අදාළ සෑම සිතුවිල්ලක් ම භික්ෂුව චිත්තානුපස්සනාවට යොමු කරනවා. භික්ෂුව තුළ සකස්වන අපායගාමී නොවන සියුම් ද්වේශය, දැන් එම භික්ෂුවට ද්වේශය නිරෝධය කිරීමේ කමටහනක් බවටයි පත් වන්නේ.

සතර අගතියට අයත් තුන්වැනි කාරණය වෙන්නේ, එම භික්ෂුව භයෙන් තොරවයි හැසිරෙන්නේ. බිය රහිතව ජීවත්වන භික්ෂුවක්. බිය කියන කාරණය භික්ෂුව දන්නවා, අනිත්‍ය වූ සිතක් ය කියලා. බුදුරජාණන් වහන්සේ උදෙසා අර්ථවත් ම බුද්ධ පූජාවක් හැටියට ජීවිතය පූජා කරන භික්ෂුව එම පූජාව සිදු කළ යුත්තේ භයෙන් තොරව මයි. බුදුරජාණන් වහන්සේ නමැති අයෝමය ශක්තිය ඉදිරියේ එම භික්ෂුවට බිය අනිත්‍ය වූ පංච උපාදානස්කන්ධයක් පමණක් මයි. තමා තුළ වැඩෙන ආර්ය ශීලය, ආර්ය මෛත්‍රිය, තමා තුළින් බිය බැහැර කරනවා.

# රැකියාවේ යුතුකම, වගකීම භවයටම වැටුප තීරණය කරනු ඇත

මේ ලිපිය පින්වත් ඔබට සටහන් තබන්නේ නොවැම්බර් 26 වැනිදා. වේලාව සවස පහට විතර ඇති. කුටියට යාබද කැලෑ තීරයට එපිටින් පිහිටි වෙල් යායේ, නිරතුරුව ම ගැවසෙන මීහරක් රංචුව පාලනය කරන ගොපලු දරුවාගේ කටහඬ භික්ෂුවට හොඳින් ඇසෙනවා. මීහරක් රංචුව හැසිරවීමේදී ගොපලු දරුවා, භාවිත කරන්නේ අමුතුම භාෂාවක්. විවිධ ශබ්ද නඟමින්, ඔහු මීහරකුන් තමන්ට අවශ්‍ය දිශාවට යොමු කරනවා. අහිංසක ගොපලු දරුවාගේ මුවින් නික්මෙන හඬ ඇසෙද්දී ඒ හඬ භික්ෂුවට ඇසෙන්නේ මීහරකෙක්ගේ අඳෝනාවක් වගේ මයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ, 'තෘෂ්ණා පච්චයා උපාදානං' කියන ධර්මතාවයේ ඒහිපස්සික ගුණයයි, භික්ෂුව එම ගොපලු දරුවා තුළින් දකින්නේ. තම ජීවිකාව උදෙසා මීහරක් රංචුව තෘෂ්ණාවෙන් උපාදානය කොටගත් නිසාම, එම සත්ත්ව උපාදානයන්ට අදාළව එම රූප ගුණ සහිත චේතනාවන්ගෙන් ජීවිතය බැඳී යනවා. යම් හෙයකින්, මේ ගොපලු දරුවා, මරණාසන්න මොහොතේ මීහරක් සත්ත්ව උපාදානයට බැඳී ගියොත් ධර්මානුකූලව ඊළඟ පටිච්චසමුප්පන්න ජීවිතය, මීහරකෙක් ව ඉපදෙන්න හොඳටම ඉඩ තිබෙනවා. නිරතුරුව ම කුටිය අවට තණකොළ බුදින්න පැමිණෙන මීහරක් දකිද්දී භික්ෂුවට සිතෙන්නේ, මේ මීහරක් පෙර ජීවිතවල, අනුන්ට

ගොඩක් ණය වෙලා තිබෙනවා. ණය අරගෙන එම ණය නොගෙවා හැරලා තිබෙනවා. ණය අරගෙන වංචාවන් කරලා තිබෙනවා. දරුවෙක් තම දෙමාපියන්ට ධර්මානුකූලව යුතුකම් ඉටු කරන්නේ නැත්නම්, තමන් ඉපදුණු රටට, ජාතියට, ආගමට යම් පින්වතෙක් ධර්මානුකූලව, යුතුකම් ඉටු කරන්නේ නැතිනම් අපි ණයකාරයෝ වෙනවා.

වර්තමාන සමාජයේ තම යුතුකම් ඉටු කරලා, ණයෙන් මිදෙන පින්වතුන්ලාට වඩා තම යුතුකම් වගකීම් පැහැර ඇරලා, ලෝකයට පෙරළා ණය වෙන පිරිස ඉතාමත් වැඩියි. අපි ලෝකයෙන් යුතුකම් අකුරට බලාපොරොත්තු වුණත්, පෙරළා යුතුකම් ඉටුකිරීමේදී අපි හුඟක්ම දුර්වල වෙනවා. පසුගිය දවසක භික්ෂුවට පිණ්ඩපාතය බෙදන්න වැඩිහිටි පාසල් දරුවෙක් පැමිණියා. එම දරුවාගේ කොණ්ඩය අවශ්‍ය ප්‍රමාණයට වඩා හුඟාක් වැවිලයි තිබුණේ. භික්ෂුව එම දරුවාගේ පියාගෙන් විමසුවා, ඇයි මේ දරුවා කොණ්ඩේ වවාගෙන සිටින්නේ කියලා. එවිට එම පින්වත් පියා කියනවා, දැන් කාලයේ ළමයි තම හිසකෙස් වැඩිපුර වවනවාය කියලා. භික්ෂුව එම තාත්තාගෙන් විමසුවා දරුවන්ට හිසකෙස් අනවශ්‍ය ලෙස, සකස් කොට ගෙන පාසලට එන්න අවසර දෙනවද කියලා. එම තාත්තා කියනවා දැන් විදුහල්පතිවරුන් දරුවන්ට බයයි. එම නිසා පාසලෙන් අවශ්‍ය අවවාදයන් ලැබෙන්නේ නැහැය කියලා.

අනාගත පරම්පරාව විනයගරුක භාවයට පත් කරන, දරුවෙක්ගෙ දෙවැනි අම්මා වෙන්නේ, පාසලේ විදුහල්පතිතුමා සහ ගෞරවනීය ගුරු මණ්ඩලයයි. දස මසක් කුසේ දරාගෙන ලොවට බිහිකළ දරුවෙක්, පළමු අම්මා විසින් පෝෂණය කරන්නේ රුධිරය කිරි බවට පත් කරලා. මවකගේ මෛත්‍රී, කරුණා, මුදිතා උපේක්ෂා ගුණයන්ට පුලුවන් රතු රුධිරය සුදු පැහැති මවුකිරි බවට පත් කරන්න.

පාසල් ජීවිතය, යහපත් විනයගරුක පුරවැසියෙක් සමාජගත කළ යුතු වුවත්, වර්තමානයේ කුමක් ද සිද්ධ වෙන්නේ. දරුවෙක්ගේ දෙවැනි අම්මා වන පාසල විසින් සමහරක් ගුරුතුමන්ලාගේ වගකීම් පැහැර හැරීම විසින්, දෙවැනි අම්මා දරුවන්ට පොවන අධ්‍යාපනය නමැති මවුකිර, කාමච්ඡන්දයන්ගෙන් බියෙන්, සැකයෙන්, අවිනයෙන්, පංචනීවරණ ධර්මයන්ගෙන් ම පෝෂණය වෙලා. ඒ නිසාම ධර්මානුකූල හේතුඵල ධර්මයන් නොදන්නා භාවයෙන් සමහරක් පාසල් බලධාරීන්, ජාතියේම ඝාතකාරයන් බවට පත් වීමේ ධර්මානුකූල අනතුරේ කොටස්කරුවන් දිශාවට ගමන් කරනවා.

පාසල් පද්ධතියේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීමේ, වැඩිම වගකීම තිබෙන්නේ දරුවන්ගේ දෙමාපියන්ට. භික්ෂුව මේ මොහොතේ වැඩ සිටින ගම්මානයේ තිබෙනවා, දරුවන් සියයක් පමණ අධ්‍යාපනය ලබන පාසලක්, මෙම පාසලට සහ දරුවන්ට ආදරෙන් හිටපු විදුහල්පතිතුමා, දැන් පාසලේ නැහැ. පාසල් කාලයේදී දරුවෙකුගේ වරදකට පහරක් ගැසුවාය කියලා, දරුවාගේ දෙමාපියන් අදාළ බලධාරීන්ට පැමිණිලි කරලා, එම පාසලට ආදරය කළ විදුහල්පතිතුමා වෙනත් පාසලකට මාරු කරලා. භික්ෂුවට හොඳටෝම විශ්වාසයි. දරුවන්ට, දෙමාපියන්ට පාසලට, ආදරය කරපු එම විදුහල්පතිතුමා වර්තමානයේ මේ සියල්ලටම ද්වේශ කරනවාය කියලා. අනාගතයට දැනුමෙන්, තාක්ෂණයෙන්, විනයෙන් පෝෂණය වෙන සමාජයක් බිහිකරන ගුරුවරයා නමැති දෙවැනි අම්මාගේ ගුණාත්මකභාවය ඇති කොට ගැනීමේ වගකීම, පින්වත් දෙමාපියන් සිහිනුවණින් තේරුම් ගන්න ඕනේ. ගම්වල, නගරවල දෙමාපියන්ගේ පුලුවන්කාරකම් ගුරු වෘත්තියේ ආත්ම ගරුත්වයට ඇඟිලි ගැසීම සුදුසු නැහැ.

යම් පින්වතෙක් ලබන්නා වූ ආදායම කියන්නේ, වැටුප කියන්නේ, හේතුඵල ධර්මයක්. අතීතයේ අපි දුන්න දෙයයි වර්තමානයේ අපි ලබන්නේ. එක් පින්වතෙකුට දෝත පුරා

පිරී ඉතිරී යන්න ලැබෙනවා. තවත් පින්වතෙකුට එක අතක් පිරෙන්න පමණයි ලැබෙන්නේ. තවත් පින්වතෙකුගේ දෑත් දෙකම හිස් වෙලා තිබෙන්නේ. කාටවත් අසාධාරණයක් වෙලා නැහැ. අතීතයේ දුන්න දෙය ලැබෙනවා. පින්වතෙක් සිටිනවා, ඔහු අවුරුද්දට එකම වතාවක් පමණයි. දානයක් පූජා කරන්නේ. තවත් පින්වතෙක් සිටිනවා ඔහු මාසයකට වතාවක් දානයක් පූජා කරනවා. තවත් පින්වතෙක් සිටිනවා ඔහු සතියකට වතාවක් පමණයි, දානයක් පූජා කරන්නේ. තවත් පින්වතෙක් සිටිනවා ඔහු දිනපතා දන් පූජා කරනවා. තවත් පින්වතෙක් සිටිනවා ඔහු සෑම නිමේෂයකදීම අවශ්‍ය දෙය, අවශ්‍ය කෙනාට, දන් දෙනවා. අපිම දුන්න දෙයයි පෙරළා අපිට ලැබෙන්නේ. ඔබ ලබන වැටුප කියන්නෙත් හේතුඵල ධර්මයක්. පින්වත් ඔබ දක්ෂ විය යුතුයි. අකුසලයටම යොමුවන සමාජය ඉදිරියේ පින්වත් ඔබ, ඔබගේ රාජකාරිය වෙනුවෙන් ලබන වැටුප, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන, ධර්මයක් බවට පත් කොට ගන්න.

පින්වත් ඔබ මාසික වැටුප පමණක් ම ලබන කෙනෙක් නම්, ඔබ මාසෙකට එක දවසක් පමණක් දන් පූජා කරපු කෙනෙක්. එහෙම පින්වතුන් ඕනෑ තරම් සමාජයේ ජීවත් වෙනවා. මාසෙකට වතාවක් සලාක දානය පූජා කරනවා නමුත් ස්වාමීන් වහන්සේ නමක් නිවස ඉදිරියට වැඩියත් දානේ හැන්දක් බෙදන්නේ නැහැ. පින්වත් ඔබ මාසික වැටුපට අමතරව දිනපතා අතිකාල දීමනා, ප්‍රසාද දීමනා, දිරි දීමනා සහ වෙනත් ආදායම් ද ලබන පින්වතෙක් නම්, ඔබ පෙර ජීවිතවල නිතිපතා, වේලාව, අවේලාව නොබලා, දන් පූජා කරපු සිල්වතුන්ට උපකාරක ධර්මයන් පූජා කරපු පින්වතෙක් වෙන්න පුළුවන්.

ඉහත සටහනින් පින්වතුන්ලාට සිතෙන්න පුළුවන්, ලෝකය, පංචඋපාදානස්කන්ධ ලෝකය හරිම පුදුමාකාරයි නේද කියලා. ලෝකය තුළ කිසිම පුදුමාකාර දෙයක් නැහැ. ලෝකය හේතුඵල ධර්මයක් පමණක්මයි. පින්වත් ඔබට සිතෙනවා නම්, ලෝකය හරිම පුදුමාකාරයි, ප්‍රශ්නකාරයි කියලා, ඊට එකම ධර්මානුකූල

හේතුව පින්වත් ඔබේ, අවිද්‍යාවේ පුදුමාකාර වර්ධනය පමණක්මයි. අවිද්‍යාව නැතිවෙන තැන, ලෝකය ඔබට හේතුඵල ධර්මයක් මයි.

පින්වත් ඔබ ලබන වැටුපත්, ඔබ ලැබුව වෘත්තියත්, ධර්මතාවයක් නම්, පින්වත් ඔබ ධර්මයට ගරු කරන්න ඕනේ. එවිටයි, ඔබ ම භුක්තිවිඳින ධර්මය තුළින්, කුසලය, මතු කොට ගන්නේ, මේ මොහොතේ ගවගාලේ, වැසි, පිනි, සීතල, සැපයක් ම කොට ගෙන සුවසේ නිදන මීහරක් රංචුව. කර්මය කර්මඵල විශ්වාසය හඳුනන්නේ නැහැ. ඒ නිසා ම සෑම සැප වේදනාවකට ම ඇලී යනවා. සෑම දුක් වේදනාවකට ම ගැටී යනවා. මේ නිමේෂයේදීත් මී හරක් රංචුව ම, අනාගත පංචඋපාදානස්කන්ධ ලෝකය අකුසලයෙන් ම වර්ධනය කොට ගන්නවා. කොළ පැහැති වියළී ගිය තණපත්, රතුපාට රුධිරය කරගන්න, එම රතුපාට රුධිරය හෙට උදෑසන සුදුපාට ප්‍රණීත මී කිරි බවට පත් කොට ගන්න. අවශ්‍ය හැකියාව සහිතව උපන් මීහරකා, ආදීනවයන් හඳුනන්නේ නැහැ. හඳුනන්නේ ආශ්වාදය පමණක් මයි. වෙල්යායේ තණකොළ බුදින මීහරකා වියළී ගිය තණපත් අනුභව කරලා, අතීත අකුසල් නිසා ම, ලෝකයාට ප්‍රණීත මීකිරි සුදුම සුදු පැහැයෙන් ලබා දුන්නත්, අවසානයේ මස්කඩ මුදලාලිලට කඳුළු පිරි දෑසින් ම, තම ශරීර මාංශයන් පූජා කොට මියැදුනත්, ලෝකය ගැන මුකුත්ම නොදන්නා මීහරකා කවදාකවත් ම ලෝකය හිනස්සන්නේ නැහැ.

වර්තමානයේ පාසල් දරුවන්, අවිනයවාදීන්ව හැසිරෙද්දී පින්වත් දරුවන් ගැන සිතීම පැත්තකින් තබා, හේතුඵල ධර්මයන්ට අදාළව, භික්ෂුව සිතන්නේ, පින්වත් ගුරුවරයා ගැනයි. ගුරු වෘත්තියට ඉහළින් තිබෙන, නිලධාරි සහ දේශපාලන වගකිවයුත්තන් ගැනයි. අපි රාජකාරියක් ඉටු කරලා, මාසේ අන්තිමට වැටුප අතට ගනිද්දී, එම වැටුප ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පෝෂණය වූ වැටුපක් වෙන්න ඕනේ. පින්වත් ඔබ ක්‍රිස්තියානි පින්වතෙක් නම්, එම වැටුප ක්‍රිස්තු ධර්මයේ

අර්ථයන්ගෙන් පෝෂණය වූ වැටුපක් වෙන්න ඕනේ. සමාජයේ යම් පින්වතෙක් හොඳ රැකියාවක් නැතිව, ජීවත් වෙද්දී, තවත් සමහරෙක් අඩු වැටුපක් ලබමින් ජීවත් වෙද්දී, රැකියා පෝළිමේ ළතැවෙමින්, ජීවත් වෙද්දී පින්වත් ඔබ ඉහත කඩඉම් සියල්ලක් ම ජයගත්තේ, ඔබේ අතීත කුසල් සංස්කාර ධර්මයන් නිසා මයි. එම නිසා පින්වත් ඔබ ලබන මාසික වැටුප, ආශ්වාදයක් බවට නොව, ආදීනවයන්ගෙන් මිදීම උදෙසා ප්‍රයෝජනයට ගැනීමට දක්ෂ වෙන්න.

අපගේ යුතුකම, වගකීම්, පැහැර හැරීමෙන් අපේ ජීවිත වලට එකතු වෙන සාංසාරික ණයකාරිත්වය, පටිච්චසමුප්පන්නව අපිට විපාක දෙන්නේ අනාගත සාංසාරික ජීවිතයේදී කම්කරුවන්, මෙහෙකරුවන්, පුලන්නන්, යදින්නන් බවට, බර අදින සතුන් බවට, පස්ගෝරස, බිත්තර ලබා දෙන සතුන් බවට පත් කරලා. පින්වත් ඔබ ලබන වැටුපට අදාළව ඔබේ යුතුකම් වගකීම් ඉටු නොකරන අයෙක් නම්, ඔබ පින් කරලා, දිව්‍ය තලයක ඉපදුනත්, මාතලීගේ අශ්ව රථයේ බර අදින දිව්‍ය අජානීය අශ්වයෙක් වෙලා ඉපදෙන්න පුළුවන්. පින්වත් ඔබ ලබන මාසික වැටුප, අනාගත බරපතළ ආදීනවයන් ගෙන් මිදීම උදෙසා ම ඔබ කළමනාකරණය කොට ගත යුතුයි.

පින්වත් ඔබ රාජකාරිය ඉටු කොට, මාසය අවසානයේ, රුපියල් පනස්දාහක වැටුපක් අතට ගන්නවා නම්, එම වැටුප අතට ගත්ත මොහොතේ ඔබ තුළ විශ්වාසයක් ඇති වෙන්න ඕනේ, මම රුපියල් පනස්දාහකට වැඩි සේවයක් සිදු කළාය කියලා. පින්වත් ඔබ වැටුප් දිනයට, ඔබේ හෘද සාක්ෂියත් සමග ඔබ සංවාදයේ යෙදෙන්න. පංචඋපාදානස්කන්ධ ලෝකයේ අධිකරණ, ස්ථාපිතවී තිබෙන්නේ තමා තුළමයි. හේතුඵල ධර්මයන්ට අදාළව, ලෝකයේ සාධාරණම තීන්දු ලබා දෙන සංස්කාර නමැති විනිශ්චයකරුවා ලබා දෙන තීන්දුව, ක්‍රියාත්මක කරන දැනීම් කරුවා වෙන්නේ විඤ්ඤාණයයි. තමා, තමාට බොරු කළ නොහැකි, බොරු කළොත් බොරුවත් විපාකයට ම

පැමිණෙන, ලෝකයේ අසමසම නීති පද්ධතිය, සංස්කාර නමැති විනිශ්චයකරුවා ලබාදෙන විඥ්ඥාණය නමැති තීන්දුවයි. පින්වත් ඔබ පංච උපාදානස්කන්ධ ලෝකයට බොරු කළත්, වගකීම් යුතුකම් පැහැරහැරියත්, ඔබ තුළ තෘෂ්ණාවේ සැඩ පහර හේතුවෙන් සකස් වෙන, පංච උපාදානස්කන්ධ ලෝකය, වගකීම් යුතුකම් පැහැර හරින්නේ නැහැ. මේ ජීවිතයේ පින්වත් ගුරුවරයෙක්, තම යුතුකම් පැහැර හැරියොත්, ඊළඟ ජීවිතයේදී බර ඔසවන නාටාමි කෙනෙක් කරන්න පුළුවන්.

# තෙපාවක් මත රැඳුණු දිවියක් මහ මෙරක් වනු කෙලෙසදෝ

දැන් වේලාව රාත්‍රි අටට විතර ඇති. බිත්ති ඔරලෝසුවේ තත්පර කටුවේ හඬ වේගවත්ව ඇසෙනවා. පරිසරය ඒ තරමටම නිහඬයි. මේ නිහඬ රාත්‍රියේ, භික්ෂුවගේ සිත ළඟ කවුදෝ නැවතිලා සිටිනවා. නිහඬතාවයට පින් සිද්ධවෙන්නයි. භික්ෂුව මේ අමුත්තාව හැඳින ගන්නේ. රූපය තුළට බැස ගත්තාවූ රූපී නොවන, අරූපී මේ අමුත්තා කවුද?. මොහු ඥාතියෙක්ද, හිතවතෙක්ද, පෙම්වතෙක්ද, පෙම්වතියක්ද, වධකයෙක්ද?. මේ නිහඬතාවය විදර්ශනාත්මකව අත්විඳින නිහඬ රාත්‍රියෙදී, සිත ළඟ සැරිසරණ මේ අමුත්තා භික්ෂුවට හොඳට පැහැදිලියි. ඒ වෙන කවුරුත් ම නොවේ. එකිනෙකට අත්වැල් බැඳගත්තා වූ, පටිච්චසමුච්පන්න විඤ්ඤාණයත්, උණුසුමත්, ආයුෂයත්ය.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යම් පින්වතෙක් මිය ගියාය කියලා කියන්නේ, විඤ්ඤාණයත්, උණුසුමත්, ආයුෂත්, ජීවිතයෙන් බැහැර වීමයි කියලා. මේ නිහඬ රාත්‍රියේදී භික්ෂුව තවමත් අපවත් නොවී ජීවත් වෙන්නේ පටිච්චසමුප්පන්න විඤ්ඤාණයත්, උණුසුමත්, ආයුෂයත් සංස්කාරයන්ගේ ප්‍රතික්‍රියාවන් හේතුවෙන් බැහැර නොවී සිත ළඟ නැවතී සිටින නිසා මයි. පින්වත් ඔබ විවේකී සිතින් ඔබේ සිත ළඟ නතරවී සිටින, සංස්කාරයන්ට අදාළව ඔබට ජීවිතය කියලා දෙන, විඤ්ඤාණයත්, ආයුෂයත්, උණුසුමත්, ධර්මානුකූලව මතු කොට දකින්න. එවිට පින්වත් ඔබට දැනේවි ජීවිතය කියන්නේ මහ

මෙරක් වැනි දෙයක් නොව, ඔබගේ අසිහිය නිසා ම, ජීවිතය මහමෙරක් බවට පත් කරන කාරණා තුනක මුහුණුවරක්ය කියලා.

සංස්කාර හේතුවෙන් විඤ්ඤාණය සකස් වුණත්, විඤ්ඤාණය ඉදිරියේ, සංස්කාර සැඟවිලයි සිටින්නේ. මේ සැඟවීම සිද්ධ කරන්නේ අවිද්‍යාව විසින්. උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් ගේ අර්ථය, නිවැරදිව ජීවිතයට එකතු කොට නොගත් නිසාම, පංචඋපද්‍රානස්කන්ධ ධර්මයන් කෙරෙහි ඇති කොට ගන්නා වූ අසීමිත තෘෂ්ණාව, සංස්කාරයන් අප්‍රකටව තබා, විඤ්ඤාණයේ ක්‍රියාකාරිත්වයෙන් නැවත සංස්කාරයන් ම රැස් කොට දෙනවා.

පින්වත් ඔබ භික්ෂුව ගෙන් විමසුවොත්, "ස්වාමීන් වහන්ස, විඤ්ඤාණය කියන්නේ කුමක්ද" කියලා, භික්ෂුව පිළිතුරු දෙන්නේ, සංස්කාර හේතුවෙන් සකස්වන ඵලය විඤ්ඤාණය කියලයි. විඤ්ඤාණය කියන්නේ දැනීමට. මෙය සටහන් තබන භික්ෂුවට, පැවිදි වෙන්න දැනීම සකස් වුණා. ඔබට වෛද්‍යවරයෙක් වෙන්න දැනීම සකස්වුණා, ඔබට ව්‍යාපාරිකයෙක් වෙන්න දැනීම සකස් වුණා. ඔබට දිවි නසාගන්න දැනීම සකස් වුණා. පින්වත් ඔබ තුළ සකස් වෙන දැනීම් කියලා කියන්නේ විඤ්ඤාණයට.

මේ නිහඬ රාත්‍රියෙදී, භික්ෂුවගේ දැනීම සකස් වුණේ මේ සටහන ලියන්න. නමුත් ගිහි පින්වත් ඔබට මේ රාත්‍රියේදී දැනීම සකස් වෙන්නට ඇත්තේ කාමච්ඡන්දයන් ගේ ආශ්වාදය ලබන්නට. එකිනෙකට වෙනස් දැනීම් නිරතුරුව ම අපි තුළ සකස් වෙන්නේ, අපි පුරුදු පුහුණු කළ කුසල්, අකුසල් සංස්කාරයන්ට අදාළවමයි.

අපි තුළ සකස් වෙන දැනීම් වලට හේතුව සංස්කාරයන් බව නොදන්නා නිසා ම, අපි දැනීම් හෙවත් විඤ්ඤාණය මම හැටියට දකිනවා. මගේ ආත්මය හැටියට දකිනවා. විඤ්ඤාණය කෙරෙහි මමත්වයේ දැඩි භාවය ඇති කොට ගන්නවා. යම් පුද්ගලයෙකුට

හිතෙනවා තවත් පුද්ගලයකු මරා දමන්න. මේ සකස් වුණා වූ දැනීම, එම පුද්ගලයාගේ අතීත අකුසල් සංස්කාරයන්ගේ ඵලයක් හැටියට දකින්නේ නැහැ. ඔහු එම දැනීම මගේ කොට ගන්නවා. ඒ දැනීම තුළ මම සිටිනවාය කියලා දකිනවා. ඒ දැනීම මගේ ආත්මය කොට දකිනවා. සංස්කාර හේතුවෙන් සකස් වුණ දැනීම මමත්වයේ දැඩි භාවයෙන්ම ගැනීම නිසා, ඔහු මිනී මරනවා. සංස්කාර, විඤ්ඤාණය උපයෝගී කොට ගෙන නැවත නැවත සංස්කාර ම, භවය ම, විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය ම ජීවත් කොට දෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "සංස්කාර නිරෝධා, විඤ්ඤාණ නිරෝධො" කියලා. පංචඋපාදානස්කන්ධ ලෝකය තුළත්, පටිච්චසමුප්පාද ධර්මය තුළත් මුල සිට අග දක්වා ම බැස ගෙන සිටින, විඤ්ඤාණය නමැති අධිපති වාදී ධර්මතාවය, අවිද්‍යාව ඉදිරියේ මොන තරම් බලවත් වුවත්, සංකීර්ණ වුවත්, තෘෂ්ණාව ඉදිරියේ මොන තරම් සටකපට ලෙස හැසිරුණත් කුසල්, අකුසල් සංස්කාර කියන එකම කාරණය, නිරෝධයෙන්, අධිපති වාදී විඤ්ඤාණය නිරෝධය කිරීමේ ශක්තිය ධර්මානුකූලව ඔබට තිබෙනවා. සංස්කාර හේතුවෙන් සකස් වෙන, හුදු හේතුඵල ධර්මයක් වන විඤ්ඤාණයට අයෝමය කාර්ය භාරයක් පංචඋපාදානස්කන්ධ ලෝකය තුළදී ලැබී තිබෙන්නේ, තෘෂ්ණාව නිසා මිස, විඤ්ඤාණය නමැති අර්ථයේ ඇති ශක්තිමත් භාවය නිසා නම් නොවේ. විඤ්ඤාණය හුදු කාඩ්බෝඩ් වීරයෙක් පමණක් මයි.

පින්වතුන්ලා ගේ ඇසෙන්, කණෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින්, ගලා බසින තෘෂ්ණාවේ සැඩ පහර ශක්තිමත් වීම නිසා ම, විඤ්ඤාණය නමැති මැජික්කරුවා සමාජය ඉදිරියේ රඟදක්වන, සුදු, කළු, මැජික් සංදර්ශනයන් හේතුවෙන් පින්වත් ඔබ තුළ සකස් වන ඇලීම් සහ ගැටීම්, එම ඇලීම් ගැටීම් හේතුවෙන් සකස් වන මේ සංස්කාර නැවත තෘෂ්ණාවෙන් ඔද්දල් වුණ විඤ්ඤාණය මයි පිනවන්නේ. පින්වත්

ඔබ සිතුවත් ඔබ නැවතීමක් කරා ය යන්නේ කියලා, ඔබ හිතුවත් ඔබ ආරක්ෂාවක් දෙසටයි යන්නේ කියලා, මේ දැනීම, මේ සිතීම අයිතිත්, තෘෂ්ණාවෙන් ඔද්දල් වුණු විඤ්ඤාණයට මයි කියන යථාර්ථය අපි තේරුම් ගන්න ඕනේ. විඤ්ඤාණය තුළ සිටිමින්, අපි විඤ්ඤාණය ගැන හොයනවා. අපි විඤ්ඤාණයේ දාස භාවයට පත් වෙමින් අපි විඤ්ඤාණයේ නිරෝධය ගැන කතා කරනවා. මේ සැම අදියරකදී ම අපි තුළ සකස් වන සංස්කාර, පෙරලා විඤ්ඤාණය ම ශක්තිමත් කරනවා.

විඤ්ඤාණය ගැන අපි හැදෑරීමට, සිතීමට පෙරාතුව අපි සංස්කාර ගැන සිතන්න ඕනේ. සංස්කාර ගැන සිතීමට පෙරාතුව අපි අවිද්‍යාව ගැන සිතන්න ඕනේ. මුලින් ම අවිද්‍යාව ගැන නොසිතා සංස්කාර සහ විඤ්ඤාණය ගැන සිතන්න ගියොත් පින්වත් ඔබ තුළ නොදන්නා භාවයෙන් ම අවිද්‍යාවයි තව තවත් ශක්තිමත් වෙන්නේ. සමාජයේ ජීවත්වන සමහර පින්වතුන් සිටිනවා ප්‍රශ්නයක් ඇසුවොත් අහන්නේ විඤ්ඤාණය ගැනමයි. නමුත් එම පින්වතුන් දන්නේ නැහැ විඤ්ඤාණය ගැන තමන් මෙතරම් පෙරල, පෙරළා අහන්නේ අවිද්‍යාව නිසා මයි කියලා.

නිහතමානී පින්වතා, ලෝකය ගැන සොයන්න යන්නේ නැහැ. මොකද ඔහු අන්තිමයටයි සිටින්නේ. ඔහු අන්තිමයට සිටින නිසා ඔහුට ඉදිරිය නිවැරැදිව හොඳින් පේනවා. ඔහුට පසුපස පිළිබඳ ගැටලුවක්, ප්‍රශ්නයක් නැහැ. මොකද ඔහු අන්තිමයා. නමුත් අපි පළවෙනියා වෙන්න ගියොත්, මාන්නය, මමත්වයේ දැඩිභාවය නිසාම, මාර්ගයේ ඉදිරියට පෙනුණත් ඔබට පසුපසින් සිදුවෙන කිසිම ධර්මයක් කෙරෙහි දක්මක් ඔබට නැහැ. මම පළමුවැනියා, මම නායකයා, මම දක්ෂයා, මම නුවණැත්තා. සම්පූර්ණයෙන් ම එය ඇත්තක්. නමුත් ඉදිරියෙන් ම සිටින ඔබව නිරීක්ෂණය කොට කමටහනක් කොට ගෙන, ඔබගේ දුර්වලතා, අඩුපාඩු දකිමින් නිවැරදිවන පුද්ගලයන් ඔබ පසු පස සිටිනවාය කියලා දකින්න ඔබට සිහියක් නැහැ. ඒ

අතින් බලන කොට භික්ෂුව නම්, හරිම ධර්මානුකූල කපටියෙක්. ලොක්කන්, නායකයන්, ප්‍රධානීන්, අතර භික්ෂුව අදත් අන්තිමයා වෙලා ජීවත් වෙනවා.

සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ දේශනා කරනවා, මම උදෑසන ම පින්ඩපාතයේ වඩින්න පාත්‍රය අතට ගන්නේ, රොඩී රැහැක දරුවෙක් උදෑසන සිඟමනේ යන්න පොල්කටුව අතට ගන්නේ යම් සේද, එවැනි නිහතමානී හැඟීමකින් මයි කියලා. භික්ෂුවට සිහිපත් වෙනවා ධූතාංගධාරී භික්ෂුණීන්ගේ ප්‍රධානී, කිසාගෝතමී උත්තමාවියගේ කහට පැහැ පාංශුකූල චීවරය, එම උත්තමාවියගේ නහර වැල් ඉලිප්පුණු කේඩෑරිවී ගිය තෘෂ්ණාව මළ ශරීරය, නිහතමානීභාවය, ඔබට නමස්කාර වේවා, ඔබ මයි තෘෂ්ණාව නිරෝධයේ පළමුවැනි පියවර, ඔබ මයි මමත්වයේ නිවීමේ අවසානයත්. නමුත් සමහර පින්වතුන්ලා ප්‍රකාශ කරනවා අවුරුද්ද ඉක්මනට ගෙවී ගියාය කියලා. පින්වත් ඔබට එහෙම හිතෙනවා නම්, එය අහිංසක අවුරුද්දෙ වරද්දක් නම් නොවේ. එය අපේ පංචඋපස්දානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාවේ වරදයි. අපි තුළ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණය කෙරෙහි තෘෂ්ණාව වැඩි වෙන කොට කාලය කෙරෙහි අසිහිය ඇති වෙනවා. තෘෂ්ණාවේ වේගයට කාලය අසිහියෙන් ගෙවී යද්දී අපිට දැනෙන්නේ අවුරුද්ද වේගයෙන් ගෙවී කියාය කියලයි.

මෙය සටහන් තබන භික්ෂුව, ඇස් දෙක පියාගෙන, ගෙවී ගිය වසරට සිත යොමු කරවනවා. භික්ෂුවට අරමුණු වෙන්නේ, මැකී ගිය සිතුවම් පෙළක් පමණක් මයි. ඒ සිතුවම් මැකී ගිහිල්ලා තිබෙන්නේ. එම සිතුවම් උපයෝගි කොට ගත් ඇලීම්, ගැලීම්, උපේක්ෂා, නමැති තීන්ත වල දූර්වලභාවයන් නිසා මයි. ඒ බොඳවී ගිය අතීත සිතුවම් නිසා වර්තමානයේ කිසිම සංස්කාරයක් මතු කොට දෙන්නේ නැහැ. සංස්කාර කියලා කියන්නේ සුන්දර වූ ලෝකය අසුන්දර කරන, අසුන්දර වූ ලෝකය සුන්දර කරන ධර්මතාවයක්. ඒ වගේමයි සංස්කාරයන් නිරෝධය කිරීමෙන් පංචඋපාදානයකට ලෝකය ම නිරෝධය

කිරීමේ මාර්ගයත් බුදුරජාණන් වහන්සේ අපට කියලා දෙනවා. භික්ෂුවගේ ජීවිතය කියන්නේ සංස්කාර නමැති කොක්කේ එල්ලෙන පටිච්චසමුච්පන්න විඤ්ඤාණයේ ක්‍රියාකාරකමක් පමණ මයි. සංස්කාර නමැති කොක්ක ප්‍රතික්‍රියා දක්වද්දී විඤ්ඤාණයට සිද්ධ වෙනවා. නැවත නැවත පංචඋපාදානයට ම ලෝකය බිහි කරන්න.

පින්වත් ඔබ, දෑස් දෙක පියාගෙන දකින්න. ඔබගේ ජීවිතය කියන්නේ, පටිච්චසමුප්පන්න සංස්කාර ගොඩක එලයන්ය කියලා. මේ සංස්කාර ගොඩ විඤ්ඤාණය උපයෝගී කොට ගෙන සිද්ධ කරන්නේ නැවත සංස්කාර රැස් කොට දීම පමණක් මයි. පින්වත් ඔබ පොතෙන් මොහොතක් සිත මෑත් කරලා දෑස් පියා ගන්න. ඔබ ලබන සෑම සැප වේදනාවක් ම, ඔබ ලබන සෑම දුක් වේදනාවක් ම, ඔබ ලබන සෑම උපේක්ෂා විඳීමක් ම, ඒ සංස්කාර ගොඩේ එලයක් ම බව දකින්න. සංස්කාරයෝ අනිත්‍යයයි, සංස්කාරයෝ අස්ථිරයි, සංස්කාරයෝ අනාත්මයි, වශයෙන් නුවණින් දකිමින්, සංස්කාරයන් කෙරෙහි කලකිරීම ඇතිකොට ගන්න. මේ අනිත්‍ය වූ සංස්කාරයන්ගේ වියරුව අතීතයේ කල්ප විනාශ කී දාහකට හසු වී අපිව පුච්ච, පුච්චා මරන්න ඇතිද?. වර්තමානයේ සංස්කාරයන් කෙරෙහි බියක් භික්ෂුවට ඇති වන්නේ නැහැ. එයයි භික්ෂුව ලබන ධර්මයේ සුන්දර රසය.

භික්ෂුව තබන සමහරක් සටහන් කියවා, පින්වත් ඔබ තුළ ගැටීමක්, විචිකිච්ඡාවක් ඇති වෙන්නත් පුළුවන්. භික්ෂුව පින්වත් ඔබට ගෞරවයෙන් දැනුම් දෙනවා, අනුන් ගේ සටහනක් නිසා අකුසල් සංස්කාර නම් රැස් කොට ගන්න එපාය කියලා. ඔබ භික්ෂුවට බැන්නත්, භික්ෂුව ඔබට බනින්නේ නැහැ. මොකද භික්ෂුව දන්නවා මම බැනුම් අහන්නේ මගේම අකුසල් සංස්කාරයක් නිසාය කියලා.

භික්ෂුව දැන් මේ සටහන අවසන් කරලා සැතපෙනවා. හෙට උදෑසන අවදි වුණොත් ඔබට නැවත ලියන්නම්. ඒ තරමට ම සංස්කාරයෝ අස්ථිරයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ආශ්වාසය ඉහළට අරගෙන ප්‍රශ්වාසය කරන පුංචි නිමේෂයේදී මරණය සිදුවේ යැයි දකිමින් ජීවත් වෙන්න කියලා.

අපේ උපන් දිනය දවසේ අපිට පුළුවන් නම් මෝහයෙන් කරන සුභ පැතුම් වල ආශ්වාදයෙන්, මොහොතකට සිත මෑත්කොට ගෙන පුංචි නිමේෂයක් මරණානුස්සතියේ යෙදෙන්න, මරණානුස්සතිය තුළින් චන්දය, වීර්යය, චිත්තය, විමංසා කියන සතර ඍද්ධිපාද ධර්මයන් මතු කොට ගන්න, එය තමා විසින්ම, තමන්ට ලබාදෙන සුන්දරම දීර්ඝායුෂ ලබන උපන් දින සුබ පැතුමක් වෙනවා.

# තෘෂ්ණාව තෘෂ්ණාවෙන්ම නැති කරන කලාව

දුක අර්ථය කොටගත් පංචඋපාදානස්කන්ධ ලෝකයේදි අපි හැමෝම සැප වේදනාවන්ට කැමතියි. සැප වේදනාවන් ඇතිවුණ අවස්ථාවන්හි දී අපි ඒ සැප වේදනාව මගේ කොට ගන්නවා. ඒ සැප වේදනාවන් තුළ බැස ගන්නවා. ඒ සැප වේදනාවන් නොවෙනස් වන දෙයක් බව දකිනවා. නමුත් යම් මොහොතක දී ඒ සැප වේදනාවන් වෙනස් වී දුක් වේදනාවක් බවට පත්වෙද්දී අපිට ඉතිරි වන්නේ බලාපොරොත්තු බිඳවැටීමක් පමණක් මයි.

මෙය සටහන් තබන භික්ෂුවගේ භික්ෂු ජීවිතය තුළ කවදාකවත් බිඳවැටුණ බලාපොරොත්තු නැහැ. බලාපොරොත්තු බිඳවැටෙන්න නම් බලාපොරොත්තු ඇති කොට ගන්න ඕනේ. මමත්වයේ දැඩිභාවයෙන් තොරව සංස්කාරයන්ට අදාළව ජීවිතය දකින කොට සැප, දුක් වේදනාවන් ගෙන් බැහැර වූ ධර්මයේ උපේක්ෂාව තුළයි ජීවිතය පවතින්නේ. ආනන්ද මහෝත්තමයන් වහන්සේ දේශනා කරන ධර්මයේ බොහෝම සුන්දර අර්ථයක් තිබෙනවා. ආහාරය උපයෝගී කොට ගෙන, ආහාරයෙන් පෝෂණය වන මේ කය නිරෝධය කරන, තෘෂ්ණාව උපයෝගී කොට ගෙන, තෘෂ්ණාව නිරෝධය කරන, මාන්නය උපයෝගී කොට ගෙන, මාන්නය නිරෝධය කරන, ලිංගික ආශාව උපයෝගී කොට ගෙන, ලිංගික ආශාව නිරෝධය කරන සුන්දර ධර්මයක් ආනන්ද මහෝත්තමයන් වහන්සේ දේශනා කරනවා.

ආනන්ද මහෝත්තමයන් වහන්සේ දේශනා කරනවා මේ කය ආහාරයෙන් වැඩී තිබෙන්නේ. එම නිසා ආහාර උපයෝගී කොට ගෙන ආහාර කෙරෙහි තෘෂ්ණාව නිරෝධය කරන්නය කියල. වර්තමාන සමාජයේ දිව පිනවීමට ඇති අධික තෘෂ්ණාව නිසා ම ආහාර උපයෝගී කොට ගෙන ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දොම්නස්සයන් ගේ සිරකරුවන් බවට සමාජය පත් වෙලා තිබෙනවා. දිවේ ස්පර්ශය අනිත්‍ය වශයෙන් නොදකින නිසා ම, දිවේ ස්පර්ශය හේතුවෙන් ලබන කෙටි සැප වේදනාවන් අනිත්‍ය බව නොදකින නිසා ම, එකිනෙකට වෙනස් හඳුනා ගැනීම් පසුපස සංස්කාරයන් හඹාගෙන පිට්සා, කොත්තු රොටි, කෙටි කෑම සංස්කෘතිය වේගයෙන් ශක්තිමත් වෙනවා. අවිද්‍යාවේ අවන්හල්, හෝටල්, කඩ කෑම සංස්කෘතිය සමස්ත ජාතියම ජාති, ජරා, ව්‍යාධි, මරණයන් ගේ සුන්දර සද්ධර්මයේ ඒහිපස්සික ගුණය, සිහිබුද්ධිය ඇති හැමෝටම හොඳින් මතු කොට පෙන්වනවා.

ආනන්ද මහෝත්තමයන් වහන්සේ දේශනා කරනවා, ආහාරයෙන් පෝෂණය වන මේ කය ආහාරය උපයෝගී කොට ගෙන නිරෝධය කරන්නය කියලා. ආහාරය උපයෝගී කොට ගෙන ආහාරය කෙරෙහි තෘෂ්ණාව නිරෝධය කරන්නේ කොහොමද? ආහාර කෙරෙහිත්, ආහාරයෙන් පෝෂණය වන මේ කය කෙරෙහිත්, සතිය සිහිය ඇති කොට ගන්නවා. මේ කය ආහාරයෙන් ඉපදුණා වූ රූපයක්. පින්වත් ඔබේ ඔය සුන්දර රූපය හටගන්නේ ආහාරයෙන්. අතීතයේ යම් දවසක ඔබේ අම්මාගේ ශරීරයේ පැලෝපීය නාළය තුළ අම්මාගේ ඩිම්බයකුත්, තාත්තාගේ ශුක්‍රාණුවකුත් එකතු වීමෙනුයි ඔබේ රූපයේ මූල බීජය වන කලල රූපය ඇති වුණේ. අම්මාගේ ඩිම්බයක් කියන්නේ, තාත්තාගේ ශුක්‍රාණුවක් කියන්නේ තමන් අනුභව කළා වූ ආහාරයේ ඕජාවෙන් හටගන්නා වූ ධර්මතාවයන් දෙකක් මයි. ඒ නිසයි ඔබේ රූපය ආහාරයෙන් හටගත්තාය කියලා ධර්මානුකූලව අර්ථ දක්වන්නේ.

පින්වත් ඔබේ ඔය රූපය අයිති පිළී ගඳ ගහන ඔබේ මෑණියන්ගේ ශරීරයේ නිපදවෙන ඩිම්බයක, පිළී ගඳ ගහන ඔබේ පියාණන්ගේ ශුක්‍රාණුවකට. පින්වත් ඔබ දෑස් පියාගෙන දකින්න පිරිමියකුගේ ශරීරයෙන් පිටවී යන ශුක්‍රාණුවක ඇති පිළී ගඳ, දුගඳ, අපුල භාවය. දින විසි අටකට වරක් කාන්තාවකගේ ශරීරයෙන් පිටවී යන මළ ඩිම්බයක ඇති අපුලභාවය. දුගඳ, පිළිකුල්භාවය. පින්වත් ඔබේ මුල් අයිතිය ඒ පිළිකුල්භාවයටමයි. ඒ පිළිකුල්භාවය යටපත් කොට ගෙන පඨවි ධාතුවේ තද ස්වභාවයටත්, ආපෝ ධාතුවේ මෘදු මෙලෙක් ස්වභාවයටත්, තේජෝ ධාතුවේ උණුසුමටත්, වයෝ ධාතුවේ හැඩය, ලාලිත්‍යය, රිද්මයටත් පෙර සංස්කාරයන් හේතුවෙන් සකස් වන වර්ණය, සැපය, බලයටත් අපි ආශ්වාදයෙන් බැඳී යනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ශරීරය ලක්ෂ ගණන් වටිනා සයනයක සතපවන්න සුදුසු ශරීරයක් නොවේ. මේ ශරීරය සුන්දර මන්දිරයකට ගෙවද්දන්න සුදුසු ශරීරයක් නොවේ. මේ ශරීරය දහස් ගණන් වටිනා ඇඳුම්, ආභරණ අන්දවන්න සුදුසු ශරීරයක් නොවේ. මේ ශරීරය අයිති ජරාවට, ව්‍යාධියට, මරණයට මයි. "ඒ නිසා මහණෙනි, ආරණ්‍යයක්, ශූන්‍යාගාරයක්, රුක්ඛ මූලයක් ඔබේ නවාතැන බවට පත් කොට ගන්න, වටිනාකමක් නොමැති පාංශකූල චීවරයකින් ලැජ්ජා, භය ඇති තැන් වසා ගන්න, අනුන් පූජාකරන පිණ්ඩපාතයකින් යැපෙන්න" කියලා බුදුරජාණන් වහන්සේ අපිට අවවාද කරනවා.

පින්වත් ඔබ ඔබේ මෑණියන්ගේ මවු කුසේ ගර්භාෂ කුටිය තුළ ස්වභාව ධර්මයත් සමග යම් සේ ඔබ වැඩුණා ද, ඒ උපත නිරෝධය කිරීමට නම් ඔබ ස්වභාව ධර්මය සමග මුහුවිය යුතු මයි. නව මාසයක් කිසිවකු ගේ පෞද්ගලික උපකාරයකින් තොරව ස්වභාව ධර්මය තුළින් ම වැඩුණ අපි මෙලොව එළිය දුටු මොහොතේ පටන් ම කෘත්‍රිම ලෝකයේ සාමාජිකයන් වෙනවා. ස්වභාව ධර්මය අවබෝධ කොට ගැනීමට නම් අපි

අනිවාර්යයෙන් ම ස්වභාව ධර්මයේ ම කොටසක් වෙන්න ඕනෙ. ඒ නිසයි බුදුරජාණන් වහන්සේ අපිව රුක්ඛ මූලයකට, ශූන්‍යාගාරයකට, ආරණ්‍යයකට යොමු කරන්නේ.

වර්තමානයේ අපි සුදුස්සාට සුදුසු තැන දෙන්නේ නැහැ. මැණියන්ගේ ගර්භාෂ කුටියේ ලේ, සැරව ගොඩේ හැදෙන රූපය අපි සුවඳ විළවුන් සාප්පුවක් බවට පත් කොට ගෙන තිබෙනවා. ඒ නිසාම අපිට ධර්මානුකූලව සැඟවුණ දක්ෂභාවයක් මතු කොට ගන්න ප්‍රමාද වෙලා තිබෙනවා.

භික්ෂුව මේ මොහොතේ වැඩසිටින කුටිය අවුරුදු පනහකට වඩා පැරණි කුටියක්. භික්ෂුව දන්නා පරිදි කුටියේ තිබෙන ලෑලි ඇඳට අවුරුදු පනහකට වැඩි ඉතිහාසයක් තිබෙනවා. මේ කුටියේ මේ ලෑලි ඇඳ මත මීට වසර හතළිහකට පෙරාතුව විදේශීය සුදු ජාතික ස්වාමින් වහන්සේ නමක්, කර්ම රෝගයකින් පීඩා විඳීම නිසා ගෙල වැලලාගෙන අපවත් වෙලා තිබෙනවා. ඊට පසුව තවත් සුදු ජාතික ස්වාමින් වහන්සේ නමක් වැලි පොළගෙක් දෂ්ට කිරීම නිසා අපවත් වෙලා තිබෙනවා.

අස්ථිර වූ පංචඋපාදානස්කන්ධ ලෝකයක් තුළ ස්ථිර වූ සැප වේදනාවන් සොයා ගෙන අයාලේ යන අපිට එම විදේශීය ස්වාමින් වහන්සේලාගේ අපවත් වීම්, සංසාර බිය මතු කොට ගන්න සුන්දර පූර්වාදර්ශයන් වෙනවා.

පින්වත් ඔබට සතර මහා ධාතුවෙන් සෑදුන කයේ යථා ස්වභාවය ගැන ඉහත සටහන තැබුවේ ආනන්ද මහෝත්තමයන් වහන්සේ දේශනා කොට වදාළ "මේ කය ආහාරයෙන් වැඩුණ, එම නිසා ආහාරය උපයෝගී කොට ගෙන ආහාරය නිරෝධය කළ යුතුයි" කියන ධර්මය පහදා දෙන්නයි. ආනන්ද මහෝත්තමයන් වහන්සේ මේ ධර්මය දේශනා කරන්නේ සැඟවුණ රාග සිත් ඇතිව සිටි භික්ෂුණින් වහන්සේ නමකටයි. එම භික්ෂුණිය රෝගී බවක් හඟවා උපක්‍රමශීලීව ආනන්ද ස්වාමින් වහන්සේව ආරාමයට වඩම්මවා ගන්නේ. ආනන්ද

ස්වාමීන් වහන්සේ භික්ෂුණියගේ උපක්‍රමය හඳුනාගෙන ඇයට දේශනා කරනවා, "ඔබ පිණ්ඩපාතය වළඳන කොට ආහාර මිස තෘෂ්ණාව වළඳන්න එපා"ය කියලා.

"පින්වත් ඔබ ආහාරය සමග තෘෂ්ණාවත් වැළඳුවොත් ආහාරය මොහොතකින් තේජෝ ධාතුවේ උණුසුමෙන් දිරවා රුධිරය, මළ, මුත්‍රා බවට පත් වුණත් ඔබ වළඳන තෘෂ්ණාව නම් ඔබව පටිච්චසමුප්පන්නව දුක කරා ම රැගෙන යනවා" ය කියලා.

වර්තමාන සමාජයේ පින්වතුන්ලා එක ආහාර පිඟානක් අනුභව කරන කොට තෘෂ්ණාව ලොකු බේසමක් පමණ අනුභව කරනවා. ආහාරය තුළින් ශරීරයේ නිරෝගී භාවය, වර්ණය, සැපය, බලය, හැඩය, මස්පිඩු වර්ධනය, කෙට්ටුවීම, මහත් වීම කියන අතුරුපස වලින් පිරුණු තෘෂ්ණාවේ ආහාරත් මදි නොකියන්න අනුභව කරනවා.

දිනක් මහත්වරු දෙදෙනෙක් උදෑසන පිණ්ඩපාත මඩුවට දානය රැගෙන ඇවිත් භික්ෂුවට මහත් ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා, "ස්වාමීන් වහන්ස අපගේ කොම්පෝස්ට් එළවළු, පලතුරු, පළා වගාවේ මුල්ම කුළුඳුල් අස්වැන්න නෙළලා ඔබවහන්සේට නිරෝගී දානයක් හදා ගෙන ආවා"ය කියලා. ඒ අවස්ථාවේ මහත්වරු දෙදෙනා තමන්ගේ කොම්පෝස්ට් වගාවේ විශේෂත්වය සහ විෂ රහිත භාවය ගැන වර්ණනා කරමින් තමයි දානය බෙදුවේ. ඒ මහත්වරුන් ගේ කොම්පෝස්ට් වර්ණනාව ඇසෙද්දි භික්ෂුවට හදවතින් සිනාවක් ඇති වුණත් ඒ බව මුහුණෙන් හැඟෙව්වේ නැහැ.

රසායනික පොහොර, කෘමිනාශක යොදන වස විෂ ආහාරයන් අපි ප්‍රතික්ෂේප කරන්නේ ඒවායෙන් අපි ඈත් වෙන්නේ ඒවාට අපි ගැටෙන්නේ රූපය කෙරෙහි, නිරෝගී භාවය කෙරෙහි සක්කායදිට්ඨිය නිසා මයි. වර්තමානයේ අපි රසායනික පොහොර, කෘමිනාශක සමග ගැටිලා

කොම්පෝස්ට් සොයාගෙන යන්නේත්, රූපයේ නිරෝගී භාවය කෙරෙහි ඇති කොට ගන්නා වූ සක්කායදිට්ඨිය නිසා මයි. පංචඋපාදානස්කන්ධ මාරයා රසායනික කෘමි නාශකයන්ට ගැටිලා අපිව කොම්පෝස්ට් වලට ඇලීමට සලස්වලා එකම කාසියේ දෙපැත්ත මාරු කරලා මුලා කරනවා.

පංචඋපාදානස්කන්ධ මාරයා වර්තමානයේ කොම්පෝස්ට් වගාවන් වර්ණනා කරලා අපිට ලබාදීලා තිබෙන සුන්දර ධර්මයේ ප්‍රතිඵලය රූපයේ නිරෝගී භාවය කෙරෙහි සක්කායදිට්ඨියයි. ගෞරවනීය පින්වතුනි රසායනික පොහොර බැහැර කරලා කොම්පෝස්ට්වලට මාරු වෙලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ආහාරය කෙරෙහි තෘෂ්ණාව බැහැර කරලයි ආහාරය නිරෝධය කරන්න පුළුවන්. තෘෂ්ණාවෙන් ඔද්දල් වුණ පංචඋපාදානස්කන්ධ මාරයා පින්වත් ඔබට අන්දන විකට ඇඳුම් ආශ්වාදයෙන් පළඳින්න එපා.

වර්තමාන සමාජය ආහාරය කෙරෙහි තෘෂ්ණාව සියුම් කොට ගැනීම පැත්තකින් තියලා තළු මර මරා වස විෂ රහිත ආහාරයන් කෙරෙහි ඇලීම් ඇති කොට ගෙන තිබෙනවා. ඇළෙන ප්‍රමාණයට ම රසායනික කෙරෙහි ගැටීම වැඩි වන බවත් සිතන්න දක්ෂ වෙන්න ඕනේ. ආහාරය නිසා පින්වත් ඔබ සිටින්නේ ඇළීම් සහ ගැටීම් අතර නම් ආහාරය උපයෝගී කොට ගෙන ඔබ ලබන්නේ අධර්ම යයි. පින්වත් ඔබ කොහොමද ආහාරය තුළින් ධර්මය එහෙමත් නැතිනම් උපේක්ෂාව මතු කොට ගන්නේ?.

පින්වත් ඔබ මෙම ලිපිය කියවන්නේ කැමැත්තෙන් ආශ්වාදයෙන් නම්, එසේත් නැතිනම් ඔබ මේ ලිපිය කියවන්නේ ගැටෙන සිතින් නම්, මේ දෙතැනදී ම ඔබ අනාගත භවය උදෙසා මේ නිමේෂයේදීත් ඇළීම් සහ ගැටීම් හේතුවෙන් සංස්කාරයන් රැස් කොට ගන්නවා. භික්ෂුව පින්වත් ඔබට අනිත්‍යය ගැන. විදර්ශනාව ගැන, සටහන් තබන කොට පින්වත් ඔබ එම සටහන කියවීමෙන් තෘෂ්ණාවයි ජීවිතයට එකතු කොට ගන්නේ.

එසේ නොවී පින්වත් ඔබ මේ සටහන කියවන්නේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකිමින් නම්, විදර්ශනාත්මක චේතනාවකින් නම්, මේ මොහොතේ ඔබ තුළ අනාගත භවයට සංස්කාර රැස්වීමක් නැහැ. නමුත් විදර්ශනාත්මක සිතුවිල්ලකුත්, සප්ත බොජ්ඣංගයන්ට මුවා වෙලා ආශ්වාදය බොහෝම සියුම් ආකාරයට බැස ගෙන සංස්කාරයන් රැස්වෙන්න පුළුවන්.

ආනන්ද මහෝත්තමයන් වහන්සේ අදාළ භික්ෂුණියට දේශනා කරනවා, කෙසේද තෘෂ්ණාව උපයෝගිකොට ගෙන තෘෂ්ණාව නිරෝධය කරන්නේ කියලා. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබන සද්ධර්මය ශ්‍රවණය කරන ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරන පින්වතෙක් සිටිනවා. එම පින්වතා කල්පනා කරනවා කසළ ශෝධනය කරපු සුනීතත් උතුම් රහත් ඵලයට පත්වුණා; මනුෂ්‍ය ඝාතන කරපු අංගුලිමාලත් උතුම් රහත් ඵලයට පත්වුණා; අම්බපාලිය කියන ගණිකාවත් උතුම් රහත් ඵලයට පත්වුණා; පටාචාරා වැනි අසරණ භාවයේ පතුලට ම වැටුණ කාන්තාවකුත් උතුම් රහත් ඵලයට පත්වුණා. එම නිසා මමත් මේ ජීවිතයේදීම උතුම් රහත් ඵලයට පත් වෙනවාය කියලා, උතුම් රහත්ඵල අවබෝධය ලබා ගැනීම කෙරෙහි තෘෂ්ණාවක් ඇති කොට ගන්නවා.

තවත් ගිහි පින්වතෙක් කල්පනා කරනවා විශාඛා උපාසිකාව අවුරුදු හතක වයසේදී සෝවාන්ඵල අවබෝධය ලබනවා; ජේතවනය රන්කාසි වලින් අතුරන්න තරම් ධනවතෙක් වූ අනේපිඬු සිටුතුමා උතුම් සෝවාන්ඵල අවබෝධය ලබනවා; උපතින්ම යාචක ජීවිතයක් ගත කළ ශරීරය දද කුෂ්ඨවලින් රෝගී වූ සුප්‍රබුද්ධ, උතුම් සෝවාන්ඵල අවබෝධය ලබනවා. එම නිසා මමත් මේ ජීවිතයේදීම උතුම් සෝවාන්ඵල අවබෝධය ලබනවාය කියලා තෘෂ්ණාවක් ඇති කොට ගන්නවා. ආනන්ද මහෝත්තමයන් වහන්සේ දේශනා කරනවා එම පින්වතුන් මේ කය තෘෂ්ණාවෙන් වැඩුණ නිසා ම තෘෂ්ණාව උපයෝගී කොට ගෙන තෘෂ්ණාව නිරෝධය කරනවාය කියලා.

පින්වත් ඔබ අනාගතයේ යම් දවසක තෘෂ්ණාව නිරෝධය කරනවා නම් වර්තමානයේ ඔබ තෘෂ්ණාව නිරෝධය කරනවාය කියන තෘෂ්ණාව ඔබ තුළින් ඇති කොට ගත යුතු මයි. භව නිරෝධය උදෙසා ඔබ ඇති කොට ගන්නා වූ තෘෂ්ණාව, තෘෂ්ණාවේ වර්ධනය උදෙසා නොව තෘෂ්ණාවේ නිරෝධය උදෙසා මයි හේතු වෙන්නේ.

පින්වත් ඔබ මෙම සටහන කියවන මොහොතේ මොහොතක් ඇස් දෙක පියාගෙන, මම මේ ජීවිතයේදී ම උතුම් සෝවාන්ඵල අවබෝධය සාක්ෂාත් කොට ගන්නවාය කියන තෘෂ්ණාව ඔබ තුළ ඇති කොට ගන්න. පින්වත් ඔබ ඇති කොට ගත් තෘෂ්ණාවට අදාළ සිතුවිල්ල ඊළඟ සිතුවිල්ලෙන් අනිත්‍ය වශයෙන් දකින්න ඔබ දක්ෂ වෙන්න ඕනේ. එවිටයි ඔබ ධර්මානුකූලව තෘෂ්ණාව උපයෝගී කොට ගෙන තෘෂ්ණාව මරා දැමීමේ අර්ථවත් මාර්ගයට අවතීර්ණ වෙන්නේ.

# ප්‍රශ්නය බරපතල වුණත් හේතුඵල ගැලපීමේදී මතුවන දේ සුන්දරයි

ඇසට දකින්න ප්‍රිය කරන, කනට අසන්නට ප්‍රිය කරන, මනසින් විඳින්න ප්‍රිය කරන, මොන තරම් සුන්දර දේවල් ලෝකයේ තිබෙනවාද? සමහරක් පින්වත් මනුෂ්‍යයෝ මොන තරම්, සුන්දර සැපයක් අත්විඳිනවද? අපි අත්විඳින හැම සැපයක් පසුපස ම, සැඟවුණ සුන්දර ධර්මයේ අර්ථයක් තිබෙනවා. අපි පින කියලා කියන්නේ එම සුන්දර ධර්මයේ අර්ථයට. පින අනිත්‍ය වූ සංස්කාරයක් වුණත්, පින විපාක දෙන කොට, පින මයි සැපයට අග්‍ර වෙන්නේ.

පින, සැපයට කියන තවත් නමක් වුවත්. පින ලෝභ, ද්වේෂ, මෝහ, අකුසල් මූලයන් ගෙන් පෝෂණය වුණොත් සැපයට හේතු වෙන පින ම, දුකට හේතු වෙන ගින්දරක් ම වෙන්න පුළුවන් බව, ධර්මයේ සඳහන් වෙනවා.

තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, ගරුත්වයෙන්, කර්මය කර්මඵල විශ්වාසයෙන්, සකසා, විසිතුරුව, ප්‍රනීත භාවයෙන් සිදු කරන පින්කම්, පෙරලා විපාකයට පැමිණෙන්නේ, සුගතියට අදාළව කාම ලෝකයේ, ආයුෂය, වර්ණය, සැපය, බලයට අදාළව මයි. බෞද්ධ සමාජයේ ජීවත් වෙන සත්පුරුෂ පින්වතුන්, පින්කම් සිදු කරනවා දකින කොට භික්ෂූන් වන අපිට සතුටක් ඇති වෙනවා. සත්පුරුෂ පින්වතුන්ලා, ආයුෂය, වර්ණය, සැපය, බලය, වැඩි වැඩියෙන් ලබන කොට, එය සමාජයට, රටට සම්මා සම්බුද්ධ ශාසනයට ආරක්ෂාවක් මයි, යහපතක් මයි.

බුදුරජාණන් වහන්සේ සත්පුරුෂයා වශයෙන් දේශනා කරන්නේ, යම් පින්වතෙක් සම්මාදිට්ඨියෙන් පෝෂණය වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩයිද ඔහු සත්පුරුෂයායි. බුදුරජාණන් වහන්සේ, සත්පුරුෂයාටත් වඩා සත්පුරුෂයා වශයෙන් හඳුන්වන්නේ, සම්මාදිට්ඨියෙන් පෝෂණය වූ, සම්මා ඥාණ, සම්මා විමුක්තීන් සාක්ෂාත් කොට ගත්ත පින්වතාටයි.

බුදුරජාණන් වහන්සේ අසත්පුරුෂයා වශයෙන් හඳුන්වන්නේ යමෙක් මිච්ඡා අෂ්ටාංගික මාර්ගය වඩයිද, ඔහු අසත්පුරුෂයායි. බුදුරජාණන් වහන්සේ, අසත්පුරුෂයාටත් වඩා අසත්පුරුෂයා වශයෙන් දේශනා කරන්නේ, යමෙක් මිථ්‍යාදෘෂ්ඨි ඇත්තේ, මිච්ඡා ඥාණ, මිච්ඡා විමුක්ති වඩයිද, ඔහු අසත්පුරුෂයාටත් වඩා අසත්පුරුෂයායි. ආර්ය ධර්මය තුළ නිවැරදිව ස්ථානගත වෙච්ච සත්පුරුෂයා, පින තුළින් තමා ලබන ආයුෂ, වර්ණය, සැපය, බලය, පෙරලා යොමු කරන්නේ, සත්පුරුෂ ධර්මයන්ගේ ආරක්ෂාව උදෙසා මය.

නමුත් ආර්ය ධර්මයන් සරණ නොගිය, අසත්පුරුෂ පුද්ගලයන්, පින්කම් සිදුකිරීමට පටන් ගත්තොත්, එම අසත්පුරුෂ පින්වතුන් ලබන්නා වූ ආයුෂය, වර්ණය, සැපය, බලය, පෙරලා යොමු කරන්නේ, අසත්පුරුෂ ධර්මයන්ගේ පෝෂණය උදෙසා මය. එය හරියට, වසවර්ති මාරයා සහ මාර පිරිස, පින්කම් සිදු කිරීමට පටන් ගන්නා වගේ භයානක ක්‍රියාවකි.

ධර්මානුකූල හේතුඵල ධර්මයන්ට යටත්ව, සකස් වෙන ඉහත ධර්මතාවන් සම්බන්ධයෙන්, භික්ෂුව ඇඟිල්ල දිගුකරලා කාටවත් චෝදනා කරන්නේ නැහැ. සමාජය තුළ ක්‍රියාත්මක වෙන සත්පුරුෂ ධර්මයන්ගේත්. අසත්පුරුෂ ධර්මයන්ගේත්. සැබෑ රුව ගුණ, පින්වත් ඔබට නිවැරදිව හඳුනාගෙන, නිවැරදිවීම උදෙසාමයි, ඉහත සටහන තැබුවේ. මිථ්‍යා දිට්ඨියෙන් පෝෂණය වූ, මිච්ඡා හැසිරීම් වලින් යුත් පුද්ගලයා, සමාජයට ලොකු අනතුරක් මයි. මෙවැනි මිච්ඡා හැසිරීම් වලින් යුත්

අසත්පුරුෂ පුද්ගලයා සිතනවා, "මම කුලවත්, මම ප්‍රසිද්ධයි, මම විනයගරුකයි, මම බහුශ්‍රැතයි, මාව හැමෝම පිළිගත යුතුයි, මම නිවැරදියි" කියල. මෙම ගතිගුණ අසත්පුරුෂ භාවයේ ලක්ෂණයන්ය කියලා, ධර්මයේ සඳහන් වෙනවා.

අද උදෑසන භික්ෂුව පිණ්ඩපාතය පිළිගැනීමෙන් අනතුරුව පැමිණ සිටි, පනහකට වැඩි පින්වතුන්ලාට, පුණ්‍යානුමෝදනාවන් සිදු කොට, අවසානයේ ප්‍රාර්ථනා කළේ, "නිවන් අවබෝධය ලබන තුරාවට, අසත්පුරුෂ ආශ්‍රයන්, පාපමිත්‍ර ආශ්‍රයන් නොලැබේවා" යැයි කියලා. මහා ගින්නකට, මහා ගංවතුරකට කරන්න පුළුවන් විනාශයකට වඩා, විනාශයක්, අසත්පුරුෂ පුද්ගලයකුට සමාජයට, රටට සිදු කරන්න පුළුවන් බව පින්වත් ඔබ තේරුම් ගත යුතුයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ආර්ය ධර්මයේ නොහැසිරෙන, ආර්යයන් වහන්සේලා ඇසුරු නොකරන, අසත්පුරුෂ පුද්ගලයා, රූපය ආත්මය වශයෙන් දකිනවාය කියලා; වේදනාව, සඤ්ඤාව, සංස්කාර, විඤ්ඤාණ ධර්මතාවන්. ආත්මීය වශයෙන් දකිනවාය කියලා. පංච උපාදානස්කන්ධ ධර්මයන් කෙරෙහි ඇති කොට ගන්නා, කෙල හලන තෘෂ්ණාව, සමාජ ආරක්ෂාව කෙරෙහි, සමාජ යහපත කෙරෙහි ඇති සියලුම ගුණාත්මක ධර්මතාවන් විනාශ කොට දමනවා. වරක් ස්වාමින් වහන්සේ නමක් බුදුරජාණන් වහන්සේ ගෙන් විමසනවා, පංචඋපාදානස්කන්ධය කුමක් මුල් කොට ගෙන ඇති වෙනවාද කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා තෘෂ්ණාව මුල් කොට ගෙනයි, පංචඋපාදානස්කන්ධය සකස් වෙන්නේ කියලා; පංචඋපාදානස්කන්ධය කෙරෙහි යම් ඡන්දරාගයක් වෙත් ද, එයයි එහි උපාදානය කියලා. බුදුරජාණන් වහන්සේ උපාදානය වශයෙන් දේශනා කරන්නේ බැඳී යාමයි. කුමකටද අපි තෘෂ්ණාවෙන් බැඳී යන්නේ, එයයි උපාදානය. සත්ත්වයා,

කාමයන් කෙරෙහි බැඳී යනවා; දෘෂ්ඨීන් කෙරෙහි බැඳී යනවා; මතවාදයන් කෙරෙහි බැඳී යනවා; වැරදි ශීලව්‍රතයන් කෙරෙහි සත්ත්වයා බැඳී යනවා, බුදුරජාණන් වහන්සේ රූපස්කන්ධය පැනවීමට හේතුව, සතර මහා ධාතුව වශයෙන් දකින්නේ නැහැ. වේදනාස්කන්ධය, සඤ්ඤාස්කන්ධය, සංස්කාරස්කන්ධය, පැනවීමට හේතුව, ස්පර්ශය බව දකින්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණස්කන්ධය පැනවීමට හේතුව, නාමරූප ධර්මයන් බව දකින්නේ නැහැ. ධර්මය කෙරෙහි නිවැරදි දැක්ම හෙවත්, දිට්ඨි විශුද්ධිය පිරිසිදු නොවීම නිසාම, ආත්මීය දිට්ඨියේ මමත්වයේ දැඩි භාවය අසිහියෙන් පෝෂණය කොට ගන්නවා.

අසත්පුරුෂ භාවයට පත් වූ පුද්ගලයකු ගේ, ආත්මීය දිට්ඨියෙන් පෝෂණය වූ මමත්වයේ දැඩි භාවය, ශක්තිමත් වෙන ප්‍රමාණයට, , එම අසත්පුරුෂ පුද්ගලයා, සමාජයට ප්‍රකට කරන්නේ, තමන්ගේ චිත්ත විශුද්ධියේ, ශීල විශුද්ධියේ බිඳවැටීමයි. මේ සියල්ලට ම හේතුව වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ලෞකික ප්‍රඥාවට අදාළව දේශනා කොට තිබෙන සම්මාදිට්ඨියේ සහ සම්මා සංකප්පයන්ගේ දුර්වලතාවයන් මයි.

තමා තමාට කෘතවේදී වෙන, තමා තමාට අනුකම්පාව දක්වන පින්වතුන්, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් සකස් කොට දෙන, සම්මාදිට්ඨි සහ සම්මා සංකප්පයන් ගේ තීරණාත්මක භාවය, ධර්ම මාර්ගය පුහුණුවීමේ දී නුවනින් තේරුම් ගන්න දක්ෂ වෙන්න ඕනේ. මේ දක්ෂ භාවය දුර්වල වූ තැන, රූපය ඇසුරින් සකස් වෙන ආයුෂයත් මගේ කොට ගන්නවා. වර්ණයත් මගේ කොට ගන්නවා. සැපයත් මගේ කොට ගන්නවා. බලයත් මගේ කොට ගන්නවා. ජනප්‍රිය භාවයනුත් මගේ කොට ගන්නවා. මේවා මගේ ආත්මය කොට ගන්නවා. මේවා තුළ මම සිටිනවාය කියලා ගන්නවා. මේවා ස්ථිර, සැප, සුභ, දේවල් හැටියට ම ගන්නවා. මෙවැනි පුද්ගලයන් ඉහත අධාර්මික, ධර්මයන් ගුරුකොට ගෙන, තමා තමාවත්. තමා අනුන්වත් අසත්පුරුෂ

භාවයන්ට ම යොමු කොට ගන්නවා. සත්ත්වයා පුහුණු කොට ගන්නාවූ, මේ විකෘති ධර්මයන් නිසා ම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, උතුම් සෝවාන් ඵලයට පත් නොවූ සෑම පින්වතෙක්ම කිනම් හෝ මානසික ව්‍යාධියකින් පෙළෙනවාය කියලා.

රටක් පාලනය කරන පින්වතුන්ලාගේ බඹසර හැසිරීම කියන්නේ, එම පාලක පින්වතුන් ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ශක්තිමත්ව හැසිරීමයි. බඹසර හැසිරීම කියන වචනයේ සැබෑ අර්ථයට අනුව දැකීමේදී අපේ රටේ, රට කඩාගෙනම දුවන්නට හදන සමහරක් පාලක පින්වතුන්ලා තුළ බඹසර කියන අර්ථය ගැවිලාවත් නොමැති බවක් පෙනෙන්නට තිබෙනවා. භික්ෂුව මේ සටහන් තබන්නේ වැරදි ඇතොත් නිවැරදි කොට ගැනීම උදෙසා මයි.

ඕනෑම අසත්පුරුෂ ධර්මයන් වඩන පින්වතෙකුට, කල්‍යාණමිත්‍ර ආශ්‍රය ඔස්සේ සත්පුරුෂයෙක් වීමේ නිදහස, ධර්මය තුළ විවෘතව තිබෙනවා. අපේ මනුෂ්‍ය ජීවිත කියලා කියන්නේ අතීත පටිච්චසමුප්පන්න සංස්කාර ගොඩක එකතුවක් පමණක් මයි. අතීත සංස්කාර හේතුවෙන් සකස් වෙන දැනීම් හෙවත්, විඤ්ඤාණයන් ඔස්සේ, අපි නැවත නැවත භවය සකස් කොට දෙන, සංස්කාරයන් ම රැස් කොට ගන්නවා. විඤ්ඤාණය, සළායතනයන් ගෙන් යම් ආයතනයක බැසගෙන තිබෙනවාද, එම පටිච්චසමුප්පන්න විඤ්ඤාණය පසුපස, අප්‍රකටව සංස්කාරයන් ද බැසගෙන තිබෙනවා. ඵස්සය සකස් වෙන්නේ, අධ්‍යාත්මික රූපයන්, බාහිර රූපයන් විඤ්ඤාණයන් එකතු වීමෙන් වුවත් මේ ඵස්සය තුළත් සංස්කාරයන් බැසගෙන තිබෙනවා මයි. මොකද සංස්කාර හේතුවෙන් මයි. විඤ්ඤාණය සකස් වෙන්නේ. ඒ වගේ මයි, විඤ්ඤාණය හේතුවෙන් මයි නාම රූප ධර්මයන් සකස් වෙන්නේත් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඉහත ධර්මතාවයන්ට අදාළව අපි තේරුම් ගත යුතුයි අපේ සෑම මනුෂ්‍ය ක්‍රියාකාරකමක් පසුපස ම අතීත සංස්කාරයන් හේතුවෙන් සකස් වුණ දැනීම් බැසගෙන තිබෙනවාය කියන කාරණය. ඒ නිසාම අපි දක්ෂ විය යුතුයි. අපි පටිච්චසමුප්පන්නව ප්‍රගුණ කළ, වර්තමානයේ අපි තුළ තිබෙන, උපන් රටට, අහිතකර වැරදි දෘෂ්ටියෙන් මිදෙන්න.

අපේ ජීවිත ඉදිරියට පැමිණෙන සමහරක් ප්‍රශ්න අනුන් ඇති කළා වූ ප්‍රශ්නයන් වුවද, එම ප්‍රශ්න හේතුවෙන්, ඔබ අත් විඳින්නා වූ දුක් වේදනාවන් ඔබේම. පටිච්චසමුප්පන්න අකුසල් විපාකයන් ගේ ඵලයන් මය. නමුත් ඕනෑම ප්‍රශ්නයක්, මොන තරම් ව්‍යාකූල වුවද, එම ප්‍රශ්නය ධර්මානුකූලව හේතුඵල ධර්මයන්ට අදාළව, විග්‍රහ කොට ගන්නා කළ ඕනෑම ව්‍යාකූල ප්‍රශ්නයක් හරිම සුන්දර ධර්මයේ අර්ථයක් ම වෙනවා. සමාජය නිරතුරුව මතු කොට දෙන ප්‍රශ්න තුළින්, පින්වත් ඔබ ඇලීම් ගැටීම් දිශාවට නොයා ඔබට පුළුවන් නම් එම ප්‍රශ්න, ධර්මයේ උපේක්ෂාවෙන් දකින්න, එම දක්ෂ භාවයන් සුන්දර සත්පුරුෂ ධර්මයක් ම වෙනවා.

අපි උතුම් සෝවාන් ඵලයට පත් වෙන මොහොත දක්වා, අපායගාමී වැරදි කරන ස්වභාවයෙන් මිදිලා නැහැ. ඒ නිසාම අපි. උතුම් සද්ධර්මය අපගේ නිවැරදි වීම උදෙසා මයි ප්‍රයෝජනයට ගත යුත්තේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා බුදුරජාණන් වහන්සේලා චීවර, පිණ්ඩපාත, සේනාසන, ඖෂධ යන සිව්පසය උදෙසා භවයේ සැප වර්ණනා කිරීම උදෙසා ධර්මය දේශනා කරන්නේ නැහැය කියලා.

බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයාට කරුණාවෙන් මයි අනුකම්පාවෙන් මයි, හිතෛෂීභාවයෙන් මයි දහම් දේශනා කරන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද සත්තිස්බෝධිපාක්ෂික ධර්මයන් වඩමින්, වාද විවාද නොකර, සමාජයට පූර්වාදර්ශී ජීවිත ගත කරන්න කියලයි බුදුරජාණන් වන්සේ අපිට අවවාද කොට තිබෙන්නේ.

# ගෙයි ගින්දර පිටටත් එපා!
# පිටරටටත් එපා!

බුදුරජාණන් වහන්සේ රාහුල පුංචි ආයුෂ්මතුන්ගේ භාරකාරත්වය පවරන්නේ සාරිපුත්ත මහ රහතන් වහන්සේට. බුදුරජාණන් වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේව හඳුන්වන්නේ සංඝ සමාජයේ කිරි මව කියලයි. නිහතමානිභාවයේ පරතෙරට ගිය අයිතිවාසිකම් මඟහැර තම යුතුකම් පමණක් ම පූර්වාදර්ශයන් ගෙන්ම සංඝ සමාජයට ඉටුකළ සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේගේ අයෝමය සංඝ ගුණයන් භික්ෂුවට මේ හිමිදිරි උදෑසන සිහියට නැඟෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ, මහා ප්‍රඥාවන්තය කියලා. "උන්වහන්සේ රූපාවචර ධ්‍යාන සම්පත්, අරූපාවචර ධ්‍යාන සම්පත් අත්විඳීමේ පරතෙරට පැමිණි උත්තමයෙක්. උන්වහන්සේ රූප සඤ්ඤාවන් ඉක්මවා ගොස්, අකාසානඤ්චායතනයට සමවැදී වාසය කරනවා; ආකාසානඤ්චායතනය ඉක්මවා ගොස් විඤ්ඤාණඤ්චායතනයට සමවැදී වාසය කරනවා; විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ගොස් ආකිඤ්චඤ්ඤායතනයට සමවැදී වාසය කරනවා; ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා ගොස් නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට සමවැදී වාසය කරනවා; නේවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා ගොස් නිරෝධ සමාපත්තියට සමවැදී වාසය කරනවා. මේ සියලු ම ධර්මයෝ හටගෙන අනිත්‍ය

වන බව දැනගන්නා ආර්ය ශීලයෙන්, ආර්ය සමාධියෙන්, ආර්ය ප්‍රඥාවෙන්, ආර්යඥාණ දර්ශනයෙන් සහ ආර්ය විමුක්තියෙන් සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ පරිපූර්ණවයි, අවසාන සිරුර දරාගෙනයි, වැඩ සිටින්නේ" කියලා බුදුරජාණන් වහන්සේ සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේගේ මහා ගුණයන් දේශනා කොට තිබෙනවා.

මේ උතුම් ගෞරවණීය සංඝ සමාජයේ එක සාමාජිකයෙක් තුළ නිධන්ගතව තිබෙන ඉහත උතුම් ගුණයන් මේ ලැබුවා වූ නව වසරේ උදාවත් සමග ඔබ මොහොතක් නුවණින් මෙනෙහි කළොත් එය පින්වත් ඔබට මොන තරම් නම් සැනසිල්ලක් වේවිද? උතුම් සංඝ සමාජය කෙරෙහි මොන තරම් නම් ප්‍රසාදයක් ඇති වෙයිද? සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ සිටියේ කොතැනද? අපි සිටින්නේ කොතැනද කියලා, අපේ ජීවිත වලට අප්‍රමාදීභාවය උදා කොට ගන්න මොන තරම් නම් පිටිවහලක් වේවිද?

සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ ගේ නිහතමානී සත්පුරුෂ භාවය, වර්තමාන මාන්නයේ අසත්පුරුෂ භාවයන්ට මොනතරම් නම් ගුරු උපදේශයක් වෙනවාද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අසත්පුරුෂ පුද්ගලයාට මෙහෙම සිතෙනවාය කියලා. "මම කුලවත්, මම ධනවත්, මම ප්‍රසිද්ධයි, මම ජනප්‍රියයි, මම හොඳින් සිවුපසය ලබනවා, මම බහුශ්‍රැතයි, මම විනයධරයි, මම ධර්මකථිකයි, මම පාංශුකූලිකයි, මම පිණ්ඩපාතිකයි, මම ධ්‍යාන සම්පත් තිබෙන කෙනෙක්, තමා තමාවම වර්ණනා කොට ගන්නවා, අනුන්ව හෙළා දකිනවා. මේවා අසත්පුරුෂ ධර්මයන්ය" කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. භික්ෂුව පින්වත් ඔබට මේවා සටහන් තබන්නේ, ඔබටත් වැරැදි ඇතොත් නිවැරැදි වීම සඳහා මයි. එසේ නැතිව කටපාඩම් කොට ගැනීම සඳහා නම් නොවේ.

දැන් වේලාව උදෑසන 4.20 යි. මේ වෙලාවේ පින්වත් ඔබ අලුත් අවුරුද්දට කිරිබතක් උයන්න ලක ලැහැස්ති වෙනවා වෙන්න පුළුවන්. එසේත් නැතිනම් පින්වත් ඔබ ආගමික කටයුතුවල යෙදී සිටිනවා වෙන්නත් පුළුවන්. එසේත් නැතිනම් මධ්‍යම රාත්‍රියේ අවිද්‍යාවේ රතිඤ්ඤා පත්තු කරලා පංචනීවරණ තුරුල් කරගෙන තද නින්දේ වෙන්නත් පුළුවන්. එසේත් නැතිනම් මත් වතුරෙන් මත්වී සව්දිය පිරූ ෂැම්පේන්වලින්, දහදියෙන් තෙමී ගිය ඇඳුම් වලින් යුතුව තවමත් බාල් නටනවා වෙන්නත් පුළුවන්. පංචඋපාදානස්කන්ධය නමැති එකම ලෝකය තුළ තෘෂ්ණාවේ විවිධත්වයට අදාළව ඉන්ද්‍රිය ධර්මයන්ගේ විවිධත්වයට අදාළව අපේ විඳීම් විවිධාකාරවයි ක්‍රියාත්මක වන්නේ. මේක තමයි ලෝකය, කිසිම සාධාරණයක්, කිසිම අසාධාරණයක් නැහැ. පින්වත් ඔබගේ ඇලීම් සහ ගැටීම්වලට අදාළව මදි නොකියන්න, තෘෂ්ණාව නමැති වධකයා සංස්කාර නමැති හැන්දෙන් විඤ්ඤාණය නමැති දැනීම්, කැමැත්ත, අකමැත්ත බෙදා දෙනවා.

අපි පුංචි කාලේ අපේ අම්මලා දර ළිප අවුලවල නැවුම් මැටි මුට්ටියේ පොල්කටු හැන්දෙන් කිරිබත් උයපු හැටි භික්ෂුවගේ මතකයට නැඟෙනවා. ඊට පෙරදා සවස කිරිබත තුනී කිරීමට අවශ්‍ය කෙසෙල් කොළය කපා තබන්නේ මම. ඒ කෙසෙල් පඳුරු තිබ්බ තැන දැන් සලකුණක් වත් නැහැ. දරළිප, පොල්කටු හැන්ද මේ සියල්ලම වෙනස් වෙලා. පහසුවේ නාමයෙන් පැන්ටිගත වූ තාක්ෂණයේ මාර ගෑස් ලිප, පින්වත් ඔබට පහසුවටත්, ලාභයටත්, ඉක්මනටත්, රසවත්වත්, පිරිසිදුවටත් කියන මාර ශබ්ද කෝෂයේ වචන වලට මුවා වෙලා දිවේ රස තෘෂ්ණාව, මාර වේශයෙන් වේගවත් කොට දී තිබෙනවා.

අනිත්‍යයි කියන අර්ථය සිහිපත් කරමින් සිටින විට පරිසරයේ නිහඬතාව අනිත්‍ය වී, ගසක ලැග සිටින මොණරෙකුගේ වේගවත් කෑගැසීමේ හඬ භික්ෂුවට ඇසෙනවා. මොණරු වේගයෙන් කෑගසන කොට එම හඬට ප්‍රතිචාර දක්වන්න ළඟපාත ගස්වල

ලැග සිටින මොණරුන් හැමෝම කෑගසනවා. මොණරුන්ගේ මේ කෑගැසීම එම සතුන්ගේ සමගියද, එහෙමත් නැතිනම් බියට පත්වීමද කියන්න භික්ෂුව දන්නේ නැහැ. නමුත් එම සතුන් අතර අපේකම තිබෙනවා. අනතුරක සේයාවක් ඉදිරියේ එම සතුන් එක්ව ප්‍රතිචාර දක්වනවා.

තිරිසන් සතුන් අතර අපේකම තිබුණත්, අපේ රටේ පින්වත් ජනතාව අතර අපේකම වේගයෙන් දුර්වල වීගෙන යනවා. අපි අතර අපේකම දුර්වල වීම නිසා ම අපේ රට වර්තමානයේ, විදේශීය තානාපතිතුමන්ලාගේ අතේ නැටවෙන රූකඩයක් බවට පත් වෙලා තිබෙනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ගෙදර ගින්දර පිටට දෙන්න එපාය කියලා. මේ ධර්මය බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ විවාහ ජීවිත ගතකරන අඹුසැමියන්ට. බුදුරජාණන් වහන්සේ ගෙදර ගින්දර පිටට දෙන්න එපාය කියලා කියන්නේ ගෙදර නෝනා සහ මහත්මයා අතර තියෙන ප්‍රශ්න පිට අයට කියන්න එපාය කියන කාරණයයි.

අපි ජීවත් වන සමාජය තුළ දික්කසාද, අඹුසැමි සමගිය බිඳවැටීම, විනෝදාංශයක් බවට පත්වූ කාමයේ වරදවා හැසිරීම්, ඔඩුදුවමින් පවතින පරිසරයක් තුළ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඉහත ධර්මය, සමාජයට ගොඩාක් වටිනවා. මොනම හේතුවක් නිසාවත්, බිරිඳ තමන්ගේ ස්වාමිපුරුෂයාගේ වැරැදි පිටස්තර අයට ප්‍රකාශ කිරීම සුදුසු නැහැ.

සිංහල බෞද්ධ කාන්තාවක් කියන්නේ බුදුරජාණන් වහන්සේගේ ධර්මයන්ට දිවි හිමියෙන් ගරුකරන කෙනෙක්. හේතුඵල ධර්මයන්ට අදාළව ලෝකය දකින්න උත්සාහ ගන්න කෙනෙක්. තමන්ගේ ස්වාමිපුරුෂයා හෝ ස්වාමි දියණිය යම් වරදක් කරනවා නම්, එම වරද නිසා ඔබ දුකට පත් වෙනවා නම් එය ඔබේත් අතීත අකුසල් සංස්කාරයක විපාකයක්. තනි අතකින් අපිට අත්පුඩි ගහන්න බැහැ. අත් දෙකක එකතුවයි,

අත්පොළසන් හඬ කියන්නේ. ස්වාමිපුරුෂයෙකුට වැරැද්දක් කරන්න දැනීම් සකස් වෙන්නේ නෝනා මහත්මියගේත් අතීත අකුසල් සංස්කාරයන් නිසා මයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ගෙදර ගින්දර පිටට දෙන්න එපාය කියන්නේ අඹුසැමියන් තමන්ගේ විවාහ ජීවිතයේ ප්‍රශ්න, තමන් විසින්ම, ඉවසීමෙන්, සමගියෙන්, හේතුඵල ධර්මයන් දකිමින් විසඳා ගන්න කියන කාරණයයි. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඉහත ධර්මයට අපි අකීකරු වී පවුල් ජීවිතවල ප්‍රශ්න පිටස්තර පින්වතුන්ට ප්‍රකාශ කළොත්, ඒවායේ අතුරු විපාකයන් නිසා ඇති කොට ගන්නා අකුසල් සංස්කාරයන්, අනාගත භව ගමනේ, අනාගත විවාහ ජීවිත, මහා ගිනි ජාලාවන් බවටම පත්වේවි.

ධර්මානුකූලව අපේ ජීවිත කියන්නේ ප්‍රශ්න පත්‍රයක්. එම ප්‍රශ්න පත්‍රයට සාර්ථකව පිළිතුරු ලියන්න තමයි, බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගය දේශනා කොට තිබෙන්නේ. එම නිසා අඹුසැමි ප්‍රශ්න තිබෙන පින්වත් ඔබ ඉවසන්න. ඔබ ඉවසන තෙක් ධර්මය මඟ බලාගෙන සිටී. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි කීකරු වූ ඔබට අකුසලය යටපත් කොට කුසලය මතු කොට දීමටය.

ලැබුවා වූ නව වසරේ දී විවාහ ජීවිත ගතකරන පින්වතුන්ට ඇතිවන මත ගැටුම් හේතුවෙන් දෙදෙනා දෙදෙනාට ආඩම්බරකම් පෙන්වමින් අහක බලාගෙන ඉන්නේ නැතුව මමත්වයේ දැඩි භාවය මොහොතකට තුනී කොට ගෙන ගෑස් ළිපේ බත් හැළිය ඉදෙන්නත් ළඟයි, ඉක්මණට සමගි වෙන්න.

ගෙදර ගින්දර පිටට දෙන්න එපාය කියලා බුදුරජාණන් වහන්සේ අඹුසැමියන්ට දේශනා කළත්, වර්තමානයේ අපේ රටේ පින්වත් පාලක පින්වතුන්ලාටද ඉහත ධර්මය ගොඩක් වටිනවා. අපේ සමහර පින්වත් පාලකතුමන්ලා තුළ අපේකම නැති නිසාම රටේ ගින්දර ජාත්‍යන්තරයට දෙනවා. ඒ කියන්නේ රටේ ප්‍රශ්න

ලෝකයට කියනවා. ඒ නිසාමයි භික්ෂුව මුලින් සටහන් තැබුවේ වර්තමානයේ අපේ රට විදේශීය තානාපතිතුමන්ලාගේ අල්ලේ නැටවෙන රටක් බවට පත්වෙලා තිබෙනවාය කියල.

මෙවැනි ක්‍රියාවන්ට, අතීතයේ අපේ පැරැන්නෝ ප්‍රකාශ කළේ දෙවියන්ගේ හාල් කැවිලයි කියලයි. නමුත් වර්තමානයේ සමාජයට සද්ධර්මයේ අර්ථයන් නිවැරැදිව ගළපා ගැනීමට ඇති ශක්තිය නිසා ජනතාව දන්නවා, රටේ ගින්දර ජාත්‍යන්තරයට දෙන්නේ, අදාළ බලධාරින්ගේ අසිහියෙන් පෝෂණය වූ තෘෂ්ණාව නිසා මය කියලා.

වර්තමානයේ අපි, ජනප්‍රිය අනුකරණයන් ජීවිත වලට එකතු කොට ගෙන සෑම මොහොතක ම සතුටු කරන්නේ පංච නීවරණ වල බැස ගන්න තෘෂ්ණාවෙන් අසිහියට පත්වූ පින්වතුන් මයි. මේ ලැබුවාවූ නව වසරේදී පින්වත් ඔබ යහපුරුදු තුළින් යහපත් මනුෂ්‍යයන්ව යහපත් දෙවියන්ව සතුටු කරන්න. එය පින්වත් ඔබට සමස්ත යහපත ගරු කරන ලෝකයාට ම පූජා කරන ආයුෂ, වර්ණය, සැපය, බලය පිරි සතුටේ සංසිඳීමේ දානයක් ම වෙනවා.

# තමන් තුළටම එබී බලන්න, ලොව බිහිසුණුම අඳුර ඇතිදැයි කියා

රූපයේ ආශ්වාදයත්, කාමයේ ආශ්වාදයත් මගේම ආත්මය කොට ගත් තැනදී තාරුණ්‍යයේ සිතුවිලි විනයෙන් සදාචාර ධර්මයන් ගෙන්, ශීලාචාර ධර්මයන් ගෙන් පෝෂණය වීමේ ඉඩකඩ හොඳටෝම අඩු වෙනවා.

මහා පරළාහ නිරයේ යම් තිරිසනෙක් කනෙන් යම් ශබ්දයක් ඇසුවොත්, තමන් අකමැති ශබ්දයක් මයි අසන්නේ. කවදාකවත් තමන්ට කැමැති ශබ්දයක් ඇසෙන්නේ නැහැ. එම නිරිසතුන් තම නාසයෙන්, දිවෙන්, ශරීරයෙන් යම් විඳීමක් ලැබුවොත් එම විඳීම තමන් අකමැති විඳීමක් මයි. තමන් කැමැති තමන් සතුටු විඳීමක් කවදාකවත් ලබන්නේ නැහැ. මහා පරළාහ නිරයේ යම් තිරිසනෙක්, තම සිතින් යම් සිතුවිල්ලක් සිතුවොත් එම සිතුවිල්ල දුක, වේදනාව, අමිහිර දෙන සිතුවිල්ලක් මයි. කවදාකවත් සතුටු සිතක් ප්‍රියමනාප සිතුවිල්ලක් ඇති වෙන්නේ නැහැ. මෙම ස්වභාවය මහා පරළාහ නිරයේ ජීවත්වෙන නිරිසතුන් විඳින අකුසල් විපාකයක්.

තෘෂ්ණාවේ අසිහියෙන් මත්වෙලා කාමයේ ආශ්වාදයෙන්, රූපයේ ආශ්වාදයෙන් මත්වෙලා, කැමැති කැමති සිතුවිලි සමඟ පොරබදන, අපිට අකමැති දේවල් ම විඳින මහා පරළාහ නිරය කමටහනක් ම වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දුක අධික, සතුටක් නැති මහා පරළාහ නිරයට වඩා දරුණු කටුක බිහිසුණු අනතුරක් තරුණ මධ්‍යම මහළු අපිට තිබෙනවාය කියලා. එම බිහිසුණු අනතුර තමයි, යම් පින්වතෙක් ජාති, ජරා, ව්‍යාධි, මරණ මේ දුක යයි දුක තතු සේ නොදනීද, මේ දුකට හේතුව තෘෂ්ණාව යැයි දුකට හේතුවන කාරණය තතු සේ නොදනීද, මේ දුකේ නිරෝධය යැයි, දුකේ නිරෝධය තතු සේ නොදනීද, මේ දුක නිරෝධය කිරීමේ මාර්ගය යැයි, දුක නිරෝධය කරන මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය ගැන තතු සේ නොදනීද, ඒ නිසා ම නැවත උපතකට අවශ්‍ය වෙන සංස්කාරයන් කෙරෙහි ම තෘෂ්ණාවෙන් ඇලෙයිද, දුකට හේතුවන සංස්කාරයන් ම ජීවිතයෙහි රැස්කොට ගනීද, එය මහා පරළාහ නිරයට වඩා අනතුරුදායක බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තමන් කැමති රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන්, ධර්ම රූපයන් සොයාගෙන තෘෂ්ණාවේ අසිහියෙන්, ඉන්ද්‍රිය අසංවර භාවය ඇති කොටගත් ආශ්වාදයේ කරවටක් ගිලුණු ඕනෑම පින්වතෙකුට උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති කියන ධර්මතාවය තුළ මහා පරළාහ නිරය, කල්ප ගණනක් දීර්ඝ වාසස්ථානය වෙන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යම් අරුණෝදයක් වේද, එම අරුණෝදය, උදාවෙන නව යොවුන් හිරුට පෙර නිමිත්තක්ය කියලා. දෙසැම්බර් මාසයේ දී නම් පාන්දර පහයි තිහට, කුටියේ මිදුල අමදින්න අවශ්‍ය ආලෝකය පරිසරයේ තිබුණා. මේ ජනවාරි මාසයේ හිරු උදා වෙන්නේ ටිකක් ප්‍රමාද වෙලා. ඒ නිසා භික්ෂුව උදෑසන හය වෙනකම් සිටිනවා මිදුල අමදින්න. අපි සෑම බුද්ධ වන්දනාවක් ම අවසානයේ දීම, පින්කමක් අවසානයේ දී, පිණ්ඩපාත දානයක් අවසානයේදී මියගිය ඤාතීන්ට, දෙවියන්ට, පින් අනුමෝදන් කරන්නේ, අප වටා අපට නොපෙනෙන, දෙවියන් අමනුෂ්‍යයන් සිටින නිසා මයි. භික්ෂුවට හොඳටෝම විශ්වාසයි, පිණ්ඩපාත මඩුවක් අසල පින්වත් ඔබ බෙදන දානයට, අත ගහලා සතුටු වෙන්න,

ඔබ සිදු කරන පින්කම් දැකලා සතුටු වෙන්න, ඔබ ලබාදෙන පින් අනුමෝදන් වෙන්න සිය ගණන් දෙවියන්, අමනුෂ්‍යයන් රැස්වෙලා සිටිනවාය කියන කාරණය. භික්ෂුව උදෑසනට සවසට කුටිය අවට පිරිසිදු කරන්නේ මනුෂ්‍යයන් පින්වත් ඔබලා වගේම පිනට කැමැති පින සොයාගෙන පැමිණෙන දිව්‍ය සහ අමනුෂ්‍ය ප්‍රජාවන් සතුටු කිරීම උදෙසා මයි. මේ දැක්ම උතුම් සම්මා දිට්ඨියෙන් පෝෂණය වූ උතුම් අර්ථයක්.

අපි හැමෝම ලස්සනට කැමැතියි. පිරිසිදුකමට කැමැතියි. අපි ලස්සනට පිරිසිදු භාවයට අකමැති නම් එය බලවත් අකුසලයක්. පින්වත් ඔබ කවදාකවත් පන්සලක, ආරණ්‍යයක, කුටියක, වැලි මළුවක් අපවිත්‍ර කරන්න එපා. ඊයේ පෙරේදා දවසක පුංචි දරු පැටියෙක්, භික්ෂුව ලස්සනට ඇමදලා තිබ්බ වැලි මළුවේ තම සිඟිති දෙපාවලින් එක එක හැඩයේ රූපයන් ඇඳලා. භික්ෂුව එම පුංචි පින්වත් දරුවාට ප්‍රකාශ කළා, දරුවෝ කුටියේ වැලි මළුව අපිරිසිදු කරන්න හොඳ නැහැ. ඔබේ හිසකෙස් අවුල් සහිත හිසකෙස් බවට පත් වෙන්න පුළුවන්.

සමහර පින්වත් කාන්තා පක්ෂයේ පින්වතියන් ගේ හිසකෙස් හරියට අවුල් වැඩියි. මේවා ධර්මානුකූල හේතුඵල ධර්මයන්. ගෞරවණීය ස්වාමීන් වහන්සේලා, සිල්වත්ව, මෙත් සිතින්, මනුෂ්‍යයන්, දෙවියන්, අමනුෂ්‍යයන් සතුටුවේවා යැයි කියලා, මාගේ භික්ෂු ජීවිතයේ කෙලෙස් සියුම්වීම උදෙසා, භික්ෂු වත, ශක්තිමත් වේවා යැයි සිතලා ලස්සනට අමදින මිදුල, අපවිත්‍ර කිරීමෙන් අගෞරවයෙන් පාවහන් පයලා ගෙන ඇවිදීමෙන් තරුණ කාලයේදී ම ඔබේ හිසකෙස් ඇද වෙන්න පුළුවන්. හිසකෙස් වැටෙන්න පුළුවන්. ඔබට අපිරිසිදුව සිටින්නට සිතුවිලි සකස් වෙන්න පුළුවන්. හැමෝගේම ආදරයෙන්, අවධානයෙන් අපි බැහැර වෙන්න පුළුවන්. හිසකෙස් සුදු වෙන්නේ, හිසකෙස් වැටෙන්නේ පීනස නිසා බව තුන්දොස් කිපීම නිසා බව ඇත්ත. නමුත් තුන්දොස් කිපීමටත් හේතුවක් තිබෙනවා. ඒ හේතුවට බෙහෙත් තිබෙන්නේ ධර්ම රත්නය තුළ පමණක් මයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ඉර, සඳ, ආලෝකය නොදෙන මහා ඝන අඳුරේම සැමදා ගිලී පවතින ස්ථානයන් මේ ලෝකයේ තිබෙනවාය කියලා. ඒවායේ ජීවත් වෙන සත්වයන්ට පෙනෙන ඇස් දෙකක් තිබුණත්, එකිනෙකා පෙනෙන්නේ නැහැ. මෙම අඳුරම උරුම කොටගත් දුක්ඛිත සත්වයන්ට, එකිනෙකා පෙනෙන්නේ තමන් වගේම තවත් සත්වයන් මේ අඳුරේ ජීවත් වෙන බව දකින්නේ, කල්ප ගණනාවකට වරක් උදාවෙන ලෙව්තුරා බුදුරජාණන් වහන්සේ උතුම් සම්මා සම්බුද්ධ රාජ්‍යය අවබෝධ කොට ගන්නා නිමේෂයේදී පමණක් මයි. මේ මොහොතේ භික්ෂුව දෑස් දෙක පියාගෙන නුවණින් දකිනවා අතීත සංසාරයේ පටිච්චසමුප්පන්නව කල්ප කොච්චර නම් කාලයක් අඳුරේ ම ගිලී පවතින මේ ලෝකයන් තුළ මම දුක් විඳින්න ඇතිද කියලා.

මම බුද්ධෝත්පාද කාලවල ඉපදිලා, විද්‍යාව කියන අර්ථයට, විමුක්තිය කියන අර්ථයට විහිළු කරලා අවිද්‍යාව ශක්තිමත් කොට ගෙන මෙවන් අඳුරු ගුහා තුළ මොන තරම් දුක් විඳින්න ඇතිද?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහණෙනි මේ ඉර, සඳ, එළිය නොදෙන හැමදාමත් ඝන අඳුරේ ගිලී පවතින, අඳුරු ස්ථානයන්හි සත්ත්වයා විඳින දුකට වඩා වැඩි දුකක් මේ ලෝක ධාතුවේ තිබෙනවාය කියලා. එම අඳුරට වඩා බිහිසුණු වියරු අඳුරක් ලෝකයේ තිබෙනවාය කියලා. එම අඳුර තමයි, යම් භික්ෂුවක් යම් ගිහි පින්වතෙක්, ජාති, ජරා, ව්‍යාධි, මරණ මේ දුක යැයි තතුසේ නොදනීද, මෙයයි දුකට හේතුව යැයි, තෘෂ්ණාව ගැන නොදනීද, මෙයයි දුකේ නිරෝධය යැයි තතු සේ නොදනීද, මෙයයි දුක නිරෝධය කරන මාර්ගය යැයි, තතුසේ නොදනීද, මේ නොදැනීම නිසාම දුකට හේතු වෙන සංස්කාරයන් කෙරෙහි තෘෂ්ණාවන්ම බැසගනීද, නැවත නැවත උපතකට අදාළ සංස්කාරයන් ම රැස් කොට ගනීද, සඳු, හිරු එළිය නොදෙන වියරු ඝනාන්ධකාරයට වඩා චතුරාර්ය

සත්‍යය ධර්මයන් නොදැනීමේ බිහිසුණු අඳුර බලවත්ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පින්වත් ඔබ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනාවක් උතුම් දස පාරමී ශක්තියෙන් උපන් චතුරාර්ය සත්‍ය ධර්මයන්ට ඒ තුළින් ලබන විද්‍යා විමුක්තියට අපහාස කළොත්, විහිළු කළොත් ඉර, හඳ, ආලෝකය නොදෙන මහා ඝන අඳුරු ලෝකයන්, පටිච්ච සමුප්පන්නව ඔබ එනතුරු මඟ බලාගෙන සිටිනු ඇත කියලා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අපි විදර්ශනා නුවණින් අවබෝධ කොටගත යුත්තේ රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ ධර්මයන් ගේ අනිත්‍ය භාවය යැයි කියලා. අපි රූපය විතරක් අනිත්‍යයයි කියලා දකිමින් සිටියාම අර්ථවත් ඵලයක් ලැබෙන්නේ නැහැ. අපි වේදනාව පමණක් අනිත්‍යයි කියලා දකිමින් සිටියාට අර්ථයේ ඵලයක් ලැබෙන්නේ නැහැ. අපි පංචඋපාදානස්කන්ධ ධර්මයෙන්ගේ ම වර්තමාන අතීත අනාගත අනිත්‍ය භාව අවබෝධ කොට ගන්න ඕනේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අප විදර්ශනා නුවණින් ප්‍රහාණය කළ යුත්තේ අවිද්‍යාව සහ භවයට ඇති තෘෂ්ණාවයි කියලා. ඉර, සඳ, ආලෝකය නොදෙන මහා ඝන අඳුරේ ගිලී පවතින ලෝකයන්ට වඩා අවිද්‍යාවේ අඳුර අති බිහිසුණු නම් කරුණාකර පින්වත් ඔබ, අවිද්‍යාව දුරු කරන්න. අවබෝධයෙන්ම පහකොට දමන්න. භවය, ජාති, ජරා, ව්‍යාධි, මරණවලට තෝතැන්නක් නම් කරුණාකර, භවාත්‍රය කෙරෙහි තෘෂ්ණාව අවබෝධයෙන් ම දුරු කරන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇති ඉහත ධර්මයෙන් පැහැදිලි වෙනවා, මේ උතුම් ආර්ය විනයෙහි, සැපයෙන් වාසය කිරීමක් හැටියට සැලකෙන ලෞකික ධ්‍යාන සම්පත්තීන් තුළත්, අනාගත දුකටම හේතුවෙන, තෘෂ්ණාව බැසගෙන තිබෙනවාය කියන කාරණය.

සුන්දරම ලෞකික සැපය වන ලෞකික ධ්‍යාන සම්පත්තීන් තුළත්, දුකට හේතුවෙන තෘෂ්ණාව බැසගෙන තිබෙනවා නම් අපිට ඉතිරිව ඇත්තේ දුක සහ සැප දෙකම සකස් කොට දෙන පංචඋපාදානස්කන්ධ ලෝකය අනිත්‍ය වශයෙන් විදර්ශනා නුවණින් දකිමින් ලෝකය නිරෝධය කිරීම පමණක් මයි.

සුන්දරව ලෞකික ධ්‍යාන සැපයන් තුළත් දුකට හේතුව තෘෂ්ණාව බැසගෙන තිබෙනවා නම්, වර්තමාන සමාජයේ පින්වත් ඔබට, දුක අමතක කොට දුක මතින්, දුක බොරුවෙන්, අමතක කොට එන්න අපිත් සමඟ සැප ලබන්න යැයි ඔබට අතවනන, පංචනීවරණ මිච්ඡා ශාස්තෘවරුන්ගේ වැදි බණ, මොන තරම් නම් මිථ්‍යාවක්ද?

ඇත්ත මොන තරම් සුන්දර වුවත්, ඇත්ත මතුකොට දකින්න නම් අතීතයේ දී චතුරාර්ය සත්‍ය ධර්මය නමැති ඇත්ත අවංකවම ජීවිතයට එකතු කොට ගැනීමෙන්, ඇති කොට ගත් කුසල් සංස්කාරයන් අත්‍යවශ්‍ය ම වෙනවා.

පංචඋපාදානස්කන්ධ ලෝකය කෙරෙහි තෘෂ්ණාව උපදින්නේ, ඵස්සය කෙරෙහි ඇති කොට ගත් කැදර කමේ අඩු, වැඩි භාවය නිසා මයි. අනාගාමී ඵලයට පත්වූ පින්වතාටත්, පංචඋපාදානස්කන්ධ ලෝකය කෙරෙහි කාම, රාග, පටිඝ ධර්මයන් නිරෝධය වූ එහෙත් ඵස්සය කෙරෙහි අනුෂය තෘෂ්ණාවක් තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අශූචි කන්දත්, අශූචි බිඳත්, එකම ගඳකින් යුක්තයි කියලා. ඒ නිසාම භවයේ බියකරු බව දකින ආර්ය ශ්‍රාවකයා, උතුම් අනාගාමී ඵලයට පත් පින්වතාට ඉතිරිව ඇති එකම ආත්ම භාවයන් අශූචි බිඳක් හැටියට දකින්න කියලයි අපිට දේශනා කොට තිබෙන්නේ.

පින්වත් ඔබ උතුම් අනාගාමීඵල අවබෝධය, තෘෂ්ණාවෙන් යුතුව, ආශ්වාදයෙන් යුතුව, නිත්‍ය සඤ්ඤාවෙන් යුතුව, වර්ණනා කරනවා නම්, භික්ෂුව සිතනවා, පින්වත් ඔබ එම නිත්‍ය සඤ්ඤාවෙන්, බැහැර වෙන තුරාවට, ඔබට උතුම් සෝවාන් ඵල අවබෝධයට පත් වෙන්න බැහැය කියලා.

භික්ෂුව මුණගැසෙන්න පැමිණි, පුංචි දියණියකගේ මව්පිය දෙපළක්, ප්‍රකාශ කළා "ස්වාමීන් වහන්ස, අපේ දියණිය උදේට පාසල් යෑමට සූදානම් වීමේදී අපිව කේන්ති ගස්සවනවා"ය කියලා. මේ ප්‍රශ්නය පාසල් වයසේ දරුවන් සිටින දෙමාපියන්ට බහුලව තිබෙනවා. මෙවැනි ප්‍රශ්න අපේ අම්මා තාත්තලාගේ හෘද සාක්ෂියට, තට්ටු කරලා කියනවා, අප තවම අනුන්ගේ පාලනයෙන් මිදිලා නැහැය කියලා.

# දුක නමැති රෝගයට එකවර ඔසු දෙකක්

පංචඋපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාවෙහි, අපි සිදු කරන, වැරදි ඇවතුම් පැවතුම් ද රෝගී භාවයේ දුක්, වේගයෙන් සමාජගත කරනවා. පින්වත් ඔබ රෝගී භාවය නිසා දුක් විඳින පින්වතෙක් නම් රෝගී භාවයට එකම හේතුව තෘෂ්ණාවයි. ඔබට රෝගී භාවයේ දුක අඩු කොට ගැනීමට අවශ්‍ය නම් ඔබ තෘෂ්ණාවයි අඩු කොට ගත යුත්තේ. තෘෂ්ණාව අඩු කරන, එකම ධර්මානුකූල මාර්ගය, ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. රෝගී භාවයෙන් දුක් විඳින පින්වත් ඔබට ධර්මානුකූලව ගත යුතු එකම බෙහෙත උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශක්තියයි.

රෝගී පින්වතා ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වීමෙන් තම දුක නමැති රෝගයට ඖෂධ වර්ග දෙකක් එකවර ජීවිතයට එකතු කොට ගන්නවා. වර්තමානයේ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වීමෙන් තෙරුවන් කෙරෙහි කීකරු භාවයෙන් ඔබ තුළ වැඩෙන ශීලයේ, මෛත්‍රියේ, ශක්තියෙන් ඔබ ජීවිතයට එකතු කොට ගන්නා අනවශ්‍ය ආහාර සහ වැරදි ඇවතුම් පැවතුම් කෙරෙහිත්, ඒවායින් වැළකීම කෙරෙහිත්, සතිය සිහිය ඇති කොට ගන්නවා. දෙවැනිව වර්තමානයේ රෝගී ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගය ශක්තිමත් කොට ගැනීමේදී ජීවිතයට එකතු වෙන කුසල් ශක්තිය නිසා, රෝගී භාවයට අදාළව විපාකයට පැමිණෙන අතීත අකුසල් සංස්කාර වලට අදාළ වැරදි, දැනීම් මැඬ පවත්වා ගැනීමේ ශක්තිය ඔබට ලැබෙනවා.

පින්වත් ඔබට ශරීරයට නුසුදුසු කෘත්‍රිම ආහාර, රසකාරක වසවිස සහිත ආහාර, අධික පෝෂණයෙන් යුත් ආහාර සීමාව ඉක්මවා අපථ්‍ය ආහාර අනුභව කිරීමට දැනීම් සකස් වෙන්නේ අනාගතයේ රෝගී භාවයට අදාළ විපාකයට පැමිණීමට ඇති සංස්කාරයන් හේතුවෙන් සකස් වෙන දැනීම් නිසා මය. ආර්ය අෂ්ටාංගික මාර්ගය දුර්වල පින්වතාට, ඉන්ද්‍රිය අසංවර භාවය නිසාම සිතෙන සිතෙන දෙය, දකින දකින දෙය ආහාරයට ගැනීමට දැනීම් සකස් වෙනවා. වර්තමානයේ නිරෝගී ඔබ ඇති කොට ගන්නා වූ ආහාරය සහ වැරදි ඇවතුම් පැවතුම් කෙරෙහි තෘෂ්ණාව අනාගතයේදී ඔබ අත්දකින රෝගී දුකේ පෙර නිමිත්තකි. ඉහත සටහනෙන්, පින්වත් ඔබට තේරුම් යන්න ඕනේ, ඔබ අත්විඳින රෝගී දුකට සුදුසුකම් ලත් වෛද්‍ය ප්‍රතිකාර ලබන ගමන් ම ඔබ ශක්තිමත් කොට ගන්නා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ කුසල් ධර්මයන් ගෙන් පෝෂණය වූ සිතේ ශක්තියයි ධර්මානුකූලව ඔබේ නිරෝගී භාවයට මාර්ගය කියන කාරණය.

පිණ්ඩපාතය බෙදන්න පැමිණි වයස අවුරුදු හැත්තෑපහක් පමණ වූ අම්මා කෙනෙක් දණහිසේ අමාරුවක් නිසා වාඩි වී සිටීමට නොහැකිව හිටගෙනයි පින් අනුමෝදන් වුණේ. භික්ෂුව එම වයෝවෘද්ධ අම්මාගෙන් විමසුවා මැණියෝ ශරීරය දෙස බලන කොට දුක කියන කාරණය තේරෙනවා නේද කියලා. එවිට එම අම්මා කියනවා මට නම් කිසිම දුකක් නැහැ. මට තිබෙන එකම ප්‍රශ්නය දණහිස් දෙකේ වේදනාව පමණක් මය කියලා. එම අසරණ අම්මා සෑම නිමේෂයකදී ම පංචඋපාදානස්කන්ධ දුක තුළ ජීවත් වුණත් ඒ අම්මා දුක හඳුනන්නේ නැහැ. ධර්මානුකූලව දුක යනු කුමක්දැයි නොහඳුනන බෞද්ධ පින්වතෙක් වේ නම් ඔහු කෙලෙසක දුක ඇති වීමට හේතුව, දුකේ නිරෝධය සහ දුක නිරෝධය කිරීමේ ආර්ය අෂ්ටාංගික මාර්ගය හඳුනා ගන්නද?

බුදුරජාණන් වහන්සේ උතුම් ධර්මරත්නය තුළින් දුක කියන කාරණයත්, දුක ඇති වීමට එකම හේතුව තෘෂ්ණාව කියන කාරණයත්, දුක නැති කිරීමට අවශ්‍ය නම් තෘෂ්ණාව නිරෝධය කළ යුතු යැයි කියන කාරණයත්, තෘෂ්ණාව නිරෝධය කිරීමේ එකම මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යැයි තමා තුළින් ම දුකෙන් මිදීමේ ක්‍රියාන්විතය සරලව දේශනා කොට තිබෙනවා. එය චතුරාර්ය සත්‍ය ධර්මයන් සතු **ස්වාක්ඛාත ගුණයයි.**

උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් ජීවමානව වැඩසිටින තාක්කල්, අතීතයේ වගේ ම වර්තමානයේදී ද, අනාගතයේදී ද මේ ස්වාක්ඛාත වූද, සන්දිට්ඨික වූද, උතුම් ශ්‍රී සද්ධර්මය අවබෝධකොටගත හැකිය කියන කාරණය සද්ධර්මයේ **අකාලික ගුණයයි.**

බුදුරජාණන් වහන්සේ ස්වාක්ඛාත ගුණයෙන් යුක්තව දේශනා කොට ඇති චතුරාර්ය සත්‍ය ධර්මයන් මේ ජීවිතේදී ම තමා තුළින් දකිමින් උතුම් සෝවාන් ඵලයට පත් වෙන්න පුළුවන්. උතුම් රහත් ඵල අවබෝධයට පත් වෙන්න පුළුවන්. එය චතුරාර්ය සත්‍ය ධර්මයන් සතු උතුම් **සන්දිට්ඨික ගුණයයි.**

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ජාති, ජරා, ව්‍යාධි, මරණ, දුක කාටවත්ම සඟවන්න බැහැ. දුක තිබෙන ජීවිත තුළ අනිවාර්යයෙන්ම පංචඋපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාව තිබෙනවා. තෘෂ්ණාව ඉදිරියේ කවදාකවත් දුක සඟවන්න බැහැ. පින්වත් ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගය ජීවිතය තුළින් ශක්තිමත් කොට ගන්නා ප්‍රමාණයට තෘෂ්ණාවත් දුකත් සියුම් වෙනවා. ඉහත ධර්මතාවන් සඟවන්න බැහැ. විවෘතව බබළනවා ප්‍රකටව මතු වී පෙනෙනවා. භව නිරෝධය සාක්ෂාත් කොට ගත් රහතන් වහන්සේගේ ජීවිතය තුළින් තෘෂ්ණාවේ නිරෝධය ප්‍රකටයි. තෘෂ්ණාවේ නිරෝධය විවෘතයි. සඟවන්න බැහැ. එය චතුරාර්ය සත්‍යය ධර්මයන් සතු උතුම් **ඒහිපස්සික ගුණයයි.**

පින්වත් ඔබ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබමින් උතුම් ශ්‍රී සද්ධර්මය නුවණින් මෙනෙහි කරමින් චතුරාර්ය සත්‍ය ධර්මයන් සතු **ස්වාක්ඛාත ගුණය, සන්දිට්ඨික ගුණය, අකාලික ගුණය, එහිපස්සික ගුණය, ඕපනයික ගුණය** නිවැරදිව ජීවිතයට එකතු කොට ගැනීමට දක්ෂනම්, පින්වත් ඔබට ස්ත්‍රී පුරුෂ බේදයකින් තොරව දුප්පත් පොහොසත් බේදයකින් තොරව කුලවත් කුලහීන බේදයකින් තොරව ලොකු කුඩා බේදයකින් තොරව ලස්සන, අවලස්සන බේදයකින් තොරව ධර්මාවබෝධයක් කරා ගමන් කරන්න පුළුවන්. එය උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් සතු **පච්චත්තං වේදිතබ්බෝ ගුණයයි.**

යම් පින්වතෙක් මොන තරම් පින්කම් සිදු කළත් චතුරාර්ය සත්‍ය ධර්මයන් සතු ඉහත ගුණයන් තමා තුළින් මතු කොට දකින්නට අදක්ෂ නම් එම පින්වතා තවම ශ්‍රී සද්ධර්මය කෙරෙහි ශ්‍රද්ධාව ඇති කොට ගත් පින්වතෙක් නෙවෙයි. යම් පින්වතෙක් ගේ ධර්මරත්නය කෙරෙහි ශ්‍රද්ධාව දුර්වල නම් එම පින්වතා ගේ බුද්ධරත්නය, සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව ඉදිරියේ ද ප්‍රශ්නාර්ථයක් මයි තබන්නට වෙන්නෙ.

උතුම් ධර්මරත්නයේ ගුණයන්, චතුරාර්ය සත්‍ය ධර්මයන් තුළින් මතු කොට නොදැකීමේ අනතුර බෞද්ධ සමාජය තුළ වේගයෙන් වර්ධනය වෙනවා. දුක ඉදිරියේ දුකට හේතුව වන තෘෂ්ණාව ම වර්ධනය කොට ගැනීමේ දිශාවටයි සමාජය ගමන් කරන්නේ. ඉහත අනතුර ඉදිරියේ පින්වත් ඔබ දක්ෂ වෙන්න. ඔබ යම් දානමය, ශීලමය, භාවනාමය පින්කමක් සිදු කරන කොට තමන් සිදු කරන පින්කම සිහිනුවණින් චතුරාර්ය සත්‍ය ධර්මයන් තුළ විසුරුවා දකින්න.

සෝවාන් ඵල අවබෝධය ලැබීමට පෙරාතුව ශක්‍ර දෙවියන් තම සුජම්පති දේවියත් සමඟ ඉතා දුප්පත් වේශයකින් වෙස්වලා ගෙන මනුෂ්‍ය ලෝකයට පැමිණ නිරෝධ සමාපත්තියෙන් නැගීසිට පිණ්ඩපාතයේ වැඩිය මහා කාශ්‍යප මහරහතන් වහන්සේට වංචාකාරීව දානයක් පූජා කරනවා. ශක්‍ර දෙවියන්

පූජා කළා වූ එම දානයේ පින ආනිශංස සහිත වුණත් තෘෂ්ණාව සියුම් වීම උදෙසා දුකේ නිරෝධය උදෙසා එම දානය උපකාර වුණේ නැහැ.

මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ ශ්‍රේෂ්ඨම දානය බවට පත් වෙන්නේ පින්කම් සිදු කිරීමේදී සකස් වෙන ලෝභ සිත් දන් දීමයි. පින්කම් කිරීමේදී සකස් වෙන ද්වේශ සිත්, මෝහ සිත් දන් දීමයි. පින්කම් සිදු කිරීමේදී සකස් වෙන කාමයේ ආශ්වාදයෙන් රූපයේ ආශ්වාදයෙන් සකස් වෙන සිත් දන් දීමයි. වර්තමාන සමාජය කල්‍යාණ මිත්‍ර ආශ්‍රයේ සහ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීමේ දුර්වල භාවය නිසා ම පින්කම් වලදී අනිත්‍ය වූ පිනක් වෙනුවෙන් අවබෝධාත්මක ගොඩක් ධර්මයන් අහිමි කොට ගන්නවා.

සිහිය දුර්වල වූ තැනදී දුක අමතක වෙනවා. දුකට හේතුව තෘෂ්ණාව අමතක වෙනවා. එවිට අපේ මතකය දිග හැරෙන්නේ සැපය කෙරෙහි තෘෂ්ණාව කියන මිථ්‍යාව දෙසට මයි.

භික්ෂුව මේ සටහන තබන නිහඬ රාත්‍රියේදී මොහොතක් දෑස් පියාගෙන දකිනවා, භික්ෂුව ගිහි ජීවිතය පුරාවට පූජා කළා වූ සියලුම දානයන් තුළින් රැස් කොට ගත්තා වූ සෑම කුසල් සහ අකුසල් සංස්කාරයක් ම අනිත්‍යයි කියලා.

භික්ෂුවගේ භික්ෂු ජීවිතය තුළ මුල් ම කැඳ කෝප්පය සහ පිණ්ඩපාත දානය භික්ෂුවට පූජා කළේ කතරගම ප්‍රදේශයේ පින්වතුන් පිරිසක්. ඒ මුල් ම දානයේ පටන් අද උදෑසන භික්ෂුව ලැබූ පිණ්ඩපාත දානය දක්වා පින්වත් ඔබ පූජා කළා වූ දානයන් තුළින් පින්වත් ඔබලා රැස් කොට ගත්තා වූ සියලුම කුසල් සහ අකුසල් සංස්කාරයක් ම අනිත්‍ය වූ සංස්කාරයක් මයි. දානයට අදාළව පින්කම් වලට අදාළව මතු කොට දකිනා, අතීත පංචඋපාදානස්කන්ධයන්ට අදාළ අනිත්‍ය දැක්ම, ආර්ය ප්‍රඥාව උදෙසා භික්ෂුව තමා තමාට පූජා කරන ශ්‍රේෂ්ඨ ම දානයක් වෙනවා.

පින්වත් ඔබ මහා සංසරත්නය අරමුණ කොට ගෙන දන් පූජා කළ යුත්තේ ඔබගේ ප්‍රඥාවටයි; ඔබගේ විමුක්තියටයි. එසේ නැතිව මෝහයට නම් නොවේ. මෝහය කියන්නේ කුමකටද? ධර්මානුකූලව මෝහය කියල කියන්නේ චතුරාර්ය සත්‍යය නොදැනීමටයි. දුකට හේතුව වන තෘෂ්ණාව නිරෝධය කරන ආර්ය අෂ්ටාංගික මාර්ගය අමෝහය ශක්තිමත් කොට දෙන මාර්ගයයි.

තවත් මහත්මයෙක් ප්‍රශ්නයක් විමසුවා, යම් පින්වතෙක් තුළ මෝහය තිබෙනවා නම් ඔහු තුළ අනිවාර්යයෙන් ම ලෝභය සහ ද්වේශය තිබෙනවාද කියලා. මෝහය ඇති, එහෙත් ද්වේශය නැති එක පුද්ගලයෙක් සිටිනවා. උතුම් අනාගාමී ඵලයට පත් වූ පින්වතා තුළ පංචඋපාදානස්කන්ධ ධර්මයන් කෙරෙහි අනුෂය ලෝභය තිබුණත් ඔහු තුළ ධර්මානුකූලව ද්වේශය නිරෝධය වෙලයි තිබෙන්නෙ. උතුම් රහතන් වහන්සේ නමක් පමණක් මයි ලෝභ, ද්වේශ, මෝහ ධර්මයන් පරිපූර්ණ වශයෙන් නිරෝධය කොට වැඩ සිටින්නේ.

# සක්කාය දිට්ඨියට මොන පන්ති භේදයක්ද?

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පින්වතුන්ලාට සෝවාන් ඵල අවබෝධය උදෙසා ගමන් කළ යුතු, ආශ්‍රවයන් ප්‍රහීනය කිරීමේ අනුපිළිවෙළ, උතුම් සබ්බාසව සූත්‍රයේ දී දේශනා කොට තිබෙනවා. සබ්බාසව සූත්‍රය ජීවිතයට කමටහනක් කොට නොගැනීම නිසා ම, ධර්මයේ නාමයෙන් පිනේ, කුසලයේ නාමයෙන්, ඇලීම් ගැටීම් දෙක තුළ ම දෝලනය වන සක්කායදිට්ඨිය හෙවත් මමත්වයේ දැඩි භාවය පින්වත් මනුෂ්‍ය සන්තාන වල අතු රිකිලි දමා වැඩෙන බවක් පෙනෙන්නට තිබෙනවා. බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයේදී මුලින්ම දේශනා කරන්නේ දර්ශනයෙන් ප්‍රහීනය කළ යුතු ආශ්‍රවයන් ගැනයි. අතීත, වර්තමාන, අනාගත පංචඋපාදානස්කන්ධ ධර්මයන් කෙරෙහි ඇති කොට ගන්නා, නිත්‍ය සැප, සුබ, ආත්මීය දැක්ම ධර්මානුකූලව පිරිසිඳු කොට ගැනීමයි සක්කායදිට්ඨිය නිරෝධය කිරීමේ මාර්ගයේ ආරම්භය වෙන්නේ. ඉහත අර්ථයයි දර්ශනයෙන්, නිවැරැදි දැක්මෙන්, ප්‍රහීනය කළ යුතු ආශ්‍රවයන් වශයෙන් හඳුන්වන්නේ.

පංචඋපාදානස්කන්ධ ධර්මයන්ගේ ඇත්ත ඇති සැටියෙන් නොදැනීම නිසා ම අපි තුළ සක්කායදිට්ඨිය හෙවත් මමත්වයේ කුණුහැව, මගේ කොට ගෙන, මගේ ආත්මය කොට ගෙන, පෝෂණය කොට ගන්නවා.

පින්වත් ඔබට පංචඋපාදානස්කන්ධ ධර්මයන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය පිළිබඳව ඇත්ත, ඇති සැටියෙන් මතු කොට දෙන්නේ ඔබගේ ජීවිතය පටිච්චසමුප්පාද ධර්මයන් තුළ විසිරුවා දැකීම තුළ පමණක් මය. පටිච්චසමුප්පාද ධර්මයන්ට අදාළව ජීවිතය නොදකින තාක් කල්, ඔබගේ අධ්‍යාත්මික පංචඋපාදානස්කන්ධයන්, ආශ්වාදයේ තෝතැන්නක් බවටයි පත් වෙන්නේ. සක්කායදිට්ඨියේ තිබෙන බලවත් ම අනතුර තමයි, යම් පින්වතෙක්, විදර්ශනාත්මක දැක්මෙන් තොරව, පින සහ කුසල් ධර්මයන් සිදු කරන්න, සිදු කරන්න සක්කායදිට්ඨිය පිනේ සහ කුසල් ධර්මයන්ගේ ආශ්වාදය තුළ ම පෝෂණය වෙන නිසා ම, සතිය සිහිය, දුර්වල පින්වතාට, සක්කායදිට්ඨිය මතුකොට දැකීමට ප්‍රමාදීභාවය ඇති වෙනවා.

මෙය සටහන් තබන භික්ෂුව, උතුම් පැවිදි භාවයට පත් වුණේ, පින්වත් ඔබගෙන්, පැසසුම්, ජනප්‍රිය භාවයන් ලබන්නට නොවේ. ඒ වගේ මයි පින්වත් ඔබගෙන්, විවේචන සහ බැණුම් අසන්නට නොවේ. ඉහත අර්ථයන් දෙකම භික්ෂුව, අවුරුදු හතළිස් හතරක් වන ගිහි ජීවිතයේදී පමණටත් වඩා ලබල තිබෙනවා. භික්ෂුව පැවිදි භාවයට පත් වුණේ, ගිහි ජීවිතයේ දී කරපු දේවල් නැවත කරන්නට නොවේ. ගිහි ජීවිතයේ දී නොකරපු දේවල් කරන්නත් නොවේ. කරපු දේවලුත්, නොකරපු දේවලුත් අනිත්‍ය වූ සංස්කාරයන් ම බව අවබෝධයෙන් දැකීමටයි. විවේචන හේතුවෙන් ගැටෙන සිතත්, පැසසුම් ජනප්‍රිය භාවයන් හේතුවෙන් ඇලෙන සිතත්, අනිත්‍ය වූ සංස්කාරයන්ය කියල, දැකල, සිත විදර්ශනාත්මක උපේක්ෂාවට ගන්නයි.

වර්තමානයේ භික්ෂුව හොඳාකාරව දන්නවා විවේචනයන්ට වඩා, පැසසුම්, ජනප්‍රිය භාවයන් ඉදිරියේ සතිය, සිහිය ශක්තිමත් කොට ගත යුතුය කියලා. අවංකව ම විවේචනයන්ට වඩා පැසසුම්, ජනප්‍රිය තාවයන් අනතුරු දායකයි. අතීත පටිච්චසමුප්පන්න ජීවිතයේ දී සමාජයේ ජනප්‍රිය භාවයන් ලබලා අසිහියෙන් ජයඝෝෂා, ප්‍රීතිඝෝෂා අත්පොළසන් සාධුකාර මැද ආශ්වාදයෙන්

පිනාගොස් අනුන්ගේ කරමතින් නැග නගරයෙන් නගරයට ජනතාව අතරට ගිහිල්ලා සිදු කොට ගන්නා වූ අකුසල් මූලයන් නිසා මයි මේ ජීවිතයේ දී විවේචන, නින්දා, අපහාස, භික්ෂුව පසුපස එන්නෙ කියලා, භික්ෂුව ධර්මානුකූලව දැන ගත්තේ ගිහි ජීවිතයේදී මයි. ඒ නිසා ම භික්ෂුව විවේචන සහ පැසසුම්, ජනප්‍රිය භාවයන්, ඉදිරියේ සුන්දර විදර්ශනාත්මක උපේක්ෂාව, ජීවිතයට එකතු කොට ගැනීම උදෙසා මයි පූර්වාදර්ශයන් දෙන්නේ. මෙය සටහන් තබන භික්ෂුවට සමාජයෙන් ලැබෙන යම් පැසසුමක්, ජනප්‍රිය භාවයක් වෙයිද, එම පැසසුම, ජනප්‍රිය භාවය, ඒවා ලබන්නට භික්ෂුවට මාර්ගය කියාදුන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට ගෞරවයෙන් පූජා කරලා, අද උදෑසනත් භික්ෂුව ගමට වැඩම කරලා, පින්වත් ඔබ පාත්‍රයට ලබාදුන් පිණ්ඩපාතයෙනුයි ජීවත් වෙන්නේ, භිගමනෙනුයි ජීවත් වෙන්නේ. භික්ෂුව විවේචනය කරන පින්වතුන්ලා වගේ ම, භික්ෂුව ඔසවා තැබීමට උත්සාහ ගන්න පින්වතුන්ලාත්, භික්ෂුව කෙරෙහි පින කෙරෙහි ආශ්වාදයෙන් භික්ෂුව සමග කටයුතු කරන පින්වතුන්ලාත්, භික්ෂුවට සුන්දර ප්‍රනීත විදර්ශනාත්මක ධර්මයේ උපේක්ෂාවන්, ජීවිතයට එකතු කොට දෙන කමටහන් මයි.

භික්ෂුවගේ පියා මියයන කොට භික්ෂුවට වයස අවුරුදු තිස් තුනයි. එදා තාත්තාගේ මරණය හේතුවෙන් මගේ දෑසට කඳුළක් නැගුණේ නැහැ. එදා මගේ ඥාතිවරයෙක් ප්‍රකාශ කරල තිබුණා, "ලලිත්ට තිබෙන්නේ ගල් සිතක්, තාත්තා අහිමි වුණත් ඇඬුවේ නැහැ"ය කියලා. එදා ලලිත්ට තිබුණේ ලෞකික උපේක්ෂාව වර්තමානයේ භික්ෂුවට තිබෙන්නේ, විදර්ශනාත්මක උපේක්ෂාවයි.

භික්ෂුව ඉහත කාරණාවන් සටහන් තබන්නේ, පින්වත් ඔබලාට ජීවිතයට ධර්මානුකූලව අර්ථයක් එකතු කොට ගන්න මයි. අප තුළ සකස් වෙන අසිහිය නිසා ම, අපි නිරතුරුව ම තමාගේ ආධ්‍යාත්මික පංචඋපාදානස්කන්ධ ලෝකය උපයෝගී

කොට ගෙන අනුන්ගේ බාහිර පංචඋපාදානස්කන්ධ ලෝකය වටේ දුවනවා. මේ මොහොතේ දිවීම නිසා ම අපේ දැක්ම, තව තව ආත්මීය දෘෂ්ඨියෙන් අපිරිසිදු වෙනවා.

බුදුරජාණන් වහන්සේ මෙම ආත්මීය දෘෂ්ඨිය හඳුන්වන්නේ මමත්වයේ කුණු හැව කියලයි. සර්පයෙක් වහලයේ බාල්කයක පිරිමැද තම සැව ගලවා දමනවා වගෙයි, ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙන පින්වතුන්ලා ශීල විශුද්ධියෙන්, චිත්ත විශුද්ධියෙන් ශක්තිමත්ව, දිට්ඨි විශුද්ධිය හෙවත් දැඩි ආත්මීය දැක්මේ පිරිසිදු භාවය පටිච්චසමුප්පාද ධර්මයන්ගේ පෝෂණයෙන් පංචඋපාදානස්කන්ධ අනිත්‍ය ධර්මයන්ගේ දැකීමෙන් ජීවිතයට එකතු කොට ගන්නේ.

අපි උතුම් සෝවාන් ඵල අවබෝධය ලබනා තෙක්ම, මම ඉස්සරහට දමාගෙන, මම අංක එකට අරගෙන, මතුපිටින් පෙනෙන ආශ්වාදයෙන්, ඇතුළාන්තයේ දැඩි දෘෂ්ඨිය පටිච්චසමුප්පන්න විඤ්ඤාණය තුළ ශක්තිමත් කොට ගන්නවා. සක්කායදිට්ඨිය කියන අර්ථය, පටිච්චසමුප්පන්නව අති දීර්ඝ කාලයක් පෝෂණය කොට ගෙන පැමිණි ධර්මතාවයක්. මේ ධර්මතාවයේ ඇති ශක්තිමත් භාවය නිසා ම, උගත්-නූගත්, දුප්පත්-පොහොසත්, රූමත්-අවලස්සන, රෝගී-නිරෝගී භේදයකින් තොරව උතුම් සෝවාන් ඵල අවබෝධය නොලැබූ සැම දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම, සතර අපායේ සත්වයෙක් ම ඉහත දැඩි දෘෂ්ඨියේ කොටස්කරුවන් බවට පත් වෙලයි සිටින්නේ.

රුවැති පින්වතෙක්, තම රූපය කෙරෙහි යම් මමත්වයේ දැඩි භාවයක් ඇති කොට ගෙන තිබෙනවාද, විරූපී පින්වතෙක් තම රූපය කෙරෙහි එවැනිම මමත්වයේ දැඩි භාවයක් ඇති කොට ගන්නවා. ඡායාරූප ශිල්පී මහත්මයෙක් උපතින් ම විරූපී පින්වතෙකුගේ ඡායාරූපයක් ගනිද්දී එම විරූපී පින්වතා තමන්ගේ විරූපී රූපයේ මුහුණේ ඉරියව් ලස්සන කොට ගන්න මුහුණට ආයාසයෙන් ම නඟාගත් සිනහව, මේ මොහොතේ භික්ෂුවට මතකයට නැගෙනවා. ඒ අතීත අකුසල් සංස්කාර

හේතුවෙන් ම, විරූපී භාවයට පත් අහිංසක පින්වතා මගේ රූපයත් ලස්සනයි කියලා ඇති කොට ගන්නා වූ මමත්වයේ දැඩි භාවයේ ශක්තිමත් භාවයයි, පින්වත් ඔබගේ මමත්වයේ දැඩි භාවය, අතීත සංස්කාර හේතුවෙන් සකස් වුණ, රූමත් භාවයත්, ඔබගේ විරූපී භාවයත් යන දෙක ම වඩාත් ලස්සන කොට පෙන්වනවා.

පොහොසත් මහත්මයෙක් තම කෝටි ගණනක් වටිනා සුඛෝපභෝගී වාහනය කෙරෙහි තිබෙන මමත්වයේ දැඩි භාවයම දුප්පත් පින්වතා තමන්ගේ දුප්පත් පාපැදිය කෙරෙහි ඇති කොටගන්නවා. සක්කායදිට්ඨිය පන්ති භේදයකින් තොරව තම ආශ්වාදයේත්, ආදීනවයන්ගේත් ප්‍රතිඵල සමව බෙදා දෙනවා.

දුස්ශීල පින්වතා, අකුසලය කෙරෙහි ඇති කොට ගන්නා මමත්වයේ දැඩි භාවය ම පින්කම් කරන සිල්වත් පින්වතා, පින කෙරෙහි ඇති කොට ගන්නවා. මුස්ලිම්, හින්දු, ක්‍රිස්තියානි පින්වතුන් තම ආගම කෙරෙහි ඇති කොට ගන්නා මමත්වයේ දැඩි භාවය ම බෞද්ධ පින්වතා තෙරුවන් කෙරෙහිත් ඇති කොට ගන්නවා. ඒ නිසා ම කඩු, පොලු බෝම්බ අරගෙන ආගමේ නාමයෙන් කෙරෙන අවිචාරවත් යාගයන් සමාජයේ නිරතුරුව ම සිදු වෙනවා.

උතුම් චීවරය දරාගෙනත්, සුදු සිල් ඇඳුම දරාගෙනත්, යුරෝපීය ඇඳුම, ආර්ය සිංහල ඇඳුම දරාගෙනත්, අළුගෝසු නිල ඇඳුම දරාගෙනත් මමත්වයේ දැඩි භාවය අප තුළ නිදහසේ වැඩෙනවා. ලස්සන ඇඳුම් පැළඳුම් පැළඳගෙන තරුපහේ හෝටල් වල මංගල උත්සව වලට සහභාගි වෙන්න යන නෝනලා ළඟනම් මමත්වයේ දැඩි භාවය තොග මිලට විකුණන්නත් තිබෙනවා.

සක්කාය දිට්ඨිය මුල් වටයේදී ම හඳුනා ගැනීම ඔබට හරිම අපහසුයි. සක්කාය දිට්ඨිය තුළ මිච්ඡා හැසිරීම් වගේ ම සම්මා හැසිරීමත් ශක්තිමත්ව බැසගෙන තිබෙන්න පුළුවන්. වරෙක ජීවිත පරිත්‍යාගයෙන් තවත් වරෙක සිල්වත් භාවයෙන්, කීකරු භාවයෙන්, යටහත් පහත් භාවයෙන්, ත්‍යාගශීලී භාවයෙන්, ගුණගරුක භාවයෙන්, සත්පුරුෂ භාවයෙන්, සක්කායදිට්ඨිය පෙනී සිටින අවස්ථා ඕනෑ තරම් භික්ෂුවට මුණගැසී තිබෙනවා.

භික්ෂුව සමාජයේ ඔබ මොබ හැසිරෙන සක්කායදිට්ඨියේ රුවගුණ දකින කොට, ඒ තුළින් එම පින්වතුන්ලාගේ ශීල විශුද්ධියේ, චිත්ත විශුද්ධියේ දුර්වල තාවයන් හේතුවෙන් සකස් වුණ හේතුඵල ධර්මයන් මයි දකින්නේ. භික්ෂුව නිසා කිසිම පින්වතෙකුට මමත්වයේ දැඩි භාවය ශක්තිමත් කොට ගැනීමට භික්ෂුව අවස්ථාව දෙන්නේ නැහැ. භික්ෂුවට යම් පින්වතෙකු ගේ සක්කායදිට්ඨිය නිරෝධය කරන්නට බැහැ. නමුත් ආශ්වාදයේ ආදීනවයේ අනතුරුදායක බව යම් පමණකට පාලනය කොට ගැනීමට අවශ්‍ය සීමාවන් උපකාරක ධර්මයන් සකස් කොට දෙන්න පුළුවන්. යම් පින්වතෙකුගේ මමත්වයේ දැඩි භාවයේ සීමාවන් ඉක්මවා යන බව භික්ෂුවට තේරුම් ගියොත්, එම පින්වතා කෙරෙහි කරුණාවෙන්, කල්‍යාණ මිත්‍ර භාවයෙන්, එවැනි පින්වතුන් ටික කාලයක් ඈත්කොට තබනවා.

සක්කායදිට්ඨියේ රුව ගුණ ගැන කාගෙන් වත් අසා දැනගන්න භික්ෂුවට අවශ්‍ය නැහැ. ගිහි ජීවිතයේ දී මා තුළ ඝනව වැඩී තිබූ සක්කායදිට්ඨියේ කුණු හැව ගලවා දමන්න, සර්පයෙක් පියස්සේ බාල්කයක පිරිමැද තමන්ගේ පැරැණි හැව ගලවා දමනවා වගේ, ලෙහෙසි පහසු කටයුත්තක් බව මම දැක්කේ නැහැ.

# පූර්වාදර්ශයන් ගන්න අනුකරණයට නොයන්න

ගිහි ජීවිතයේදී මා තුළ සැඟව වැඩී තිබූ මමත්වයේ කුණු හැව මගේ ජීවිතයට බලවත් ප්‍රශ්න මතු කළ අවස්ථා ගොඩක් තිබුණා. මා තුළ තිබූ සක්කාය දිට්ඨියේ තීව්‍ර භාවය මයි, මාව සක්කායදිට්ඨියේ නිරෝධය දෙසට යොමු කළේ. මට මතකයි මා රාජකාරි සිදු කළ ආයතනයක ප්‍රධානියා, මට කියනවා "ලලිත් ඔයා ඔයාගේ කේන්තිය අඩුකර ගන්නේ නැතිනම් ඔයාට අනාගතයේ කිසිම දෙයක් හරියන්නේ නැහැ"ය කියලා. ඒ කතාව අහලා එදා මට නැවත කේන්තියක් මයි සකස් වුණේ.

භික්ෂුව මේ සටහන ලියන ආසනයේ වාඩි වෙලා දකිනවා ගිහි ජීවිතයේදී මම රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ ධර්මයන් කෙරෙහි මොන තරම් කුණු පෙරේතයෙක්ද කියලා. මම එම කුණු පෙරේත කම මා තුළින් ම නිහතමානීව, කෘතවේදීව, මතු කොට ගන්නේ මා උදෙසා මා තුළ තිබූ ශ්‍රේෂ්ඨ, කල්‍යාණ මිත්‍රභාවය නිසා මයි. භික්ෂුව ඉහත කුණු පෙරේතයෙක් කියන වචනය භාවිත කළේ පින්වත් ඔබේ මමත්වයේ කුණු හැවට ධර්මානුකූලව අභියෝග කිරීමට අවශ්‍ය ශක්තිමත් ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා මයි.

භික්ෂුව ඉහත සටහන තබනකොට පින්වත් ඔබට සිතෙන්නට පුළුවන්, "අනේ මම ළඟ ඔය කියන විදිහේ සක්කායදිට්ඨියක් නැහැ"ය කියලා. ඔබ තුළ සකස් වුණ ඒ පාපී මිත්‍රත්වයේ සිතුවිල්ල සක්කායදිට්ඨියේම ඵලයක් බව තේරුම් ගැනීමට,

පින්වත් ඔබ දක්ෂ වෙන්න. සක්කායදිට්ඨිය තමන් තුළ නැහැය කියන අර්ථය තුළත්, සක්කායදිට්ඨිය බැසගෙන සිටිනවා. සක්කායදිට්ඨියේ මේ ඇස්බැන්දුම් නිසා මයි, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ "දිනකට කස පහරවල් තුන්සියය බැගින් අවුරුදු තුන්සියයක් තියුණු කස පහරවල් දිනපතා ලබලා හරි සක්කායදිට්ඨිය නිරෝධය කරගන්නට"ය කියලා. පින්වත් ඔබ මගේ කොටගෙන සුරතල් කරන, එස්සය අසල ම කාමරයක් තනාදී පෝෂණය කරන සක්කායදිට්ඨියේ වියරු භාවය තේරුම් ගැනීමට ඉහත උපමාව පින්වත් ඔබට උපකාරයක් වේවි.

මෙය සටහන් තබන භික්ෂුවට ගිහි ජීවිතයේදී පංච ශීලය ආරක්ෂා කිරීමෙන්, සද්ධර්මය ශ්‍රවණය කිරීමෙන්, බෝධි පූජා තැබීමෙන්, පින්කම් සිදු කිරීමෙන්, අනුනට උපකාර කිරීමෙන්, සක්කායදිට්ඨිය සියුම් කොට ගන්නවාය කියන කාරණය මිරිගුවක්ම වුණා. මා තුළ පිනට අදාළව ආයුෂය, වර්ණය, සැපය, බලය, වැඩෙන කොට, තරාදියේ අනෙක් පැත්තෙන් සක්කායදිට්ඨියයි වැඩිවුණේ.

ඉහත සක්කායදිට්ඨියේ ඇස්බැන්දුම මම හඳුනාගත් නිසා ම මා, මට නිරතුරුවම විවෘත භාවයෙන් මා සමග, මා තුළ ඇති මමත්වයේ දැඩි භාවය ගැන සංවාදයෙහි යෙදුණ අවස්ථා ඕනෑ තරම් මගේ ජීවිතයේ තිබෙනවා.

මම එදා පංචඋපාදානස්කන්ධය යනු රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ වශයෙන් දැනගෙන සිටියේ නැහැ. නමුත් මගේ සක්කායදිට්ඨියේ අත්දැකීම් තුළින්ම මම තේරුම් ගත්තා මගේ මමත්වයේ දැඩි භාවයට හේතුව මගේ රූපයට සහ අනුන්ගේ රූපයන්ට මා තුළ ඇති ඇලීම සහ ගැටීමය කියලා. මම සක්කායදිට්ඨිය හිස්කොට ගත හොත්, අනුන්ගේ සක්කායදිට්ඨිය මට ප්‍රශ්නයක් නොවන බව මම තේරුම් ගත්තා. තමා තුළ සක්කායදිට්ඨිය පුරවා ගෙන තිබෙන නිසා මයි, අනුන්ගේ සක්කායදිට්ඨියත්, අනුන්ගේ අවබෝධයත්

අපට ප්‍රශ්නයක් වෙන්නේ. භික්ෂුව ගිහි ජීවිතයේදී තමා තුළ තිබුණ දැඩි භාවයට කියන ධර්මානුකූල නම සක්කායදිට්ඨිය කියලා දැනගෙන සිටියේ නැහැ.

භික්ෂුව පැවිදි වෙන අවස්ථාවේ ආර්ය අෂ්ඨාංගික මාර්ග යේ මාර්ග අංග අට පිළිවෙළට කියන්නට දැනගෙන හිටියේ නැහැ. නමුත් ගිහි ජීවිතයේදී ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෞකික වශයෙන් හොඳින් වැඩී තිබුණ බව භික්ෂුව අද දන්නවා. ලෞකික මාර්ගය වැඩී තිබූ නිසා මයි මට එදා පුළුවන් වුණේ සක්කාය දිට්ඨියේ අනතුර මා තුළින් මතු කොට ගැනීම සඳහා අවශ්‍ය සම්මා සතිය ඇති කොට ගැනීමට. ඒ වගේ මයි යම් රූපයක් ගුරු උපදේශයකින් තොරව විදර්ශනාත්මකව විඳීමේ හැකියාවක් මට එදා තිබුණා. රූපයක් විදර්ශනාත්මකව විඳීමේ හැකියාව මට ලැබුණේ අතීත පටිච්චසමුප්පන්න පුහුණුවක් නිසා බව භික්ෂුවට හොඳටම විශ්වාසයි.

එකිනෙකාගේ පටිච්චසමුප්පන්න සංස්කාර ධර්මයන්, අපි එකිනෙකාට වෙනස් අත්දැකීම් ධර්ම මාර්ගයේදී සකස්කොට දෙනවා. අපි හැමෝරගේම නිවන් මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය වුණත් අපි හැමෝටම එකම කාලසටහනක්, එකම අච්චුවක් වෙන්න බැහැ.

අතීතයේ පුංචි සෝපාක රහතන් වහන්සේ, චුල්ලපන්ථක රහතන් වහන්සේ, සුනීත රහතන් වහන්සේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කොට ගත් වෙලාවේ එම උත්තමයන් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අට පිළිවෙළට දේශනා කිරීමට දැනගෙන නොසිටි බව භික්ෂුවට විශ්වාසයි. නමුත් එම උත්තමයන් පරිපූර්ණ වශයෙන් අවබෝධ කළේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයයි. එම උත්තමයන් තුළ වැඩී තිබුණේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. සම්මා ගුණ සහ සම්මා විමුක්තියයි. එකිනෙකාගේ විවිධ අතීත සංස්කාර විවිධ අත්දැකීම් ඔස්සේ

අපිව එක ම චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධයට යොමු කරනවා. එම නිසා කවදාකවත් භික්ෂුවට ඔබ වෙන්න බැහැ. ඒ වගේ මයි ඔබට භික්ෂුව වෙන්නත් බැහැ.

භික්ෂුව භික්ෂුවගේ අතීත සංස්කාරයන්ගේ ඵලයකි. ඔබ ඔබේ අතීත සංස්කාරයන් ගේ ඵලයකි. එම නිසා ම අනුකරණයන් ගෙන් තොරවයි කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ඔස්සේ පින්වත් ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගය ශක්තිමත් කොට ගත යුත්තේ.

භික්ෂුවගේ භික්ෂු ජීවිතය තුළදී හෝ ගිහි ජීවිතයේදී ධර්ම මාර්ගය වැඩීමේදී කිසිවෙක් අනුකරණය කරලා නැහැ. මා මතුකොට ගත් සංස්කාර ඔස්සේ සකස් වන දැනීම් වලට අදාළවයි ඉදිරියට පැමිණියේ. නමුත් පැවිදිවූවාට පසුව අතීත රහතන් වහන්සේලාගේ ජීවිත පූර්වාදර්ශයන් කොට ගත්තා.

මගේ ගිහි ජීවිතයේදී මා තුළ ඝනව වැඩී තිබූ සක්කායදිට්ඨිය තුනී කොට ගැනීමට ගුරු උපදේශයකින් තොරව ම මාව යොමු වුණේ මගේ අතීත සංස්කාර හේතුවෙන් දැනීම සකස් වුණේ රූපය අත්විඳීමෙන් ම එහි අස්ථිර භාවය, අනිත්‍ය භාවය, පිළිකුල, අසුභය දැකීම කියන ඉතාමත් අනතුරු දායක දිශාවටයි. ගිහි ජීවිතයේදී ඊට නිදහස මට තිබුණා. මා තුළ ඝනව වැඩී තිබූ මමත්වයේ දැඩි භාවය තුනී කිරීමට වෙනත් විකල්පයක් පිළිබඳ දැනීම් මට සකස් වූයේ නැහැ. තරාදියේ එක පැත්තකට විඳීම කියන අර්ථයත්, තරාදියේ අනෙක් පැත්තට සිහිය කියන අර්ථයත් සමබරව යොදා ගෙන මාරයාගේ ගිහි බන්ධනයන්ට කොටු නොවී රූපයේ නීරසභාවය විඳීමේ, අනිත්‍යභාවය හඳුනාගැනීමේ වෙනස්වීම අත්දැකීම් තුළින් ම දකිමින් උතුම් පැවිදි ජීවිතයට අනතුරකින් තොරව ගොඩ වෙන්න භික්ෂුවට උපකාරක ධර්මයන් සකස් කොට දුන්නේ භික්ෂුවගේ අනිත්‍ය වන අතීත කුසල් සංස්කාර හේතුවෙන් සකස් කොට දුන් දැනීම් මයි. සතිය සිහිය නමැති වේවැලෙන් කීකරු කොට ගත් විඤ්ඤාණය නමැති මැජික්කරුවා මයි.

පංචඋපාදානස්කන්ධය කෙරෙහි දැඩි තෘෂ්ණාව නමැති භූමිතෙල් වල ශක්තිය හීන කොට දමන කොට සක්කායදිට්ඨිය නමැති පහනේ ආලෝකය අඩුවී නිවී යනවා.

සක්කායදිට්ඨිය නිරෝධය කිරීමේ මාර්ගය වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එම නිසා පින්වත් ඔබ තමා තුළින් සක්කායදිට්ඨිය හඳුනා ගනිමින් තමා තුළින් ම සක්කායදිට්ඨිය පිළිකුල් කරමින්, ඔබේ සක්කායදිට්ඨියේ පිළිකුල් බව පිළිකුල් භාවනාවට ලක් කරන්න. සක්කායදිට්ඨිය නිරෝධ මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගය ශක්තිමත් කොට ගන්න.

ශීලයේ යම් දුර්වල භාවයක් තිබෙනවා නම් පසුගාමී වෙන්න එපා. එහෙම දුර්වල සිතක් සකස් වෙනවා නම් එය ඔබගේ අකුසලයක ඵලයක්. එම දුර්වල භාවය අකුසල් සංස්කාරයක ඵලයක් බව හඳුනාගෙන තව තව ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ශක්තිමත් කොට ගන්න. මෙහිදී ලෞකික ප්‍රඥාවට අදාළ සම්මා දිට්ඨියත්, සම්මා සංකප්පයනුත් කෙරෙහි ඔබේ අවධානය සහ පුහුණුව ශක්තිමත් වෙන්න ඕනේ. නෙක්ඛම්ම සංකප්පයයි ඔබේ පුහුණුවේ ජවය ඔබට ශක්තිමත් කොට දෙන්නේ.

ලෞකික ප්‍රඥාවෙන් ඔබ පෝෂණය වෙන කොට ශීල විශුද්ධියත් (සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව) චිත්ත විශුද්ධියත් (සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි) ඔබ තුළ ශක්තිමත් වෙන කොට, ඔබ යොමු වෙන්නේ වැරදි ආත්මීය දැක්මෙන් පින්වත් ඔබ පිරිසිදු වෙන දිට්ඨි විශුද්ධිය වෙතටයි. මේ සඳහා පින්වත් ඔබ පටිච්චසමුප්පාද ධර්මයේ සමුදය, නිරෝධය, වශයෙන් මෙනෙහි කිරීම සජ්ඣායනය කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වෙනවා. ඒ වගේ මයි කායානුපස්සනාවට අදාළව කාය, වේදනා, චිත්ත, ධම්ම කියන ධර්මතාවයන් ගේ අනිත්‍යභාවය මෙනෙහි කිරීම අත්‍යවශ්‍ය ධර්ම කාරණයක් වෙනවා.

මේ සක්කායදිට්ඨිය නිරෝධය කිරීමේ මාර්ගයේදී ඔබගේ මව, පියා, බිරිඳ, ස්වාමි පුරුෂයා, පුතා, දුව, පෙම්වතා, පෙම්වතිය, ඔබට ඇලීම් ගැලීම් සකස් කොට දෙන සෑම රූපයක් ම නිහඬ කමටහන් බවට පත් කොට ගැනීමට ඔබ දක්ෂ විය යුතුයි. මේ සියල්ල ඉදිරියේ පින්වත් ඔබ නිහඬ විදර්ශකයෙක් විය යුතුයි. නමුත් මෙතනදී ඔබ අදක්ෂ වුණොත් එම නිහඬ විදර්ශනාවද පෙරළා ඔබේ සක්කායදිට්ඨියම පෝෂණය කිරීමේ පෙර ගමන්කරු වෙන්න පුළුවන්. ඒ නිසා මයි ලෞකික ප්‍රඥාවේ ශක්තියත් විශේෂයෙන් ම නෙක්ඛම්ම සංකප්පත්, මධ්‍යස්ථ වීර්යයත් ගැන භික්ෂුව ලිපියේ ඉහතින් සටහන් තැබුවේ.

# සංස්කාරයන්ගේ සුදු අන්තුවා කවුද?

මීට වසරකට පමණ පෙරාතුව, භික්ෂුව මුණගැසීමට බොහොම කනස්සල්ලෙන් පැමිණි මහත්මයෙක්, භික්ෂුවට ප්‍රකාශ කළා, "ස්වාමින් වහන්ස, අපි බලාපොරොත්තු නැති මොහෙතාක, මගේ බිරිඳගේ කුසේ දරුවෙක් පිළිසිඳ ගත්තා"ය කියලා. එම අවස්ථාවේ, භික්ෂුව එම මහත්මයාට ප්‍රකාශ කළේ, "ඔබලා මේ මොහොතේ, දරුවෙක් බලාපොරොත්තු නොවුණාට, ඔබේ පීතෘත්වය, බිරිඳගේ මාතෘත්වය බලාපොරොත්තුවෙන් මයි. ඔය දරුවා පටිච්චසමුප්පන්නව ඔබේ බිරිඳගේ මවුකුසට පැමිණ තිබෙන්නේ" කියලා.

"ඔබ දෙපළගේ සංස්කාරයන්ට අදාළව ඔබලාට ලැබිය යුතු දෙයයි, ඔය ලැබිලා තිබෙන්නේ. එම නිසා ඔය කනස්සල්ලෙන් බැහැර වෙලා, මවුපියන්ට උරුම, මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන් ගෙන් පෝෂිත මහා බ්‍රහ්ම ගුණයන් ඇති කොට ගෙන, පිළිසිඳ ගත් දරුවා වගකීමෙන් ආරක්ෂා කොට ගන්න"ය කියලා.

පසුගිය මාසයේ දවසක එම මහත්මයා, බොහොම සතුටින් භික්ෂුව මුණගැසිලා ප්‍රකාශ කරනවා, "ස්වාමින් වහන්ස අපිට පුතෙක් ලැබුණා"ය කියලා. අපි බලාපොරොත්තු නැති මොහොතක වුවද, අපිව බලාපොරොත්තුවෙන් යමෙක් පැමිණෙන්නේ ධර්මානුකූල හේතුවක් නිසා මයි. එම ධර්මානුකූල හේතුව "සංස්කාර පච්චයා. විඤ්ඤාණං" කියන ධර්මතාවයි.

අපි කැමැති වුවද, අපි අකැමැති වුවද, මේවා සංස්කාරයන්ගේ ම සූදුවකි. අනාගතයේ යම් දවසක අපි කාම, රාග, පටිඝ ධර්මයන් නිරෝධය කොට දමන තෙක් ම, අපි මේ සූදුවේ කොටස් කරුවන් වන්නෙමු.

සූදුවක් තිබෙන තැන, ජය සහ පරාජය අනිවාර්යයෙන්ම තිබෙනවා. විදර්ශනා ප්‍රඥාවෙන් යම් පින්වතෙක් දුර්වලද, ඔහු මේ ජීවිතයේදි ජය සහ පරාජයන් හේතුවෙන්, දුක සහ ශෝකය ජීවිතයට එකතු කොට ගන්නා අතර, විදර්ශනා ප්‍රඥාව ශක්තිමත් පින්වතා, ජය සහ පරාජය කියන අර්ථයන් දෙකම, අනිත්‍ය බව දකිමින් මෙලොව පරලොව සැපය ම ලබන බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙනවා. නුවණින් පිරිහීමෙන්, සත්වයා පංචඋපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාවෙන්, කාමයේ, රූපයේ ආශ්වාදය ම සොයමින්, දුකට හේතුවෙන භවය ම ශක්තිමත් කොට ගන්නවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "රූපය කියන්නේ මාරයා"ය කියලා. රූපය මාරයා යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙන්නේ, රූපය නිරතුරුව ම ජරා, ව්‍යාධි, මරණයන්ට, අදාළව විකෘති වෙන, වෙනස් වෙන නිසා මය.

රූපයේ ආදීනවය, ජරා, ව්‍යාධි මරණයන් තුළ බැසගෙන සිටියත්. රූපයේ ආශ්වාදය නම්, දැස් පෙනෙන ඔබව, අවිද්‍යාවේ අන්ධභාවයට පත් කරන මාර උගුලක් මය. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "මහණෙනි පාපය, අකුසලය ළාමක දෙයක් වශයෙන්ම දකින්න"ය කියලා. "පාපය, අකුසලය, ළාමක දෙයක් වශයෙන් දැකලා, අකුසලය කෙරෙහි කලකිරීම ඇති කොට ගන්න"ය කියලා. බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළ වන්නේත් ඉහත අර්ථය ලෝකයාට දේශනා කිරීමටයි.

රූපය මාරයා වෙන තැනදි, රූපය හේතුවෙන් සකස් වෙන වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ ධර්මයනුත් මාරයා මයි වෙන්නේ. පින්වත් ඔබ සිතනවාද, ඔබේ රූපය මාරයාය

කියලා? අද උදෑසන පිණ්ඩපාතය බෙදන්න නෝනා කෙනෙක් පැමිණ සිටියා. ඇයගේ තරුණ හිසකෙස් දුඹුරු පැහැයෙන් පාට ගන්වලයි තිබුණේ. ඇය පැළඳගෙන සිටි රත්‍රං බඩු දකින කොට භික්ෂුවට සිතුණේ, ඇය රත්‍රන් බඩු ප්‍රදර්ශනයක් පවත්වනවාද කියලා. බුදුරජාණන් වහන්සේ මාරයා වශයෙන් හැඳින්වූ මේ රූපය, පින්වත් ඔබ, දේවදූතයෙක් වශයෙන් ම දකිනවා.

රුපියල් ලක්ෂ පනහකට වැඩි වටිනාකමැති රත්තරන් ආභරණ පැළඳගෙන සිටින පින්වත් කාන්තාවක් තම යෙහෙළියකට කියනවාලු, "විශාඛා උපාසිකාවත් මහාමේළ පළඳනාව පැළඳගෙනයි සිටියේ. එම නිසා බෞද්ධ කාන්තාවන් විශාඛා උපාසිකාව අනුගමනය කළ යුතුය" කියලා.

අපේ කාමයේ සහ රූපයේ ආශ්වාදය නිසා ම, පූර්වාදර්ශයන් ජීවිත වලට එකතු කොට ගන්නේ වැරදි අන්තයන් තුළින් මයි. විශාඛාව උතුම් සෝවාන් ඵල අවබෝධය ලබන්නේ, වයස අවුරදු හතේදී. ඇයට මහාමේළ පළඳනාව, දායාද වශයෙන් ලැබෙන්නේ ඇයගේ විවාහයෙන් පස්සේ. විශාඛා උපාසිකාව මහාමේළ පළඳනාව පරිහරණය කළේ උතුම් සෝවාන්ඵල අවබෝධයට පත් කාන්තාවක් හැටියට. විශාඛාව වයස අවුරුදූ හතේදීත්. සාංසාරික පුහුණු, පුරුදු නිසා ම, කයෙන්, වචනයෙන්, සිතෙන්, බොහෝම සංවර දැරියක්.

දැන් පින්වත් ඔබ සිතන්නකෝ, රූපයේ ආශ්වාදයෙන් මත්වී, කාමයේ ආශ්වාදයේ සිරකරුවෙක් වී, රත්තරන් පරිහරණය කරන, ඔබගේ ස්වභාවයත්, උතුම් සෝවාන්ඵලයට පත්වූ කාන්තාවකගේ, ශරීරය සැරසීමේ චේතනාවනුත් අතර තිබෙන ධර්මානුකූල පරතරය මොන තරම් ද කියලා. පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවයේ දැක්වෙන පෝෂණය ම, ආර්ය ශීලයෙන්, ආර්ය ශ්‍රද්ධාවෙන්, පෝෂණය වූ සෝවාන්ඵල අවබෝධය, සාක්ෂාත් කොට ගත්, විශාකා උපාසිකාව මහාමේළ පළඳනාව කෙරෙහි සක්කායදිට්ඨිය මරා දමලයි තිබුණේ. නමුත් අපි මොකක්ද කරන්නේ, රත්තරන් නිසා ම, සක්කායදිට්ඨිය

ශක්තිමත් කොට ගන්නවා. පින්වත් ඔබ විශාඛා උපාසිකාව පූර්වාදර්ශයට අරගෙන මුලින් ම සෝවාන් ඵලයට පත් වෙලා, දෙවනුව ඇති තරම් රත්තරන් පළඳින්න. සියල්ලට ම පෙරාතුව ඔබ රත්තරන් දැම්මොත්, ඔබට රත්තරනුත්, සුගතියත්, උතුම් සෝවාන්ඵලයත් යන දෙකම අහිමි වෙලා, ලස්සන මාල ගිරවෙක් වෙලා, නැවත උපදින්න සිද්ධ වෙන්නත් පුළුවන් කියල හිතන්න.

බුදුරජාණන් වහන්සේ පින්වත් කාන්තා පක්ෂය කෙරෙහි බොහෝම කරුණාවෙන් දේශනා කරනවා, කාන්තාව

- රූපයෙන්,
- සිනාවෙන්,
- කතාවෙන්,
- ගීතයෙන්,
- හැඬීමෙන්,
- ආකල්පයන් ගෙන්,
- රසවත් ආහාරයන් ගෙන් සහ
- පහසින්

යන අට ආකාරයෙන්, පුරුෂයාව බැඳ ගන්නවාය කියලා.

බුදුරජාණන් වහන්සේ උතුම් සම්මා සම්බුද්ධ රාජ්‍යය අවබෝධ කොට ගැනීමට පෙරාතුව, සිදුහත් කුමාර අවධියේදීත්, කාන්තා පක්ෂයේ ඉහත ස්වභාවය දැනගෙන ඉඳලා තිබෙනවා. ඒ නිසා මයි, එදින උපත ලද රාහුල පුතා ගේ, ඇසුර වත් නොලබා ම, ගිහි ගෙදරින් නික්ම යන්නේ, යශෝධරාවගේ කතාවෙන්, සිනාවෙන්, සහ හැඬීමෙන් විය හැකි බන්ධනය ගැන සිතලාමයි. පින්වත් පිරිමි පක්ෂය ඔබේ හෘද සාක්ෂියට තට්ටු කරලා අහන්නකෝ. ඔබ පින්වත් කාන්තාවකට බැඳී ගියා නම් බැඳී ගියේ ඉහත ධර්මතාවන්ට ම නේද කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන ඉහත ධර්මයන්, පුරුෂ පක්ෂයට, අනතුරු අවම කොට ගැනීම උදෙසා, සතිය, සිහිය, ඇති කොට දෙන අතර, පින්වත් කාන්තා පක්ෂයට ද, තමන්ගේ සුන්දර ඇවැතුම් පැවතුම් සහ ආකල්පයන් තුළ සැඟවී ඇති, තමන්ගේත්, අනුන්ගේත්, විරාගයට අන්තරායකාරී, කුසල් ධර්මයන් මන්දගාමී කරන, අනතුරු පිළිබඳව සිහිපත් කොට දෙනවා.

පින්වත් ඔබ සිතුවත්, රටක් පාලනය කරන්නේ, රාජ්‍ය නායකයෙක්ය කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "රාජ්‍ය නායකයාවත් පාලනය කරන කුසල් ධර්මයෝ දෙදෙනෙක් මේ ලෝකය පාලනය කරනවා"ය කියලා. මේ ලෝකයම පාලනය කරන කුසල් ධර්මයන් දෙක නම්, ලැජ්ජාව සහ බයයි. එම කුසල් ධර්මයන් දෙක ලෝකය පාලනය නොකරන්නේ නම්, මනුෂ්‍ය සමාජයේ, අම්මලා කියලා, පුංචි අම්මලා කියලා, නැන්දා, දුව, මිණිපිරිය, බිරිඳ, සහෝදරිය කියලා, කාන්තාව ගැන තැකීමක් නැහැ. මනුෂ්‍ය සමාජය හරකුන්, බල්ලන්, ඌරන්, කුකුළන් මෙන් අසංවරව අශීලාචාරව හැසිරෙනවා"ය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "ලැජ්ජාව, බිය, නැමැති මේ ලෝක පාලක කුසල් ධර්මයන් දෙක කෙරෙහි මැනවින් සිහිය පිහිටුවා ගත් පින්වතා, බඹසර ඇති, වැඩුණු මනුෂ්‍ය ගුණ ධර්ම ඇති, උතුම් මනුෂ්‍යයෙක් බවටමයි පත් වෙන්නේ" කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන ඉහත ධර්මයට අදාළව, අප ජීවත් වෙන සමාජය දෙස බැලීමේදී , අපව පාලනය කරන්නේ, අකුසලයට අදාළ, ලැජ්ජා නැති කමත්, බියෙන් තොර වංචාකාරී බවත් පමණක් මය. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "පංචඋපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාව හේතුවෙන්, මනුෂ්‍යයාගේ සළායතනයන් ගෙන් ගලා බසින, ලෝභ, ද්වේෂ, මෝහ, ධර්මයන් යනු සිතේ උපන් මළකඩයක්"ය කියලා. "සිතෙහි උපන් සතුරෙක්"ය කියලා, "සිතෙහි උපන් වසලයෙක්"ය කියලා. "සිතෙහි උපන් වධකයෙක්"ය කියලා, "සිතේ උපන් පස මිතුරෙක්"ය කියලා.

සමාජය තුළ දිනෙන් දින, තම බලය ශක්තිමත් කොට ගන්නා, සමාජය පාලනය කරන අකුසලයට අදාළ, ලැජ්ජා නැතිකම සහ බියෙන් තොර වංචාකාරී බව, අසත්පුරුෂ ආශ්‍රයෙන් අසද්ධර්මය ශ්‍රවණය කිරීමේත්, අනුවණින් මෙනෙහි කිරීමේත් ධර්මානුකූල ඵලයකි. ලැජ්ජාව, බිය කුසලයේ ඵලයක් වෙනවා සේම, ලැජ්ජා නැති කම අකුසලයේ ම ඵලයකි. මේවා සුන්දර ධර්මයේ හේතුඵල ධර්මයන්ය.

# ඔබ කියවා, ඔබේ ඇමතිතුමාට කියවන්න දෙන්න!

පින්වත් ඔබ ජීවත් වෙන සමාජයේ, කුසලයට සහ අකුසලයට අදාළව දිගහැරෙන හේතුඵල ධර්මයන්, ධර්මානුකූලව, නුවණින් නොදැකීම නිසා ම, අසිහියෙන් හම්බු කරනවා; අසිහියෙන් බොරු කියනවා; අසිහියෙන් තමන් උපන් රට, ජාතිය, ආගම, පාවා දෙනවා; අසිහියෙන් අනාගත බලය උදෙසා සිහින මාලිගා ඉදිකොට ගන්නවා; සමාජය තුළ ජීවත් වෙන පාසල් දැරියන්ව, තරුණියන්ව, වැඩිහිටි කාන්තාවන්ව අසිහියෙන් ම කාමච්ඡන්දයන් දෙසට යොමු කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "සමාජයේ සදාචාරාත්මක දියුණුව උදෙසා, සමාජය තුළ ජීවත් වෙන ළදැරියව, තරුණියව, වැඩිහිටි කාන්තා පක්ෂය පෝෂණය කරන්න, ඒ අයගේ ආත්මගරුත්වය ආරක්ෂා කරන්න"ය කියලා.

සැපය නිත්‍ය වශයෙන් ගත්ත, වේදනාව නිත්‍ය වශයෙන් ගත්ත අනුවණ පින්වතා, බලයෙන්, ධනයෙන්, නිලයෙන් සිහින මාලිගා තනාගෙන ජීවත් වුණත් තම ජීවිතය ඉදිරියේ ඇති ජීවිත අනතුරු, ජීවිතයේ අනිත්‍යභාවය සහ මරණය ගැන, මොහොතක් වත් සිතන්නේ නැහැ. වර්තමාන සමාජය පාලනය කරන, අකුසලයෙන් උපන් ලැජ්ජා නැති කමත්, අකුසලයට බිය නැති කමත්, මේ වන විට සමාජයට බරපතල විනාශයක් සිදුකොට දී තිබෙනවා. ආසියාවේ සුන්දර ම බිම්කඩ වූ මේ උතුම් මාතෘභූමිය, විනාශ කොට දැමීමේ සම්පූර්ණ වගකීම,

ධර්මානුකූලව දැරිය යුත්තේ මේ රටේ පක්ෂ සහ විපක්ෂ දේශපාලනයයි. පින්වත් ඔබලා සියල්ලෝම, මේ විනාශයේ කොටස්කරුවෝ ය.

මේ රටේ කිසිම පක්ෂ සහ විපක්ෂ දේශපාලන මහත්මයෙක්, කටක් ඇරලා වචනයක් ප්‍රකාශ කරන්නේ නැහැ, මේ රටේ දේශපාලනඥයින් ලබන්නා වූ වරප්‍රසාදයන් වැඩිය කියලා. හැමෝම ප්‍රයෝගකාරීව උත්සාහ ගන්නේ, තමන්ගේ ගොඩ වැඩි කර ගැනීම සඳහා පමණක් මයි.

මිහිඳු මහෝත්තමයන් වහන්සේ, දේවානම්පියතිස්ස රජතුමා ඉදිරියේ සිංහනාදයක් කරනවා, "මහරජ ඔබ රටේ, භාරකරුවා මිස, අයිතිකරුවා නොවේ"ය කියලා. නමුත් වර්තමානයේ භාරකරුවන් අයිතිකාරයන් බවට පත් වෙලා. මිහිඳු මහෝත්තමයන් වහන්සේ කරන ලද ධර්මාවවාදයන්, විකෘතියක් බවට ම පත් කොට තිබෙනවා. අකුසලයට ලැජ්ජා නැති කමත් බිය නැති වීමත් හේතුවෙන්, තමන් නිසා මෙවන් සද්ධර්මයේ අර්ථයන් සමාජගත වූ, මේ සුන්දර මාතෘභූමිය විනාශ කිරීමේ පාපය, එසේ මෙසේ පාපයක් නොවේ. අනාගත භව ගමනේ, කල්ප ගණන් සතර අපා දුක් විඳීමට උරුම පාපකර්මයන් වෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "ලැජ්ජා නොකටයුතු තැන්හි යමෙක් ලැජ්ජා කෙරෙත්ද? ලැජ්ජා කළ යුතු තැන්හි, යම් කෙනෙක් ලැජ්ජා නොකරයිද, එවැනි විපරිත වූ මනුෂ්‍යයෝ, අපායට ම වැටෙනවා"ය කියලා.

ජනතාව විශ්වාසයෙන් පැවරූ වගකීම්, අගතිගාමී ලෙස, ආත්මාර්ථකාමී ලෙස, භුක්ති විඳීමේ ගුණමකු භාවයන් කෙරෙහි, කරුණාකර ලැජ්ජාව බිය දෙක ඇති කොට ගන්න. දැන දැන අසිහියෙන් තාවකාලික සැපයක් උදෙසා දීර්ඝකාලීන සතර අපා දුකට වැටෙන්න එපා. මේ රට පින්වත් ඔබලාගේ බූදලයක් නොවේ. පින්වත් ඔබලාට පැවරූ වගකීමක් පමණක් ම වෙයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "කහවත් දරාගත්, සුදුවත් දරාගත්, ආත්මාර්ථකාමී, ගති ඇති, කාය සංවරය, වචී සංවරය, මනෝ සංවරය, නැති, පව්ටු පුද්ගලයෝ සමාජයේ ජීවත් වෙනවා. ඔවුන් තමන් අසිහියෙන් සිදු කරන පව් හේතුවෙන් නරකයෙහි උපදී" කියලා.

වංචාකාරීව ජීවත් වෙන මෙවැනි පුද්ගලයෝ, රටවැසියා රවටා, යම් ධනයක් රැස් කොට ගනීද, එම ධනයෙන් යම් සැපයක් ලබයිද, යම් රසමසවුලක් අනුභව කරයිද, එම ආහාරයට වඩා, ගිනි ගුලියක් අනුභව කිරීම, උතුම් යැයි කියලා ධර්මයේ සඳහන් වෙනවා.

භික්ෂූන් වන අපගේ, ආහාර සොයා ගැනීමේ චර්යාව, පිණ්ඩපාතයේ පිඬුසිඟායෑමයි. මෙය අකුසලයෙන් උපන් යාචක පින්වතුන්ට අයත් චර්යාවක්. නමුත් භික්ෂූන් වන අපි, ගෙපිළිවලින් පිඬු සිඟා හැසිරෙන්නේ, රජුන්ගේ දඬුවමකට ලක්වීම නිසා නොවේ. සොරුන් විසින් නෙරපන ලද නිසා නොවේ. ගත් ණය ගෙවාගත නොහැකි නිසා නොවේ. කාටවත් බියට පත්වීම නිසා නොවේ. ජීවත්වීම උදෙසාද නොවේ. භික්ෂූන් වන අපි පිඬුසිඟා හැසිරෙන්නේ, ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව දුකෙන් මිදී යනවාය කියන දුකේ කෙළවරට පැමිණීම සඳහා පමණක් මයි.

ඒත් පින්වත් ඔබලා ඔය, ලැජ්ජාව සහ බයෙන් ප්‍රමාදභාවයට පත්වී කරන, නාමික ජනතා සේවය, තව තවත්, ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක් ගොඩ, සංවර්ධනය කොට ගැනීම උදෙසා පමණක් මය, කියලා ධර්මානුකූලව සටහන් තබනවා.

භික්ෂුව මේ සටහන අවසන් කරන මොහොතේ, දෑස් පියාගෙන, නුවණින් දකිනවා, අද දවසේ භික්ෂුව තුළ ලෝකය කුසලයෙන් පාලනය කරන, ලැජ්ජා බිය දෙක භික්ෂුව තුළ තිබුණද කියලා. දුශ්ශීලභාවය කෙරෙහි, සිව්පසය පරිහරණය

කෙරෙහි, ලැජ්ජාව බය දෙක තිබුණද කියලා. මෙය සටහන් තබන භික්ෂුව ධර්මානුකූලව දන්නවා. ශ්‍රද්ධාවන්ත ගිහි පින්වතුන්ලාට බොරු කරලා මම වළඳන සෑම බත් කටක් ම, භික්ෂුවට ගිනි ගුලියක් ම වෙනවාය කියලා.

කරුණාකර, පක්ෂ විපක්ෂ දේශපාලන මාමේ නැන්දේ, ඔබලා තුළ ලෝකය පාලනය කරන, කුසල් ධර්මයන් දෙක වන ලැජ්ජාව සහ බය, වහ වහා ඇති කොට ගන්න, බුදුරජාණන් වහන්සේ සප්ත අපරිහානීය ධර්මයන්ට අදාළව දේශපාලන නායකත්වයට අනුශාසනා කරනවා. රටේ ජීවත් වෙන ළදැරියට, පාසල් දැරියන්ට, තරුණියන්ට, වැඩිහිටි කාන්තාවන්ට, අවශ්‍ය සමාජ සුරක්ෂිතභාවය, ආත්මගරුත්වය, ශීලාචාර ධර්මයන් ආරක්ෂා කොට ගෙන ජීවත් වීමට අවශ්‍ය පරිසරය රාජ්‍ය ප්‍රතිපත්තීන් ඔස්සේ ලබා දෙන්නය කියලා. නමුත් පාලක පින්වතුන්ලා ගේ ප්‍රමාදීභාවයන් නිසා, වර්තමානයේ පාසල් පද්ධතියේ ගැහැනු දරුවන් පවා, කාමච්ඡන්දයන්ට වේගයෙන් ඇදී යන ප්‍රවණතාවක් සමාජගත වෙලා තිබෙනවා. එය අහිංසක කාන්තා පක්ෂයේ වරදක් නොවේ. පාලක පින්වතුන්ගේ වගකීම් පැහැර හැරීමේ ඵලයයි.

පින්වත් කාන්තා පක්ෂය, හේතුඵල ධර්මයන්ට අදාළව, කාමයන්ගේ ආකර්ෂණයට යටත්, හේතුන් අටකින් සමන්විතවයි සිටින්නේ. එම හේතුන් අට ලිපියේ මුලින් සඳහන් කොට තිබෙනවා. කාන්තාව සතු ඉහත ආකර්ෂණීය ධර්මතාවන් නිසා ම, සමාජය තුළ ලැජ්ජාව බිය සහිත විනයකාමී පරිපාලනයක් ඇති කිරීම, රටේ භාරකරුවන් ගේ උත්තරීතර වගකීමයි. එය කළ හැක්කේ රටේ පක්ෂ, විපක්ෂ පාලක පින්වතුන්ලා, තමන් රටේ භාරකරුවන් මිස, අයිතිකරුවන් නොවේය යන ධර්මානුකූල යථාර්ථය නුවණින් තේරුම් ගත්තොත් පමණක් මය. **පක්ෂ විපක්ෂ නායක පින්වතුන්ලා මේ යථාර්ථය තේරුම් නොගන්නවා නම්, දේශපාලනයෙන් තොර නායකයෙක් රටට නායකත්වය දීම, අත්‍යවශ්‍ය ම කාරණයකි.**

# භාවනාවෙනුත් අං එනවා නම්...

උපසම්පදා භික්ෂුවක් වස් පවාරණය සිදු කළාට පසුව අවම වශයෙන් එක රාත්‍රියක් හෝ වස් සමාදන්ව සිටි කුටියෙන් බැහැරට වඩින්නය කියලා බුදුරජාණන් වහන්සේ අපට දේශනාකොට තිබෙනවා. පුරා තුන් මාසයක් එකම ගමක, එකම කුටියක, එකම දායක පිරිසක් සමඟ කටයුතු කිරීමෙන් එම භික්ෂුව රූප, වේදනා හඳුනාගැනීම් සංස්කාර, විඤ්ඤාණ ධර්මයන් කෙරෙහි යම් බැඳීමක්, යම් කැමැත්තක් ඇති කොට ගත්තා නම්, එම බැඳීම් දුර්වල කොට දැමීමට බුදුරජාණන් වහන්සේ ඉහත අවවාදය අපට පැනෙව්වා වෙන්න පුළුවන්.

භික්ෂුව පසුගිය මාසයේ වස් සමාදන්ව වැඩසිටි කුටියෙන් සමුගත්ත උදෑසන පිණ්ඩපාත මඩුවට පැමිණ සිටි පින්වතුන්ලාගේ දෑස් වලින් කඳුළු රූටා වැටෙනවා භික්ෂුව දැක්කා. මහා සංඝරත්නය සතු සුපටිපන්න ගුණය, උජුපටිපන්න ගුණය, ඤායපටින්න ගුණය, සාමීචිපටිපන්න ගුණය කෙරෙහි ඇති කොට ගන්නා වූ බැඳීමයි, ඒ දෑස්වලට කඳුළු මතු කොට දෙන්නේ.

භික්ෂුව ගිහි ජීවිතයේදී, ජීවිතය ඉදිරියට පැමිණි ප්‍රශ්න වලදී ලෝකයට හොරෙන් මම තනිවම අඬපු අවස්ථා ගොඩාක් අතීතයේ තිබුණා. ඒ කාලයේදී සංස්කාර ගැන දැනීමක් මට තිබුණේ නැහැ. ඒ නිසා ම මගේ කඳුළු වලට වරදකරුවා හැටියට මම දැක්කේ සමාජය මයි. අතීත පටිච්චසමුප්පන්න සංස්කාරයන්ට අදාළව ම මට ලැබුණ නොලැබුණ දෙය,

ධර්මානුකූල හේතුඵල ධර්මයක් හැටියට දකින්න, මම එදා දැනගෙන සිටියේ නැහැ. නමුත් මගේ නෙතින් ගැලූ කඳුළු නිසා මා තුළ ඇති වූ වේදනාවන්, සිත්තැවුල්, බලාපොරොත්තු කඩවීම් හේතුවෙන් මම ගිහි ජීවිතයේදී ම අධිෂ්ඨානයක් ඇති කොට ගත්තා මගේ ඉදිරි ජීවිත කාලයේදී කවදාකවත් තවත් කෙනකුට කඳුළක් දෙන්නේ නැහැයි කියලා. නමුත් ඉහත අර්ථය සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය වුණ සුන්දර සිතුවිල්ලක්ය කියල මම එදා දැනගෙන සිටියේ නැහැ.

භික්ෂුව ගිහි ජීවිතයේදී ඇති කොට ගත් තවත් කෙනකුට කඳුළක්, දුකක් දෙන්නේ නැහැය කියන සිතුවිල්ල භික්ෂුව අපවත්වන තුරාවට ම ජීවිතයෙන් අර්ථවත් කොට ගන්නවා.

වර්තමාන සමාජයේ දරුවන් නිසා හඬන දෙමාපියන්, දෙමාපියන්ගේ වැරදි නිසා හඬන දරුවන්, සැමියාගේ වැරදි නිසා හඬන බිරින්දෑවරු, බිරින්දෑවරුන්ගේ වැරදි නිසා හඬන සැමියන්, වංචාකරුවන් නිසා හඬන අහිංසකයන්, අප්‍රමාණව අපේ සමාජයේ ජීවත් වෙනවා. පින්වත් ඔබට සමාජය නිවැරදි කරන්න බැහැ. එහෙත් පින්වත් ඔබට පුළුවන්, මම කවදාකවත් තවත් කෙනකුට කඳුළක්, දුකක් දෙන්නේ නැහැය කියන උතුම් සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය වූ අර්ථය ජීවිතයට එකතු කොට ගන්න. එම අර්ථය පින්වත් ඔබට ආර්ය අෂ්ටාංගික මාර්ගය ශක්තිමත් කොට ගැනීම උදෙසා සුන්දර ශක්තියක් වේවි.

පසුගිය දිනක උදෑසන පිණ්ඩපාත මඩුවට කැඳ අරගෙන පහළොස් දෙනෙක් පැමිණ සිටියා. භික්ෂුවගේ අතේ තිබුණේ සාමාන්‍ය ප්‍රමාණයේ කෝප්පයක්. එම පහළොස් දෙනාගෙන්ම භික්ෂුව කුඩා ප්‍රමාණය බැගින් කැඳ පිළිගත්ත. කැඳ රැගෙන පැමිණි පින්වතුන් පහළොස් දෙනාම භික්ෂුව සතුටට පත් කළා. පින්වතුන් පනස් දෙනෙක් පිණ්ඩපාත මඩුවට පැමිණ තිබුණොත් එම පනස් දෙනාගෙන් ම බත් හැන්ද බැගින් පිළිගන්නවා. කාටවත් දුකක් නැහැ. හැමෝම සතුටු කරනවා, අපේ භික්ෂු

ජීවිතවලට අපි පූර්වාදර්ශයක් ගන්න මහාකාශ්‍යප මහරහතන් වහන්සේට වරක් ලාදුරු රෝගියෙක් පිණ්ඩපාතයක් පාත්‍රයට බෙදනවා. ඒ මොහොතේ එම රෝගියාගේ ඇඟිල්ලේ පුරුකක් පාත්‍රයට වැටෙනවා. මහා කාශ්‍යප මහරහතන්වහන්සේ මෙත් සිතින් එම රෝගියාට පින් අනුමෝදන් කොට එම රෝගියාට පෙනෙන්නට ගස් සෙවණක වැඩසිටිමින් එම ඇඟිලි පුරුක පාත්‍රයෙන් ඉවත් කොට දානය වළඳනවා. උන්වහන්සේ තව කෙනකුට දුකක් දුන්නේ නැහැ. අනුනට දුක් කඳුළු නොදීමේ මේ උතුම් චර්යාව, අපේ පිය උරුමයෙන් භික්ෂූන් වන අපට ලැබුණු චර්යාවක් වෙනවා.

මෙය සටහන් තබන භික්ෂුව මුණගැසෙන්න පැමිණෙන පින්වතුන් ප්‍රකාශ කරනවා, "ඔබවහන්සේ දේශනා කරන සද්ධර්මය ශ්‍රවණය කරලා දිවයින ඉරිදා සංග්‍රහයේ. පළවෙන ලිපි පෙළ කියවලා අධර්මයට යොමු වී තිබූ අපේ ජීවිත ධර්ම මාර්ගයට ගත්තා"ය කියලා. ප්‍රශ්න නිසාම සියදිවි නසාගන්න ගිය මම ඉන් වැළකුණේ, දික්කසාද වෙන්න ගිය පවුල් ජීවිතය ආදර්ශමත් පවුල් ජීවිතයක් බවට පත් කොට ගත්තේ, අම්මා තාත්තාට අකීකරු ජීවිතයක්, අම්මා තාත්තාට දේවත්වයෙන් සලකන දරුවෙක් බවට පත් කළේ මහරහතුන් වැඩි මග ඔස්සේ ලිපි පෙළ නිසා කියලා අප්‍රමාණ පින්වතුන් භික්ෂුවට ප්‍රකාශ කරලා තිබෙනවා. තම ජීවිත යහමඟට ගත් මෙවැනි පින්වතුන්ලා භික්ෂුවට ඉහත ප්‍රකාශයන් කරලා භික්ෂුව ඉදිරියේ කඳුළු වගුරුවලා තිබෙනවා. ඒ සත්පුරුෂ පින්වතුන්ලා ගේ නෙතින් ගලන කෘතවේදීභාවයේ කඳුළු වලට වගකියන්න භික්ෂුවට බැහැ. එම කඳුළු ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ උතුම් ධර්මරත්නයේ ගුණයත්, තම තමන්ගේ ජීවිත වලට එකතු කොට ගැනීම නිසා ම සද්ධර්මයේ ඕපනයික ගුණයෙන්, එහිපස්සික ගුණයෙන් ලැබූ අත්දැකීම් නිසා ම එම පින්වතුන්ලාගේ නෙතින් ගලන කඳුළුයි.

යම් ස්වාමීන් වහන්සේ නමකගේ ගුණයක් පින්වත් ඔබ දැකලා ඔබේ නෙතින් කඳුළක් රූටා වැටෙනවා නම් එම කඳුළු බුදුරජාණන් වහන්සේට කීකරුභාවයෙන් තම උතුම් භික්ෂු ජීවිත සුපටිපන්න ගුණයෙන්, උජුපටිපන්න ගුණයෙන්, ඤායපටිපන්න ගුණයෙන්, සාමීචිපටිපන්න ගුණයෙන් ශක්තිමත් කොට ගන්න, මහා සංඝරත්නයේ ගුණයන් දැකීම නිසා ම පින්වත් ඔබේ නෙතින් ගලන කඳුළුයි. මේ සියලු ගුණයන් අයිති ලොව්තුරා බුදුරජාණන් වහන්සේට මයි. අනාගතයේ යම් දවසක මෙය සටහන් තබන භික්ෂුව අපවත් වුණොත් සමහර විට පින්වත් ඔබේ නෙතින් කඳුළක් රූටා වැටෙන්න පුළුවන්. එම කඳුළටත් භික්ෂුවට වගකියන්න බැහැය කියලා අද ම සටහන් කොට තබනවා. භික්ෂුවගේ මළ කඳ ඉදිරියේ පින්වත් ඔබේ නෙතින් ගලන කඳුළ පින්වත් ඔබ ධර්ම මාර්ගයේ ප්‍රමාදිභාවය හේතුවෙන් ම ඔබේ නෙතට නැගෙන කඳුළක් මයි. බුදුරජාණන් වහන්සේ දුක ගැන දේශනා කරන කොට දෝමනස්ස කියලා අර්ථ දක්වන්නේ ඔය කඳුළටයි. දුක තිබෙනවා නම් පින්වත් ඔබ තුළ දෝමනස්සයන්ට අදාළ ධර්මයන් තිබෙනවා නම් එතැන තෘෂ්ණාවත් තිබෙන්නට ඕනේ.

බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට දේශනා කරනවා ආනන්ද, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවට පසුව එම සම්බුද්ධ ශ්‍රී දේහයට සක්විති රජකෙනකුගේ ශ්‍රී දේහයට දක්වන ගෞරවයන්, පුද සත්කාර දක්වන්නය කියලා. සුවඳ පැනින් ශ්‍රී දේහය දෝවනය කොට කපු පිළියෙන් පන්සිය වතාවක් ද, කපු පුළුන් වලින් පන්සිය වතාවක් ද ශ්‍රී දේහය වෙළන්නට කියනවා. සඳුන් දැවයෙන් තැනූ දෙනක බහා සඳුන් දැවයෙන් තැනූ චිතකයක ආදාහනය කිරීම සක්විති රජකෙනකුගේ ශ්‍රී දේහයට දක්වන ගෞරවය යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

බුදුරජාණන් වහන්සේ නමකගේ පිරිනිවීමේ මංගල්‍යයට අදාළ දැක්විය යුතු ඉහත ආශ්චර්යවත් ගෞරවයන් ගැන බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට දේශනා කරන්නේ උන්වහන්සේ සතු මහා කරුණා ගුණය නිසා මයි. දෙවනුව එවැනි ආශ්චර්යවත් ගෞරවයන් ලබන්නට බුදුරජාණන් වහන්සේලා පසුපස පටිච්චසමුප්පන්ව ඇති දස පාරමී කුසල් ශක්තිය හේතුඵල ධර්මයන් හැටියට දැකලා මයි. බුදුරජාණන් වහන්සේ සතු මහා කරුණා ගුණය නිසා ම තවත් දින කිහිපයකින් අළු බවට ධාතුන් වහන්සේලා බවට පත්වෙන තම දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුත් රූපකාය අවසාන නිමේෂයේදීත් මනුෂය, දිව්‍ය, බ්‍රහ්ම, සත්පුරුෂයන් උදෙසා ශ්‍රී දේහයට ගෞරවයන් කොට පින් රැස් කොට ගන්න, කුසල් ධර්මයන් ජීවිතවලට එකතු කොට ගන්න. විදර්ශනාමය ප්‍රඥාව ඇති කොට ගන්න, පිරිනිවී ගිය ශ්‍රී දේහය තුළින් ලෝකයාට අවස්ථාව සලසා දුන්නා.

නමුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මයි අපිට ඉගැන්වූවේ සියලු සංස්කාරයෝ අනිත්‍යයි කියලා. රූපය කායානුපස්සනාව තුළින් දකින්නය කියලා. රූපය මරණානුස්සතියක් හැටියට දකින්නයි කියලා. එවැනි සුන්දර ධර්මයේ ඇත්ත ඇති සැටියෙන් අපිට දේශනා කරපු බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ පිරිනිවන් පෑවාට පසුව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහයට සක්විති රජ කෙනකුගේ දේහයට දක්වන ගුරු බුහුමන් දක්වන්න කියලා අපට දේශනා කළේ, අතීත සංස්කාරයන්ට අදාළව සිදුවිය යුත්ත එය නිසා මයි. මරණානුස්සතිය අපිට උගන්වා බුදුරජාණන් වහන්සේ තම ශ්‍රී දේහය අතීත සංස්කාරයන්ට අතහැරියා.

ප්‍රියයන් ගෙන් වෙන්වීම දුකක්ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පින්වත් ඔබ ප්‍රිය කරන ඔබේ රූපය, මළ කඳක් බවට පත් වුණාට පස්සේ මළ කඳ වෙනුවෙන් ජීවත්ව සිටියදී කොන්දේසි, උපදෙස් පනවන්නේ මළ කඳ

අප්‍රිය දෙයක් වශයෙන් දකින නිසා මය. මළ කඳක් යනු අප්‍රිය මරණානුස්සතියක් බව ධර්මානුකූලව සම්පූර්ණ ඇත්තකි. එහෙත් විදර්ශනාමය අවබෝධය යනු මළ කඳත්, සංස්කාර හේතුවෙන් සකස් වුණ හේතුඵල ධර්මයක් වශයෙන් දැකීමයි. එහෙයින් මළ කඳ භාරදිය යුත්තේ ඇලීමට හෝ ගැටීමට නොවේ. උතුම් ධර්මයේ උපේක්ෂාවටයි. විදර්ශනාත්මක ධර්මයේ උපේක්ෂාව යනු අතීත සංස්කාරයන්ට අදාළව විය යුත්ත සිදුවීමටයි.

පින්වත් ඔබේ ජීවිතය සංස්කාරයන්ට අතහරින්න. එවිට පින්වත් ඔබ සිටින්නේ ධර්මයේ උපේක්ෂාව තුළය. එසේ නොවුණොත් මරණානුස්සතියේ ආශ්වාදයෙන් පින්වත් ඔබ ජීවත්ව සිටියදී ම ඔබේ අනාගත මළ මිනියෙනුත් තවත් රූපයකට බැසගැනීමට අදාළ සංස්කාරයන්ට පින්වත් ඔබ රැස් කොට ගනු ඇත.

ඉහත අනතුරෙන් මිදීමට පින්වත් ඔබට ඇති එකම සුන්දර ධර්මානුකූල විසඳුම, පින්වත් ඔබ ප්‍රගුණ කරන කායානුපස්සනාව මුලින්ම පටිච්චසමුප්පාද ධර්මයෙනුත් දෙවනුව පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවයෙනුත් පෝෂණය කොට ගැනීමයි. ඉහත අර්ථයන් දෙකින් පින්වත් ඔබේ කායානුපස්සනාව පෝෂණය නොවුණොත් අනිවාර්යයෙන් ම කායානුපස්සනාවේ ආශ්වාදය හෙවත් ලෞකික සප්ත බොජ්ඣංග ධර්මයන්ගේ හිරකාරයෙක් බවට ඔබ පත්වීමේ ඉඩකඩ විවෘතව තිබෙනවා.

අතීතයේ බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදීම අසුබ භාවනාව දැඩි ලෙස ප්‍රගුණ කළ ස්වාමින්වහන්සේ නමක්, අසුබ සඤ්ඤාව තුළ හිඳිමින්ම අපවත් වී දිව්‍යතලයක සුන්දර දිව්‍යාංගනාවන් පිරිවරා ගෙන ඉපදෙනවා. අතීත පුහුණුවට අදාළව අසුබ භාවනාවේ උපාදානයට අදාළව එම දෙවියාට අසුබ සඤ්ඤාව මයි දිව්‍යතලයේදී වැඩුණේ. එම දෙවියාට තමා වටා සිටින සුන්දර දිව්‍යාංගනාවන් පෙනෙන්නේ ඇටසැකිලි හැටියට. මේ දෙවියාට සෝවාන්ඵල අවබෝධය නොලැබී ඉහත

අනතුර සිදුවූයේ පෙර ජීවිතයේ අසුබ භාවනාව දැඩි ලෙස පුහුණු කළත් ඒ කියන්නේ කායානුපස්සනාව පුහුණු කළත් වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාව පුහුණු කළේ නැහැ. පටිච්චසමුප්පාද ධර්මයන් තුළ ජීවිතය විසුරුවා දැක්කේ නැහැ. පංචඋපාදානස්කන්ධයේ අතීත, වර්තමාන, අනාගත අනිත්‍යභාවය පුහුණු කළේ නැහැ. දැඩිව අසුබ භාවනාව පුහුණු කළත් අසුබ භාවනාව තමන් තුළ වැඩුණේ ආශ්වාදයක් හැටියටයි. ආශ්වාදය තුළ සකස් වුණේ ලෞකික සප්ත බොජ්ඣංග ධර්මයන් මයි. එහි ධර්මානුකූල ඵලය වුණේ නැවත කාම ලෝකයේ දෙවියන් අතර උපත ලැබීමයි.

කායානුපස්සනාව පුහුණුවීමේදී ඔබ තුළ සකස් වෙන සෑම ධර්මතාවයක් ම ඒ කියන්නේ කායසංස්කාර, වචීසංස්කාර, මනෝසංස්කාර, පංචනීවරණ, සප්තබොජ්ඣංගයන් වගේම පින්වත් ඔබ පුහුණු කරන කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව කියන ධර්මතාවයනුත්, ධම්මානුපස්සනාවෙන් දකින්න. අනිත්‍ය වූ ධර්මතාවන් හැටියට දකින්න. ඒ විතරක් නොවේ ධම්මානුපස්සනාවෙන් දකින සිතත් ඔබ පෙරළා චිත්තානුපස්සනාවෙන් අනිත්‍ය වශයෙන් දැකිය යුතුයි. මෙවැනි අවස්ථාවක ඔබ තුළ සප්ත බොජ්ඣංග ධර්මයන් ශක්තිමත්ව වැඩෙන්න පුළුවන්. ඒ සෑම සප්ත බොජ්ඣංග ධර්මයක් ම ධම්මානුපස්සනාවෙන් දකිමින් නැවත නැවත සතරසතිපට්ඨාන ධර්මයන් තුළ ම පුහුණුව ලබන්න.

පින්වත් ඔබ දෙතිස්කුණපයක්, සතරමහා ධාතුවක්, අට්ඨික සඤ්ඤාවක්, මරණානුස්සතියක්, අනිත්‍ය වූ ඉරියව් පවත්වන කයක් වශයෙන් කායානුපස්සනාව පමණක් පුහුණු කරලා ප්‍රමාණවත් නැහැ. කායානුපස්සනාව ඔබ කොතෙක් පුහුණු කළත් පින්වත් ඔබ තුළ වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාව, දුර්වලනම්, කායානුපස්සනාව ඔබ තුළ වැඩෙන්නේ ආශ්වාදයක් හැටියට මයි. මේ ආශ්වාදය ඔබ අනිවාර්යයෙන් ම ධම්මානුපස්සනාවට යොමු කරන්න ඕනේ.

හුදකලා කායානුපස්සනාව, අසුබ, පිළිකුල් භාවනාව පින්වත් ඔබව නැවත කාමලෝකයේ දිව්‍ය උපතකට යොමු කරාවි. ලිපියේ මුලින් සඳහන් කළ ස්වාමින්වහන්සේ අසුබ භාවනාව දැඩිව පුහුණු කළත් අපවත්වීමෙන් පසුව කාම ලෝකයට අයත් දිව්‍යතලයක විදර්ශනාත්මක අවබෝධයකින් තොරව උපදින්නේ ඉහත දුර්වලතාවය නිසා මය.

පින්වත් ඔබ මුලින්ම කායානුපස්සනාව පුහුණුවීමේදී කායානුපස්සනාව තුළින්ම වේදනානුපස්සනාවත්, චිත්තානුපස්සනාවත්, ධම්මානුපස්සනාවත්, ඔබේ පුහුණුවට එකතු කොට ගන්න පින්වත් ඔබට පුළුවන්.

අපි පුහුණුකොට ගන්න සතර සතිපට්ඨාන ධර්මයන් ඉලක්ක කොට ගත යුත්තේ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය කෙරෙහි මය. පින්වත් ඔබ තුළ කායානුපස්සනාවත්, පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවයත් අර්ථවත් කොට දීමට සක්කායදිට්ඨිය භාවනාවෙන් මුලිනුපුටා දැමීමට ඔබට උපකාරක ධර්මයන් සකස් කොට දෙන්නේ පටිච්චසමුප්පාද ධර්මයන් තුළ ඔබේ ජීවිතය විසුරුවා දැකීමට ඔබ ලබනා පුහුණුවයි. සතරසතිපට්ඨාන භාවනාවට යොමු වන පින්වත, නිරතුරුව ම අවිද්‍යා පච්චයා සංඛාරා සහ අවිද්‍යා නිරෝධා සංඛාර නිරෝධෝ පටිච්චසමුප්පාද ක්‍රියාවලිය සමුදය සහ නිරෝධය වශයෙන් මෙනෙහි කරන්න, සජ්ඣායනය කරන්න පුහුණුව අත්‍යවශ්‍යයි.

පටිච්චසමුප්පාද ධර්මයන්ගෙන් පෝෂණය නොවූ ඔබගේ භාවනාව නිරතුරුව ම ඔබ තුළ භාවනාවේ සක්කායදිට්ඨිය, මමත්වයේ දැඩිභාවය ඇති කොට දෙනවා. එවිට ඔබ සිදුකරන භාවනාව අනුන්ව හෙළා දකින ඔබ ඔසවා තබන වියරුවක් බවටයි පත් වන්නේ. පටිච්චසමුප්පාද ධර්මයන් කෙරෙහි පින්වත් ඔබේ සතිය සිහිය ශක්තිමත් කොට ගන්න නම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප සහ ශීලයට අදාළ අංගයන් වැඩෙන්න ම අවශ්‍යයි.

# සඳ එළියට වශී නොවන පාළුවක් නැති විවේකය

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙන්නේ තෘෂ්ණාවේ වේවැලෙන් ඔබව පාලනය කරන ලෝකය සතර සතිපට්ඨාන ධර්මතාවන් තුළින් පින්වත් ඔබේ පාලනයට යටත් කොට දීමටයි. මෙය සටහන් තබන භික්ෂුව ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පෝෂණය වූ සතර සතිපට්ඨාන ධර්මයන්ගේ ශක්තියෙන් ලෝකයේ පාලනය සියතට ගත් භික්ෂුවක්. සතර සතිපට්ඨානය නමැති ආරක්ෂකයා ඉදිරියේ තෘෂ්ණාව නිරතුරුව අත්අඩංගුවට පත් ධර්මතාවයක් ම වෙනවා.

භික්ෂුව ඉහතින් ලෝකය යැයි සටහන් තැබුවේ සම්මුති ලෝකය නොව පංචඋපාදානස්කන්ධ ලෝකයයි. පින්වත් ඔබ පංචඋපාදානස්කන්ධ ලෝකය කෙරෙහි තෘෂ්ණාව මරා දැමූ කල ඇසට, කනට, නාසයට අරමුණු වන සම්මුති ලෝකයත් පින්වත් ඔබ නිරෝධය කළා ම වෙනවා. පින්වත් ඔබ ඔබේ ජීවිතයත් සමඟ පිළිසඳරක යෙදෙන්න "කවදාද මම තෘෂ්ණාවේ පාලනයෙන් මිදී උතුම් සතර සතිපට්ඨාන ධර්මයන් ගේ පාලනයට මගේ ජීවිතය යොමු කොට ගන්නේ" කියලා. එහෙම සිතුවිල්ලක් ඇති කොට ගෙන එම සිතුවිල්ලෙන් ඔබ චිත්තානුපස්සනාවෙන් දකින්න ඕනේ. එසේ නොවුණොත් සතර සතිපට්ඨාන ධර්මයන් තුළත් තෘෂ්ණාව හොල්මන් කරන්න පුළුවන්.

මේ සටහන ලියන අද දිනය දෙසැම්බර් 24 වැනිදා. දැන් වෙලාව රාත්‍රි හතට පමණ ඇති. උඳුවප් පසළොස්වක පොහොය සඳේ ආලෝකය කැලයේ ගස් අතු පතරින් එබිකම් කරන හැටි ජනෙල් කවුළුවෙන් භික්ෂුවට හොඳට පෙනෙනවා. උඳුවප් සඳ එළියෙන් ආලෝකවත් රාත්‍රිය හරිම නිහඬයි. සතර සතිපට්ඨාන ධර්මයන් ගෙන් මෝදු වන විදර්ශනාමය ප්‍රඥාවේ එළියෙන් ජීවිතයත් ආලෝකවත් වෙද්දී ජීවිතයක ඇතිවන විදර්ශනාමය නිහඬතාව හෙට හිමිදිරියේ අතුරුදන් වී යන සඳ එළියේ ආලෝකයත් සමඟ මුසු වුණාම ජීවිතය නැවතිලයි තිබෙන්නේ. ජීවිතය නැවතිලා තිබෙන්නේ එස්සය ළඟ. එස්සය ළඟ නැවතුන ජීවිතයක් කවදාකවත් සඳ එළියේ චමත්කාරය ගැන කවි, සින්දු ලියන්නේ නැහැ. විදර්ශනාමය ප්‍රඥාවේ ආලෝකය ඉදිරියේ පසළොස්වක පොහොය සඳ එළියත්, කණාමැදිරි එළියක් පමණක් මයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "උතුම් සෝවාන් ඵලයට පත් වූ පින්වතෙක් අතින් ආනන්තරීය පාපකර්මයක් සිදුවන්නේ නැහැ"ය කියලා. එය ධර්මතාවක්. මෙවැනි ධර්මතාවන් දහයක් ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙනවා. එක් ලෝක ධාතුවක බුදුරජාණන් වහන්සේලා දෙනමක් එකවර පහල වෙන්නේ නැහැ. සක්විති රජවරු දෙදෙනෙක් එකවර පහල වෙන්නේ නැහැ. ස්ත්‍රියක් ලොව්තුරා බුද්ධත්වයට පත් වන්නේ නැහැ. ස්ත්‍රියක් සක්විති රජ බවට ශක්‍ර දෙවියන් බවට, වසවර්ති මාරයා බවට පත් වන්නේ නැහැ. ස්ත්‍රියක් මහා බ්‍රහ්මයා බවට පත්වන්නේත් නැහැ. මේවා ධර්මතාවන්. ඒ වගේ මයි මේ උතුම් සම්මාසම්බුද්ධ ශාසන ප්‍රතිපදාව තුළ පසළොස්වක සඳ එළියත් කණාමැදිරි එළියක් බවට පත්වන ධර්මතාවක් තිබෙනවා. එය තමයි උතුම් සතර සතිපට්ඨාන ධර්මයන් ගේ පුහුණු වෙන් මෝදු වන විදර්ශනාමය ප්‍රඥාවේ ආලෝකය ඉදිරියේ පසළොස්වක සඳ එළියත්, කණාමැදිරි එළියක් බවට පත්වීම.

භික්ෂුව මුණගැසෙන්න කුඩා දරුවන් දෙදෙනෙක් සමඟ මවුපිය යුවළක් පැමිණියා. කුඩා දරුවන් දෙදෙනා නම් සෙල්ලම් වයසේ නිසා ටිකක් සෙල්ලම් කරමින් ශබ්ද කළා. දරුවන්ගේ තාත්තා භික්ෂුවට කියනවා "දරුවන්ගේ ශබ්දය නිසා ඔබවහන්සේගේ විවේකයට බාධා වුණා නම් සමාවෙන්න" කියලා. භික්ෂුව එම මහත්මයාට ප්‍රකාශ කළා මමත් ඔය වයසේදී ඔහොම තමයි කියලා.

මෙය සටහන් තබන භික්ෂුවගේ විවේකය අනුන් නිසා ලැබෙන විවේකයක් හෝ අනුන් නිසා බිඳෙන විවේකයක් නොවේ. යම් භික්ෂුවකගේ විවේකය අනුන් නිසා ලැබෙනවා නම් අනුන් නිසා බිඳෙනවා නම් එම භික්ෂුව තවම ධර්මානුකූලව විවේකයට පත් වෙලා නැහැ. ධර්මානුකූලව සැබෑම විවේකය සකස් වෙන්නේ ඵස්සය, තෘෂ්ණාවෙන් තෙත් නොකරන බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් තුළ මයි. ඵස්සය තෘෂ්ණාවෙන් තෙත් කරන ප්‍රමාණයට අපි අවිවේකයට අදාළව ඇලීම්, ගැටීම් සකස් කොට ගන්නවා.

පින්වත් ඔබේ විවේකය අනුන් නිසා බිඳෙනවා නම් කරුණාකරල ඔබ ලබන විවේකයත් ඔබ ලබන අවිවේකයත් සතර සතිපට්ඨාන ධර්මයන් තුළ විසුරුවා දකින්න දක්ෂ වෙන්න. පින්වත් ඔබ තුළ විවේකයත්, අවිවේකයත් සකස් වෙන්නේ ඔබේ රූපය ඇසුරෙන් මයි. එම නිසා අධ්‍යාත්මික බාහිර රූපයන්ගේ අනිත්‍ය භාවය කායානුපස්සනාව තුළින් දකින්න. විවේකය නිසා සකස් වන සැප වේදනාවත්, අවිවේකය නිසා ඇති වන දුක් වේදනාවත්, වේදනානුපස්සනාවෙන් දකින්න. විවේකී සිතත්, අවිවේකී සිතත් චිත්තානුපස්සනාවෙන් දකින්න. විවේකය තුළ සකස් වන සප්තබොජ්ඣංග ධර්මයනුත්, අවිවේකය තුළ සකස් වන පංචනිවරණ ධර්මයනුත් ධම්මානුපස්සනාවෙන් අනිත්‍ය වශයෙන් දකින්න. විවේකයත්, අවිවේකයත් එකම කාසියේ දෙපැත්ත වුණත් මේ ධර්මානුකූල යථාර්ථය තේරුම් ගන්න නම් විවේකය අත්‍යවශ්‍ය වෙනවා.

පින්වත් මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා "ඔබ වහන්සේ මේ කැලයේ කුටියකට වෙලා තනියම වැඩසිටින කොට පාළුවක්, තනිකමක් දැනෙන්නේ නැතිද" කියලා. භික්ෂුව එම මහත්මයාට දුන්න පිළිතුර වුණේ "මහා සංසරත්නයට පාළුවක්, තනිකමක් දැනෙන්න නම් මෙතන මමය කියලා ගත්තාවු කෙනෙක් ඉන්න ඕන නේද" කියලා. "මම කෙරෙහි තෘෂ්ණාව හිස් කළ තැන ජීවිතය පටිච්චසමුප්පාද ධර්මයන් තුළ විසුරුවා දැකලා, දැක්ම පිරිසිදු කොට ගන්න තැන ඔය ප්‍රශ්නය බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයකුට අදාළ වෙන්නේ නැහැ"ය කියලා. මේ නිහඬ රාත්‍රියේදී පින්වත් ඔබෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරල ඔබේ පාළුව මකාගන්න කියලා. රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාන යාළුවො ටික නම් ආශ්‍රයට ගන්න එපාය කියලා. එම යාළුවන්ට තෘෂ්ණාවේ මත්වතුර පොවන්න එපාය කියලා.

පටිච්චසමුප්පාද ධර්මයන් ගැන සටහන් තබන අද දිනය දෙසැම්බර් 24 වැනිදා. දැන් වෙලාව රාත්‍රි අටට පමණ ඇති. තවත් පැය කිහිපයකින් ලෝකවාසී ක්‍රිස්තියානි පින්වතුන්ලාට තම ආගමික නායකයාණන් වන ක්‍රිස්තුස් වහන්සේ ගේ උපත සමරන සුන්දර නත්තලක් උදාවෙනවා. අද රාත්‍රි 12.00 ට ලෝකයේ සෑම පල්ලියකින් ම නාද දෙන සීනු හඬින් පරිසරය දෝංකාරය දේවි. ක්‍රිස්තුස් වහන්සේ ගේ උපත සිහියට නැගෙද්දී භික්ෂුවට සිහිපත් වෙන්නේ පටිච්චසමුප්පාද ධර්මයයි. ක්‍රිස්තුස් වහන්සේව කුරුසියේ ඇණ ගසා ජීවිතක්ෂයට පත් කිරීමෙන් පසුව ක්‍රිස්තුස් වහන්සේ ලබන පටිච්චසමුප්පන්න නැවත උපත පටිච්චසමුප්පාද ධර්මයන්ට මොන තරම් සමීපද? ලෝකයේ ඕනෑම ආගමික ශාස්තෘන් වහන්සේ නමකගේ ජීවිතය මේ උතුම් පටිච්චසමුප්පාද ධර්මයන් තුළ විසුරුවා දකින්න පුළුවන්. එය ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සම්මාසම්බුද්ධ ඤාණයේ අසිරිමත් භාවයක් මයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වරක් මහාකාශ්‍යප මහරහතන් වහන්සේට දේශනා කරනවා, "කාශ්‍යප දැන් ඔබ වයෝවෘද්ධයි, ඔබට කැලයේ ජීවත් වෙන්න අපහසුයි. රළු පාංශුකූල චීවර දරන්න අපහසුයි, ගස් ගල් අතරින් දුරබැහැර ගෙවා ගෙන පිණ්ඩපාත චාරිකාවේ යෙදෙන්න අපහසුයි. එම නිසා කාශ්‍යප ඔබ නාගරික ආරණ්‍ය වල වැඩසිටින්න, සැහැල්ලු චීවර දරන්න, ආරාධනා දාන වලට වඩින්න"ය කියලා.

ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේට කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රකාශ කරනවා "මාගේ පහසු විහරණය උදෙසාත්, අනාගත භික්ෂු සමාජයට පූර්වාදර්ශයක් උදෙසාත්, මම කැලයේ මයි ජීවත් වෙන්නේ, පාංශකුල චීවර මයි දරන්නේ, පිණ්ඩපාතයෙන් මයි යැපෙන්නේ" කියලා. බුදුරජාණන් වහන්සේ කාශ්‍යප මහරහතන් වහන්සේගේ සත්පුරුෂ කෘතවේදී පිළිතුරට සාධුකාර දීම පමණක් මයි සිදු කළේ.

සත්පුරුෂ උතුම් මනුෂ්‍යයෝ තමන්ට උපකාර කළ තමන්ගේ ජීවිත වලට බැඳුණා වූ අතීත ඥාති පරම්පරාවන් ගේ පූර්වාදර්ශයන් තුළින් ලැබුණා වූ යහපත් ධර්මයන් කවදාකවත් අමතක කරන්නේ නැහැ. ආගන්තුක ධර්මයන්ගෙන් වසා දමන්නේ නැහැ.

පළමුව තමන්ගේ පහසු විහරණය උදෙසා යහපත් ධර්මයන් ආරක්ෂාකොට ගන්නවා. දෙවනුව මෙත් සිතින් "මා ජීවිතයට ලැබූ යහපත් දේවල් අනාගත පරම්පරාවන් ද සුවසේ ලබත්වා" කියල "සුවසේ පරිහරණය කරත්වා" කියල තමන් ලැබූ යහපත් ධර්මතාවන් ආරක්ෂා කොට ගන්නවා.

තමන් යහපත තුළ සිටිමින් එම යහපත පූර්වාදර්ශයන් තුළින් සමාජගත කරන උතුමන්ට බුදුරජාණන් වහන්සේත් සාධුකාර දෙනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ගෙන් සාධුකාර ලබමින් අනාගත භික්ෂු සමාජයට යහපත් ප්‍රතිපදාවක් ඉතිරි කොට ආරක්ෂා කොට තබා පිරිනිවී ගිය උතුම් රහතන් වහන්සේලා අනුව යන ස්වාමින් වහන්සේලා කොතෙක් නම් අපේ භික්ෂු සමාජය තුළ වැඩසිටිනවාද?

බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කොට තිබෙනවා ඔබ මේ උතුම් ශාසන ධර්මයන් ආරක්ෂා කොට ගන්නා අන්තිමයා වෙන්න එපාය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "රත්තරන් වේශයෙන්, රත්තරන් නොවන දෙයක් මතු වුණොත් සැබෑ රත්තරන් අතුරුදන්ව යනවා"ය කියලා. "ඒ වගේ මයි සද්ධර්මයේ වේශයෙන් විකෘති බොරු ධර්මයක් මතුවුණොත් එම විකෘතිය සැබෑ සද්ධර්මයේ අතුරුදන් වීම පිණිස ම හේතු වෙනවා"ය කියලා.

ඒ වගේ මයි ගෞරවණීය පින්වතුනි, සිංහල බෞද්ධ කමේ වේශයෙන් ආගන්තුක චර්යාවන්, හැසිරීම්, වටිනාකම් මතු වුණොත් එය සැබෑ සිංහල බෞද්ධ කමේ අතුරුදන් වීම උදෙසා ම හේතු වෙන්න පුළුවන්.

මෙය සටහන් තබන භික්ෂුව අපවත් වෙන තුරාවට, බුදුරජාණන් වහන්සේ සාධුකාර දුන් මහා කාශ්‍යප මහරහතන් වහන්සේ දිවි හිමියෙන් ආරක්ෂා කොට දුන් මේ උතුම් භික්ෂු ප්‍රතිපදාවේ අන්තිමයා නම් වෙන්නේ නැහැ. භික්ෂුවට වැදගත් වෙන්නේ වෙහෙස, රෝගීභාවයන් දුෂ්කරතාවන් නොවේ මේවා සියල්ලෝම අතීත සංස්කාරයන් ගේ ඵලයක් මයි.

භික්ෂුවට වැදගත් වෙන්නේ ඒ අනිත්‍ය වූ සංස්කාරයන් ගේ යථා ස්වභාවය නිරවුල්ව ලෝකයට දේශනා කොට තිබෙන මේ උතුම් සද්ධර්මය ඊළඟ පරම්පරාවට දායාද කොට තබා අපවත්වීම පමණක් මය.

මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනය, භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිසගේ මය. එම නිසා පින්වත් ගිහි පින්වතුන්ලා ද ඔබලාගේ වැඩිහිටියන් ගෙන් ඔබට උරුම වූ යහපත් පුරුදු, යහපත් ගුණධර්මයන් රැකගෙන ජීවත් වන පරපුරේ අන්තිමයා වෙන්න එපා.

වර්තමානයේ හුඟාක් සිංහල බෞද්ධ අම්මලා, තාත්තලා, තරුණ තරුණියන්, දරු දැරියන් තමන්ට මවුපිය උරුමයෙන් පෙර සාංසාරික පින නිසා ම ලැබුණු මේ උතුම් සිංහල කම බෞද්ධ කම ආරක්ෂා කොට ගත් පරපුරේ අන්තිමයා බවට පත් වෙලා සිටිනවා.

ඇඳුමෙන් පැළඳුමෙන්, කෑමෙන් බීමෙන්, හැසිරීමෙන්, සිතුම් පැතුම් වලින් සිංහල බෞද්ධ කමට ආවේණික නොවූ අසංවර ආගන්තුක ධර්මයන් ගේ සිරකරුවන් බවට පත් වෙලා ජීවත් වෙන යම් පින්වතෙක් වේ නම් එම පින්වතා සිය කැමැත්තෙන් ම තමන්ට ලැබුණු යහපත් ධර්මයන් ආරක්ෂා කොට ගත් පරපුරේ අන්තිමයා බවටයි පත් වෙන්නේ.

මේ ලෝක ධාතුවේ උතුම් රහතන් වහන්සේලා දෙනමකගේ ආධ්‍යාත්මික ශක්තියෙන් උපන් ජාතියක් සිටිනවා නම් ඒ උතුම් ජාතිය සිංහල බෞද්ධ ජාතියයි. මිහිඳු මහෝත්තමයන් වහන්සේගේත්, සංඝමිත්තා උත්තමාවියගේත් සද්ධර්මයේ ලේ උරුමයෙන් උපන් ශ්‍රේෂ්ඨ ජාතිය මේ උතුම් සිංහල බෞද්ධ ජාතියයි. භික්ෂුව මෙහෙම සටහන් තබද්දී පින්වත් ඔබ තුළ ඇති විය යුත්තේ කෙලෙස් සහිත ප්‍රෞඪත්වයක්, ආඩම්බරකමක් නොවේ. ඇතිවිය යුත්තේ, මේ අසිරිමත් උපතක් ලබන්නට හේතු වූ ධර්මානුකූල හේතුඵල ධර්මයන්ගේ ශක්තියයි. පින්වත් ඔබ මේ සුන්දර සිංහල බෞද්ධ ජීවිතයක් ලැබුවේ පටිච්චසමුප්පන්නව අතීතයේ ප්‍රගුණ කළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් පෝෂණය වූ කුසල් ධර්මයන් නිසා මය.

සිංහල බෞද්ධයා කියල කියන්නේ 'ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන්නා' කියන අර්ථයයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ බැසගත් සිංහල බෞද්ධයා තෙරුවන් කෙරෙහි ගෞරවයෙන් ම ශ්‍රද්ධාව ඇති කොට ගත් පින්වතෙකි. ඔහු සතු සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීමේ හැකියාව නිසාම ඔහු තමා තුළින් දකිනවා, "තමන් ජන්ම ලාභය ලැබූ සිංහල බෞද්ධ ජාතිය උතුම් සුපටිපන්න ගුණයෙන්, උජුපටිපන්න ගුණයෙන්, ඤායපටිපන්න ගුණයෙන්, සාමිචිපටිපන්න ගුණයෙන් විදර්ශනාත්මකව පෝෂණය වුණ මිහිඳු මහෝත්තමයන් වහන්සේගේත්, සංඝමිත්තා උත්තමාවියගේත් සද්ධර්මයේ ලේ උරුමයේ ජාන ශක්තිය පටිච්චසමුප්පන්නව තමාගේ අධ්‍යාත්මයත් සමඟ මුසු වෙලා තිබෙනවා"ය කියලා.

# ලෝකය පාලනය කරන්නේ ඇමරිකාව හෝ රුසියාව නොවන වග..

අපි හැමෝම ජීවත් වෙන්න කැමැතියි. නමුත් අපි හැමෝම මරණයට අකැමැතියි. සමාජයේ ජීවත්වන සමහර පින්වතුන්" මරණය ගැන සිතන්න අකැමැතියි. මරණය ගැන සිතන්න අකැමැති පින්වතා බොහෝම ඉක්මනට මරණය ජීවිතයට ළඟා කොට ගන්නවා. එසේත් නැති නම් ජීවත් වුණත් ඒ ජීවිතය මැරිච්ච ජීවිතයක්ම වෙනවා.

නොමැරී ජීවත් වුණත් වර්තමාන සමාජයේ වැඩිපුර ම තිබෙන්නේ අලෝභ, අද්වේශ, අමෝහ ධර්මයන් මැරිච්ච ජීවිතයි. බුදුරජාණන් වහන්සේ මෙවැනි ජීවිත වලට ධර්මානුකූලව කියන්නේ 'ඇවිදින ඇටසැකිලි' කියලා. එසේත් නැති නම් 'ඇවිදින මළකඳන්' කියලයි. මෙවැනි ඇවිදින මළකඳන් වලින් සමාජයටත්" තමන්ටත් වැඩක් නැහැ. එවැනි ඇවිදින මළකඳන් තමනුත් අකුසල් සිදු කොට ගෙන අනුන් වත් අකුසලයට ම යොමු කරනවා.

අපි හැමෝම ජීවත් වෙන්න කැමැති වුණත් මේ සම්මා සම්බුද්ධ ශාසනයේ ජීවත් වෙන එක පුද්ගලයෙක් සිටිනවා. එම පුද්ගයා ජීවත් වෙන්න අකැමැතියි. නමුත් මැරෙන්න කැමැතියි. මේ පුද්ගලයාගේ කැමැත්තත්, අකැමැත්තත්, ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් ගෙන් තොර ධර්මයේ උපේක්ෂාවෙනුයි පෝෂණය වෙලා තිබෙන්නේ. ඒ ආශ්චර්යවත් මනුෂ්‍යයාට "තමයි උතුම් රහතන් වහන්සේ" කියල කියන්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පින්වත්, ඔබලාට 'නුවණින් දකින්න'ය කියලා. ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් ගෙන් තොරව ජීවිතයත් මරණයත් දකින්න කියලා. මම කවදාද ඵස්සය වේදනාවෙන් කිලිටි නොකරන ඒ ආශ්චර්යවත් රහතන් වහන්සේ නමක් බවට පත් වෙන්නේ කියලා දකිමින් ජීවත් වෙන්න කියලා. නිදි යහනේ කොට්ටෙට හිස තබාගෙන අපි මොන තරම් නම් සිහින දකිනවාද? ඒ සෑම සිහිනයක් ම දුක ඉතිරි කරලා සැපය නැවත සිහිනයක් බවට ම පත් කරනවා. අපිට ඉතිරි වෙලා තිබෙන්නේ සැපය හඹාගෙන නැවත නැවත සිහින දැකීම පමණක් මයි.

සිහින නොදකින රහතන් වහන්සේ අවබෝධයෙන්ම දන්නවා ජීවත් වීමත් මරණයත් යන දෙකම අතීත පටිච්චසමුප්පන්න සංස්කාරයන්ගේ නූල් සුත්තරයක්ය කියලා. අපේ දීර්ඝ පටිච්චසමුප්පන්න ජීවිතය හරිම ගොරහැඩියි. ඒ හොරහැඩි භාවය අතීත මළකඳන් කෝටි ගානක මහා මළමිනී කඳු යායක් වගේයි භික්ෂුවට පෙනෙන්නේ. ඒ මළමිනී කඳුයායේ මනුෂ්‍ය මළකඳන්, සතර අපා සත්ත්ව මළකඳන්, දිව්‍ය බ්‍රහ්ම මළකඳන්, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් සහිත සක්විති රජ මළකදන්, හරිම අපූරු මළකඳන් ගොඩක චිත්‍රයක් භික්ෂුවගේ මනසේ ගොඩ නැගෙනවා. ඒ චිත්‍රය මොහොතකින් භික්ෂුවගේ ඵස්සය ඉදිරියේ මැකී යනවා.

ලෝකය මිරිගුවක්ද, ලෝකය ප්‍රශ්නාර්ථයක්ද, ලෝකය අනවබෝධයක් ද? පංචඋපදානස්කන්ධ ලෝකය අනවබෝධය නිසා ම ප්‍රශ්නාර්ථයක් බවට පත් වූ මිරිඟුවක් පමණක් මයි.

පින්වත් ඔබ සිත ළඟ නවතින්න" ඒ කියන්නේ දැක්කා, ඇසුණා, දැනුණා කියනතැන නවතින්න. එවිට ලෝකය ඔබ ළඟ නවතීවි. "පින්වත් ඔබ ඵස්සය ළඟ නවතින්න, දැක්ක දෙය දැක්කා කියන තැන නවතින්න, ඇසුණ දෙය ඇසුණාය කියන තැන නවතින්න, දැණුන දෙය දැණුනාය කියන තැන

නවතින්න" එවිට ඔබට දැනේවි ලෝකය පාලනය කරන්නේ ඇමරිකාවත්, රුසියාවත් නොව පින්වත් ඔබේ සතිය සිහියයි කියලා.

ඵස්සය කෙරෙහි තෘෂ්ණාව නිරෝධය කිරීමෙන් පංචඋපාදානස්කන්ධ ලෝකයට නිරෝධය කරන උත්තරීතර ධර්මය දේශනා කළේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මයි.

තෘෂ්ණාවට පුළුවන් සම්මුති ලෝකය ම ඔබේ පංචඋපාදානස්කන්ධ ලෝකයට ගෙන්න. එවිට ජීවිතය හරිම සංකීර්ණයි. ඒ සංකීර්ණ පංචඋපාදානස්කන්ධ ලෝකයේ එකම සරුසාර ඵලය නැවත නැවත ලෝකය ගොඩනඟන සංස්කාරයන් පමණක් මයි.

කාම, රාග, පටිඝයන් ගෙන් බැහැරව ගත්තා වූ සිත හරිම ප්‍රභාෂ්වරයි. එම ප්‍රභාෂ්වර සිත හරියට බොර නොවූ පැහැදිලි ජලයක් වගේ සිතේ පතුල හොඳින් පෙනෙනවා. සිතේ පතුල කියලා කියන්නේ අධ්‍යාත්මික සහ බාහිර රූපයන් සහ විඤ්ඤාණය සමඟ මුහුව සැදෙන ඵස්සයටයි. සිතේ පතුල වන ඵස්සය, ඇලීම්, ගැටීම් වලින් තොරවූ තැන වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණයන් නොකැළඹුන ස්වභාවයට පත් වෙනවා. එවිට බොර පැහැයෙන් බැහැර වූ සිතේ පතුල වන දැක්කා, ඇසුණා, දැනුණා කියන ඵස්සය සතිය සිහිය නමැති සම්මා ඇසට හොඳින් දර්ශනය වෙනවා.

ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් නිරෝධයෙන් මාරාන්තික භව විෂ බීජයෙන් ජාතිය නිෂේධ කොට ගත් රහතන් වහන්සේ තම විදර්ශනාමය සම්මා ඇසෙන් දකිනවා, ඵස්සය තෘෂ්ණාවෙන් තෙත් කිරීම හේතුවෙන් සකස් වන සංස්කාර නමැති විෂ බීජය විඤ්ඤාණයේ සහයෝගයෙන් සකස් කොට දුන් අතීත සංසාර දුක, සංසාර ගැඹුර, සංසාර බිය පටිච්චසමුප්පන්නව කල්ප සියක් කෝටි ප්‍රකෝටි ගානක් ඈතට දිවයන, හොරහැඩි, අනවබෝධාත්මක, අසිහියෙන් යුත්, උපාදානපච්චයා

භවො කියන ධර්මතාවයේ පිහිටෙන් භවයෙන් භවය අල්ලා ගැනීමෙන් පැමිණි මේ නිස්සාර ජීවිතය ගැන රහතන් වහන්සේ ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් ගෙන් තොරව හෙම්බත් වෙලයි සිටින්නේ. අල්ලා ගත්තා වූ දෙයකුත් නැති අතහැරියා වූ දෙයකුත් නැති අල්ලා ගැනීමටත්, අතහැරීමටත් එකම හේතුව වූ තෘෂ්ණාව පමණක් මයි උන්වහන්සේලා ගෙන් නිරෝධය වෙලා තිබෙන්නේ.

අපි හැමෝම මගේ කොටගෙන මේ අල්ලාගෙන සිටින්නේ අපිට අයිති නැති රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ නමැති පංචඋපාදානස්කන්ධ ලෝකයක්. මගේ බිරිඳ, මගේ ස්වාමිපුරුෂයා, දරුවා, මව, පියා, පෙම්වතා, පෙම්වතිය මේ සියල්ලම තෘෂ්ණාවේ ඵලය වන සංස්කාර හේතුවෙන් සකස් වෙන විඤ්ඤාණයේ අසත්පුරුෂ ගුරුවරයා පින්වත් ඔබට උගන්වන දුකට හේතු වන ඉගැන්වීම්ය.

ඵස්සය, ඔබට පුළුවන් පංචඋපාදානස්කන්ධ ලෝකය සංස්කාරයන්ගේ ගිනිදැල් වලින් බුර බුරා අවුළුවන්න. ඇසේ ඵස්සය, කනේ ඵස්සය නාසය, දිව, ශරීරය, මනසේ ඵස්සය, විදර්ශනාමය ප්‍රඥාවෙන් තොරවූ ප්‍රඥාවේ ඇස දුර්වල" මනුෂ්‍ය" දිව්‍ය, බ්‍රහ්ම ප්‍රජාවගේ සිතුවිලි කාම, රාග, පටිඝයන් ගෙන් කුල්මත් කරනවා. කාම සිත් රස නහර පිනවනවා. රාග සිත් ඇඟ කිලිපොලා යනවා. ද්වේශ සිත් ශරීරයේ ලේ රත් කරනවා.

ඵස්සය තෘෂ්ණාවෙන් තෙත් වීමේ ඇස්බැන්දුම තේරුම් ගැනීමට අවශ්‍ය ප්‍රඥාවේ ඇසේ දුර්වල භාවය නිසා තෘෂ්ණාවේ ඵලය වන ඵස්සයේ ඇස්බැන්දුම ඔබේ රාගයත්, කාමයත්, ද්වේශයත් මගේ ම කොට ගන්නවා. අවිද්‍යා සහගත සිතුවිල්ලක් අනාගත ලෝකය ගොඩනඟන බව ඔබ දකින්නේ නැහැ.

සිතට ඉඩ දීලා ඔබ බලා සිටිනවා. හරියටම රටේ බලධාරි මහ ඇත්තෝ තමන්ගේ පොඩි ඇත්තෝ වැරදි කරනවා බලා සිටිනවා වගේ. හැඩ වැඩ විතර්ක මතු කරමින් සිතට තව තව

අල්ලස් දෙනවා. සුවසේ දුකට හේතු වන සංස්කාර ම රැස් කරන්න. නායකයාට වැරදුන තැන සියල්ල ම වැරදිලා යනවා. ජනතාවගේ ලෞකික ප්‍රඥාවේ ඇස හෙවත් සම්මා දිට්ඨිය දුර්වල වෙච්ච තැන තෘෂ්ණාව විසින් ඵස්සය නන්නත්තාර කරලා ම දමනවා. මේ නන්නත්තාර වීම" මගේ ජීවිතය තුළිනුත්, ඔබේ ජීවිතය තුළිනුත්, රටේ පාලක පින්වතුන්ලාගේ ජීවිත තුළිනුත් සක්සුදක් සේ ජාති අන්ධයෙකුට හැර අන් ඕනෑම කෙනෙකුට හොඳින් දර්ශනය වෙනවා.

ඇත්තෙන්ම ලෝකය කියන්නේ ඇස්බැන්දුමක්. මේක හරියට සිංහල අවුරුදු උත්සව වල කනා මුට්ටියට පොල්ලෙන් ගහනවා වගේ වැඩක්. මේ ලෝක විහිළුව නැති නම් ඇස්බැන්දුම ජීවිතගත කරන්නේ ඵස්සය අසලම ගැවසෙන අවිද්‍යාවේ මූල බීජය වන තෘෂ්ණාවයි.

අපි තුළින් ආර්ය අෂ්ටාංගික මාර්ගය දුර්වල වෙන ප්‍රමාණයට අවිද්‍යාවේ මූල බීජය වන තෘෂ්ණාව කොළ අතු, රිකිලි දමමින් සරුසාරව වැඩෙනවා. සරුසාරව වැඩෙන තෘෂ්ණාව අපට ලබා දෙන එකම ඵලය පංචඋපාදානස්කන්ධ දුක පමණක් මයි.

තෘෂ්ණාව, ඔබ කවදාද මාව මේ අධිවේගී විනාශයෙන් මුදවන්නේ?. ආර්ය අෂ්ටාංගික මාර්ගය, ඔබ කවදාද, මට මා කෙරෙහිම අනුකම්පාවෙන් ඔබ මගේ පිහිටට එන්නේ?. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රමාදය නිසා ම තෘෂ්ණාවේ කුණු සතුට ඇළ වේලි වල ගලාගෙන යන ජලය වගේ අපේ ඵස්සය ඇලීම් ගැටීම් ඔස්සේ ම හඳුනා ගැනීම සංස්කාර පෝෂණය කරමින් අකුසලයට ම දැනීම් සකස් කොට දෙනවා.

භික්ෂුව වැඩ සිටින කුටිය අවට පරිසරය අවකාශ්‍යකයෙන් හොඳටම වියළිලා. කේඩෑරී වෙච්ච හරක් රංචු තණකොළ වලට වඩා උලා කන්නේ වැලි සහිත පොළවයි. තණකොළ වෙනුවට වැලි සහිත පොළව උලා කන මේ අහිංසක සතුන් දකින කොට භික්ෂුවට මැවිලා පෙනෙන්නේ පෙර ජීවිතයක දන් නොදුන්

සත්ව ඝාතනයන් කළ මනුෂ්‍යයන් මයි. දන් නොදීම නිසා ම දිවට රසට ආහාරයක් නැහැ. සත්ව ඝාතනයන් නිසා අවසානයේ මස් මුදලාලිගේ ලොරියටයි ගොඩ වෙන්නේ.

මේ අහිංසක හරක් හේතුඵල ධර්මයන්ට අදාළව අවසානයේ මස් කඩයට පටවන එක ගැන භික්ෂුවට එතරම් පුදුමයක් නැහැ. භික්ෂුවට පුදුමයක් වෙන්නේ වර්තමානයේ මේ සුන්දර ධර්මයක උරුමය ලද මනුෂ්‍යයෝ ඇයි දන් පූජා කිරීම දුර්වල කොට ගනිමින් මනුෂ්‍ය ඝාතන, සත්ව ඝාතන, මනුෂ්‍ය සහ සත්ව හිංසනයන් සිදු කොට ගනිමින් අනාගත භව ගමනේ මස් කඩයට පටවන සත්ත්වයන් බවට පත් වෙන්න උත්සාහ ගන්නේ කියලා.

සමහර පින්වතුන් සිටිනවා දානය පූජා කිරීමට උනන්දුවක් ඇත්තේ ම නැහැ. දානයක් පූජා කරන්න පැමිණියත් එය ඉතිරි කොට ගෙන රැගෙන යන්න බලාපොරොත්තුවෙන් මයි දන් පූජා කරන්නේ.

කරුණාකර ලෝභ සිතින් දන් පූජා කරන්න එපා. ඒවා පින්වත් ඔබේ පරිහරණයට ගන්න. එවිට එය ඔබේ තාවකාලික සතුටට හෝ හේතු වේවි. එම තාවකාලික සතුට අනාගත භව ගමනේ වැලි උලා කන හරකෙක් බවට පත් කළොත් එදාට රට තණකොළ කන පුන්නක්කු බොන සැපට හැදෙන හරකුන්ට නම් දොස් කියන්න එපා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "රූපය කියන්නේ මාරයාය" කියලා. මේ ප්‍රදේශයේ ඉඩෝරය සමඟ ජීවත්වන කේඩෑරිවී ගිය හරකුන් දකිද්දි එම සතුන් තුළින් භික්ෂුව දකින්නේ මාරයා මයි.

ඔය සැම හරකෙක් ම අවම වශයෙන් මනුෂ්‍යයෝ දහ දෙනෙක් වත් අනාගත භව ගමනේ හරකුන් බවට පත් කරනවා. මාරයාගේ ගණිත සාස්තරයේ තිබෙන අපූරු සමීකරණයක් මේක. අවිද්‍යාවේ ගුරුවරු මේ ගණිත සාස්තරයන් සහිත

පාඩම් පොත් අපේ භාවිතයෙන් ඉවත් කරලයි තිබෙන්නේ. එය හරියට අපේ පාසල් දරුවාගෙන් ඉතිහාසය පාඩම් පොත ඉවත් කරලා තිබෙනවා වගේ. ඇත්ත දැනගන්නවාට බොරුව සමඟ ජීවත්වන මිච්ඡා මනුෂ්‍යයෝ කැමැති නැහැ.

භික්ෂුව මේ සටහන් තබන්නේ උතුම් ශ්‍රී සද්ධර්මයයි. ඒ පින්වත් ඔබට ගැටීමට නොවේ. නිවැරදි වීම සඳහා මයි. ඔබගේ අවබෝධය උදෙසා මයි.

# විශේෂ ලිපි

**මේ ලිපිමාලාව ඔබට පුදන පිංවත් ස්වාමීන් වහන්සේ විසින්,**
**ජීවිත යථාර්ථය දෙස සවිඥානිකව බලමින්,**
**විශේෂ දිනයන්, විශේෂ සිද්ධීන් අරමුණු කර පිංවත් ඔබ වෙනුවෙන්**
**තබන ලද සටහන් මෙතැන් සිට කොටස් කිහිපයකින්**
**යුතුව ඔබට පිරිනැමේ.**

# පාස්කු ප්‍රහාරයට පසුවදනක්

පසුගිය මාස දෙකේ පැවති දැඩි වියළි කාලගුණයට විරාමයක් තබලා භික්ෂුව වැඩසිටින ගම්මානයට මේ සවස් යාමයේ මහා වැස්සක් ඇදහැලෙනවා. ගෙවී ගිය සිංහල අලුත් අවුරුද්දේ පින්වත් සිංහල බෞද්ධ ජනතාවට පින් දහම් සිදු කොට ගන්නට වෙන් කොට තිබූ පුණ්‍ය කාලයේ පින්වත් ඔබලා ගමේ පන්සලට ගොස් සිදු කොට ගත් පින්කම් තුළින් රැස් කොට ගත් පින්, දෙවියන්ට අනුමෝදන් කිරීම නිසා එම අසිරිමත් පිනෙන් වැස්ස වලාහක දෙවියන් ආශ්වාදයට පත්වෙලාදෝ මේ මොහොතේ පරිසරයම අඳුරු කරලා වැස්ස වහිනවා.

වියළී ගිය මහපොළොවට මළානික වී ගිය ගහකොළ වලට මේ නැවුම් වැස්සේ පහස දැනෙද්දී ඒ කෙටි ආශ්වාදයේ පහස වචන වලින් කියාගන්න බැරිව පරිසරය හැඟීම් බරව සිටින බවයි භික්ෂුවට දැනෙන්නේ.

කියාගන්න බැරි දේවල් මොන තරම් අපේ ජීවිත තුළ තිබෙනවාද? කියාගන්න බැරි දේවල් අපේ ජීවිත තුළ සිරගත වී තිබෙන්නේ ඒවා කියාගන්න විශ්වාසවන්ත අය අපට මුණනොගැසෙන්නේ සංසාරයේ අපිම කරපු මිත්‍ර ද්‍රෝහිකම් නිසා මය. දැන දැන අනුන් තැබූ විශ්වාසයන් බිඳ දැමූ නිසා මය.

මෙය සටහන් තබන භික්ෂුව දැසින් දැක තිබෙනවා, අවංක, යහපත්, විශ්වාසවන්ත මනුෂ්‍යයන්ගේ අහිංසක බලාපොරොත්තු, අහිංසක විශ්වාසයන්, බිඳ දැමූ මනුෂ්‍යයන් තමන්ගේ සියලු අනාගත බලාපොරොත්තු බිඳවැටී අවාසනාවන්ත මරණයන්ට මුහුණ දුන් ධර්මානුකූල හේතුඵල ධර්මයක්.

වර්තමාන සමාජයේ අහිංසක ජනතාව තබන විශ්වාසයන් සහ ජනතාවගේ බලාපොරොත්තු වැඩිපුර ම බිඳ දමන්නේ රටේ දේශපාලන බලධාරීන්. අහිංසක ජනතාව මැතිවරණයකදී යම් කණ්ඩායමකට රට භාර දෙන්නේ එම කණ්ඩායම කෙරෙහි මොන තරම් නම් විශ්වාසයකින් ද? වර්තමානයේ ජනතාව තැබූ ඒ අහිංසක බලාපොරොත්තු ලේ, කඳුළු, මළමිනී අතර ආයෙමත් සිරගත වෙලා.

රටේ ජීවත්වෙන සිල්වතුන්, බුද්ධිමතුන් මේ සෑම කෙනෙක් ම ගෞරවයෙන් තැබූ විශ්වාසයක් අමු අමුවේ ම බිඳ දැමීම දේශපාලන පින්වතුන්ලාට විනෝදාංශයක් වුණාට, මෙම ජනතා විශ්වාසයන් බිඳ දැමීමේ අකුසල් විපාකදෙන විට බොහෝ ම අමිහිරි මෙලොව, පරලොව බලාපොරොත්තු කඩවීම් සහ මුළාවීම් සිද්ධවෙන්න පුළුවන්. මෙවැනි අකුසල් විපාකදෙන විට සකස් වෙන මුළාවීම් කොතරම් අමිහිරි ද කියනවා නම්, මරණින් පසුව සුගතියේ ම උපදිනවා යැයි සිතා සිටින ඔබ නිරයේ පතුලට ම ඇද දමන්න පුළුවන්. ඊළඟ ජීවිතයේ නැවත මේ රටේ ම දේශපාලනඥයෙක් වෙනවා යැයි සිතා සිටින ඔබට ප්‍රේත ලෝකයේ දේශපාලනඥයෙක් බවට පත්වෙන්න පුළුවන්.

අනුන්ගේ බලාපොරොත්තු සහ විශ්වාසයන් විනාශ කළොත් අපේ බලාපොරොත්තු සහ විශ්වාසයන් විනාශ වී යනවා මයි. අහිංසක මනුෂ්‍යයන් තැබූ විශ්වාසයන් කිසිඳු හිරිකිතයකින් තොරව බිඳ දැමූ තවත් දවසක් ඊයේ උදාවුණා. කුටියට පැමිණි කැපකරු මහත්මයා ප්‍රකාශ කළා අහිංසක ජීවිත දෙසිය ගණනක් අවාසනාවන්ත ලෙස මරාදමලා කියලා. ආයෙමත් කැලි කැඩී

ගිය මිනිස් මළ සිරුරු, විනාශ වී යන දේපළ ආර්ථිකයේ බිඳවැටීම, ජාත්‍යන්තර අපකීර්තිය, අපි හැමෝගේ ම ජීවිත ඉදිරියේ සීරුවෙන් සිටිනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් ගැන අසන්නට ලැබීම්, හේතුවක් නිසා මයි සිද්ධ වෙන්නේ" කියලා. ඒ හේතුව තමයි ඉපදීම.

පින්වත් ඔබත්, මමත් ඉපදීම නිසාමයි මේ ජරා, ව්‍යාධි, මරණ, දුක, මරාගෙන මැරෙන බෝම්බකරුවන් යැයි අසන්නට ලැබෙන අප්‍රියයන් ගැන දුක, ඉපදීම ඇති වීමටත් හේතුවක් තිබෙනවා. ඒ තමයි භවාත්‍රය කෙරෙහි ඇතිකොටගත් තෘෂ්ණාව.

තෘෂ්ණාව ඇතිවීමටත් හේතුවක් තිබෙනවා. ඒ තමයි, ඵස්සය කෙරෙහි ඇති කොට ගත් ඇලීම්, ගැටීම් සහ උපේක්ෂාව. මේ සියල්ලටම හේතුව වන්නේ චතුරාර්ය සත්‍යය නොදැනීම කියන අවිද්‍යාවයි. මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් කියන්නේ දුකේ නිරෝධය උදෙසා දුකේ පතුලම උරුමකොට ගත් අවිද්‍යාවේ අන්ධයෙක්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අවිද්‍යාව නමැති මඩ වතුරේ ගිලී නාන මනුෂ්‍යයෝ තමන්ගේ විමුක්තිය උදෙසා, තම ජාතියේ, තම ආගමේ, විමුක්තිය උදෙසා, තම ස්වර්ගයේ විමුක්තිය උදෙසා නානා විධ යාගයන් සිදුකරනවාය කියලා.

අතීතයේ සමහරු අහිංසක තිරිසන් සතුන් දහස් ගණනකගේ බෙලි කපා එම රුධිරයෙන් යාගයන් සිදුකරනවා. තවත් සමහරු එළිගි තෙල්, මී පැණි, සඳුන් දැව, සුවඳ කුඩු ටොන් ගණන් පුච්චමින් තම විමුක්තිය උදෙසා ගිනි යාගයන් සිදුකරනවා. තවත් සමහරු කාලානුරූපීව බෝම්බ, පිස්තෝල, කඩු, කිණිසි, යකඩ පොලු අතින් ගෙන අහිංසකයන්ගේ බෙලි කපමින් මරාගෙන මැරෙමින් තම විමුක්තියේ නාමයෙන් ම්ලේච්ඡ යාගයන් සිදුකරනවා.

වරක් කූටදත්ත බ්‍රාහ්මණයා තමාගේ විමුක්තිය උදෙසා, තමාගේ පිරිසිදු වීම උදෙසා, හරකුන්, එළුවන්, බැටළුවන් තුන්දහස් පන්සියයක් අහිංසක සතුන්ගේ බෙලි කපා ගලාගෙන යන ලෙයින් සහ මසින් දෙවියන් පුදන මහා යාගයක් සූදානම් කොට තිබුණා.

යාගකරුවන් වූ යාග බමුණන් මුවහත දිළිසෙන කඩු, මන්නා, පිහි තම අතේ තබාගෙන මහා මිනීමරු සත්ව යාගයට සූදානම්වයි සිටියේ. බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් සතුන් තුන්දහස් පන්සියයකගේ රුධිරයෙන් තෙත් වෙන්නට ගිය කූටදත්ත බ්‍රහ්මණයා අපාගත වෙන්න ගිය මේ යාග භූමියට වඩිනවා.

බුදුරජාණන් වහන්සේ කූටදත්ත බ්‍රාහ්මණයාට දේශනා කරනවා, "බ්‍රාහ්මණය, මේ ලෝකයේ තමනුත් අරක්ෂා වී අනුන්වත් ආරක්ෂා කරන එකම යාගය උතුම් පංචශීලය ආරක්ෂා කිරීමේ යාගයයි" කියලා.

රුධිරයෙන්, මළ කඳන් වලින්, විනාශයෙන් විමුක්තිය සොයන අවිද්‍යාවේ අන්ධභාවය පිටුදකිමින් බුදුරජාණන් වහන්සේ ලෝකයාට දේශනා කරන එකම සත්පුරුෂ යාගය, පංචශීලය ආරක්ෂා කොට ගැනීමේ යාගයයි. පින්වත් ඔබ සමාජය තුළ මෙවැනි මිනීමරු යාගයන් කොතෙක් සිදු වුණත් එවැනි යාගයන්ට පිළිතුරු බඳින ඔබේ එකම යාගය බවට උතුම් පංචශීලයේ ආරක්ෂාව පත් කොට ගන්න.

බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවෙන් කූටදත්ත බ්‍රාහ්මණයා මරණය පෙනි පෙනී සිටි සතුන් තුන්දහස් පන්සියය ම නිදහස් කොට හරිනවා. අහිංසක සතුනගේ රුධිරයෙන් තම වියරු ආශාවන් සංතර්පනය කොට ගන්න බලාපොරොත්තුවේ සිටි තියුණු කඩු, මන්නා, පිහි අත දරාගෙන සිටි යාග බමුණන්ට ඉතිරිව තිබුණේ බුදුරජාණන් වහන්සේට පරුෂ වචනයෙන් බැණ වැදීම පමණක් මයි.

මනුෂ්‍යයාගේ අවිද්‍යාවේ අන්ධභාවය වැඩි වෙන කොට ලේ පැහැයට, ලේ රසයට, ලේ දැකීමට, ලේ බීමට ඇති කැමැත්ත මනුෂ්‍යයා තුළ වැඩිවෙනවා. මෙහි උච්චම අවස්ථාව තමයි, අනාගතයේ ඇතිවෙන මෘග සංඥාව කියන්නේ.

වර්තමානයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් මෙන් එදාට සියලුම මනුෂ්‍යයෝ මෘගයන් බවට පත් වෙනවා. එදාට මනුෂ්‍යයෝ වතුර වෙනුවට බොන්නේ මිනිස් රුධිරයයි. ආහාර වෙනුවට උයාගෙන කන්නේ මනුෂ්‍ය මාංශයයි. වර්තමානයේ මෙවැනි අවිද්‍යාවාදී මරාගෙන මැරෙන බෝම්බකරුවන් හේතුවෙන් සමාජය තුළ මෝදු වෙන වෛරය, ද්වේශය, පළිගැනීමේ චේතනාවන් පටිච්චසමුප්පන්නව මනුෂ්‍ය සන්තාන වල ලියලා, දලු දමා, මෘග සංඥා සමයේදී එකිනෙකා මරාගෙන කන චේතනාවන් මනුෂ්‍යයා තුළ ධර්මානුකූලව සකස් කොට දෙනවා.

වර්තමානයේ අවිද්‍යාවාදී වියරු මනුෂ්‍යයන්ගේ විකෘති හැසිරීම් ඉදිරියේ පින්වත් ඔබ ධර්මානුකූලව සතිය සිහිය ඇති කොට නොගත්තොත් ඔබේ ද්වේශ සහගත සිත මේ වර්තමානයේදීත් ඔබට අනාගත මෘග සංඥාවට අදාළ සංස්කාරයන් රැස් කොට දෙනවා.

අවිද්‍යාවෙන් ගිනිගන්නා පංචඋපාදානස්කන්ධ වියරු ලෝකයක් ඉදිරියේ පින්වත් ඔබගේ පංචඋපාදානස්කන්ධ ලෝකය ඇලීම් ගැටීම් වලින් තොර ධර්මයේ උපේක්ෂාව මතු කොට ගන්න. සිදුවූ බරපතළ විනාශය හේතුඵල ධර්මයන්ට යටත්ව දකිමින් අකුසල් සංස්කාරයන්ගේ තියුණු විපාකයන් ගැන ජීවිතයට කමටහන් ම එකතු කොට ගන්න. වරදකරුවන්ට දඬුවම් දීම සහ කලබලකාරී තත්ත්වයන් පාලනය කිරීම රාජ්‍ය හමුදාවන්ට භාරදී පින්වත් ඔබ සැමට යහපත පිණිස හේතු වන පංචශීල යාගය තුළ ශක්තිමත් වෙන්න.

සිය ගණනක් අහිංසක ජනතාව මරාගෙන මැරෙන වියරු බෝම්බකරුවෙක් හේතුවෙන් පින්වත් ඔබ ආවේගශීලීව, ද්වේශය, වෛරය, පළිගැනීම ඇති කොට ගතහොත්, එම වෛරය පටිච්චසමුප්පන්නව වර්ධනය වී අනාගත භව ගමනේදී පින්වත් ඔබවත් මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් බවට පත් කරන්න පුළුවන්.

සංස්කාර යනු චේතනාවයි. අපි සෑම කෙනෙක් පසුපස ම පටිච්චසමුප්පන්නව මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් වීමේ අකුසල් සංස්කාර සහ සාංසාරික පුරුදු යටපත් වී තිබෙනවා. නමුත් අපි ලැබුවා වූ තෙරුවන් සරණ නමැති කල්‍යාණ මිත්‍රභාවය නිසාම එම වියරු අතීත සංස්කාරයන් අපි තුළින් මතු වෙන්නේ නැහැ. සද්ධර්මයේ විනයගරුකභාවය අපි තුළ තිබෙනවා.

පින්වත් ඔබ තෙරුවන් සරණ නමැති උතුම් කල්‍යාණමිත්‍රභාවයෙන් බැහැරව වියරු මිථ්‍යාදෘෂ්ටිකයන් සේ ආවේගශීලී වුණොත් පින්වත් ඔබ තමනුත් විනාශ වී අනුනුත් විනාශ කරන කෙනෙක් බවටයි, පත් වෙන්නේ.

උතුම් ශ්‍රී සද්ධර්මය පින්වත් ඔබට උගන්වන්නේ සමාජය තුළ සිදුවන සෑම යහපත් සහ අයහපත් ක්‍රියාවක්ම, හැඟීම් වලට යට නොවී ඒ කියන්නේ ඇලීම් ගැටීම් දෙසට නොයා ධර්මයේ උපේක්ෂාවෙන් විනාශය සහ සෞභාග්‍යය දකින්නය කියලා.

මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් කියන්නේ මිථ්‍යාදෘෂ්ටික, අසත්පුරුෂ ආශ්‍රයක ඵලයක් මයි. ඔහු අතින් විනාශ වී යන අහිංසක ජීවිතයක් කියන්නේ අතීත අකුසල් සංස්කාරයන්ගේ ඵලයක් මයි. පින්වත් ඔබ තුළ ඇති කොට ගන්නා ඉහත ධර්මයේ උපේක්ෂාවයි, විනාශකාරී අධර්මයෝ තාවකාලිකව හෝ පරාජය කොට දෙන්නේ.

වර්තමානයේ රට තුළ උද්ගත වෙලා තිබෙන්නේ බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් ජනතාව අතර ප්‍රශ්නයක් නොවේ පින්වත් ඔබ ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගන්න. වර්තමානයේ රට තුළ උද්ගත වෙලා තිබෙන්නේ වගකීමෙන් තොර දේශපාලන සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්නයක්. මේ රටේ සියලුම ජනතාව සහෝදරත්වයෙන් ජාතික සමගියෙන් යුතුව මේ වගකීම් විරහිත දේශපාලන සංස්කෘතියයි වෙනස් කළ යුත්තේ.

සප්ත අපරිහානී ධර්මයන්ට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අතීතයේ නායකයන් පැන වූ නීතිරීති වෙනස් කරන්න එපාය කියලා. අතීතයේ නායකයන් විසින් ශක්තිමත් කොට තිබූ ජාතික ආරක්ෂාවට අදාළ සැලසුම් නොසලකා හැරීම නිසා මයි වර්තමානයේ මේ වියරු විනාශයන් සමාජගත වෙලා තිබෙන්නේ.

අපේ රටේ ගෞරවනීය දේශපාලන බලධාරීන් මෙතෙක් කලක් සිදු කළේ බොරුව බොරුවෙන් ම වසා දැමීමයි. බොරුවේ වියරු ආදීනවයන් නොදැක බොරුව බොරුවෙන් ම වසා දමා ආශ්වාදයේ සුන්දර සිහින ලෝක වල ජීවත් වුණා.

වර්තමානයේ මේ විනාශයත් සමග විපාක දෙන්නේ බොරුවේ ආදීනවයයි. අපි හැමෝම ඉදිරියේ ධර්මයේ සුන්දර ඒහිපස්සික ගුණය ඇස්පනාපිටම විපාකයට ඇවිත් තිබෙනවා. එහෙයින් ගෞරවණීය දේශපාලන පින්වතුනි, බොරු කීමේ කෙටි ආශ්වාදය හේතුවෙන් විපාකයට පැමිණ ඇති දීර්ඝ කටුක ආදීනවය සිහි නුවණින් තේරුම් අරගෙන, දැන්වත් බොරුවේ නිස්සරණය උදෙසා කැපවෙන්න කියලා ගෞරවයෙන් සටහන් තබනවා.

මනුෂ්‍ය ඝාතන නවසිය අනූනවයක් සිදුකළ අංගුලිමාලටත් සුවපත් වේවා යැයි දේශනා කරපු උතුම් ශාස්තෘන්වහන්සේ නමකගේ දරුවන් අපි. ඒ පූර්වාදර්ශයත් පින්වත් ඔබේ ජීවිතයට එකතු කොට ගන්න.

මරාගෙන මැරෙන බෝම්බකරුවන් සිහියට නඟාගෙන සුවපත් වේවා යැයි සිතන්න. ජීවිත පරිත්‍යාගයන් සිදුකළ අහිංසක ජනතාව සිහියට නඟාගෙන සුවපත් වේවා යැයි සිතන්න. ප්‍රශ්නයට වගකිවයුතු දේශපාලන නායක පින්වතුන් සිහියට නඟාගෙන සුවපත්වේවා යැයි සිතන්න. භික්ෂුව මේ සටහන තබන මොහොතේත් ඉහත සියලුම ධර්මානුකූල හේතුඵල ධර්මයන් සිහියට නඟාගෙන සුවපත් වේවා යැයි සිතමින් ඒ මෛත්‍රී සංස්කාරයන් අනිත්‍ය වශයෙන් ම දකිමිනුයි පසු වෙන්නේ. මේ දැක්මටයි බුදුරජාණන් වහන්සේ මෛත්‍රියේ යාගය කියලා දේශනා කරන්නේ.

පින්වත් ඔබ පිළිගත්තත්, පිළිනොගත්තත් විනාශය තුළින් ජයග්‍රහණය මතු කොට ගන්නා ධර්මානුකූල මාර්ගයයි, භික්ෂුව සටහන් තැබුවේ.

ගෞරවණීය රටවැසි ජනතාව ජාති ආගම් බේදයකින් තොරව මෛත්‍රියෙන් සහ පංචශීලයෙන් ශක්තිමත් වෙනවා නම් ධර්මය පින්වත් ඔබලාට සහතිකයක් දෙනවා "ධර්මයෝ, ධර්මයෝම වඩත්" කියලා. එවිට විනාශකාරී අධර්මයෝ තාවකාලිකව පාලනය වේවි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සියලු සංස්කාරයෝ අනිත්‍යයි, අස්ථිරයි, නොසිතූ නොපැතූ මොහොතක කැඩී, බිඳී විසිරී යනවාය කියලා. එහෙයින් පින්වත් ඔබේ ආරක්ෂාවට කුසල් ධර්මයන් ගෙන් පෝෂණය වූ පින කෙරෙහි පමණක් විශ්වාසය තබන්න. එම පිනේ ශක්තිය රට සුරකින රාජ්‍ය හමුදාවන්ට සහ පොලිසියට ද අනුමෝදන් කරන්න.

පින්වත් ඔබ බිය බැහැර කොට ධර්මයේ උපේක්ෂාවෙන් පංචඋපාදානස්කන්ධ ලෝකය දකින්න. බොරුව බොරුවෙන් නොව බොරුව ඇත්තෙන් වසා දමන ජාතික ආරක්ෂාවට ගරු කරන විනයගරුක නායකයෙක් රටට අවශ්‍යයි කියන කාරණය සිහිනුවණින් දකින්න.

# පාස්කු ප්‍රහාරයෙන් පසු වෙසගේ සැබෑම අසිරිය

සිතක සැහැල්ලුව කියන්නේ, ඇලීම් සහ ගැටීම්වලින් තොර උපේක්ෂාවටයි. අතීතයේ දවසක භික්ෂුවට, මතකයි, යම් පින්වතෙක් භික්ෂුවට ප්‍රකාශ කළා, තමාගේ විරුද්ධවාදියාට බැන්නට පසුවයි තමාගේ සිත සැහැල්ලු වුණේ කියලා. මේ සැහැල්ලුවට කියන්නේ, මිච්ඡා සැහැල්ලුව කියලයි.

සම්මා සැහැල්ලුවට අදාලව උපේක්ෂාව ඇති කොට ගන්න නම්, පංචනීවරණ තුනී වූ සමාධිමත් සිතක් තිබෙන්නට අවශ්‍යයි. වර්තමාන සමාජයේ ජීවත් වෙන පින්වතුන් තුළ, වඩාත් ම දුර්වල ධර්මතාවය කුමක්ද කියලා, ඔබ භික්ෂුවගෙන් ප්‍රශ්න කළොත්, භික්ෂුව පිළිතුරු දෙන්නේ, ඇලීම් සහ ගැටීම් වලින් තොර උපේක්ෂාවයි කියලා.

උපේක්ෂාව දුර්වල වුණ තැන, එම හිස්තැන පුරවන්නේ ඇලීම සහ ගැටීමයි.

වර්තමාන සමාජය කියන්නේ ඇලීම් සහ ගැටීම් දෙක අතර, සිත්සේ දෝලනය වෙන සමාජයක්. ආදරය කරන පින්වතා, හිරි ඔතප් දෙකින් තොරව, මහපාරෙත් ආදරය කරනවා. ද්වේශ කරන පින්වතා, හිරි ඔතප් දෙකින් තොරව මහ පාරේත් ගහ මරා ගන්නවා.

කල්‍යාණමිත්‍ර ආශ්‍රය වියෝවූ, අතීත පංච උපාදානස්කන්ධ ලෝකයේදී, අසත්පුරුෂ ආශ්‍රය නිසා, අසද්ධර්මයන් නිසා, අපි මොන තරම්, මරාගෙන මැරෙන බෝම්බකරුවන් වෙන්න ඇත්ද?. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටියදීම, උතුම් අරහත්ඵල අවබෝධය ලැබීමට පින තිබූ, අංගුලිමාල තියුණු කඩුවකින්, මනුෂ්‍ය ඝාතන සිදු කරලා, එම පණ ගැහෙන මළ කඳන්වලින් ඇගිලි කපාගෙනයි ඇගිලි මාලය සකස් කොට ගත්තේ.

උදේනි රජතුමාගේ මාගන්දියා බිසව, බුදුරජාණන් වහන්සේ සමග ඇති කොට ගත් වෛරය පිරිමසා ගන්න, සාමාවතී බිසව ඇතුළු පරිවාර කතුන් පන්සියයක්, මාළිගාවේ දොර අගුළු දමා, මාළිගයට ගිනි තබා පුලුස්සා දමනවා. ගින්නෙන් අනතුරුව උදේනි රජතුමාට දකින්නට ලැබුණේ, සාමාවතී බිසව වෙනුවට, අළුගොඩක් පමණක් මයි.

ඉහත සිද්ධිය සැලවීමෙන් අනතුරුව, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අවබෝධයෙන් ම උතුම් තෙරුවන් සරණ පිහිටි, සාමාවතී බිසව ඇතුළු පිරිස, මරණාසන්න මොහොතේ තමන් කරා පැමිණි අකුසල් සංස්කාරයන්ගේ, වියරුභාවය, විදර්ශනාත්මකව දැක, උතුම් සෝවාන්ඵලය අවබෝධය ලබමින් ම, අතීත සංස්කාරයන්ගේ වියරු විනාශයන් ඉදිරියේදී ම, භව ගමන සසර අපා දුකෙන් ජයගත්තාය කියලා.

සාමාවතී බිසව ඇතුළු පිරිස, විනාශය හමුවේ. ජයග්‍රහණය මතු කොට ගත්, ඉහත සිද්ධිය, වර්තමානයේ මරාගෙන මැරෙන, බෝම්බ බියෙන් සිත් සතන් විසිරී තිබෙන, අපේ සමාජයට වටිනා කමටහනක් වෙනවා. වෙසක් පුරපසළොස්වක පොහොය දිනයට, ගමේ පන්සලට, ගමේ ආරණ්‍යයට, සිල් සමාදන් වෙන්න යන්න බියෙන් පසුවෙන, පින්වතුන්ලාට, බිය නැමති පංචනීවරණයන්ගේ ප්‍රමාදිභාවයත්, බිය බැහැරකොට ජීවිතයට

ලබන සප්තබොජ්ඣංග ධර්මයන්ගේ අප්‍රමාදිභාවයත්, පිළිබඳව සාමාවතී බිසව ඇතුළු පිරිස, සුන්දර ධර්මයේ පූර්වාදර්ශයක් වර්තමානයේ අපිට ලබා දෙනවා.

ස්වභාවික වේවා, අස්වාභාවික වේවා අපි හැමෝගේම මරණය, අතීත සංස්කාරයන්ගේ ඵලයක්. බුදුරජාණන් වහන්සේ නමකට හෝ රහතන් වහන්සේ නමකට හැර වෙනත් කිසිම සත්ත්වයෙකුට, තම මරණය ඉක්මන් කරන්න හෝ ප්‍රමාද කරන්න බැහැ. තම මරණය ඉක්මන් කරන්න හෝ ප්‍රමාද කරන්න නම්, එම උත්තමයා, ඇලීම්, ගැටීම් සහ උපේක්ෂාව කියන, ඵස්සය හේතුවෙන් සකස් වෙන වේදනාව, අවබෝධයෙන් ම නිරෝධය කළ යුතු වෙනවා. ඇලීම්, ගැටීම් සහ උපේක්ෂාවන් තුළ මියයන, ඕනෑම සත්ත්වයෙක්, නැවත භවයේ පටිච්චසමුප්පන්නව උපත ලබනවා.

මරණය අයිති සංස්කාරයන්ට මයි. මරණයෙන් පසුව ලබන උපත අයිතිත් සංස්කාරයන්ට මය. මේ අවිද්‍යාව හේතුවෙන් සකස් වෙන සංස්කාරයන්ට, පටිච්චසමුප්පන්නව විඤ්ඤාණයත් උණුසුම, සහ ආයුෂයත් උපකාරක ධර්මයන් සකස් කොට දෙනවා.

බුදුරජාණන් වහන්සේ තම නිය මතට, මහපොළවෙන් පස් ටිකක් අරගෙන දේශනා කරනවා. තම නිය මත තිබෙන පස් ප්‍රමාණය යම්සේ කුඩාද, එවැනි පුංචි පිරිසක් පමණක් මයි, තම ජීවිත තුළින් ශ්‍රද්ධාව අර්ථවත් කොට ගෙන තිබෙන්නේ කියලා. කල්‍යාණමිත්‍ර ආශ්‍රය මොනවට ලැබූ, සාමාවතී බිසව ඇතුළු පිරිසට, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ගැන ප්‍රශ්නයක් තිබුණේ නැහැ. එම උතුම් ශ්‍රද්ධාව, අසත්පුරුෂ මාගන්දියාගේ කුරිරු මරණ සැලසුම ඉදිරියේ, මරණ බිය වෙනුවට සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය මයි මතු කොට දුන්නේ.

තුන් ලෝකයට ම උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය දායාද කළ, තවත් සුන්දර අසිරිමත් වෙසක් පුරපසළොස්වක පොහොය දිනයක්, අද උදාවෙනවා. වෙසක් මාසය සත්ත්වයාගේ සිත් සතන් කරුණාවෙන්, මෛත්‍රියෙන්, මනුෂ්‍යකමින්, තෙත් කරන මාසයක්. මනුෂ්‍යයාගේ සිතුවිලි මෛත්‍රීයෙන්, කරුණාවෙන් මනුෂ්‍ය කමින්, තෙත් වන නිසා ම, පරිසරයත් සෞම්‍ය වෙනවා. කොළ පැහැයෙන් එලබර වෙන ගහකොළ සතා සිව්පාවාටත්, කුසගින්නෙන් තොර සතුටක් මයි ලබා දෙන්නේ.

සුන්දර සාමකාමී වෙසක් මාසයේ, පින්වත් ඔබ හැමෝම කථා කරන්නේ, ශීල ව්‍යාපාරයන් ගැන. භක්ති ගීත, තොරණ, දන්සල්, වෙසක් සැරසිලි ගැන නමුත් මෙවර උදාවුණ, වෙසක් පුරපසළොස්වක පොහොය දිනයේදී අපි හැමෝගෙන් ම මේ උතුම් දේවල් උදුරාගෙන තිබෙනවා.

කවුද මේ නික්ලේෂි වෙසක් අසිරියේ සතුට, ඔබෙන් සහ මගෙන් උදුරා ගත්තේ. දෙවියෙක්ද, යක්ෂයෙක්ද, බ්‍රහ්මයෙක්ද, එසේත් නැත්නම් ත්‍රස්තවාදියෙක්ද, එසේත් නැතිනම්, අපිම පටිච්චසමුප්පන්නව සිදු කළ අතීත අකුසල් සංස්කාරයන් විසින්ද? පින්වත් ඔබේ හෘදසාක්ෂියට තට්ටු කරලා, ඉහත ප්‍රශ්නයට නිවැරදි ධර්මානුකූල පිළිතුරු ඔබ තුළින් මතු කොට ගත්තොත්, අන්තවාදී ආගමික උමතුව මැද, උදා වුණ මේ වෙසක් මංගල්‍යය, පින්වත් ඔබේ ජීවිතයේ ඔබට උදා වුණ, අර්ථවත්ම වෙසක් මංගල්‍යය වෙනවා.

නිවැරදි දිශාවට හෝ වැරදි දිශාවට, තෘෂ්ණාව වැඩිවෙන කොට, පංච උපාදානස්කන්ධ ලෝකය හරිම වේගවත්. යම් පින්වතෙක් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට, ආමිස පූජාවන් සිදු කරලා දිව්‍ය ලෝකයට යන්න ප්‍රාර්ථනා කරන කොට, තවත් පුද්ගලයෙක්, මරාගෙන මැරෙන බෝම්බයකින් උපරිම මනුෂ්‍ය ඝාතනයන් සිදු කරලා දිව්‍යලෝකයේ උපදින්න ප්‍රාර්ථනා

කරනවා. ප්‍රතිඵලය අහසයි පොළවයි වගේ වෙනස් වුණත්, ඉහත සිද්ධීන් දෙකට ම මුල් වෙන්නේ, පංචඋපාදානස්ධය කෙරෙහි තෘෂ්ණාවයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ, නැමැති පංචඋපාදානස්කන්ධ ලෝකය, සංස්කාරයන්ගේ ප්‍රතික්‍රියා හේතුවෙන්, නිරතුරුවම, කැඩෙමින්, බිඳෙමින්, විසිරෙමින් ගමන් කරනවාය කියලා. ගෙවීගිය සුන්දර සිංහල අලුත් අවුරුද්දේ, පින්වත් ඔබ ඇති කොට ගත් යහපත් බලාපොරොත්තු, සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය, මොනවට ඔප්පුකරමින්, වෙසක් මාසය වෙනකොට එම බලාපොරොත්තු කැඩී බිඳී, විසිරී ගියා.

මෙය සටහන් තබන භික්ෂුවට නම්, සිතෙන්නේ, භික්ෂුවගේ ජීවිතය තුළ උදාවුණ, ආශ්වාදයේ හොරා පොලිස් සෙල්ලමෙන් මිදුන, සංස්කාරයන්ගේ අනිත්‍යභාවයෙන් සකස් වෙන, සංස්කාර වියරුව, එහිපස්සිකව මතුකොට පෙන් වූ, වෙසක් මංගල්‍යයක්, මෙවර විනාශය තුළින් අපිට දකින්නට ලැබුණාය කියලා.

අප විසින්ම සකස්කොටගත් හේතුඵල ධර්මයෙන් විසින්, සංස්කාරයන්ගේ ආශ්වාදයන්ගෙන් අපිව මොහොතක් දුරස්කරලා සංස්කාරයන්ගේ වියරු ආදීනවය අපේ ජීවිත ඉදිරියේ සමාජගතකොට තිබෙනවා. ආදිනවයන්ගේ වියරුභාවය ඉදිරියේ අපිට ඉතිරි වී තිබෙන්නේ, බියෙන් තැතිගැනීම නොවේ. වෙසක් පුරපසළොස්වක පොහොය දිනයට පන්සලට යෑමෙන් වැලකී සිටීම නොවේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නැමති උත්තම පුරුෂයා ලෝකයට පහළවෙන්නේ, බිය වෙනුවට, අපිට අභය දෙන්නයි. සමාජගත වී ඇති, ජරා, ව්‍යාධි, මරණ, දුක හමුවේ, දුකට සැබෑම හේතුව මතුකොට ගන්න.

වර්තමානයේ සමාජය පත්වී ඇති දුකට සැබෑම හේතුව කුමක්ද? රටේ පාලක පින්වතුන්ලාගේ ඇසෙන්, කනෙන්, නාසයෙන් දිවෙන්, ශරීරයෙන්, මනසින් ගලා බසින තාෂ්ණාවේ සැඩ පහරයි. මේ වියරු තෘෂ්ණාවේ සැඩ පහරමයි, සමාජයට මරාගෙන මැරෙන බෝම්බකරුවන් ප්‍රසූත කරන්නේ. වර්තමානයෙ මරාගෙන මැරෙන බෝම්බකරුවන් පරීක්ෂා කරනවා වගේම ඊටත් වැඩි ප්‍රමුඛතාවයන් දිය යුත්තේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් බිහි කරන, වගකීම් විරහිත දේශපාලන සංස්කෘතියේ සැබෑ මුහුණුවර හඳුනා ගැනීමටයි.

නමුත් වර්තමානයේ සමාජය තුළ කුමක්ද සිද්ධවෙන්නේ, පාලක පින්වතුන්ලා විසින් උවමනාවෙන්ම රටේ නීතිය, විනය, දුර්වල කොට, අහිංසක ජනතාව තුළ ඉන්ද්‍රිය අසංවරභාවය උවමනාවෙන් ම ඇති කොට අතීත පටිච්ච සමුප්පන්න අසම්මත, මනුෂ්‍යත්වයට පටහැනි සංස්කාරයන්ට මතු වීමට ඉඩ දෙනවා. රටක පාලක පින්වතුන්ට කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ, කුමන ජාතියක වේවා, අහිංසක පින්වතුන් අංගුලිමාල ලා වෙනතෙක් වගකීම් විරහිතව බලා සිටින්න. සමාජයේ ඉහත දුර්වලතාවයන් නිවැරදි කොට ගැනීමේදී කලබල වීම්, අවශ්‍ය නැහැ. අකුසලය විසින් මතු කොට දෙන, පංචඋපාදානස්කන්ධ ගින්දරත් සමග ගණුදෙනු කළ යුත්තේ, ආශ්වාදයෙන් නොව සිහිබුද්ධියෙන්. වරදකරුවා කවුරුන් වූවද, ඔහුව නිවැරදි කිරීමේදී, වැරදිකරුවාටත් ආත්මගරුත්වයක් තිබෙනවාය කියන විශ්වාසය, අපට තිබෙන්න ඕනේ. මිච්චා ආර්ය අෂ්ටාංගික මාර්ගය දුර්වල කොට දැමිය හැක්කේ, ලෞකික ප්‍රඥාවේ අර්ථයන්, වන සම්මා දිට්ඨියේ සහ සම්මා සංකප්පයන්ගේ ශක්තියෙන් මයි.

අකුසලයේ සන්දිට්ඨික ගුණය එහිපස්සිකව දකින, මේ සුන්දර වෙසක් සතියේ, වෙසක් පුරපසළොස්වක සඳ, ආකාශයේ ප්‍රභාෂ්වරව, ආලෝකමත් වේවි. නමුත් පින්වත් ඔබලාගේ ජීවිත,

චතුරාර්ය සත්‍යය ධර්මයන්ගේ අර්ථයන් ගෙන් ආවරණය නොවන්නේ නම්, ඒ ප්‍රභාෂ්වර වෙසක් සඳ එළියට, ඔබේ ජීවිත ආලෝකමත් කරන්න බැහැ.

පින්වත් ඔබේත්, මගේත්, උතුම් ශාස්තෲන් වහන්සේ මේ නිමේෂයේදීත් ජීවමානව වැඩ සිටිනවා. ඒ ජීවමාන ශාස්තෲන් වහන්සේයි උතුම් ශ්‍රී සද්ධර්මය, උතුම් ජීවිතය. ශාස්තෲන් වහන්සේයි උතුම් ශ්‍රී සද්ධර්මය, උතුම් විනය ධර්මයත්. මේ උතුම් ධර්ම විනයේ ඉලක්ක ගත අර්ථය වෙන චතුරාර්ය සත්‍යය, මේ මොහොතේ රටේ ජනතාව අත්දකින, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක තුළින් මතු කොට ගන්න. දුකේ එහිපස්සික ගුණය තුළින්, දුකට සැබෑම හේතුව වන තෘෂ්ණාවේ වියරුව මතු කොට දකින්න. මේ සමාජගත දුක තුනීවීමට නම්, තමා තුලින් ම තෘෂ්ණාව සියුම්කළ යුතු බව තේරුම් ගන්න. තෘෂ්ණාව සියුම්කරන එකම මාර්ගය වන, උතුම් අර්ය අෂ්ටාංගික මාර්ගය ම ජීවිතයට එකතු කොට ගන්න.

# විභාගයට යන දරුවා නියම ජයග්‍රාහකයෙක් කරන මග

*** ශිෂ්‍යත්වයට සහ උසස් පෙළට පෙනී සිටින දරුවන්ට විශේෂිතයි.**

## ප්‍රශ්නය

පහේ ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගය ඉදිරියේදී පැවැත්වීමට නියමිතයි. තරග විභාග මානසිකත්වය නිසා තම දරුවන් මෙම විභාගයෙන් සමත් කරවන්නට දෙමවුපියන් නොකරන දෙයක් නොමැති තරම්. නැකත් බලමින්, යන්ත්‍ර මන්ත්‍ර පළඳවමින්, දේවාල ගානේ ගොස් පූජා තබමින් තම දරුවන් විභාගයෙන් සමත් කරවීම සඳහා දෙමවුපියන් කටයුතු කරන බව පෙනෙනවා. මෙවැනි මිථ්‍යාදෘෂ්ටික පිළිවෙත් වෙනුවට මෙම පිරිස වෙත ධර්ම මාර්ගයෙන් තෙරුවන්ගේ ආශිර්වාදය ලබාගැනීමේ ක්‍රමවේදයක් විස්තර කර දෙන මෙන් නමස්කාර පූර්වකව ඉල්ලා සිටිමි.

## පිළිතුර

ධර්මානුකූලව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, උප්පැන්න සහතිකයෙන් බෞද්ධයෙක් වීමත්, කියන අර්ථයන් දෙක අහසයි පොළවයි වගේ වෙනස් අර්ථ දෙකක්. මුලින්ම උප්පැන්න සහතිකයෙන් බෞද්ධයෙක් වෙන පින්වතා, අර්ථවත් ආකාරයෙන්, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව වෙත යොමු

කරන්නේ, කල්‍යාණමිත්‍ර ආශ්‍රය තුළින් මතු කොට ගන්නා උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. වර්තමාන සමාජය උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පෝෂණය වූ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බැහැරව, උප්පැන්න සහතිකයෙන් බෞද්ධයෙක් වීමේ ප්‍රවණතාව දෙසට වේගයෙන් ඇදී යනවා. මනුෂ්‍ය සමාජය තුළට මේ විනාශය කාන්දුවන්නේ, පංචනීවරණ ධර්මයන්ගේ තීව්‍රභාවය නිසා මයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. කල්‍යාණමිත්‍ර ආශ්‍රයේ ඇති දුර්වලභාවයන් නිසා ම, උතුම් සද්ධර්මයේ සුන්දර වූද, අසුන්දර වූද, හේතුඵල ධර්මයන් පංචඋපාදානස්කන්ධ ලෝකය තුළ ගලාගෙන යනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පින්වත් ඔබ දුකට අකමැති නම්, කරුණාකර, සැපයට කැමති වෙන්නයි කියලා. සැපයට කැමති වෙන පින්වතා, මුලින්ම පංචනීවරණයන් ගෙන් ලබන මිච්ඡා සැපයත්, සප්ත බොජ්ඣංග ධර්මයන් ගෙන් ලබන සම්මා සැපයත් අතර ඇති ධර්මානුකූල වෙනස, අපි හඳුනාග න්න ඕනේ. වර්තමාන සමාජය සම්මා සැපයෙන් බැහැර වෙලා, මිච්ඡා සැපයන් සොයා ගෙන යන, තෝතැන්නක් බවට පත් වෙලා තිබෙනවා. මේ මිච්ඡාඅංග සොයා ගෙන යන ගමනේදී, සමාජයේ සටන්පාඨය වෙලා තිබෙන්නේ කාලා, බීලා, විනෝද වෙලා, සතුටු වෙලා, ජීවිතය විඳිමු කියන අර්ථයයි. මගේ සල්ලි, මගේ රූපය, මගේ ලස්සන, මම පරිහරණය කරන්නේ මට ඕනේ විදිහටයි. අබුද්ධෝත්පාද කාලවලට අයිති අමනුෂ්‍ය මිනිස් චින්තයන්, වර්තමානයේ නැවතත්, අපේ චින්තනයන් බවට පත් කොට ගැනීමේ, ව්‍යායාමයක් සමාජය තුළ දක්නට තිබෙනවා.

කාමයේ ආශ්වාදයේ ඇති කෙටි භාවය, රූපයේ ආශ්වාදයේ ඇති කෙටි භාවය නොදන්නා මනුෂ්‍යයෝ, කාලා, බීලා, විනෝද වෙලා, ජීවිතය විඳිමු කියන මනුෂ්‍යයෝ, සිත්සේ ජීවිතය විඳලා මැදි වයසට එන කොට, පිළිකා, හෘදයාබාධ, අක්මා, වකුගඩු රෝග, දියවැඩියාව වැනි බරපතළ රෝගාබාධයන්ට පත් වෙනවා. කාලා, බීලා විනෝදවෙමු සංස්කෘතියේ, සෑම සාමාජිකයෙක් ම,

මියපරලොව යන්නේ, අසිහියෙන්, රෝහල් වල දැඩි සත්කාර ඒකක වල බරපතළ ආකාරයට, කායිකව, මානසිකව පීඩාවන්ට පත් වෙලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "සිල්පද දුර්වල කොට ගන්නා පුද්ගලයා අසිහියෙන් මියයනවා"ය කියලා. පින්වත් ඔබ අසිහියෙන් මිය යන කෙනෙක් දකින කොට, එම මියයන පින්වතා තුළින්, දුශ්ශීලභාවයේ ධර්මානුකූල ඵලයන් දකින්න.

දික්කසාද, ගණිකා වෘත්තිය, නපුංසකත්වය සඳහා සමාජය තුළ ඇති වටිනාකම වැනි ධර්මතාවයන්, කාලා බීලා විනෝද වෙලා ජීවිතය විඳිමු කියන සංස්කෘතියේ අතුරුඵලයන් මයි. කල්‍යාණමිත්‍ර ආශ්‍රය දුර්වල, ඇස් ඇති ජාති අන්ධයන්, කන්නාඩි දැම්මත් ලෝකය දකින්නේ අඳුරෙන් මයි. ධර්මයේ දැස් අන්ධ මිච්ඡා සැපයේ අවසාන ඵලය සතර අපායයි. සමාජය තුළ ජීවත් වෙන, යම් පුද්ගලයෙක්. යම් කණ්ඩායමක්, යම් ආයතනයක් ඔබට අතදිගු කරන්නේ, කාලා බීලා, විනෝද වෙලා ජීවත් වෙමු කියන සංස්කෘතියට නම්, ඒ ඔහු ඔබට අත දිගු කරන්නේ, ඊළඟ පටිච්චසමුප්පන්න ජීවිතයේදී, ඔබව අනිවාර්යයෙන් ම සතර අපායේ උපතකට කැඳවා ගෙන යන්නයි.

අපේ රටේ සුන්දර කාන්තාවක් ජීවත් වුණා. ඇය සිත් සේ කාලා, බීලා, විනෝද වුණා. තමාගේ සුන්දර රූපය තමන්ටත්, අනුන්ටත්, සිත්සේ සතුටු වෙන්න අවස්ථාව ලබා දුන්නා. ඇය මැදි වියේදී අනපේක්ෂිත ආකාරයෙන් මිය යනවා. මරණින් පසු ඇයගේ පටිච්චසමුප්පන්න උපත සිදු වෙන්නේ, රිලා රංචුවක රිලවියක් හැටියටයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "කාමයේ ආශ්වාදය කෙටියි, රූපයේ ආශ්වාදය කෙටියි" කියලා. නමුත් සමාජය දැන් පිළිගන්න කැමැති, බුදුරජාණන් වහන්සේ කියන දෙය නොවේ; දුක තුළ බැසගෙන ජීවත් වෙන සමාජය තුළ දුක පැටව්ගස්සවන මාර දූතයන්ගේ, මාරදූතියන්ගේ මිච්ඡා ධර්මයනුයි. මෙවැනි සමාජයක ජීවත් වෙන, අම්මා තාත්තා කියන උතුම් අර්ථයත්, දරුවා කියන උතුම් අර්ථයත්. මිච්ඡා සැපයන්

සොයා ගෙන යන මාර්ගයට අවතීර්ණ වීම ගැන අපි පුදුම විය යුතු නැහැ. දෙමාපියන් සහ දරුවන් තුළ ඇති, තරග විභාග මානසිකත්වය හේතුවෙන්, තම දරුවන් අන්‍යශීලවෘතයන්ගේ ගොදුරක් බවට පත් කරනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සම්මා දිට්ඨියේ අර්ථයන්ට අදාළව, අම්මා තාත්තා කියන්නේ මහා බ්‍රහ්මයායි කියලා. මහා බ්‍රහ්මයා සතු මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණයන්, අම්මා තාත්තාටත්, තම දරුවන් උදෙසා සකස්වෙනවා. දෙවැනිව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ආනන්තරිය පාපකර්මයන්ට අදාළව, රහතන් වහන්සේ මැරීමත්, අම්මා තාත්තා මැරීමත් ආනන්තරීය පාපකර්මයක්ය කියල. මෙතැනදී බුදුරජාණන් වහන්සේ අම්මා තාත්තා කියන උතුම් අර්ථය, රහතන් වහන්සේ කියන අර්ථය තුළ තබා තිබෙනවා. සෑම පින්වත් අම්මා කෙනෙක්ම, තාත්තා කෙනෙක්ම, මේ ධර්මානුකූල යථාර්ථය පිළිගන්න ඕනේ. ඒ පිළිගැනීමයි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළ පිහිටියාය කියලා අර්ථවත්ව කියන්නේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙනවා නම්, අම්මා තාත්තා තුළ මහා බ්‍රහ්මයාට, උතුම් රහතන් වහන්සේ නමකට අදාළ ගුණයන් තිබෙනවා කියලා, සෑම අම්මා තාත්තා කෙනෙක්ම දක්ෂ වෙන්න ඕනේ, මේ යථාර්ථය තම තමන්ගේ ජීවිතය තුළින් දැකීමට. සෑම අම්මා, තාත්තා, කෙනෙක් ම මහා බ්‍රහ්මයා කියන අර්ථය තුළ සිටිමින්. උතුම් රහතන් වහන්සේ නමකගේ ගුණයන් තුළ සිටිමින්, තම ලෙයින් පෝෂණය කළ දූදරුවන්ව සද්ධර්මයේ ගුණාත්මකභාවයට යොමු කරමින් මිච්ඡා සැපයෙන් දරුවාව බැහැර කොට, සම්මා සැපයට මාර්ගය කියා දෙන මුල් ගුරුවරයා බවට පත් වීමට දෙමාපියන් දක්ෂ විය යුතුයි. නමුත් වර්තමාන සමාජයේ අම්මලා තාත්තලා තම මාතෘත්වයට, පීතෘත්වයට, ධර්මානුකූලව බුදුරජාණන් වහන්සේ පනවා තිබෙන උතුම් ගුණාත්මක භාවයන්. සිය කැමැත්තෙන් ම මරාගෙන, තම දරුවන්ටත්, දෙමාපියනුත් මිච්ඡා සැපයට පාර

පෙන්වන අධර්මයේ මුල් ගුරුවරුන් බවට පත්වීගෙන යනවා. මේ තත්ත්වය සමාජය තුළ මොනතරම් බරපතළ මුහුණුවරක් ගෙන තිබෙනවාද. කීවොත් තම දරුවාගේ අධ්‍යාපනයේ දියුණුව උදෙසා මුදල් වියදම් කිරීමේ සීමාවෙන් ඔබ්බට ගොස් සමහර දෙමාපියන් ගුරුවරුන්ට ලිංගික අල්ලස් ලබාදෙන තැනට, සමාජය පත් වී තිබෙනවා.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ මතුවී එන තරගකාරිත්වය, දරුවන් විභාග ජයග්‍රහණය උදෙසා ගන්නා වූ කැපවීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ මිල අධික භාවය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පහසුකම්, කියන්නේ ධර්මානුකූල හේතුඵල ධර්මයන්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "අධ්‍යාපනයට, දැනුමට අදාළව සංස්කාරයන් සමාජයක වේගයෙන් මතුවී එන්නේ ඒවායේ ප්‍රතිලාභයන් දරුවන් ලබන්නේ, ධර්මානුකූල හේතුවක් නිසාය". කියලා. එම ධර්මානුකූල හේතුව තමයි, පෙර ජීවිතයේදී තමන් සරණ ගිය ආගමට අදාළව, පැවිදි මහණ බමුණන් ගෙන් ධර්මය ශ්‍රවණය කරලා, එම ධර්මය සාකච්ඡා කරලා, හොඳ නරක, යහපත, අයහපත, ධර්මය අධර්මය තෝරා ගෙන යහපතට අදාළව, ජීවත් වීමේ ඵලයයි කියලා.

වර්තමානයේ ජනතාව, පන්සල, පල්ලිය, කෝවිලට සම්බන්ධ වීම වැඩි වෙන කොට, මහණ බමුණන් ගෙන් අවවදා අනුශාසනා ලබන කොට, අනාගතයේදී, රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ශීඝ්‍ර වර්ධනයක් වගේ ම, අධ්‍යාපනය කෙරෙහි ඇති තරගකාරිත්වය ද බොහෝ ම සංකීර්ණ භාවයට පත් වීම අනිවාර්ය සිද්ධියක් බවට පත් වෙනවා. මේවා ධර්මානුකූල හේතුඵල ධර්මයන්. ධර්මානුකූල හේතුඵල ධර්මයන් සමාජගත වෙන කොට, අපි දක්ෂ වෙන්න ඕනේ, ධර්මය තුළින් අධර්මය මතු කොට නොගෙන, ධර්මය තුළින් ධර්මයන් ම මතු කොට ගන්න.

දරුවන්ගේ විභාග ජයග්‍රහණයන් උදෙසා, දෙමාපියන් නැකත්, ජ්‍යොතිෂ්‍ය, යන්ත්‍ර මන්ත්‍ර, දේවාල වැනි අන්‍යශීලව්‍රතයන් දෙසට වේගයෙන් ඇදී යැමෙන් සිද්ධ වෙන්නේ දෙමාපියන් සතු මහා බ්‍රහ්මයා, උතුම් රහතන් වහන්සේ කියන අර්ථය තුළින් දරුවන්ට සම්මා සැපයට මුල් පාඩම කියා දිය යුතු දෙමාපියන්. තමනුත් තම දරුවනුත් මිථ්‍යාදෘෂ්ඨිය කරා ගමන් කරන මාර දූතයන්, මාර දූතියන් වීම පමණක් මයි. තම දරුවාගේ තරග විභාගය සමත් කරන්න සිල්පද දුර්වල කොට ගෙන, අකුසල් මූලයන් වඩමින්, වර්තමානයේ දෙමාපියන් ගමන් කරන්නේ, "මගේ දරුවා විභාගයෙන් සමත් කරවන්න, මම නිරයට වුණත් යන්න සූදානම්" ය කියන මාරපාක්ෂික ගමනක් නේද? කල්‍යාණ මිත්‍ර ආශ්‍රයේ දුර්වල භාවයෙන්, උතුම් සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීමේ දුර්වල භාවය හේතුවෙන් ඇති වන අදක්ෂ භාවය නිසා මයි මෙවැනි ඵලයන් සමාජගත වෙන්නේ.

පින්වත් දෙමාපියන් බුදුරජාණන් වහන්සේ සරණකොට ගෙන, මුල් කොට ගෙන, විවේකීව සිතන්න. බුදුරජාණන් වහන්සේ ව දෙවැනි තැනට දමලා, දුක තුළ ජීවත් වෙන චරිතයක් පූර්වාදර්ශයට ගන්න එපා. පින්වත් ඔබට මුලින් ම ලෞකික දුක තුනී කොට ගන්න අවශ්‍යනම්, දුකෙන් මිදුණා වූ උත්තමයෙකුගෙනුයි අවවාද, පූර්වාදර්ශයන් ගන්න ඕනේ. උතුම් ශ්‍රී සද්ධර්මය කෙරෙහි විශ්වාසයෙන්, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දරුවන්ගේ ලෞකික සැපයට හේතුවන ආකාරයට දේශනා කොට ඇති ධර්මය කුමක්ද කියලා නුවණින් දකින්න. එතැනයි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවට මාර්ගය තිබෙන්නේ. එම මාර්ගය තුළයි ලෞකික සැපයේ සැබෑම අර්ථය තිබෙන්නේ. එතැනයි, පින්වත් දෙමාපියන් මහා බ්‍රහ්මයා කියන අර්ථයට රහතන් වහන්සේ කියන අර්ථයට සැබෑම වටිනාකමක් දුන්නා වෙන්නේ.

බුදුරජාණන් වහන්සේ දරුවන්ට මුලින් ම දේශනා කොට ඇත්තේ ශ්‍රද්ධාවවත්, ශීලයවත් නොවේ. ශ්‍රද්ධාව ගැන, ශීලය ගැන සිතන්න, තේරුම් ගන්න පුංචි සිත්වලට, ටිකක් ප්‍රමාද වෙන්න පුළුවන්. එම නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "දෙමාපියන් දරුවන්ට මුලින්ම කියා දිය යුත්තේ, මෛත්‍රිය ගැන"ය කියලා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ තරගකාරිත්වය තුළ හඹාගෙන යන මේ පිස්සු බලු ගමනේදී, දෙමාපියන්ගේත් දරුවන්ගේත් දුර්වල ම ධර්මතාවය වෙලා තිබෙන්නෙත් මෛත්‍රිය කියන අර්ථය මයි. බුදුරජාණන් වහන්සේ අංක එකට දේශනා කරන මෛත්‍රිය අපි අන්තිමට දමාගෙන තිබෙනවා.

බුදුරජාණන් වහන්සේගේ අවවාදයන් දෙවැනි තැනට දමමින් මිච්ඡා සැපයන් සොයා යන මිථ්‍යාදෘෂ්ටියට පාර පෙන්වන ගමනක් කරා සමාජය ගමන් කරනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "ඔබේ දරුවා, සම්මා සැපයේ හිමිකරුවෙක් කරන්න අවශ්‍ය නම්, ඔබේ දරුවාට මෛත්‍රී ප්‍රගුණ කරවන්න"ය කියලා. "තමා තමාට මෛත්‍රිය කරන්න ප්‍රගුණ කරන්න" කියලා. පුතේ ඔයා පාන්දර නැගිටලා දත් මැදලා මුහුණ සෝදලා පාඩම් කරලා දෙමාපියන්ට බුද්ධවන්දනාවට මල්ටික කඩලා දීලා, අම්මා සමග වාඩි වෙලා ගාථා සජ්ඣායනය කරලා, ඔයාගේ කාමරයේ පොත්පත් පිළිවෙළට තබා ගත්තාය කියන්නේ ඔයා ඔයාට මෛත්‍රිය වැඩුවා වෙනවා. ඔයාගේ යහපත් ක්‍රියාවන් නිසා, අම්මා තාත්තා සතුටුවෙද්දී මහා බ්‍රහ්මයා සතුටු කිරීමේ, රහතන් වහන්සේ නමක් සතුටු කිරීමේ පින ඔයාට ලැබෙනවා. තමා තමාට මෙත්සිත වඩන දරුවා දෙමාපියන්ට, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට අකීකරු වෙන්නේ නැහැ. පරිසරයට ආදරය කරන දරුවෙක් වෙනවා.

දරුවා තුළ වැඩෙන මෙත් සිත නිසාම, දරුවාට නිරතුරුව ම මෛත්‍රියට අදාළ ආනිශංස එකොළහක් ජීවිතයට එකතු වෙනවා. මෛත්‍රියට අදාළ සුන්දර ම පළමුවැනි ආනිශංසය තමයි, මෛත්‍රිය ප්‍රගුණ කරන දරුවාට, දෙවියන්ගේ,

මනුෂ්‍යයන්ගේ, අමනුෂ්‍යයන්ගේ ප්‍රියභාවය ආශිර්වාදය ලැබෙන කොට, එම දරුවා දෙවියන් සොයා ගෙන දේවාල පස්සේ. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පස්සේ යන්න අවශ්‍ය නැහැ. මෛත්‍රිය ප්‍රගුණ කරන දරුවාට නිවසේදී ම, දෙවියන් ආශිර්වාද කරනවා. දරුවාගේ අතින් අල්ලාගෙන චන්ද්‍ර, බුධ, සිකුරු, සොයා ගෙන ජ්‍යොතිෂය පස්සේ යන්න අවශ්‍ය නැහැ. හිරුට, සඳුට, අධිගෘහිත සම්‍යක්දෘෂ්ටික දෙවිවරුන් දරුවාට නිවසේ සිටියදී ම ආශිර්වාද කරනවා.

තරගකාරිත්වය නිසා ම විභාගයට සූදානම් වන දරුවන්ට රාත්‍රි නින්ද යන්නේ නැහැ. රාත්‍රි සිහිනෙන් බිය වෙනවා. උදේට අවදිවෙන්නේ නැහැ. නමුත් පින්වත් දරුවන්ට දෙමාපියන් මෛත්‍රිය පුහුණු කරනවා නම්, දරුවා ලබන සුන්දර දෙවැනි මෛත්‍රියේ ආනිශංසය තමයි, දරුවා සුවසේ නිදාගන්නවා. සුවසේ ඇහැරෙනවා නපුරු සිහින දකින්නේ නැහැ. සුවසේ නිදාගන්න දරුවා, නපුරු සිහින නොදකින දරුවා, සුවසේ අවදිවෙන දරුවා, මුළු දවස ම ප්‍රබෝධයෙන් ගත කරනවා. අධ්‍යාපන කටයුතු උදෙසා උදාසීනභාවයක් දක්වන්නේ නැහැ.

දරුවන් මෛත්‍රී භාවනාව කිරීමෙන් ලැබෙන තවත් සුන්දර ආනිශංසයන් තමයි, එම දරුවාට නිරෝගී භාවය ප්‍රසන්න භාවය ලැබෙනවා. නිරෝගි භාවය නිසා ම, අධ්‍යාපන කටයුතු වලදී කාලයෙන් හොඳ ප්‍රයෝජනයක් ගන්න දරුවාට පුළුවන්. අධ්‍යාපන කටයුතු බාධාවන් ගෙන් තොරව සිදු කර ගැනීමට හැකියාව ලැබෙනවා. මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ප්‍රසන්න භාවය නිසා ම හැම කෙනෙක්ම, ඔබට ප්‍රිය වෙනවා. ඔබ නොදන්න දෙයක් ඔබට කරුණාවෙන් කියලා දෙනවා. මෛත්‍රිය පුහුණු කිරීමෙන් ලැබෙන තවත් සුන්දර ආනිශංසයක් තමයි. වස විසෙන් ඔබට හානි වෙන්නේ නැහැ. වස විසට වඩා, ගොඩාක් භයානක නපුරු මනුෂ්‍යයෝ සමාජයේ ජීවත් වෙනවා. දරුවාගේ අධ්‍යාපනයට ඊර්ෂ්‍යා කරන, පින්වතුන් සිටිනවා. අධ්‍යාපනයට

බාධා කරන්න උත්සාහ කරන පින්වතුන් සිටිනවා. මෙවැනි වස විස සහිත සිත් වලින්, පින්වත් දරුවන්ට වන හානිය, මෛත්‍රිය තුළින් නිෂේධ කොට දමනවා.

පින්වත් දෙමාපියන් සිතන්නකෝ, බුදුරජාණන් වහන්සේ දරුවන් උදෙසා දේශනා කොට වදාළ, මෛත්‍රී ප්‍රගුණ කිරීමෙන් දරුවන්ට, මොන තරම් ශක්තියක් ලැබෙනවාද කියලා. දෙමාපියන් දරුවන් අන්‍ය ශීල ව්‍රතයන්ට, මිත්‍යා-දෘෂ්ටිකභාවයන්ට ගොදුරු වෙන්නේ නැහැ. විභාගය ගැන සිතමින් බියෙන් ගැහෙමින් ජීවත් වීමෙන් රෝගී භාවයට පත් වෙන්නේ නැහැ. තරගකාරිත්වය නිසා වැඩෙන බලවත් ම අකුසල් මූලයන් වන ලෝභ, ද්වේශ, මෝහ අකුසල් රැස්වෙන්නේ නැහැ. වර්තමාන සමාජයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු උදෙසා වැය වෙන අධික මුදල් ප්‍රමාණය, සෙවීමට දෙමාපියන් බලවත් ආකාරයෙන්, අකුසල් මූලයන්, සිල්පද බිඳීම් සහ මිච්ඡා ආජීවයේ බරපතළ අකුසල් ජීවිතයට එකතු කොට ගන්නවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "දරුවන් උදෙසා, සෑම අම්මා කෙනෙක් ම, තාත්තා කෙනෙක් ම සංසාරයේ මහා සාගරයේ ජලයට වඩා, කඳුළු හෙළා තිබෙනවා"ය කියලා. දරුවන් උදෙසා අකුසල් වඩලා, සිල්පද දුර්වල කොට ගෙන, මිච්ඡා ආජීවයේ යෙදිලා සතර අපායන්ට වැටිලා හෙළුවා වූ කඳුළු ගැනයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙන්නේ.

පින්වත් දෙමාපියන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය, ශ්‍රද්ධාව ඇති කොට ගෙන තම දරුවන්ව කුඩා කාලයේ පටන් මෛත්‍රී චිත්තය තුළ ශක්තිමත් කරන්න. එවිට එම දරුවාට මෛත්‍රියට අදාළ සුන්දර ආනිශංස ධර්මයන් එකොළහක් ජීවිතයට එකතු වෙනවා. එවිට දරුවාගේ වර්තමාන පින කුසලය ශක්තිමත් වෙනවා. දරුවන්ට විපාකයට පැමිණීමට ඇති අතීත අකුසල් සංස්කාර යටපත් වෙලා යනවා. දෙමාපියන්ට, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, සමාජයට කීකරු දරුවෙක් හැටියට, අධ්‍යාපනය ලබලා, ගුණාත්මක දරුවෙක් හැටියට, අනාගතයේ

තම වයෝවෘද්ධ දෙමාපියන්ට අවංක භාවයෙන් ගරු කරන, උපස්ථාන කරන දරුවෙක් බවට පත්වීමේ මාර්ගය මේ උතුම් මෛත්‍රී ධර්මයන් තුළ ගැබ්වෙලා තිබෙනවා.

එම නිසා පින්වත් දෙමාපියනි, දරුවෙනි, තරගකාරීත්වය තුළ පොරකන අසුන්දර ලෝකයට, අකුසල් ලෝකයට, පෙරේත ලෝකයට, සුවපත්වේවා යෑයි ම සිතලා තමන් විවේකීව අනාගත ලෝකයේදී අධ්‍යාපනයේ ඇති වටිනාකම හොඳින් හඳුනාගෙන, දෙමාපියන්වත් අකුසලයෙන් බේරාගෙන හොඳින් අධ්‍යාපනය හදාරලා. විභාග සමත් වෙලා, ධර්මයේ සඳහන් වෙන බුදුරජාණන් වහන්සේ ඔබෙන් බලාපොරොත්තු වන උතුම් සම්මා සැපය සාක්ෂාත් කොට ගන්න දක්ෂ වෙන්න. ඒ උතුම් කර්තව්‍යය සඳහා මෛත්‍රියට වඩා සුදුසු ධර්මයක් නම් භික්ෂුව දන්නේ නැහැ.

මෙය සටහන් තබන භික්ෂුව, තම භික්ෂු ජීවිතයට පුංචි හෝ යම් ගුණාත්මක භාවයක් ලබා තිබෙනවා නම් එම ගුණාත්මක භාවයට අදාළ සංස්කාර ජීවිතයට එකතු කොට ගත්තේ මේ සුන්දර මෛත්‍රී සඤ්ඤාවෙන් මයි. බුදුරජාණන් වහන්සේ ගෙන් පාර අසාගෙන, මෛත්‍රියෙන් ජීවිතය ජයගත්ත භික්ෂුවක් පින්වත් ඔබට මේ සටහන තබන්නේ. මේ උතුම් මෛත්‍රී මාර්ගයේ ගමන් කොට භික්ෂුවට කොතැනකදීවත් වැරදුණේ නැහැ.

පින්වත් දරුවෙනි. දෙමව්පියනි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන්, මෛත්‍රියේ ආනිශංස එකොළහ කෙරෙහි විශ්වාසයෙන්, මේ උතුම් මෛත්‍රී මාර්ගයේ පෙරට එන්න. පින්වත් ඔබට මෙලොව පරලොව දෙකම වරදින්නේ නැති බව, භික්ෂුවට හොඳටම විශ්වාසයි. මෛත්‍රී චිත්තය තුළ, ශ්‍රද්ධාවත්, ශීලයත්, ත්‍යාගයත්, ජයග්‍රහණයත් ලෞකික සැපයත්, සුන්දරව මුහුවෙලා තිබෙනවා. ඒ නිසා මයි ලෝකයේ සැපයට, අදාළ ඉහළම ධර්මතාවය, මෛත්‍රිය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙන්නේ.

# ඉන්ද්‍රිය සංවරයෙන් නෙළුම් විල පිරික්සමු

දෙසැම්බර් පාසල් නිවාඩුව පටන් අරගෙන. උදෑසනම පිණ්ඩපාතය පූජා කරගන්න, දෙමාපියන් සමග පැමිණෙන පාසල් වයසේ දරුවන්, මේ දිනවල ගොඩාක් වැඩියි. අපේ රටේ බොහෝම ගුණාත්මක දරු පරපුරක් සිටිනවා. දෙමාපියන් භික්ෂුවට දෙකට නැමිලා වන්දනා කරද්දී, පසඟ පිහිටුවලා වන්දනා කරන දරුවන්, භික්ෂුව, ඕනෑ තරම් දැකල තිබෙනවා. අපේ රටේ දරුවන් සතු මේ ගුණාත්මක භාවය හේතුඵල ධර්මයක්. පෙර ජීවිතයේදී මේ රටේම ඉපදිලා, ගුණදහම් ආරක්ෂා කොට ගෙන ජීවත් වෙලා, මරණාසන්න මොහොතේ, මේ උතුම් මවුබිම ම උපාදානය කොට ගෙන, පටිච්ච සමුප්පන්නව ඉපදුණ දරුවෝ භික්ෂුවට මුණගැසිලා තිබෙනවා, පළමුවැනි හමුවීමේදී ම භික්ෂුවට ගොඩක් ළෙන්ගතු භාවයක් දක්වන දරුවන්.

මෙවැනි දරුවන් දකිද්දී භික්ෂුවට සිතෙන්නේ මේ දරුවා නම්, පෙර ජීවිතයේදී භික්ෂුවට දන් පැන් පූජා කරපු, ධර්මය ශ්‍රවණය කරපු කෙනෙක් කියලා මයි. සංස්කාර පච්චයා විඤ්ඤාණං කියන ධර්මතාව භව ගමනේ නැවත නැවත අපිව මුණගස්සනවා. මේ හේතුඵල ධර්මයන් දකින නිසා ම, භික්ෂුව දරුවන්ට ගොඩක් ළෙන්ගතුයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දරුවෙකුට මුලින් ම ලබාදිය යුත්තේ, මෛත්‍රියයි කියලා. දරුවන් අනුන්ගේ මෙත් සිතට හරිම කැමතියි. භික්ෂුව කවදාවත් දරුවෙක් ඉදිරියේ වැඩිහිටි පින්වතෙකුට අවවාද කරන්නේ නැහැ. පසුගිය දවසක

සීයා කෙනෙක් සමග තම කුඩා මිණිපිරිය දානය බෙදන්නට පැමිණියා. මේ සීයා හරිම වේගවත්, ඒ වගේමයි කලබලකාරියි. සීයාට අවවාදයක් කරන්නට සිතුණත්, භික්ෂුව නිහඬව සිටියා. සීයාට වඩා භික්ෂුවට වැදගත් වෙන්නේ දරුවායි. සීයාට කරන අවවාදයේදී පින්වත් දරුවා නොතේරෙන කමට භික්ෂුව සමග ගැටුණොත්, එය එම දරුවාට බරපතළ අකුසලයක් වෙනවා. පුංචි සිත් හොඳ, නරක නොබලාම ඉක්මනට ප්‍රතික්‍රියා දක්වනවා. දරුවන් වැඩිහිටි සමාජයෙන් ඉල්ලන්නේ මෛත්‍රියයි. වැඩිහිටි අපි දරුවන්ට පෙරළා දිය යුත්තේත් මෛත්‍රිය මයි.

දරුවන්ට මෛත්‍රිය දක්වනවාය කියලා කියන්නෙ, එම දරුවන් කැමති කරන දෙය ලබාදීල, කාමච්ඡන්දයකින් සතුටු කිරීම නම් නොවේ. දරුවාගේ අනාගත ගුණාත්මකභාවයට අදාළ, කෘතවේදී, කීකරු ධර්මතාව තුළ පෝෂණය කිරීමයි. දරුවාට මෙත් සිතින්, හරි වැරැද්ද හොඳ නරක කියල දීමයි.

පසුගිය දවසක දරුවෙක් භික්ෂුවට ලිපියක් ලබාදීල තිබුණා. එහි සටහන්ව තිබුණා, ස්වාමීන් වහන්ස, මම ඔබ වහන්සේගේ ධර්මය ශ්‍රවණය කරලා, දෙමාපියන්ට, ගුරුවරුන්ට ගොඩාක් කීකරු දරුවෙක් බවට පත් වුණා. එය මගේ අධ්‍යාපනයටත් ලොකු පහසුවක් වෙලා තිබෙනවා. ස්වාමීන් වහන්ස, මගේ පාසලේ යාළුවන්ටත්, ධර්ම දේශනයක් කරන්න. අපේ පාසලට වඩින්නය කියලා. අපිරිසිදු ධර්මයන්, තවම ආක්‍රමණය නොකළ ළමා මනස හරිම කෘතවේදියි. අහිංසක ළමා ජීවිත වල ඇති සංවේදීභාවය තේරුම් ගන්න, වර්තමානයේ වැඩිහිටි පින්වතුන්ලාට විවේකයක් නැහැ. අවිවේකයෙන් පිරුණු වැඩිහිටි පින්වතුන්, ළමා ජීවිතත්, අවිවේකයෙන් ම පුරවනවා. ගෞරවණීය වැඩිහිටියන් ගේ වැරදි නිසාම, වරදක් නොකළ දරුවෝ, අනාගත සමාජය ඉදිරියේ වැරදිකරුවන් බවට පත් වෙනවා.

වැඩිහිටි පින්වතුන්ගේ අසිහිය නිසාම, වර්තමාන සමාජයේ බරපතළම අනතුරට පත්වෙමින් පවතින පිරිසයි, අපේ ළමා පරපුර. මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා. "ස්වාමීන් වහන්ස, අපිව මෙහෙයවන්නේ කවුද" කියලා. "එකිනෙකට වෙනස් සංස්කෘතීන්, එකිනෙකට වෙනස් චර්යාවන්. එකිනෙකට වෙනස් හැකියාවන්, කවුද මේ වෙනස්කම මනුෂ්‍ය ජීවිත තුළ ඇති කරන්නේ" කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "අවිද්‍යාව හේතුවෙන් සකස් වෙන සංස්කාර, සංස්කාර හේතුවෙන් සකස්වන දැනීම් හෙවත් විඤ්ඤාණය, මනුෂ්‍ය ජීවිතවල විවිධත්වයට අදාළ ධර්මතාවන් සකස් කොට දෙනවා"ය කියලා. අපි පසුපස සිටින ක්‍රියාකරුවා අපිම පටිච්චසමුප්පන්නව රැස් කොට ගත් සංස්කාරයි.

වර්තමාන අපේ ළමා පරපුර ගුණාත්මක භාවයෙන් යුක්ත වුණත්, එම අහිංසක දරුවන් පසුපස එම දරුවන්ට නොතේරෙන එහෙත් ධර්මය ඔබට මතු කොට පෙන්වන, අතීත කාමච්ඡන්දයන්ට අදාළ අකුසල් සංස්කාරයන් පටිච්චසමුප්පන්ව අනිවාර්යයෙන් ම සැඟවිලා තිබෙනවා. මෙම ධර්මානුකූල අනතුර දකින්න දරුවාට ශක්තියක් නැහැ. දරුවා මේ අනතුරෙන් මුදා දීමේ වගකීම තිබෙන්නේ වැඩිහිටියන් වන අපිට මයි. වැඩිහිටියන් ගේ අසිහිය නිසා දඬුවම් ලබන දරුවෝ, වර්තමානයේ ගණිකා නිවාස වල, සම්බාහන මධ්‍යස්ථාන වල, රාත්‍රි සමාජ ශාලා වල, අපි ජීවත්වන සමාජය තුළ, අනාරක්ෂිතව මොන තරම් ජීවිත වලින් වන්දි ගෙවනවාද?

ධර්මය ඒහිපස්සිකයි, විවෘතව බබළනවා, සඟවන්න බැහැ. ඒ නිසා මයි, පින්වත් ළමා පරපුර, අපෙන් මෛත්‍රිය බලාපොරොත්තු වෙන්නේ. පින්වත් වැඩිහිටි ඔබලාගේ අසිහිය හේතුවෙන්, අපිව විනාශ කරන්න එපාය කියලා, දරුවා මෛත්‍රිය ඉල්ලද්දී, දරුවාට ද්වේශය දෙන්න එපා. දරුවා ආදරය ඉල්ලද්දී දරුවට කාමච්ඡන්දයන් දෙන්න එපා. වර්තමානයේ වැඩිහිටි පින්වතුන් අපිට ලැබිලා තිබෙන, මේ සුන්දර පින්වන්ත දරු

පරපුර සදාචාරාත්මකව විනාශය කරා රැගෙන යන්නේ නම්, එය පින්වත් වැඩිහිටි ඔබලාට, ජාති ජාතිත් ගෙවා නිම කළ නොහැකි මහා අකුසල් කන්දක් ම වේවි. මෙය සටහන් තබන භික්ෂුවගේ දෙමාපියන්, ගුරුවරුන්, මාව විනාශ කළේ නැහැ. මේ සටහන කියවන පින්වත් ඔබගේ දෙමාපියන්, ගුරුවරුන්, ඔබලාව විනාශ කළේ නැහැ. ගුණාත්මකව ලෝකයට ඔසවා තැබුවා. අපි කෘතවේදී වෙන්න ඕනේ.

අපේ ජීවිත තුළින් අපි යම් යහපත් දෙයක් ලැබුවා නම්, යම් ගුණාත්මක දෙයක් ලැබුවා නම්, එම උතුම් ගුණයන් ඊළඟ පරම්පරාවට ආරක්ෂා කොට දෙන්න. ආදර්ශයක් කොට දෙන්න. එයයි ගුණධර්මයන් ගෙන් පෝෂණය වුණ, මනුෂ්‍යත්වය යැයි කියන්නේ. අපි ලබපු යහපත්, ගුණාත්මක දේවල් අපි ම මරා දමලා, අපිත් මැරිලා ගියොත්, ඒ යන තැන නම්, ගුණ දහම් නොහඳුනන තිරිසන් ලෝකයක් ම වෙන්න පුළුවන්.

වැඩිහිටියන්ගේ ඇසෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින් ගලා බසිනා තෘෂ්ණාවේ සැඩ පහරට හසුවී කාමච්ඡන්දයන් ගෙන් කරවටක් ගිලී ගිය සමාජයක නොදන්නා භාවයෙන් ම, අහිංසකභාවයෙන් ම අනතුර කරා ගමන් කරන පින්වත් දරු පරපුර, මේ විනාශයෙන් යම් පමණකට හෝ ගලවා ගැනීමේ ශක්තිය තිබෙන්නේ, පාසලේ විදුහල්පති තුමා, ගුරුතුමා, ගුරුතුමියටයි. ගුරු වෘත්තියට දේවත්වයෙන් අතීත සමාජය ගරු කළේ, ගුණාත්මක මනුෂ්‍ය සමාජයක් තුළින්, මනුෂ්‍යයා දෙවියකු බවට පත් කළ නිසාමය. වර්තමානයේ අපි, ජාතියේ අනාගත ගුණාත්මකභාවය උදෙසා, පාසල් ගුරුවරයා සතු වගකීම කෘතවේදීව දකින්න ඕනේ. පාසල් ගුරුවරයාට, ආත්ම ගරුත්වයෙන් යුතුව, තම වගකීම් ඉටුකිරීමේ නිදහස, සමාජය ලබා දෙන්න ඕන. පාසල් දරුවාගේ විනය ශක්තිමත්ව පවත්වාගෙන යන්න, පින්වත් ගුරුවරයාට දෙමාපියන්ගේ ඇඟිලි ගැසීම් වලින් තොරව නිදහස දෙන්න ඕනේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "ඉපදීම උරුම කොටගත් අපි, ඉපදීමක් ම සොයනවා"ය කියලා. "වසයට යෑම, ජරාව උරුම කොටගත් අපි, ජරාවක් ම සොයනවා"ය කියලා. "ලෙඩවීම උරුම කර ගත් අපි ලෙඩවීමක් ම සොයනවා"ය කියලා. "මරණය උරුම කොට ගත් අපි මරණයට පත් වෙන දේවල් ම සොයනවා"ය කියලා. "දුකම උරුම කොට ගත් අපි දුකටම හේතු වෙන තෘෂ්ණාව ම ප්‍රගුණ කරනවාය" කියලා. ආර්ය නොවන, සැපයට හේතු නොවන, දුකට ම අතවනන අනාර්ය පර්යේෂකයන් බවට අපි පත් වෙලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කළා වූ ආර්ය වූද. සැපයට හේතු වන්නා වූද තෘෂ්ණාව සියුම් කරන්නා වූද ආර්ය පර්යේෂණයන් තිබෙනවා. පින්වත් ඔබ දුර්ලභ බුද්ධෝත්පාද කාලයක සුන්දර මනුෂ්‍ය ජීවිතයක් ලබන්නේ, ජාති, ජරා, ව්‍යාධි, මරණ අනාගත භව ගමනට තව තව එකතු කොට ගැනීමට නොවේ. තමා දරන වෘත්තිය, තමා දරන වගකීම්, තමා දරන සමාජ තත්ත්වය, තමා දරන නායකත්වයන් උපයෝගී කොට ගෙන ධර්මානුකූලව ජාති, ජරා, ව්‍යාධි, මරණ වලින් මිදීම දෙසට ගමන් කිරීමයි. බුදුරජාණන් වහන්සේට කීකරු භාවය ඇතිකොට ගත් ආර්ය පර්යේෂකයා, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේවයන්ට හේතුවන ධර්මතාවන් ජීවිතයෙන් රැස් කරන්නේ නැහැ. සේවා අයිතිවාසිකම්, වැටුප, වෘත්තියවේදියකුට අත්‍යවශ්‍ය ධර්මතාවක්. නමුත් ඔහු මේ සියල්ලට ම ඉදිරියෙන් සංසාර බිය, සංසාර ගැඹුර, සංසාර දුක ගැන දැක්ම සීරුවෙන් තබනවා. ඔහු අනාර්ය වූ, ලාමක වූ, දුකටම හේතු වන්නා වූ ලාමක ධර්මතාවන්ට මුල්තැන දෙන්නේ නැහැ.

ආර්ය වූ පර්යේෂණයේ යෙදෙන පින්වතා. මේ ලෝක ධාතුවේ වෘත්තීයවේදියෙක් ලබන ඉහළම වැටුප වන පංචශීලයෙන් ශක්තිමත් පින්වතෙක්. පංචශීලය නමැති වැටුප් පැකට්ටුවේ සමාජය ඉදිරියේ ඔබ ලබන ජනප්‍රිය භාවය තිබෙනවා. බියෙන් තොර භාවය තිබෙනවා. සිහිය හොඳින් පිහිටා තිබෙනවා. මීළඟ

ජීවිතය සුගතියම උරුම කොට දෙනවා. බලන්නකෝ පංචශීලය නමැති පඩි පැකට්ටුවේ තිබෙන වටිනාකම. පින්වත් ඔබ පසුගිය මාසයේ, රැකියාව කරලා අතට ගත්ත වැටුප් පැකට් එකේ, ඔය ගුණාත්මක දේවල් මොකක්වත් තිබුණද කියලා මොහොතක් සිතලා බලන්න. සිල්පද බිඳීම්, ලෝභ, ද්වේශ, මෝහ ධර්මයන් හැර වෙන මොනවද පින්වත් ඔබලාගේ පඩි පැකට්ටුවෙන් ඔබට ඇති වුණේ.

ආර්ය පර්යේෂකයා, පංචශීලයේ පරිපූර්ණභාවය නිසාම, ඉන්ද්‍රිය සංවරභාවය ඇති කොට ගත් කෙනෙක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, වැව් ජලයේ සමහර නෙළුම් පොහොට්ටු තිබෙනවා. එම නෙළුම් පොහොට්ටු තවම ජලයෙන් මතුපිටට ඇවිත් නැහැ. තවත් සමහර නෙළුම් පොහොට්ටු ජලයෙන් මතුපිටට ඇවිත් තිබෙනවා. නමුත් තවම පිපී නැහැ. තවත් සුන්දර නෙළුම් තිබෙනවා. ඒවා පොළොව මතුපිටට ඇවිත් හොඳින් පෙති විහිදා පිපිලා තිබෙනවා. එකිනෙක මල්, එකිනෙකට වෙනස් වර්ධනයක් තුළ තිබෙනවාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සම්මා දිට්ඨියේ අර්ථයන් ගෙන් පෝෂණය වූ පංචශීලයේ ශක්තියෙන්, ඉන්ද්‍රිය සංවරය ඇති කොට ගත් පින්වතා, අසිහියෙන් බැහැර වූ සිහියෙන් දකිනවා. නෙළුම් විලේ නෙළුම් මල්වල වර්ධනය එකිනෙකට වෙනස් වන්නා සේ අප ඉදිරියේ තිබෙන, මනුෂ්‍ය සමාජයේත්, ගුණාත්මක භාවයන්, හැදියාවන්, දක්ෂතාවන් එකිනෙකට වෙනස්ය කියන කාරණය. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මනුෂ්‍යයාගේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ වැඩුණු, නොවැඩුණු භාවය හඳුනාගැනීමට මනුෂ්‍ය සමාජය අදක්ෂ නිසාම අපි බරපතළ ඇලීම් ගැටීම් දිශාවන්ට ගමන් කරනවාය කියල.

පංති කාමරයේ ඉගෙන ගන්නා දරුවන් හතළිස්දෙනා ගෙන් අපිට එකම ගුණාත්මකභාවය බලාපොරොත්තු වෙන්න බැහැ. පාසලේ සේවය කරන පින්වත් ගුරු මණ්ඩලයෙන් එකම

ගුණාත්මකභාවයක් අපිට බලාපොරොත්තු වෙන්න බැහැ. පාසල් දරුවන්ගේ දෙමාපියන්ගෙන් එකම ගුණාත්මකභාවයක් අපිට බලාපොරොත්තු වෙන්න බැහැ. වැව් ජලයේ එක නෙළුම් පොහොට්ටුවක් ජලයෙන් ඉහළට මතු නොවී තිබියදී තවත් නෙළුමක් ජලයෙන් මතුපිට සුන්දරව පිපී තිබුණා. එය නෙළුම් මලේ වරදක් නොවේ, නෙළුමේ ස්වාභාවික වර්ධනයයි.

'සංස්කාර පච්චයා විඤ්ඤාණං' කියන ධර්මතාව තුළ, අපේ ක්‍රියාකාරකම් සකස් වෙන්නේ පටිච්චසමුප්පන්න පුරුදු, පුහුණු හේතුවෙන් සකස් වෙන අපේ ඉන්ද්‍රිය ධර්මයන් ගේ දියුණු නොදියුණු භාවය මතයි.

භික්ෂුව ඉදිරියට පින්වතුන් දහදෙනෙක් පැමිණියොත්, එම පින්වතුන් දහදෙනා එකිනෙකට වෙනස් හැසිරීම් දක්වන්නේ. මනුෂ්‍ය ජීවිතවල අපි දකින මේ විවිධත්වය, සුන්දර ධර්මානුකූල හේතුඵල ධර්මයක් අපට කියලා දෙනවා. අනුන්ගේ ධර්මානුකූල වෙනස්වීම් ඉදිරියේ පින්වත් ඔබේ සිත, ඇලීම්, ගැටීම් දෙසට වෙනස් නොවේ. ධර්මයේ උපේක්ෂාව කියන අර්ථයට ගන්න අපි දක්ෂ වෙන්න ඕනේ. එවිට පින්වත් ඔබ කවදාකවත් ඇසෙන් රූපයක් දැකලා, එම රූපය ගැන මනසින් සිතලා, ඇලීම් ගැටීම් ඇති කොට ගන්නේ නැහැ. කනෙන් ශබ්දයක් අහලා, එම ශබ්දය ගැන සිතලා, ඇලීම් ගැටීම් ඇති කොට ගන්නේ නැහැ. ඉහත අර්ථය මයි බුදුරජාණන් වහන්සේ ඉන්ද්‍රිය සංවරශීලය කියලා කියන්නේ, ඉන්ද්‍රිය සංවර ශීලය දුර්වල පින්වතා තුළ කවදාවත් චිත්ත විශුද්ධියක්, ඇතිවෙන්නේ නැහැ. පංචනීවරණයන් තුළ බැස ගන්නා වූ, ඇලීම්, ගැටීම් දෙක තුළ දෝලනය වන ජීවිතයක උරුමයයි, ඔහුට ලැබෙන්නේ.

# වසරක් පරණ වෙන මොහොතේ අලුතෙන් සිතන විදිහ

2019 වසර උදාවෙලා. වසරක් උදාවෙද්දී, පින්වතුන් අලුත් බලාපොරොත්තු, ප්‍රාර්ථනාවන් ඇති කොට ගන්නවා. පරණ ජීවිතයට, අලුත් බලාපොරොත්තු එකතු කොට ගන්නවා. ඇත්තට ම අපි සිතනවා, ජීවිතය අලුත් වුණාය කියලා. නමුත් සිද්ධ වෙලා තිබෙන්නේ ජීවිතය, වසරකින් පරණවීම පමණක් මයි. අද වෙන කොට භික්ෂුවගේ ජීවිතය, අවුරුදු පනස් අටකින් පරණවෙලා. අලුත් අවුරුද්දක් ලබද්දී මේ පරණ වූ ජීවිතය, ධර්මානුකූලව අලුත් කරගන්න, පින්වත් ඔබ දක්ෂවෙන්න ඕනේ. ධර්මානුකූලව ජීවිතයක් අලුත් කරගන්නා හැටි බුදුරජාණන් වහන්සේ, රාහුල පුංචි සාමණේර ස්වාමීන් වහන්සේට දේශනා කරනවා.

රාහුල පුංචි ආයුෂ්මතුන්ට, බුදුරජාණන් වහන්සේ කරන මුල්ම අවවාදය, රාහුල ඔබ බොරු කියන්න එපා කියලා. බොරු කියන පුද්ගලයාට කිසිදු ලැජ්ජාවකින් තොරව, ඕනෑම වරදක් කරන්නට පුළුවන් යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. බොරු කියන පින්වතා තුළින් පංචශීලයේ ඉතිරි සිල්පද සතරම දුර්වල වෙන්න පුළුවන්. උපසම්පදා භික්ෂූන් වන අප බොරු කළොත් බොරු කිව්වොත් මුළු ප්‍රාතිමෝක්ෂ ශීලයම දුර්වල වෙන්න පුළුවන්. වර්තමානයේ සමාජය මුහුණදීලා තිබෙන සෑම සමාජ අර්බුදයක්ම බොරු කීමේ ඵලයක් මයි. ඒ නිසා මයි, රාහුල පුංචි ආයුෂ්මතුන්ට ලබාදෙන මුල්ම අවවාදය හැටියට බොරු

කීමේ ආදීනවයන් දේශනා කරන්නේ. අපිට තවමත් පංචශීලයට අයත් බොරු නොකීම කියන සිල්පදය ආරක්ෂා කොට ගන්න බැරි නම් අපි කොහොමද ඉන් ඔබ්බට ඇති ශක්තිමත් ශීලයන් ආරක්ෂා කොට ගන්නේ.

මේ ලෝක ධාතුවේ බොරු නොකියන ශ්‍රේෂ්ඨ ම උත්තමයා රහතන් වහන්සේයි. රහතන් වහන්සේ කවදාකවත් අනිත්‍ය වූ ඇස, අනිත්‍ය වූ කන, නාසය, දිව, ශරීරය, මනස නිත්‍යයි කියලා බොරු කියන්නේ නැහැ. රහතන් වහන්සේ කවදාවත් දුකෙන් පිරුණා වූ පංචඋපාදානස්කන්ධ ලෝකය, සැපයි කියන බොරුව කියන්නේ නැහැ. රහතන් වහන්සේ කවදාකවත් අනිත්‍ය වූ සංස්කාර, නිත්‍යයි කියන බොරුව කියන්නේ නැහැ. රහතන් වහන්සේ කවදාකවත්, දුකෙන් පිරුණා වූ භවාත්‍රය සැපයි කියන බොරුව කියන්නේ නැහැ. රහතන් වහන්සේ කවදාකවත් අනිත්‍ය දුක්ඛ අනාත්ම ධර්මයේ නිත්‍ය සැප, ආත්මීය යැයි කියන බොරුව කියන්නේ නැහැ. රහතන් වහන්සේ කවදාකවත්, කුසල් සහ අකුසල් සංස්කාරයෝ නිත්‍යයි කියන බොරුව කියන්නේ නැහැ.

ගෞරවණීය පින්වත, පංචශීලයට අදාළ බොරු නොකීම කියන තීරණාත්මක සිල්පදය අපි අනාගතයේ යම් දවසක, ඉහත උත්තරීතර අර්ථයන් කරා අපේ ජීවිත තුළින් අරගෙන යන්න ඕනේ. ඒ නිසාමයි, රාහුල පුංචි ආයුෂ්මතුන්ට බුදුරජාණන් වහන්සේ ගෞරවනීය පියතුමන් හැටියට බොරු නොකීමේ වැදගත් භාවය මුල් ම අවවාදය හැටියට කරන්නට ඇත්තේ. අපි හැමෝගේ ම, ජීවිත වසරකින් පරණ වෙච්ච වෙලාවේ. බොරු නොකීමේ වැදගත්කම, අපේ ජීවිතවලට එකතු කොට ගන්න පුළුවන් නම් එය පරණ වූ ජීවිතයට අලුත් අවුරුද්දක් ම වේවි.

වර්තමානයේ වනවාසී භික්ෂූන් වහන්සේලා මුහුණ දෙන ලොකු ම පළිබෝධයක් තමයි, කුටිවල කැපකරුවන්ගේ බොරුකීම සහ බොරු කිරීම. කැපකරු පින්වතුන්ගේ මෙවැනි ක්‍රියාවන් ගෙන් භික්ෂුව ගොඩාක් අපහසුතාවයන්ට පත්වෙලා

තිබෙනවා. බුදුරජාණන් වහන්සේ, රාහුල ආයුෂ්මතුන්ට දේශනා කරනවා, "රාහුල කවටකමක් උදෙසාවත්, විහිළුවටවත් බොරු කියන්න එපා"ය කියලා. "දැන දැන බොරු කියන පුද්ගලයාට කළ නොහැකි පවක් නැහැ"ය කියලා.

බොරු කීමෙහි බලවත්ම විපාකය අත් වෙන්නේ මහා සංඝරත්නයට බොරු කීමයි. සංඝයා කියන්නේ ගින්දරක්. සංඝයාගේ ගුණයන්, ඥාණයන්ගේ ශක්තිය වැඩිවෙන්න, වැඩිවෙන්න සංඝයාගේ එම ගිනි රස්නය වැඩි වෙනවා. එම නිසා අපි දක්ෂ විය යුතුයි සංඝයා සමග සිහිනුවණින් කටයුතු කරන්න. අපි සියල්ලන්ම සංඝයා කියන සමූහයට අයිති වුණත්, අපගේ ගිනි රස්නය, එකිනෙකට වෙනස්.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ බව දැනගෙන බුදුරජාණන් වහන්සේට චෝදනා කළ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සමග සිටි සුභද්‍ර භික්ෂුවත් සංඝ සමාජයේ සාමාජිකයෙක් මයි. සුභද්‍ර භික්ෂුව සංඝ සමාජය නියෝජනය කළත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේත් සුභද්‍ර භික්ෂුවගේත් ගිනි රස්නය, ගුණයන්, ඥාණයන්ගේ ශක්තිය කුඩා තාරකාවක ආලෝකයත්, පසළොස්වක සඳේ ආලෝකයත් වගේ මහා පරතරයක් තිබෙනවා. නමුත් අපි සියල්ලෝම සංඝ සමාජයේ සාමාජිකයෝ. එම නිසාම භික්ෂුව කරුණාවෙන් මතක් කරනවා, සංඝයාට දැන දැන නම් බොරු කරන්න, බොරු කියන්න එපාය කියලා.

බුදුරජාණන් වහන්සේ, රාහුල ආයුෂ්මතුන්ට පළමුව බොරු කියන්න එපාය කියලා, දෙවනුව දේශනා කරනවා රාහුල, කැඩපතකින් අපි අපේ ශරීරය පරීක්ෂාකොට බලනවා වගේ, ඔබ කරන සෑම කාය කර්මයක්ම සුපරීක්ෂාවෙන් සිහි නුවණින් සිද්ධ කරන්න. රාහුල, ඔබ සිදු කරන සෑම වචී කර්මයක්ම සුපරීක්ෂාවෙන් සිහි නුවණින් සිද්ධ කරන්න. රාහුල ඔබ කරන සෑම මනෝ කර්මයක්ම සුපරීක්ෂාවෙන්, සිහි නුවණින් සිද්ධ කරන්න.

රාහුල, ඔබ කයෙන් යම් ක්‍රියාවක් සිදුකරන කොට, එම කාය කර්මය, ඔබටත්, අනුන්ටත් දුක පිණිස අකුසලය පිණිස හේතුවෙන්නේ නම් කරුණාකර, එම ක්‍රියාව සිදුකරන්න එපා. රාහුල ඔබ කයෙන් යම් ක්‍රියාවක් සිදුකරන කොට, එම කායකර්මය ඔබටත්, අනුන්ටත් යහපත පිණිස, සැහීම පිණිස, කුසලය පිණිස හේතු වෙනවා නම් කරුණාකර එය සිදු කරන්න. මෙම සටහන කියවන පින්වත් ඔබ, ලැබුවා වූ නව වසරේදී සිතන්න දක්ෂනම්, මට දුක පිණිස හේතුවෙන, අනුනට දුක, පිණිස හේතුවෙන කාය කර්මයන් මම කරන්නේ නැහැය" කියලා, තමන් සිදු කරන සෑම කායකර්මයක් ම ප්‍රත්‍යවේක්ෂාවෙන් යුතුව කුසල් ධර්මයන් වැඩෙන ආකාරයට සිදු කරන්න.

උතුම් රහතන් වහන්සේ නමක් කවරදාකවත් නාමරූප ධර්මයන්ගේ හේතුවෙන් සකස් වුණ තමන්ට අයිති නැති ඇස, කන, නාසය, දිව, ශරීරය මගේ කියලා සොර සිතින් ගන්නේ නැහැ. රහතන් වහන්සේ සළායතන හේතුවෙන් සකස් වෙන ඵස්සය, ඵස්සය හේතුවෙන් සකස් වෙන විඳීම, මගේ කියලා සොර සිතින් අයිති නැති දෙයක් ගන්නේ නැහැ. නමුත් අපි මොනවද මේ කරන්නේ. අපිට අයිති නැති ඇස මගේ කරගෙන, අපිට අයිති නැති හේතු ධර්මයන්ගෙන් හටගත් ශරීරය මගේ කොට ගෙන මගේ ආත්මය කොට ගෙන ඒ ආත්මය ඔබ කොට ගෙන පාට පාට, සුවඳ විහිදුවන විලාසිතා ලෝකයක් බවට අන්සතු රූපයක් මගේ කොට අයිති කරගන්නවා. ශරීරයෙන් විඳීම් සොයන මම, හේතුඵල ධර්මයන්ට අයත් අන්සතු රූපයක් මගේ කොට ගත් ඔබ, කවදාක නම් රූපයෙන් මිදෙන්නද? භික්ෂුව නැවතත් සටහන් තබනවා, භික්ෂුව ගිහි ජීවිතයේදී කවදාකවත් පවුඩර්, සුවඳ විලවුන් පාවිච්චි කරලා නැහැ. හැබැයි සුවඳ සබන් නම් හැමදාමත් පාවිච්චි කරනවා. ඒත් කවදාකවත් කවුරුවත්ම භික්ෂුව අවලස්සනයි, කැතයි ගඳයි කියලා නම් කියලා නැහැ. භික්ෂුව මේ සටහන් තබන්නේ, පින්වත් ඔහුට භික්ෂුව ඉන්න ඉසව්වට එන්න මාර්ගය එළිපෙහෙළිකොට දෙන්නයි.

භික්ෂුව මේ මොහොතේ වැඩසිටින කුටියට මීට මාසයකට පෙර වඩිනකොට කුටිය වටේ තිබෙන වැලි මළුවේ වැලි පස් බවට පත්වෙලයි තිබුණේ. හුඟ කාලයකින් වැලි අතුරලා නැහැ. පින්වතුන් කිහිප දෙනෙක් ට්‍රැක්ටරයක් අරගෙන වැලි ගෙනැල්ලා ලස්සනට වැලි ඇතිරුවා. වැලි මළුවේ අලුත් වැලි නිසා මේ පැරැණි කුටිය දැන් කිරිපැහැ වෙලා පෙනෙනවා. ඒත් අනාගතයේ දවසක මේ සුන්දර වැල්ලත් පස් බවට පත් වෙනවා මයි. පින්වත් ඔබ සුන්දර කරන ඔබගේ ශරීරයත්, යම් දිනයක පස් බවට ම පත් වෙන බව නුවණින් තේරුම් ගන්න ඕනේ.

උතුම් රහතන් වහන්සේ නමක් කවදාකවත්, අවිද්‍යාව හේතුවෙන් ඉපදුණ මේ රූපය, කාමයන් උදෙසා උපයෝගී කොට ගන්නේ නැහැ. මේ ඇස කියන්නේ කාමය උපද්දවන වස්තුවක්. මේ ඇස කවදාවත් කාමයන් උදෙසා රහතන් වහන්සේ උපයෝගී කොට ගන්නේ නැහැ. මේ කන, නාසය, දිව, ශරීරය, මනස කවදාකවත් රහතන් වහන්සේ කාමයන් උදෙසා උපයෝගි කොට ගන්නේ නැහැ. පංචඋපාදානස්කන්ධ ලෝකය නිරෝධය කළාවූ රහතන් වහන්සේ කාමයන් හිස් කළ පංචස්කන්ධයක් පමණක්මයි දරාගෙන සිටින්නේ. රහතන් වහන්සේ කවදාකවත් තමන් පරිහරණයකරන චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස කෙරෙහි කාමයන් ඇති කොට ගන්නේ නැහැ. කාමයන් නිරෝධය කළ රහතන් වහන්සේට සිව්පසය, ජීවිතය පවත්වාගෙන යෑම උදෙසා පමණක් මයි. අපි අනාගතයේ යම් දවසක කාමයේ වරදවා හැසිරීමෙන් වැළකීම කියන සිල් පදය මෙවන් උත්තරීතර අර්ථයක් කරා අරගෙන යන්න ඕනේ.

පසුගිය දවසක භික්ෂුව මුණගැහෙන්න වයෝවෘද්ධ යුවළක් පැමිණියා. මේ දෙදෙනා බොහෝම මිත්‍රශීලීව ලෙන්ගතු භාවයෙන් හැසිරුණේ. භික්ෂුවට ඉටිපන්දම් පැකට් එකක්, ගිලන්පස බෝතලයක් පූජා කරලා, මේ වයෝවෘද්ධ මහත්මා භික්ෂුවට කියනවා ස්වාමීන් වහන්ස අදට අපි විවාහවෙලා අවුරුදු පනහක් වෙනවා. අපි ගෙවීගිය අවුරුදු පනහම බොහෝම සමගියෙන්

එකිනෙකා කෙරෙහි ලෙන්ගතු භාවයෙන් මයි ජීවත් වුණේ. අපිට ආශිර්වාද කරන්නය කියලා. භික්ෂුව පංචශීලය සමාදන් කරවලා, පිරිත් සූත්‍රයක් කියලා මෙම වයෝවෘද්ධ දෙපළට ආශිර්වාද කළා. භික්ෂුව මේ දෙදෙනාගේ එකමුතු භාවය දැකලා, එම දෙපළට මෙහෙම අවවාදයක් සිදුකළා. "මහත්තයෝ අවුරුදු පනහක් සමගියෙන් අත්වැල් අල්ලාගෙන ජීවත් වෙච්ච බව ඇත්ත. එය විවාහ ජීවිතයක අර්ථවත් ජයග්‍රහණයක්. නමුත් මහත්තයෝ, ඔය විදිහට අත්වැල් අල්ලාගෙන ජීවත්වෙලා අනාගතයේ යම් දවසක මියයන මොහොතේ ඔය අල්ලාගෙන සිටින ලෙන්ගතු භාවයේ අත්වැල ලිහාගන්න බැරිවුණොත් මුලින්ම මැරෙන කෙනා අනතුරටයි පත්වෙන්නේ" කියලා. "තෘෂ්ණා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො කියන ධර්මතාවය ලෙහාගන්න බැරිවූ අත්වැලක් සමග අපිව භව අනතුරට පත් කරාවි" කියලා. මේ වයෝවෘද්ධ දෙපළට දෙදෙනාගේ ලෙන්ගතු භාවයේ අනතුර ඒ මොහොතෙයි වැටහුණේ. අනතුර තේරුම් ගත්ත තැනදී මෙතෙක් නිහඬව සිටි වයෝවෘද්ධ නෝනා කටහඬ අවදි කළා. "ස්වාමීන් වහන්ස අපි මොකක්ද කරන්න ඕනේ" කියලා, අහන්න තරම් නිහතමානී භාවයක් ඇය තුළ තිබුණා. භික්ෂුව ප්‍රකාශ කළා "පින්වත් ඔබලා ආර්ය අෂ්ටාංගික මාර්ගය ශක්තිමත් කොට ගන්නා ගමන්, නිරතුරුවම නුවණින් මෙනෙහි කරන්න, මීට අවුරුදු පනහකට පෙරාතුව, ආදරෙයි කියලා, ඇය ඔබට දීලා තිබෙන්නේ, පින්වත් ඔබ ඇයගෙන් ලබලා තිබෙන්නේ කබ, කලාඳුරු, සොටු, කුණුකෙළ, අශුචි, මුත්‍රා, දහදිය පිරවූ කළගෙඩියක් නේද? කොටින්ම ජාති, ජරා, ව්‍යාධි, මරණයක් නේද" කියලා...

වර්තමානයේ ආදරය කරන, ආදරය බලාපොරොත්තු වන, අනුන්ගේ ආදරය සොරකම් කරන, පින්වතුන් පින්වතියන් තේරුම් ගන්න ඕනේ ආදරයයි කියලා ඔබලා ඔය අයිති කොටගෙන සිටින්නේ දොරටු නවයකින් කබ, කලාඳුරු, සොටු, කුණුකෙළ, අශුචි, මුත්‍ර, දහදිය පිරවූ කළගෙඩියක්ය කියන ධර්මානුකූල අර්ථය.

ඔබගේ ජීවිතය වසරකින් පරණ වෙච්ච වෙලාවේ ලැබුවා වූ නව වසර ධර්මයේ අලුත් අර්ථයන් වැඩෙන වසරක් බවට පත් කොට ගන්න. බුදුරජාණන් වහන්සේ තම පින්වන්ත පුතණුවන් වන රාහුල පුංචි සාමණේර හිමියන්ට ලබාදුන් ධර්මාවවාදය, පින්වත් ඔබගේ ජීවිතයට ලොකු ආලෝකයක් වේවි. මීට වසර දෙදහස් හයසියයකට පෙරාතුව බුදුරජාණන් වහන්සේ රාහුල පුංචි ආයුෂ්මතුන්ට ලබාදුන් ධර්මාවවාදය, පින්වත් ඔබට ම බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් ලබාදුන් ධර්මාවවාදයක් යැයි කෘතවේදීව සිතන්න.

රාහුල, හැම අකුසලයකට ම මුල් වෙන අනෙක් සියලුම සිල්පද දුර්වල කොට දැමීමට හේතුවෙන බොරු කියන්න එපා. කාටවත්ම බොරු කරන්න එපා.

රාහුල කැඩපතක් ඉදිරියට ගොස් ඔබේ රූපය බලනවා වගේ ඔබ තුළින් සිදු වෙන කාය කර්මයන් ප්‍රත්‍යවේක්ෂාවෙන් දකින්න. අකුසලයට හේතු වෙන, දුකට හේතු වෙන අයහපත් කාය කර්මයන් ගෙන් මිදෙන්න. යහපතට, සැපයට හේතු වන කාය කර්මයන්හි පමණක් ම යෙදෙන්න. සත්ත්ව ඝාතනයෙන්, සත්ත්ව හිංසනයෙන් සොරකම් කිරීමෙන් කාමයේ වරදවා හැසිරීමෙන්, මත්වතුර, මත්ද්‍රව්‍ය වලින් අයහපතට හේතු වෙන කාය කර්මයන් ජීවිතයෙන් ඈත් කොට දමන්න. පින්වත් ඔබ මොහොතක් දෑස් පියාගෙන, බුදුරජාණන් වහන්සේ ඔබටමයි මේ ධර්මය දේශනා කළේ කියලා අලුතින් දකින්න.

පින්වත් ඔබ ලැබුවා වූ නව වසරේදී පවුඩර්, සුවඳ විලවුන් ටිකක් පාවිච්චි කළාට නම් කමක් නැහැ. හැබැයි බොරු කියන්න නම් එපා. බොරු කියන්න පුරුදු වුණොත් සුවඳ විලවුන් පාවිච්චි කළත් ඔබ කියාවි, අනේ මම නම්, ඕවා පාවිච්චි කරන්නේ නැහැයි කියල.

# උපන් බිමට ඇති
# ධර්මානුකූල සම්බන්ධය කුමක්ද?

තවත් සිංහල අලුත් අවුරුද්දක් උදාවෙනවා. සිංහල අලුත් අවුරුද්දක් උදාවෙන්නේ අපේ සිංහලකම, බෞද්ධකම අලුත් කරගන්න. සිංහලකම, බෞද්ධකම අලුත් වෙන්නේ තීන්ත ආලේප කරලා, අලුත් ඇඳුම් අන්දවල, කැවුම් කිරිබත් හදලා පමණක් නොවේ සිංහලකම, බෞද්ධකම අලුත් වෙන්නේ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය ජීවිත වලට එකතු කොට ගැනීමෙන් පමණක් මයි.

සිංහල අලුත් අවුරුද්ද සමරන්න ලක ලැහැස්ති වෙන පින්වත් ඔබ මොහොතක්වත් සිතුවාද සිංහලකම, බෞද්ධකම අලුත් කරගන්න නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශක්තිය ජීවිත වලට එකතු කොට ගතයුතුයි කියලා. වර්තමාන සිංහල බෞද්ධ සමාජය සිංහලකම, බෞද්ධකම පෝෂණය කොට ගන්න ආර්ය අෂ්ටාංගික මාර්ගයට වටිනාකමක් දෙන්නේ නැහැ.

කල්‍යාණමිත්‍ර ආශ්‍රයේ, සද්ධර්ම ශ්‍රවණයේ, නුවණින් මෙනෙහි කිරීමේ, ජලය සහ පොහොර දමලා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දලු, කොළ, අතු, රිකිලි මතුකොටගන්නේ නැහැ. හෙට අනිද්දා සිංහල අලුත් අවුරුද්දක් ලැබුවත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් දුර්වල කොට ගනිමින් ලබන සිංහල අලුත් අවුරුද්දට ධර්මානුකූලව කියන්නට වෙන්නේ සිංහල පරණ අවුරුද්දක් කියලයි.

මේ ලිපිය සටහන් තබන වෙලාව දහවල් එකට විතර ඇති. පරිසරය දිළිසෙනවා. අව් කාශ්ඨකයේ තිබෙන දැඩිභාවයට අව් රශ්මියේ දැඩිභාවය නිසාම කැලයේ ගසක ලැග සිටින කොවුලෙක් කෑ ගසනවා. පිපාසයෙන් උගුර කට වේලිලා කෑ ගසන කොවුලාගේ අඳෝනාව ඇසෙද්දි අපි පුංචි කාලයේ බක්මහේ පරිසරයේ නැවුම් බවත් සමග සතුටින් නාද කළ කොවුලන්ගේ මිහිරි හඬ භික්ෂුවට සිහිපත් වෙනවා.

භික්ෂුවගේ ගමේ ගිහි ගෙදර අල්ලපු වැටේ තිබෙන්නේ ගමේ පන්සල. පන්සල ඉඩමේ පිහිටි විශාල නුග ගසේ තමයි අසිරිමත් බක්මහේ කොවුලන්ගේ නවාතැන වෙන්නේ. රතු පාට ඉදුණු නුග ගෙඩි කමින් සතුටින් නාද කරපු ඒ කොවුලන්ගේ මිහිරි හඬ වර්තමානයේ භික්ෂුවට අනිත්‍ය වූ අතීත පංචඋපාදානස්කන්ධයක් පමණක් මයි. එදා බක්මහේ නුග ඵල කමින් සතුටින් නාද කරපු කොවුලන් අද කෑ ගසන්නේ පිපාසයෙන්, කුසගින්නෙන් උගුර කට වේළිලා.

සමාජය තුළ කොයිතරම් නම් වෙනසක් සිදුවෙලා තිබෙනවාද, කවුද මේ වෙනස සිදු කළේ, කවුද මේ වෙනසට වගකිව යුත්තේ. ආණ්ඩු පක්ෂය ද විපක්ෂය ද එසේත් නැතිනම් සිංහල අය ද හින්දු අය ද මුස්ලිම් අය ද මේ වෙනසට වගකිවයුත්තේ? ඔය කවුරුවත් ම නොවේ. මේ වෙනසට ධර්මානුකූලව වගකිව යුත්තේ "අවිද්‍යා පච්චයා සංස්කාර" කියන ධර්මතාවයයි.

මේ සිංහල බෞද්ධ සංස්කෘතිය විකෘතියක් බවට පත් කරන්න සැබෑ හේතුව වුණ 'අවිද්‍යා පච්චයා සංස්කාර' කියන ධර්මතාව පින්වත් ඔබ තුළින්ම සකස් වී ඔබට වහං වී ඔබ තුළින්ම ඔබට ඔච්චම් කරනවා. පින්වත් ඔබ තුළින්ම සකස් වන අවිද්‍යා පච්චයා සංස්කාර කියන ධර්මතාව නුවණින් මතු කොට ගැනීමට ඇති අදක්ෂභාවය නිසාම සමාජගතවන සමාජ විකෘතියේම ගැටීම් සහ ඇලීම් ඇති කොට ගෙන අපි නැවත අවිද්‍යාව ශක්තිමත් කොට ගන්නවා.

භික්ෂුව ඊයේ සවස මාතර නගරය මැද්දෙන් ධර්ම දේශනාවකට වැඩියා. සවස් යාමයේ සාප්පු සවාරි යන පින්වතුන්ලා අලුත් ඇඳුම් මලු එල්ලාගෙන ගියත් ඒ කිසිම මුහුණක සතුටු සිනහවක් භික්ෂුව දැක්කෙ නැහැ. සල්ලි තිබුණත් සතුටක් නැති ජීවිත වගෙයි. මේ සාප්පු සවාරි යන නෝනා කෙනෙක් ගෙන්, මහත්මයෙක් ගෙන් ඇසුවොත් "මහත්තයෝ ඔබ සතුටින් ද ඉන්නේ" කියලා, ඔහු අනිවාර්යයෙන්ම කියාවි "මොන සතුටක් ද මහත්තයෝ ඔළුව ගිනි අරගෙනයි සිටින්නේ" කියලා. සල්ලි තිබුණත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයක් නැති ජීවිත හිස ගිනිගත්ත ජීවිත මයි.

සිංහල අලුත් අවුරුද්දට තම දෙමාපියන්ට ඇඳුම් ගන්න සාප්පු සවාරි ගිය මහත්මයෙක් භික්ෂුවට කියනවා ස්වාමින්වහන්ස, ඇඳුම් පැළඳුම් ගිනි ගණන්ය කියලා. හිස ගිනිගත්ත මනුෂ්‍යයන්ගෙන් කෙසේ නම් සිසිලක් බලාපොරොත්තු වෙන්නද? මේ සෑම දෙයක් පසුපසම වගකිවයුත්තෙක් සිටිනවා ඒ වගකිවයුත්තා තමයි 'අවිද්‍යා පච්චයා සංස්කාර' කියන ධර්මතාවය.

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා කිඹුල්වත් නුවරින් හමා ගෙන එන සුළඟත් සුවදායකයි කියලා. බුදුරජාණන්වහන්සේ නමක් ලෝකයට පහල වෙන්නේ කාලය, ද්වීපය, දේශය, කුලය, මව කියන පස්මහ බැලුම් බලලා.

බුදුරජාණන්වහන්සේ උපත ලැබූ කිඹුල්වත් නුවර කියන්නේ හේතුඵල ධර්මයක් මයි. බෝධි සත්ත්වයන්ගේ දස පාරමී කුසල් ශක්තියේ එක් ඵලයකුයි කිඹුල්වත් නුවර කියන්නේ. පිනෙන් උපන් පුණ්‍ය භූමියක් බුදුරජාණන්වහන්සේ කිඹුල්වත්පුරයෙන් හමා ගෙන එන සුළඟත් සුවදායකයි කියන්නේ. අතීත පිනෙන් උපන් මනුෂ්‍යයෝ, පිනෙන් උපන් පරිසරය, පින නිසාම සකස් වුණ නැවුම් දේශගුණය මේ සියල්ල පිසගෙන හමන සුළඟත් පිනේ විදර්ශනාත්මක සතුටක් මයි, පස්සද්ධියක් මයි, ජීවිතයට එකතු කොට දෙන්නේ.

ඔබ උපන් බිම එම බිමේ උපන් ඔබත් සමඟ මොන තරම් ධර්මානුකූල සම්බන්ධයක් තිබෙනවාද? ධර්මාශෝක අධිරාජයාගේ දූ පුතුන් වෙච්ච මිහිඳු මහෝත්තමයන් වහන්සේට, සංඝමිත්තා උත්තමාවියට පින්වත් ඔබ දෙපා තබාගෙන සිටින පුණ්‍ය භූමියට වඩින්න, පිරිනිවී යන තෙක් මේ පුණ්‍ය භූමියේ වැඩසිටින්න දැනීම් සකස් වුණේ මේ පින් බිම මේ පින් බිමේ උපන් ඔබ මොන තරම් පුණ්‍යවන්ත නිසාද?

මෙය සටහන් තබන භික්ෂුව මොහොතක් ඇස් දෙක පියාගෙන නිසොල්මනේ සිටිනවා කාශ්ඨක අව් රශ්මියෙන් වියළී ගිය ශරීරයේ උෂ්ණාධික බව භික්ෂුවට හොඳින් දැනෙනවා. දැඩි අව් කාශ්ඨකය මැද්දෙ හමාගෙන එන වියළි සුළඟ, උෂ්ණාධික ශරීරයට පවන් සලනවා වගේ දැනෙනවා. මේ සියලු පාරිසරික ලක්ෂණයන් භික්ෂුවට හරිම සුවදායකයි. මේ පාරිසරික ලක්ෂණ සියල්ලම 'අවිද්‍යා පච්චයා සංස්කාර' කියන ධර්මතාවයේ උතුම් ඵලයක් මයි. අපි ධර්මය, ධර්මය හැටියට දැකිය යුතුයි. ධර්මය, අධර්මය හැටියට දැක්කොත් අවිද්‍යාවත් අවිද්‍යාව හේතුවෙන් සකස් වන සංස්කාරයත් නැවත නැවත ශක්තිමත් වෙනවා.

අව් කාශ්ඨකයෙන් උගුර කට වියළුණු කොවුලාගේ අඳෝනාව භික්ෂුවට නැවතත් ඇසෙනවා. ඒ කොවුලාගේ උගුර කට වියළුණු අඳෝනාව තුළින් භික්ෂුව දකින්නෙත් 'අවිද්‍යා පච්චයා සංස්කාර' කියන ධර්මතාව මයි.

සත්ත්වයා අවිද්‍යාව හේතුවෙන් අකුසල් කරන්න, කරන්න එම අකුසල් විපාක දීමට සුදුසු කාලගුණික, දේශගුණික, දේශපාලනික පරිසරයක් සකස් වෙනවා. ඒ නිසා මයි, ලිපියේ මුලින්ම භික්ෂුව සටහන් තැබුවේ ලබන්නා වූ සිංහල අවුරුද්ද අලුත් අවුරුද්දක් බවට පත් කොට ගන්න අවශ්‍ය නම් කරුණාකර ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශක්තියෙන් ලබන්නා වූ සිංහල අවුරුද්ද අලුත් කර ගන්නය කියලා.

ආර්ය අෂ්ටාංගික මාර්ගය ජීවිතයට එකතුකොටගත් පින්වතා තෙරුවන්ට කීකරු පින්වතෙක් වෙනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කළා වූ ධර්මයෙන් බැහැරව යන්නේ නැහැ. මහා සංසරත්නයේ ඇසුරින් ඈතට යන්නේ නැහැ. එම පින්වතා කර්මය කර්මඵල විශ්වාසයට අදාළව ලෝකය දකිනවා.

කර්මය කර්මඵල විශ්වාසයට අදාළව ලෝකය දකින පින්වතා යහපත සහ අයහපත හොඳින් අඳුරනවා. ඇයි අපි හොඳම දෙය ලැබුවේ, ඇයි අපි විශිෂ්ටම දෙය ලැබුවේ? සුගතිය, විදර්ශනාත්මක නිවන් මාර්ගය සහ ඵලයන් ලෝකයේ කවුරුවත්ම නොලැබූ මාර්ගයක් අපි ලබලා තිබෙනවා. සුන්දර නිවන් මාර්ගයක හිමිකරුවන් වෙලා තිබෙනවා.

සියලු සංස්කාරයෝ අනිත්‍ය බව ඇත්ත. මේ ඇත්ත නිසා මයි, බුදුරජාණන්වහන්සේ උතුම් භික්ෂු ප්‍රාතිමෝක්ෂ ශීලයට සිල් පද දෙසිය විසිහතක් ම ඇතුළත් කරන්නේ. අනිත්‍ය වී යන ශාසන අර්ථයන් වැඩිපුර දවසක් හෝ රැක ගන්න. සත්පුරුෂ ජීවිත, උත්තම ජීවිත, පූර්වාදර්ශී ජීවිත කවදාවත් තමන් ජීවිතාවබෝධයෙන් ලැබූ ධර්මයේ සැපයන්, අනුනට අහිමි කරන්නේ නැහැ. ධර්මානුකූල සැපයක් ලබන තම පරපුරේ අන්තිමයා වෙන්නේ නැහැ. ඔහු අවබෝධයෙන්ම දන්නවා සියලු සංස්කාරයෝ අනිත්‍යයි, අස්ථිරයි, කැඩී, බිඳී, විසිරී, අතුරුදන් වී යනවාය කියලා. ඔහු සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් තමන්ට සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දැකීමට උපකාරක ධර්මයක් සකස්කොට දුන් යහපත් දේ අනාගත ලෝකයට ආරක්ෂා කොට තිබෙනවා.

අපි යමෙක් අනාගත ලෝකයට ආරක්ෂා කොට තබන්න නම් මුලින්ම ඒ දෙය තමා තුළින් ආරක්ෂා කොට ගන්න ඕනේ. පින්වත් ඔබ ලබන්නා වූ සිංහල අවුරුද්ද ලෞකික සැපයේ සහ ලෝකෝත්තර සැපයේ එකම ධර්මානුකූල මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් ශක්තිමත් කොට ගන්න.

ඇසෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින් ගලා හැළෙන තෘෂ්ණාවේ සැඩ පහරට හසුව අසිහියෙන් කටයුතු කරන පින්වත් පාලක පින්වතුන්ලාගේ අසත්පුරුෂ ක්‍රියාවන් හේතුවෙන් මතුවන විදේශීය බලහත්කාරකම් වලින් හෙම්බත් වී සිටින සිංහල බෞද්ධ ජාතියට වර්තමානයේ සද්ධර්මයේ ආරක්ෂාව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ආරක්ෂාව අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. වර්තමානයේ මේ සිංහල බෞද්ධ සමාජය ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් අනාරක්ෂිතවයි තිබෙන්නේ. අවිද්‍යා පච්චයා සංස්කාර කියන ධර්මතාවට අදාළව ප්‍රශ්න විග්‍රහ කර ගන්නේ නැහැ. ජාතික ප්‍රශ්නවලට හේතුව පුද්ගල සංඥාවන්ට භාරදෙනවා. ඒ නිසාම සමාජය තුළ වැඩෙන්නේ අකුසලයට අදාළ ලෝභ, ද්වේශ, මෝහ ධර්මයන් මයි.

ජාතික ප්‍රශ්නවලට වගකිවයුතු පක්ෂ, විපක්ෂ දේශපාලනයට මුවා වී අවිද්‍යා පච්චයා සංස්කාර කියන ධර්මතාව අපි සැවොම මුළාවට පත්කරනවා. දුකට හේතුව අපි තුළම සකස් වන තෘෂ්ණාව කියලා අපි දකින්නේ නැහැ. අපි තුළම සකස් වන තෘෂ්ණාව නොහඳුනන අපි තෘෂ්ණාව සියුම්කරන ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රයෝජනයට ගන්නේ නැහැ.

සියලු සංස්කාරයෝ අනිත්‍ය නිසාම සිහිබුද්ධියෙන් යුතුව අනාගත පරපුරට මේ සිංහල බෞද්ධකම ආරක්ෂා වෙන්න ඕනේ. අනාගත පරපුරට ආර්ය අෂ්ටාංගික මාර්ගයේ උතුම් ගුණයන් ආරක්ෂා වෙන්න ඕනේ. අනාගත පරපුරට මේ ජාතික සම්පත් විජාතිකකරණයෙන් තොරව පෝෂණය වෙන්න ඕනේ. මේ ජනතාවගේ අකුසල් හේතුවෙන්ම සමාජගත වී ඇති අභියෝග යන් සියල්ල සිහිබුද්ධියෙන් තේරුම් ගන්න දේශපාලනයෙන් සටකපට නොවූ විනයගරුක අලුත් නායකත්වයක් රටට ලැබෙන්නට ඕනේ. මෙය සටහන් තබන භික්ෂුව හෙට අපවත්වෙන්න පුළුවන්. ඒත් මේ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය තව චිරාත් කාලයක් ජීවත්වෙන්න ඕනේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "ප්‍රාර්ථනා කිරීමෙන් බලාපොරොත්තු තැබීමෙන් පමණක් කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ"ය කියලා. පින්වත් ජනතාව යම් ප්‍රාර්ථනාවක් ඇතිකොට ගත හොත් එම ප්‍රාර්ථනාවන් සඵල කරගැනීමේ මාර්ගයේ ගමන් කළ යුතු වෙනවා. ජාතික සමගියෙන් පෝෂණය වූ සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කොට ගැනීමේ එකම ධර්මානුකූල මාර්ගය උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

වර්තමාන සමාජයේ අකුසලය හේතුවෙන් ම සමාජගත වී ඇති ජාතික අනතුරු දැකලා මේ ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද හුදු විනෝදය, සතුට සඳහා නොව ජාතියට ආදරය කරන අවංක විනයගරුක නායකයෙක් මතු කොට ගැනීමට පින්වත් ඔබේ කුසල් ධර්මයන්ගෙන් පෝෂණය වූ සිතේ ශක්තිය වර්ධනය කොට ගන්න. අවිද්‍යාව හේතුවෙන් අපි රැස් කොට ගන්නා අකුසල් සංස්කාරයන් නිසා මයි, මේ සියලු විනාශයන් සමාජගත වෙලා තිබෙන්නේ.

අවිද්‍යාවේ තීව්‍රභාවය නිසා ම බලවත් ආකාරයෙන් සමාජය අකුසලය දෙසට ගමන් කරනවා. රටේ දේශපාලන බලධාරීන් ජනතාව කාමච්ඡන්දයන් දිශාවට ම, ඇලීම් සහ ගැටීම් දිශාවට ම යොමු කරමින් ජනතාවගේ අකුසලයේ ශක්තිය තව තවත් ශක්තිමත් කොට දෙනවා. භික්ෂුව නැවතත් සටහන් තබනවා, ඉහත සෑම අර්බුදයකට ම එකම හේතුව අවිද්‍යා පච්චයා සංස්කාර කියන ධර්මතාවයේ ධර්මානුකූල ඵලයයි. භික්ෂුව කාටවත් ඇඟිල්ල දිගු කරලා චෝදනා කරන්නේ නැහැ. ආත්මීය දැක්මෙන් ඔබ්බට ගිය පටිච්චසමුප්පාද හේතුඵල ධර්මයනුයි, භික්ෂුව සටහන් තබන්නේ. පින්වත් ඔබට රටේ දේශපාලනය බඩගෝස්තරයක් වෙන්න පුළුවන්. ඒත් භික්ෂුවට දේශපාලනය ධර්මයක් මයි. පාලක පින්වතුන්ගේ සහ ජනතාවගේ අකුසල් වැඩි වෙන කොට රටක් පිරිහීමේ දිශාවට ම ගමන් කරනවා. රටක පාලක පින්වතුන් සහ ජනතාව කුසලයෙන් ශක්තිමත් වෙන කොට රට යහපත් දිශාවට ගමන් කරනවා.

මේ උදාවන සිංහල අලුත් අවුරුද්ද පින්වත් ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ජීවිතය කොට ගෙන ජාතියේ ම කුසලයේ ශක්තිය යම් පමණකට හෝ ශක්තිමත් කොට ගන්න. මේ උතුම් දේශයට නැවත විනයගරුක නායකත්වයක් මතු කොට ගැනීමට ඉතිරි වී ඇති ධර්මානුකූල එකම ප්‍රවේශය එපමණයි. එම ප්‍රවේශය තුළ රටට විනයගරුක නායකත්වයක් මතු වුණත් එයත් අනිත්‍ය වූ සංස්කාරයක් පමණක්ම කියන කාරණය ධර්මානුකූලව දකින්න ඕනේ. එසේ නොවුණොත් එම විනයගරුක නායකයාත් විනය විරෝධී නායකයෙක් බවට වෙනස් වෙන්න පුළුවන්.

සියලු සංස්කාරයෝ අනිත්‍ය වෙලා යනවා. කැඩිලා, බිඳිලා විසිරිලා යනවා. භික්ෂුව ලියනවා, පින්වත් ඔබ කියවනවා අවසානයේ අපි දෙගොල්ලන්ම රැස් කොට ගන්නේ අනිත්‍ය වී යන සංස්කාරයක් මයි.

සංස්කාරයන්ගෙන් තොරව ලෝකය දකින්න බැරිද? ඒ තත්ත්වයට පත්වුණ උත්තරීතර මනුෂ්‍යයාටයි රහතන් වහන්සේ කියලා කියන්නේ. ඵස්සය අසලින් උන්වහන්සේ ලෝකය නිරෝධය කරනවා. රහතන් වහන්සේ වර්තමාන ඵස්සය අසලින් ලෝකය නිරෝධය කළත් අතීත අවිද්‍යා පච්චයා සංඛාරා ධර්මතාවන් හේතුවෙන් පටිච්චසමුප්පන්නව ලුහුබැඳ පැමිණෙන සංස්කාරයෝ ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන්ට යටත් නොවූ විපාකයක් සකස් කොට දෙනවා.

අපි කවදා හරි උතුම් රහතන් වහන්සේ නමක් බවට පත් වුණොත් තෘෂ්ණාවෙන් තොර එකම එක කැමැත්තක් රහතන් වහන්සේට තිබෙනවා. එම තෘෂ්ණාවෙන් තොර කැමැත්ත රහතන් වහන්සේ අතීත සංස්කාරයන්ට ම අතහැරලයි තිබෙන්නේ. රහතන් වහන්සේ නමක් සහ තෘෂ්ණාවෙන් තොර එකම කැමැත්ත හැකි ඉක්මනින් අනුපධිශේෂ නිර්වාණ ධාතුවෙන් දරාගෙන සිටින අවසාන කය තුළින් ම නිවීයේවා කියන කැමැත්ත යැයි භික්ෂුව විශ්වාස කරනවා.

අතීත රහතන් වහන්සේලාගේ ගුණ සුවඳින් පුණ්‍යවන්ත වූ මේ උතුම් මාතෘ භූමියට හෙට අනිද්දා ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද සමස්ත ජාතියටම විනයගරුක නායකයකුගේ සම්ප්‍රාප්තිය උදෙසා උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මංගල්‍යයක් ම වේවා.

- සමාප්තිය -

## ''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ''
## දහම් පුස්තක මාලාවේ මෙතෙක් නිකුත් වී ඇති දහම් පුස්තකයන්

### ''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ'' පොත් මාලාව (අතහැරීම 1-14 දක්වා)

- අතහැරීම 01 (2012 මැයි සිට)
- අතහැරීම 02 (2012 සැප්තැම්බර් සිට)
- අතහැරීම 03 (2013 මැයි සිට)
- අතහැරීම 04 (සංශෝධිත මුද්‍රණය-2016 ජනවාරි සිට)
- අතහැරීම 05 (සංශෝධිත මුද්‍රණය-2016 ජනවාරි සිට)
- අතහැරීම 06 (2014 මාර්තු සිට)
- අතහැරීම 07 (2014 සැප්තැම්බර් සිට)
- අතහැරීම 08 (2015 සැප්තැම්බර් සිට)
- අතහැරීම 09 (2016 සැප්තැම්බර් සිට)
- අතහැරීම 10 (2017 ජූලි සිට)
- අතහැරීම 11 (2018 මැයි සිට)
- අතහැරීම 12 (2018 සැප්තැම්බර් සිට)
- අතහැරීම 13 (2019 සැප්තැම්බර් සිට)
- අතහැරීම 14 (2020 සැප්තැම්බර් සිට)

### ''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ'' පින්සිත් වඩන පන්සිල් මළුව පොත් මාලාව

- පින්සිත් වඩන පන්සිල් මළුව - ධර්ම සාකච්ඡා අංක 1 (2017 ජූලි සිට)
- පින්සිත් වඩන පන්සිල් මළුව - ධර්ම සාකච්ඡා අංක 2 (2018 සැප්තැම්බර් සිට)
- පින්සිත් වඩන පන්සිල් මළුව - ධර්ම සාකච්ඡා අංක 3 (2019 සැප්තැම්බර් සිට)
- පින්සිත් වඩන පන්සිල් මළුව - ධර්ම සාකච්ඡා අංක 4 (2020 සැප්තැම්බර් සිට)

### ''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ'' පොත් මාලාවේ ඉංග්‍රීසි පරිවර්තනයන්


- Giving Up Part 1 (From January 2014)
- Giving Up Part 2 (From April 2019)
- Giving Up Part 3 (From December 2017)
- Giving Up Part 4 (From September 2016)
- Giving Up Part 5 (From September 2016)
- Giving Up Part 6 (From February 2018)
- Giving Up Part 7 (From February 2018)
- Giving Up Part 11 (From September 2020)
- Noble Eightfold Path (From February 2018)

### ''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ'' අනෙකුත් පොත්

- සතර අපායෙන් මිදීම (2014 පෙබරවාරි සිට)
- කාලෙන ධම්ම සාකච්ඡා (2014 නොවැම්බර් සිට)
- ආර්ය අෂ්ටාංගික මාර්ගය (2015 පෙබරවාරි සිට)
- තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව පින්වත් ඔබට
  සැබෑම නිරෝගී භාවය ලබා දෙන එකම වෛද්‍යවරයායි (2015 මැයි සිට)
- ලස්සන වෙන්න කැමති පින්වත් දරුවන්ට මෙත් සිත (2016 මැයි සිට)
- සතර අපායෙන් මිදීම උදෙසා දේවතානුස්සතිය (2017 මැයි සිට)
- සතර අපායෙන් මිදීම උදෙසා (2017 මැයි සිට)
- අනිත්‍ය භාවනාව (2018 පෙබරවාරි සිට)
- සප්ත විශුද්ධි ධර්ම (2018 මැයි සිට)
- සිරසා නමාමි වෙසක් කලාපය - පන්සිල් මළුව ධර්ම දේශනය (2019 පෙබරවාරි සිට)
- පංචසීලය තුළින් විදර්ශනාවට මඟ (2019 මාර්තු සිට)
- ඇලහැර සංඝ සාකච්ඡාව (2019 අප්‍රේල් සිට)
- පාස්කු ඉරිදා ප්‍රහාරය සහ හෙට උදාවන ලෝකය ධර්මයේ ඇසින්... (2019 මැයි සිට)
- සිරසා නමාමි 2021 වෙසක් විශේෂ ධර්ම දේශනය - කොරෝනා අකුසලයට එකම ඖෂධය දහම් ඖෂධයයි. (2021 ජූලි සිට)

**නිෂ්පාදන වියදමට දායක වී ඉහත සඳහන් ග්‍රන්ථයන් ධර්ම දානයක් ලෙස බෙදා දීමට ලබා ගත හැක. මහ රහතුන් වැඩි මඟ ඔස්සේ දහම් පුස්තක, ඔබගේ නිවසටම හෝ ආසන්නතම ප්‍රධාන තැපැල් කාර්යාලය වෙතද ගෙන්වා ගත හැක.**

**විමසීම්: 011 2755767, 011 2755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා)**



ගෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

මිල රු. 180/-

ISBN 978 -955-7887-49-4

9 789557 887494

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්